320වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 320 - இல. 08
Volume 320 - No. 08

2025 අගෝස්තු 05වන අඟහරුවාදා
2025 ஓகஸ்ட் 05, செவ்வாய்க்கிழமை
Tuesday, 05th August, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය [තීරුව 1225]

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1226]
සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 1226]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1226]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1231]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1233-1295]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
යෞවන සමාජ පිහිටුවීම සහ ප්‍රතිසංවිධානය කිරීම [තීරුව 1295]
රේගු පරීක්ෂාවකින් තොරව බහලුම් 323ක් නිදහස් කිරීම පිළිබඳව සොයා බැලීමට පත් කරන ලද කමිටුවේ වාර්තාව [තීරුව 1304]

**පැල්වත්ත සහ සෙවනගල උක් ගොවීන්ට ගෙවීම් ප්‍රමාද වීම:**
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1305]

**යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන ගැටලු:**
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1309]

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට දේශීය සිසුන් බඳවා ගැනීම අත්හිටුවීම:**
ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1313]

**වරප්‍රසාද:**
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා 2025.07.26 දින කරන ලද ප්‍රකාශය [තීරුව 1316]

**වරප්‍රසාද යෝජනා:**
නොමඟ යවන චෝදනා මත පදනම්ව සජීවී කථා විකාශය අත්හිටුවීම [තීරුව 1322]

**2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය:**
සම්මත කරන ලදී [තීරු 1323-1407]

**ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත:**
නියෝග [තීරු 1407-1430]

**අධිකරණ සංවිධාන පනත:**
නියෝග [තීරුව 1430]

**කල්තැබීමේ යෝජනාව**:
කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැසට් කිරීම [තීරු 1431-1448]


---

# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1225]

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 1226]
மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1226]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1226]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1231]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1233-1295]

**தனி அறிவித்தல் மூல வினா:**
இளைஞர் கழகங்களை ஸ்தாபித்தலும் மறுசீரமைத்தலும் [ப: 1295]
சுங்கச் சோதனையின்றி 323 கொள்கலன்களை விடுவித்தல் தொடர்பில் விசாரணை செய்வதற்கு நியமிக்கப்பட்ட குழுவின் அறிக்கை [ப: 1304]

**பெல்வத்த மற்றும் செவனகல கரும்பு விவசாயிகளுக்கு கொடுப்பனவு மேற்கொள்வதில் தாமதம்:**
கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 1305]

**யாழ்ப்பாண மாவட்ட விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்:**
வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 1309]

**ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழக மருத்துவ பீடத்தில் உள்ளூர் மாணவர்களின் உள்ளீர்ப்பு இடைநிறுத்தம்:**
பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 1313]

**சிறப்புரிமை:**
2025.07.26ஆம் திகதிய மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸவினது கூற்று [ப: 1316]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
தவறான குற்றச்சாட்டுகளை அடிப்படையாகக்கொண்டு உரையின் நேரடி ஒலி/ஒளிபரப்பை இடைநிறுத்தியமை [ப: 1322]

**2002ஆம் ஆண்டின் 5ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 17ஆம் பிரிவின் பிரகாரம், பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களை பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுவதற்கான தீர்மானம்:**
நிறைவேற்றப்பட்டது [ப: 1323-1407]

**மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத்தீர்வைகள் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1407-1430]

**நீதித்துறைச் சட்டம்:**
ஒழுங்குவிதிகள் [ப: 1430]

**ஒத்திவைப்புப் பிரேரணை:**
கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவு தொடர்பான வர்த்தமானி அறிவித்தலை வெளியிடல் [ப: 1431-1448]

# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1225]

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1226]

Mediation (Civil and Commercial Disputes) Bill: Petition to the Supreme Court [Col. 1226]

AUDITOR-GENERAL'S REPORT [Col. 1226]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1231]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1233-1295]

QUESTION BY PRIVATE NOTICE:
Establishment and Reorganization of Youth Clubs [Col. 1295]

Report of Committee Appointed to Inquire into Release of 323 Containers without Customs Inspection [Col. 1304]

DELAY IN MAKING PAYMENTS TO SUGARCANE FARMERS IN PELWATTE AND SEVANAGALA:
Statement by Minister of Industry and Entrepreneurship Development [Col. 1305]

ISSUES FACED BY FARMERS IN JAFFNA DISTRICT:
Statement by Minister of Trade, Commerce, Food Security and Co-operative Development [Col. 1309]

SUSPENSION OF ENROLMENT OF LOCAL STUDENTS TO MEDICAL FACULTY OF GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY:
Statement by Deputy Minister of Defence [Col. 1313]

PRIVILEGE:
Statement Made by Hon. (Dr.) Nalinda Jayatissa on 26.07.2025 [Col. 1316]

PRIVILEGE MOTIONS:
Suspension of Live Telecast of Speeches Based on Misleading Allegations [Col. 1322]

RESOLUTION TO REMOVE THE INSPECTOR-GENERAL OF POLICE, MR. T.M.W. DESHABANDU TENNAKOON FROM THE OFFICE OF THE INSPECTOR-GENERAL OF POLICE IN TERMS OF SECTION 17 OF THE REMOVAL OF OFFICERS (PROCEDURE) ACT, NO. 5 OF 2002:
Passed [Col. 1323-1407]

ANTI-DUMPING AND COUNTERVAILING DUTIES ACT:
Regulations [Cols. 1407-1430]

JUDICATURE ACT:
Regulations [Col. 1430]

ADJOURNMENT MOTION:
Gazetting of Divisional Secretary’s Division of Koralaipattu Central [Cols. 1431-1448]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 අගෝස්තු 05වන අඟහරුවාදා***
*2025, ஓகஸ்ட் 05, செவ்வாய்க்கிழமை*
*Tuesday, 05th August, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත සඳහන් සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/7/IX/3/01

2025 ජූලි මස 25 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති



## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2025 අගෝස්තු මස 04වන දින "සමාගම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### மத்தியஸ்தம் (குடியியல் மற்றும் வர்த்தகப் பிணக்குகள்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### MEDIATION (CIVIL AND COMMERCIAL DISPUTES) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් 2025 ජූලි 25වන දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XLV කොටස; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ III හා IV කොටස් සහ නවවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් යෝජනා සම්මතය, නියමය සහ නියෝගය ඉදිරිපත් කරමි.

(i) (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධ යෝජනා සම්මතය

(2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(ii) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(iii) 2018 අංක 35 දරන මුදල් පනතේ 51 වගන්තිය සමඟ කියවිය යුතු 19 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

මෙම යෝජනා සම්මතය, නියමය සහ නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

1988 අංක 83 දරන පනතින් සංශෝධිත, රේගු ආඥා පනතේ (235 අධිකාරය වූ) 10(අ) වගන්තිය යටතේ ආනයනික භාණ්ඩ සඳහා තීරු බද්ද සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2024 වර්ෂය සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම ජාතික පොලිස් කොමිෂන් සභාවේ, මුදල් කොමිෂන් සභාවේ, විගණන සේවා කොමිෂන් සභාවේ, මැතිවරණ කොමිෂන් සභාවේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2024 වර්ෂය සඳහා 2025 ජූලි 08 අඟහරුවාදා හා 2025 ජූලි 09 බදාදා පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද වාර්ෂික කාර්ය සාධන වාර්තා හය රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත නොව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126 ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබිය යුතු යැයි යනුවෙන් සභාවේ අවසරය ඇතිව සංශෝධනය විය යුතු යැයි යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ සහ 35(1), (2), සහ (4) වගන්ති සමඟ කියවිය යුතු 58 වගන්තිය යටතේ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2024 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on the -

(i) Bills of Exchange (Amendment) Bill;

(ii) Regulations under Section 15 read with Sections 7 (1) and 8 (2) of the Tea (Tax and Control of Export) Act, No. 16 of 1959

(Published in Gazette Extraordinary No. 2343/63 dated 05th August, 2023);

(iii) Order under Section 2 of the Tobacco Tax Act, No. 8 of 1999 as amended relating to imposition of Tobacco Tax on Beedi

(Published in Gazette Extraordinary No. 2430/16 dated 01st April, 2025);

(iv) Regulations made under Section 35 read with Sections 19, 20,21, 22 and 23 of the Public Debt Management Act, No. 33 of 2024 and the proviso to Article 44(3) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

(Published in the Gazette Extraordinary No. 2443/14 dated 30th June, 2025); and

(v) Order under Section 22 of the Foreign Exchange Act, No. 12 of 2017

(Published in Gazette Extraordinary No. 2441/14 dated 18th June, 2025),

which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)

ගරු කථානායකතුමනි, අතුරුගිරිය, පෝරේ, සීලවිමල මාවත, අංක 208/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඒ.එච්.එල්. මාටින් සිංඤෝ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) තිහාරිය, වාරණ පාර, සිරි නිවස, අංක 238/3 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. උදේනි උමේන්ද්‍ර වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) යක්කල, අලුත්ගම, බෝගමුව, පල්ලිය පාර, අංක 125/8 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්.පී.සී. රත්නායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

Hon. Speaker, I present a petition from Mr. Augustin Fernando of No. 81/A, Bathala Hena Watta, Kanjukkuliya, Mugunuwatawana.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු කථානායකතුමනි, මීරිගම, තවලම්පිටිය, 2 වන පටුමග, මඩුගහවත්ත යන ස්ථානයෙහි පදිංචි වයි.එම්.සී. පොඩිමැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු චානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) යටියන්තොට, වත්ත පාර, මීපිටිකන්ද යන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාලබේ, කහන්තොට, මල්වත්ත පාර, අංක 228/2ඊ/1 දරන ස්ථානයෙහි පදිංචි එස්.බී.අයි.සී. සේසත් බණ්ඩාර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) හාලිඇල, නුගසෙවණගම, කොබ්බෑකඩුව මාවත, අංක 4 ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) හෝමාගම, දූවවත්ත, අංක 27/18 දරන ස්ථානයෙහි පදිංචි වයි.කේ.ජී.ඩී.බී. යටිවැල්ල මහතා සහ තවත් හයදෙනෙකුගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

ගරු කථානායකතුමනි, දිවුලපිටිය, වැවගෙදර, අංක 239/1 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. සිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, හංවැල්ල, පහත්ගම, අංක 82/3 දරන ස්ථානයෙහි පදිංචි එන්. ප්‍රසන්න ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களே, மன்னாரில் காற்றாலை மின் உற்பத்தி சம்பந்தமாக ஓர் ஆர்ப்பாட்டம் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. நாளை அல்லது நாளை மறுதினம் சம்பந்தப்பட்ட அமைச்சர்களையும் முக்கிய ஆட்களையும் அழைத்து, இதற்கு ஒரு முடிவைக் காண முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### රජයේ පාසල්: අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ වැටුප් වියදම
### அரசாங்கப் பாடசாலைகள்: கல்விசார் ஊழியர்கள் மற்றும் சம்பளச் செலவுகள்
### GOVERNMENT SCHOOLS: ACADEMIC STAFF AND EXPENDITURE ON SALARIES

307/2024

**1. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටි ජාතික හා පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වැටුප් හා පාරිශ්‍රමික වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මාසිකව හා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

(iv) රජයේ ගුරුවරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) රජයේ පාසල් තුළ ගුරු හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා වූ කාලසටහන කවරේද;

(iii) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නාමයන් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහ තුළ රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) මීළඟ වර්ෂ පහ තුළ 1 ශ්‍රේණියට ඇතුළත් වෙතැයි පුරෝකථනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஒவ்வொரு மாவட்டத்திலுமுள்ள தேசிய மற்றும் மாகாணப் பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) இந்தப் பாடசாலைகளில் பணியாற்றும் ஆசிரியர்கள் மற்றும் அதிபர்களின் மொத்த எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) இந்த ஆசிரியர்கள் மற்றும் அதிபர்களுக்கான சம்பளங்கள் மற்றும் ஊதியங்களுக்கான மொத்த மாதாந்த மற்றும் வருடாந்தச் செலவினங்கள் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) அரசாங்க ஆசிரியரொருவரின் சராசரி மாதாந்தச் சம்பளம் எவ்வளவு என்பதையும்?

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரச பாடசாலைகளில் ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், இந்த வெற்றிடங்களை நிரப்புவதற்கான காலக்கெடு யாது என்பதையும்;

(iii) 100 மாணவர்களைவிடக் குறைவான மாணவர்களைக்கொண்ட பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) அத்தகைய பாடசாலைகளின் பெயர்களை, மாவட்ட அடிப்படையில் வெவ்வேறாகவும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) (i) கடந்த ஐந்து வருடங்களில் அரச பாடசாலைகளில் முதலாம் தரத்துக்கு அனுமதிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) எதிர்வரும் ஐந்து வருடங்களில் முதலாம் தரத்துக்கு அனுமதிக்கப்படுவார்கள் என எதிர்பார்க்கப்படும் மாணவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

வெவ்வேறாக அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු රවී කරුණානායක මහතා]

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of National and provincial schools in each district, separately;

(ii) total number of teachers and principals serving in those schools;

(iii) total monthly and annual expenditure on salaries and emoluments for those teachers and principals, separately; and

(iv) average monthly salary of a government teacher?

(b) Will she also inform this House -

(i) whether there is a shortage of teachers in government schools;

(ii) if so, the timeline for filling those vacancies;

(iii) the number of schools with less than 100 students; and

(iv) the names of such schools, categorized by district?

(c) Will she further inform this House, separately, the -

(i) number of students admitted to Grade 1 in government schools over the past five years; and

(ii) projected number of Grade 1 admissions for the next five years?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටි ජාතික හා පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහතින් දැක්වේ.

| Province | District | National | Provincial | Grand Total |
|---|---|---|---|---|
| **1.Western** | 11.Colombo | 39 | 354 | 393 |
| | 12.Gampaha | 20 | 515 | 535 |
| | 13.Kalutara | 20 | 396 | 416 |
| **1.Western Total** | | **79** | **1265** | **1344** |
| **2.Central** | 21.Kandy | 36 | 614 | 650 |
| | 22.Matale | 12 | 298 | 310 |
| | 23.Nuwara Eliya | 8 | 540 | 548 |
| **2.Central Total** | | **56** | **1452** | **1508** |
| **3.Southern** | 31.Galle | 30 | 395 | 425 |
| | 32.Matara | 23 | 333 | 356 |
| | 33.Hambantota | 17 | 303 | 320 |
| **3.Southern Total** | | **70** | **1031** | **1101** |
| **4.Northern** | 41.Jaffna | 8 | 437 | 445 |
| | 42.Mannar | 5 | 126 | 131 |
| | 43.Vavuniya | 5 | 164 | 169 |
| | 44.Mullaitivu | 3 | 122 | 125 |
| | 45.Kilinochchi | 3 | 101 | 104 |
| **4.Northern Total** | | **24** | **950** | **974** |
| **5.Eastern** | 51.Batticaloa | 13 | 353 | 366 |
| | 52.Ampara | 17 | 426 | 443 |
| | 53.Trincomalee | 12 | 303 | 315 |
| **5.Eastern Total** | | **42** | **1082** | **1124** |
| **6.North Western** | 61.Kurunegala | 31 | 840 | 871 |
| | 62.Puttalam | 8 | 364 | 372 |
| **6.North Western Total** | | **39** | **1204** | **1243** |
| **7.North Central** | 71.Anuradhapura | 8 | 550 | 558 |
| | 72.Polonnaruwa | 9 | 241 | 250 |
| **7.North Central Total** | | **17** | **791** | **808** |
| **8.Uva** | 81.Badulla | 27 | 575 | 602 |
| | 82.Moneragala | 11 | 280 | 291 |
| **8.Uva Total** | | **38** | **855** | **893** |
| **9.Sabaragamuwa** | 91.Ratnapura | 16 | 575 | 591 |
| | 92.Kegalle | 15 | 495 | 510 |
| **9.Sabaragamuwa Total** | | **31** | **1070** | **1101** |
| **Grand Total** | | **396** | **9700** | **10096** |

**(මූලාශ්‍රය : 2023 පාසල් සංගණන වාතර්ාවට අනුව)**

(ii)

| | මුළු ගුරුවරුන් සංඛ්‍යාව | මුළු විදුහල්පතිවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පාසල් | 43,300 | 1,573 |
| පළාත් පාසල් | 194,487 | 10,994 |
| එකතුව | 237,787 | 12,567 |

(iii) මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වැටුප් හා පාරිශ්‍රමික වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මාසිකව හා වාර්ෂිකව වැය වන මුළු මුදල පහතින් දැක්වේ.

### මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වැටුප් හා පාරිශ්‍රමික වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මාසිකව හා වාර්ෂිකව වැය වන මුළු මුදල

| | ජාතික/ පළාත් පාසල් | ගුරුවරු | | | | විදුහල්පතිවරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | එම ගුරුවරුන්ගේ වැටුප් හා පාරිශ්‍රමික දීමනා වෙනුවෙන් මාසිකව වැය වන මුදල | | එම ගුරුවරුන්ගේ වැටුප් හා පාරිශ්‍රමික දීමනා වෙනුවෙන් වාර්ෂිකව වැය වන මුදල | | එම විදුහල්පතිවරුන්ගේ වැටුප් හා පාරිශ්‍රමික දීමනා වෙනුවෙන් මාසිකව වැය වන මුදල | | එම විදුහල්පතිවරුන්ගේ වැටුප් හා පාරිශ්‍රමික දීමනා වෙනුවෙන් වාර්ෂිකව වැය වන මුදල | |
| | | 1001 | 1003 | 1001 | 1003 | 1001 | 1003 | 1001 | 1003 |
| රත්නපුර | ජාතික පාසල් | 123,347,726.94 | 30,724,311.75 | 1,480,172,723.28 | 368,691,741.00 | 5,665,885.00 | 1,642,193.00 | 67,990,620.00 | 19,706,316.00 |
| | පළාත් සාසල් | 752,657,894.61 | 182,408,463.76 | 9,031,894,735.32 | 2,188,901,565.12 | 60,384,425.26 | 12,798,550.89 | 724,613,103.12 | 153,582,610.68 |
| කෑගල්ල | ජාතික පාසල් | 137,138,495.00 | 33,293,096.00 | 1,645,661,940.00 | 399,517,152.00 | 5,821,263.00 | 1,370,410.00 | 69,855,156.00 | 16,444,920.00 |
| | පළාත් පාසල් | 654,395,931.00 | 212,443,924.77 | 7,852,751,172.00 | 2,549,327,097.24 | 45,309,338.00 | 10,938,928.00 | 543,712,056.00 | 131,267,136.00 |
| ගාල්ල | ජාතික පාසල් | 248,272,656.83 | 67,890,304.34 | 2,979,271,881.96 | 814,683,652.08 | 11,580,901.00 | 2,714,485.00 | 138,970,812.00 | 32,573,820.00 |
| | පළාත් පාසල් | 635,745,485.07 | 147,687,980.47 | 7,628,945,820.84 | 1,772,255,765.64 | 32,831,265.90 | 8,280,504.45 | 393,975,190.80 | 99,366,053.40 |
| මාතර | ජාතික පාසල් | 203,944,481.61 | 49,002,815.73 | 2,447,333,779.32 | 588,033,788.76 | 9,482,455.66 | 2,146,887.00 | 113,789,467.92 | 25,762,644.00 |
| | පළාත් පාසල් | 547,604,921.79 | 147,601,661.09 | 6,571,259,061.48 | 1,771,219,933.08 | 39,315,709.18 | 6,897,570.00 | 471,788,510.16 | 82,770,840.00 |
| හම්බන්තොට | ජාතික පාසල් | 120,304,774.15 | 32,739,620.89 | 1,443,657,289.80 | 392,875,450.68 | 5,681,532.53 | 2,758,144.77 | 68,178,390.36 | 33,097,737.24 |
| | පළාත් පාසල් | 458,241,929.35 | 124,140,945.75 | 5,498,903,152.20 | 1,489,691,349.00 | 23,285,115.67 | 6,116,549.22 | 279,421,388.04 | 73,398,590.64 |
| බදුල්ල | ජාතික පාසල් | 120,132,954.00 | 42,179,284.14 | 1,441,595,448.00 | 506,151,409.68 | 7,264,257.00 | 1,499,720.00 | 87,171,084.00 | 17,996,640.00 |
| | පළාත් පාසල් | 789,617,234.00 | 193,392,395.02 | 9,475,406,805.84 | 2,320,708,740.24 | 185,138,400.00 | 12,843,064.01 | 2,221,660,800.00 | 154,116,768.12 |
| මොණරාගල | ජාතික පාසල් | 120,558,987.00 | 21,398,178.05 | 1,446,707,846.88 | 256,778,136.60 | 2,766,169.00 | 878,894.00 | 33,194,024.52 | 10,546,728.00 |
| | පළාත් පාසල් | 337,663,595.00 | 113,253,809.64 | 4,051,963,138.32 | 1,359,045,715.68 | 54,131,156.00 | 5,943,308.44 | 649,573,877.40 | 71,319,701.28 |
| අනුරාධපුර | ජාතික පාසල් | 59,339,300.00 | 15,094,400.00 | 712,071,600.00 | 181,132,800.00 | 2,334,800.00 | 462,800.00 | 28,017,600.00 | 5,553,600.00 |
| | පළාත් පාසල් | 796,307,700.00 | 236,255,300.00 | 9,555,692,400.00 | 2,835,063,600.00 | 54,666,700.00 | 12,277,600.00 | 656,000,400.00 | 147,331,200.00 |
| පොළොන්නරුව | ජාතික පාසල් | 55,070,800.00 | 14,008,600.00 | 660,849,600.00 | 168,103,200.00 | 3,724,500.00 | 694,200.00 | 44,694,000.00 | 8,330,400.00 |
| | පළාත් පාසල් | 279,601,900.00 | 92,971,200.00 | 3,355,222,800.00 | 1,115,654,400.00 | 16,810,300.00 | 3,540,400.00 | 201,723,600.00 | 42,484,800.00 |
| පුත්තලම | ජාතික පාසල් | 57,244,952.81 | 15,387,274.64 | 686,939,433.72 | 184,647,295.68 | 2,341,349.00 | 571,482.33 | 28,096,188.00 | 6,857,787.96 |
| | පළාත් පාසල් | 555,707,135.51 | 159,678,591.69 | 6,668,485,626.12 | 1,916,143,100.28 | 15,070,158.68 | 4,622,098.00 | 180,841,904.16 | 55,465,176.00 |
| කුරුණෑගල | ජාතික පාසල් | 236,188,542.32 | 60,238,406.55 | 2,834,262,507.84 | 722,860,878.60 | 11,367,056.73 | 2,865,662.00 | 136,404,680.76 | 34,387,944.00 |
| | පළාත් පාසල් | 1,345,313,532.11 | 316,841,480.61 | 16,143,762,385.32 | 3,802,097,767.32 | 103,229,845.10 | 18,587,182.75 | 1,238,758,141.22 | 223,046,193.00 |
| යාපනය | ජාතික පාසල් | 62,338,501.84 | 15,698,624.32 | 748,062,022.08 | 188,383,491.84 | 2,467,750.40 | 613,791.60 | 29,613,004.80 | 7,365,499.20 |
| | පළාත් පාසල් | 570,449,516.22 | 139,622,436.20 | 6,845,394,194.64 | 1,675,469,234.40 | 40,171,512.22 | 10,048,899.23 | 482,058,146.64 | 120,586,790.76 |
| කිලිනොච්චි | ජාතික පාසල් | 10,158,662.88 | 2,539,665.72 | 121,903,954.56 | 30,475,988.64 | 652,332.80 | 163,083.20 | 7,827,993.60 | 1,956,998.40 |
| | පළාත් පාසල් | 127,125,477.42 | 31,781,369.36 | 1,525,505,729.09 | 381,376,432.27 | 9,839,175.20 | 2,459,793.80 | 118,070,102.40 | 29,517,525.60 |
| මුලතිව් | ජාතික පාසල් | 11,393,370.83 | 2,848,342.71 | 136,720,449.98 | 34,180,112.50 | 491,140.80 | 122,785.20 | 5,893,689.60 | 1,473,422.40 |
| | පළාත් පාසල් | 122,260,258.11 | 30,565,064.53 | 1,467,123,097.34 | 366,780,774.34 | 8,287,880.00 | 2,071,970.00 | 99,454,560.00 | 24,863,640.00 |
| මන්නාරම | ජාතික පාසල් | 25,781,943.68 | 6,445,485.92 | 309,383,324.16 | 77,345,831.04 | 1,343,376.00 | 335,844.00 | 16,120,512.00 | 4,030,128.00 |
| | පළාත් පාසල් | 123,958,101.74 | 30,989,525.43 | 1,487,497,220.83 | 371,874,305.21 | 7,661,233.60 | 1,915,308.40 | 91,934,803.20 | 22,983,700.80 |
| වවුනියා | ජාතික පාසල් | 31,422,797.66 | 7,855,699.42 | 377,073,571.97 | 94,268,392.99 | 1,615,907.20 | 403,976.80 | 19,390,886.40 | 4,847,721.60 |
| | පළාත් පාසල් | 157,844,679.30 | 42,117,902.83 | 1,894,136,151.60 | 505,414,833.96 | 12,687,932.60 | 3,283,166.40 | 152,255,191.20 | 39,397,996.80 |
| ත්‍රිකුණාමලය | ජාතික පාසල් | 92,729,628.84 | 17,882,941.27 | 789,859,606.04 | 214,595,295.24 | 3,356,176.10 | 733,562.29 | 40,274,113.20 | 8,802,747.48 |
| | පළාත් පාසල් | 290,496,792.57 | 81,706,927.21 | 3,485,979,510.83 | 1,550,748,993.27 | 15,373,999.89 | 3,965,639.60 | 136,565,134.70 | 42,586,276.12 |
| අම්පාර | ජාතික පාසල් | 88,402,505.75 | 23,039,643.28 | 1,007,947,835.52 | 260,619,805.08 | 4,068,983.00 | 1,040,787.05 | 44,103,972.00 | 11,343,444.60 |
| | පළාත් පාසල් | 509,146,139.90 | 90,592,740.09 | 5,643,086,184.72 | 1,366,914,300.00 | 41,625,104.46 | 10,211,519.14 | 473,459,129.52 | 116,307,829.68 |
| මඩකලපුව | ජාතික පාසල් | 45,922,205.96 | 18,634,751.80 | 551,066,471.52 | 223,617,021.60 | 3,965,148.59 | 977,257.17 | 47,581,783.08 | 11,727,086.04 |
| | පළාත් පාසල් | 348,329,779.34 | 925,765,674.81 | 4,179,957,352.08 | 1,353,188,097.72 | 20,331,065.42 | 4,778,678.60 | 243,972,785.04 | 57,344,143.20 |
| මාතලේ | ජාතික පාසල් | 102,657,185.91 | 26,112,600.00 | 1,231,886,230.92 | 313,351,200.00 | 5,084,697.06 | 1,530,900.00 | 61,016,364.72 | 18,370,800.00 |
| | පළාත් පාසල් | 324,691,318.49 | 87,932,000.00 | 3,896,295,821.88 | 1,055,184,000.00 | 17,950,681.08 | 6,318,000.00 | 215,408,172.96 | 75,816,000.00 |
| නුවරඑළිය | ජාතික පාසල් | 36,317,337.68 | 10,217,200.00 | 435,808,052.16 | 122,606,400.00 | 1,936,221.73 | 631,800.00 | 23,234,660.76 | 7,581,600.00 |
| | පළාත් පාසල් | 564,294,370.30 | 156,996,000.00 | 6,771,532,443.60 | 1,883,952,000.00 | 48,994,067.00 | 13,437,900.00 | 587,928,804.00 | 161,254,800.00 |
| මහනුවර | ජාතික පාසල් | 292,926,429.16 | 73,887,800.00 | 3,515,117,149.92 | 886,653,600.00 | 10,100,188.82 | 3,086,100.00 | 121,202,265.84 | 37,033,200.00 |
| | පළාත් පාසල් | 1,011,695,692.62 | 229,958,200.00 | 12,140,348,311.44 | 2,759,498,400.00 | 99,400,513.65 | 22,258,800.00 | 1,192,806,163.80 | 267,105,600.00 |
| කොළඹ | ජාතික පාසල් | 581,358,234.62 | 121,266,518.99 | 6,976,298,815.44 | 1,455,198,227.90 | 29,308,319.27 | 5,396,600.00 | 351,699,831.24 | 64,759,200.00 |
| | පළාත් පාසල් | 749,809,279.82 | 168,500,333.22 | 8,997,711,357.84 | 2,022,003,998.60 | 65,335,214.12 | 16,368,200.00 | 784,022,569.44 | 196,418,400.00 |
| ගම්පහ | ජාතික පාසල් | 306,985,147.38 | 74,179,990.59 | 3,683,821,768.56 | 890,159,887.12 | 11,367,594.40 | 2,386,100.00 | 136,411,132.80 | 28,633,200.00 |
| | පළාත් පාසල් | 1,171,458,064.18 | 237,393,792.24 | 14,057,496,770.16 | 2,848,725,506.89 | 74,509,650.28 | 14,361,200.00 | 894,115,803.36 | 172,334,400.00 |
| කළුතර | ජාතික පාසල් | 598,307,885.56 | 53,757,918.14 | 7,179,694,626.72 | 645,095,017.67 | 12,869,725.20 | 2,029,300.00 | 154,436,702.40 | 24,351,600.00 |
| | පළාත් පාසල් | 791,134,407.71 | 156,200,668.42 | 9,493,612,892.52 | 1,874,408,020.98 | 56,942,932.70 | 13,647,600.00 | 683,315,192.40 | 163,771,200.00 |
| | | 17,783,796,644.58 | 5,173,121,861.38 | 212,563,132,066.37 | 53,155,673,707.93 | 1,305,941,106.30 | 265,029,196.34 | 15,592,604,465.56 | 3,167,972,557.00 |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(iv) රජයේ ගුරුවරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප මෙසේයි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, මම ඒ ගැන කියන්නම්.

**ශ්‍රී ලංකා ගුරු සේවය**

1 පන්තිය, 2 පන්තිය, (I ශ්‍රේණිය), 2 පන්තිය (II ශ්‍රේණිය) නිලධාරින් සඳහා

වැටුප් කේතය: (GE 2 -2025)

වැටුප් පරිමාණය: 66,880-10x1490-7x2400-20x2940-157,380

1 පන්තියේ ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 98,580

2 පන්තිය (I ශ්‍රේණිය) ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 81,780

2 පන්තිය (II ශ්‍රේණිය) ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 66,880

3 පන්තිය- I (අ) ශ්‍රේණිය, 3 පන්තිය- I (ආ) ශ්‍රේණිය, 3 පන්තිය - I (ඇ) ශ්‍රේණිය සහ 3 පන්තිය - II ශ්‍රේණිය නිලධාරින් සඳහා

වැටුප් කේතය: (GE 1-2025)

වැටුප් පරිමාණය :

53,060 - 6 x 800 - 7 x 940 - 2 x 1,080 - 66,600

3 පන්තිය - I (අ) ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 64,440

3 පන්තිය - I (ආ) ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 61,620

3 පන්තිය - I (ඇ) ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 57,860

3 පන්තිය - II ශ්‍රේණියේ ගුරුවරයෙකුගේ ආරම්භක මූලික වැටුප - රු. 53,060

(අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය උපලේඛන 1, ඇමුණුම I, උපලේඛන II - ඇමුණුම II හා පිටු අංක 49 - ඇමුණුම III ලෙස **සභාගත*** කරමි.)

(ආ) (i) ඔව්.

2024.12.31 දිනට සියලුම ජාතික හා පළාත් පාසල්හි ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| පළාත් පාසල්/ ජාතික පාසල් | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| ජාතික පාසල් | | 1,497 |
| පළාත් පාසල් | බස්නාහිර | 4,143 |
| | දකුණ | 2,566 |
| | මධ්‍යම | 7,300 |
| | වයඹ | 3,614 |
| | ඌව | 3,177 |
| | උතුරු මැද | 2,374 |
| | නැගෙනහිර | 6,051 |
| | සබරගමුව | 5,719 |
| | උතුර | 3,326 |
| එකතුව | | 39,767 |

සටහන: අධ්‍යාපන චක්‍රලේඛ 06/2021 අනුව අනුමත ගුරු පුස්තකාල සඳහා පවතින පුරප්පාඩු 2,464 ප්‍රමාණය ඉවත් කර ඇත. (ඉදිරියට එම තනතුර සඳහා ගුරු සේවයේ නිලධාරීන් බඳවා නොගැනීමට ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් මත.)

(ii) 2020-2022 කණ්ඩායමේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් 3,987ක් සඳහා ජාතික හා පළාත් පාසල්හි පවතින ගුරු පුරප්පාඩු සඳහා පහත පරිදි ගුරු පත්වීම් 2025.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇත.

| | පත්වීම් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | සිංහල මාධ්‍ය | දෙමළ මාධ්‍ය | ඉංග්‍රීසි මාධ්‍ය |
| ජාතික පාසල් | 968 | 345 | 381 |
| පළාත් පාසල් | 1,134 | 861 | 298 |
| | 2,102 | 1,206 | 679 |

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව 2023.01.27 දිනැති 2317 දරන ගැසට් ගැසට් පත්‍රය නිකුත් කරන ලද නමුත්, එම ගැසට් පත්‍රයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ නඩු හේතුවෙන්, 2023.03.25 දින පැවැත්වීමට නියමිත වූ විභාගය පැවැත්වීම අතුරු නියෝගයක් මත තාවකාලිකව නතර කර ඇති බැවින්, මේ දක්වා එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදු කිරීමට නොහැකි වී ඇත. අනෙකුත් උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමට ද ඉන් බාධාවක් වී ඇත.

මේ නිසා එම ගැසට් නිවේදනය මඟින් බඳවා ගැනීමට අපේක්ෂිත වූ 26,742ක ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් අවුරා තැබීමට සිදුවන අතර, පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති රාජ්‍ය සේවයට බඳවා ගැනීම් සමාලෝචන කමිටුවට ඉල්ලීම් ඉදිරිපත් කර, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එමෙන්ම, අංක අමප/24/0693/601/047 හා 2024.04.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව "සැමට ඉංග්‍රීසි" වැඩසටහන යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් කරන ගුරුවරු 2,500ක් බඳවා ගැනීමට ද නියමිතය.

තවද, දිවයිනේ වතු ආශ්‍රිත දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ගුරු සහායකයන් බඳවා ගැනීමට අදාළව අංක 2024.06.14 දිනැති 2389 දරන ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර, ඒ අනුව 2024.08.12 දින පැවැත්වීමට නියමිතව තිබූ බඳවා ගැනීමේ තරග විභාගයට අදාළව නඩු අංක CA (Writ) 519/2014 යටතේ අභියාචනාධිකරණයේ නඩු පැවරීම හේතුවෙන් අධිකරණය විසින් 2024.08.09 දින අදාළ තරග විභාගය පැවැත්වීමට අතුරු තහනම් නියෝගයක් පනවා ඇත. එම නඩුව අවසන් වූ පසු එම බඳවා ගැනීම් සම්බන්ධයෙන්ද ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(iii) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල් සංඛ්‍යාව 3,144කි.

(iv) එම පාසල්වල නම් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) (i) පසුගිය වර්ෂ පහ තුළ රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් කළ ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි වේ.

| වර්ෂය | පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබූ (රජයේ පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්) |
|---|---|
| 2023 | 298,959 |
| 2022 | 303,868 |
| 2021 (රජයේ පාසල් සහ පෞද්ගලික පාසල්වල පමණක්) | 315,363 |
| 2020 (රජයේ පාසල් සහ පෞද්ගලික පාසල්වල පමණක්) | 330,571 |
| 2019 (රජයේ පාසල් සහ පෞද්ගලික පාසල්වල පමණක්) | 343,912 |

(ii) මීළඟ වර්ෂ පහ තුළ රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් වෙතැයි පුරෝකථනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි වේ.

| Grade 1 Year | Birth Year | Jan -Dec (X-6) No of Birth in Respective Age | Deaths under 6 | Sch Age Target Childern Population | Grade 1 Enrolment (Govt Schs) | Remark |
|---|---|---|---|---|---|---|
| 2031 | 2025 | | | | | No Birth Statistics because 2025 |
| 2030 | 2024 | 220,761 | | 220,761 | **196,209** | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2029 | 2023 | 247,900 | 2,231 | 245,669 | **218,347** | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2028 | 2022 | 277,645 | 2,499 | 275,146 | **244,545** | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2027 | 2021 | 292,175 | 2,630 | 289,545 | **257,343** | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2026 | 2020 | 301,706 | 2,715 | 298,991 | **265,738** | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2025 | 2019 | 319,108 | 2,872 | 316,236 | 281,066 | Predictions base 89% Childern enroled in Govt. Schools and Percentage remain |
| 2024 | 2018 | 328,409 | 2,956 | 325,453 | 281,659 | Provisional Statistics |

(ඈ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ලැබිලා තිබෙන සවිස්තරාත්මක පිළිතුර මම අගය කරනවා. ඒ අනුව අහන පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙනවා ගුරුවරුන්ගේ වැටුප් සම්බන්ධව. මේ අවස්ථාව වන විට I ශ්‍රේණියේ ඉන්නේ ගුරුවරුන්ගෙන් සියයට 10ක් වාගේ ප්‍රමාණයක්. 153,000යි ඒගොල්ලන්ට ලැබෙන්නේ.

සමස්තයක් වශයෙන් ගත්තාම, රුපියල් 53,000 සිට 80,000 වෙනකල් තමයි ගුරුවරුන්ට ලැබෙන්නේ. මෙතැන විෂමතාවක් තිබෙනවා. මහ බැංකුවේ කාර්ය සහායක පුද්ගලයෙකුට රුපියල් 150,000ක් හම්බ වෙනකොට හෙට දින රජ කරන තරුණ තරුණියන්ගේ අනාගතය සුරක්ෂිත කරන ගුරුවරුන්ට හම්බ වෙන්නේ රුපියල් 53,000ත් 80,000ත් අතර වැටුපක්. මේ විෂමතාව නිවැරදි කරන්න මේ ආණ්ඩුව කටයුතු කරනවාද? ඒක තමයි මට මූලිකවම අහන්න තිබෙන්නේ.

ඒ වාගේම, මම අද ඉදිරිපත් කරපු ප්‍රශ්නයේ අනු කොටසක් වූ 1වන ශ්‍රේණියේ සිටින ළමයි පිරිස සම්බන්ධයෙන් අහපු ප්‍රශ්නය. මීට අවුරුදු 5කට ඉස්සෙල්ලා 360,000ක පමණ ළමයි පිරිසක් 1වන ශ්‍රේණියට ඇතුළත් කර ගත්තා. හැබැයි, අද ඒ සංඛ්‍යාව 298,000ට අඩු වෙලා තිබෙනවා. භයානක අඩු වීමක් තිබෙන්නේ. මේ තත්ත්වය අපි පුළුවන් තරම් නිවැරදි කරන්නේ කොහොමද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා එම අතුරු ප්‍රශ්නය ඇසීම ගැන. එහි දෙවැනි කොටසට මම මුලින්ම පිළිතුරු දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 5ක විතර පුරෝකථන ගන්නකොට අපි සලකා බැලූ කාරණයක් තමයි birth rate එක. ඒ අනුව, ඉපදීමේ ප්‍රමාණයේ සංඛ්‍යාත්මකව අඩු වීමක් තිබෙනවා. ඒක එක කාරණයක්.

අනෙක් කාරණය තමයි, අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ - අන්තර්කරණ අධ්‍යාපනය - inclusive education - අනුව පාසලට තිබෙන දුර, දුප්පත්කම හෝ ස්ත්‍රී පුරුෂභාවය කිසිම දරුවෙකුට පාසලට ඒමට බාධාවක් විය යුතු නැහැ. ඒ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරමින් සිටිනවා. සියලු දරුවන් වසර 13ක පාසල් අධ්‍යාපනය නිමා කළ යුතුයි කියන තීරණයේ තමයි අපි ඉන්නේ. සියලු ළමයින් අන්තර්කරණ අධ්‍යාපනයට එකතු කර ගැනීමේ ක්‍රියාවලිය ගැන අපි සාකච්ඡා කරමින් සිටිනවා. ඒකට අදාළ ක්‍රියාත්මක වීම් කරනවා. අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළත ඒ කොටස තිබෙනවා.

ගුරුවරුන්ගේ වැටුප් ප්‍රමාණය ගැන කථා කළොත්, ඔබතුමා නිරීක්ෂණය කරන්න, 2016 සිට කොච්චර ප්‍රමාණයක වැටුප් වැඩි වීමක් තිබෙනවාද කියලා. ඔබතුමා මේ මොහොතේ සඳහන් කරපු වැටුප් වැඩි කිරීම අපි ගියවර අය වැයෙන් තමයි කළේ.

නමුත් මීට සමාන්තරව 2022 වර්ෂයේ සහ ඊට කලින් සාපේක්ෂ වැටුප් වැඩිවීම ගත්තොත්,- *[බාධා කිරීමක්]* මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමනි. අපි සමාන්තර ශ්‍රේණිවලට අනුව තමයි වැටුප් වැඩි කිරීම කරන්නේ. එතකොට ඊට අදාළ ශ්‍රේණිවලට අනුව අපිට වැටුප් වැඩිකිරීම කරන්න සිද්ධ වෙනවා. අපි කියන්නේ ගුරු සේවය වැඩිපුර වැටුප් ලැබෙන සේවාවන් 10 ඇතුළට අපි ගන්නවා කියන එකයි. අපි මේ අය වැයෙන් ඒක කරලා තිබෙනවා. ඒ නිසා

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ගුරු සේවයට අසාධාරණයක් වෙලා තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ. සිටින ගුරුවරු සංඛ්‍යාවට මේ ගුරු වැටුප් පරිමාණයේ බලපෑමක් නැහැ. අනෙක් සේවාවලට වඩා ගුරු සේවයට ඇතුළුවීමට කොච්චර තරගයක් තිබෙනවාද කියලා අපි දන්නවා. ඒ නිසා මේ මොහොතේ වැටුප් පරිමාණය සම්බන්ධයෙන් ගුරු සේවයට අසාධාරණයක් සිදු වෙලා නැහැ කියලා අපි හිතනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොළොන්නරුව, අනුරාධපුර වාගේ දිස්ත්‍රික්කවල විදුහල් 3,400ක ශිෂ්‍ය පිරිස 100ට වඩා අඩු වෙලා තිබෙනවා. මේ නිසා ප්‍රායෝගිකව යම් විධියකින් පාසල් වසා දැමීමක් සිදු වෙනවා කියලා ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. අලුත් අධ්‍යාපන ධවල පත්‍රිකාවත් සමඟ ඔබතුමන්ලා ගන්න තීරණය තුළ අපට මේ ගැන කියන්න පුළුවන්ද? දැන් පාසල් 10,318ක් රටේ තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය ඇතුළු අනෙක් පක්ෂ ඔක්කෝම ගෙනාපු ධවල පත්‍රිකාව තමයි ඔබතුමන්ලා ඉදිරියට ගෙනියන්නේ.

සියලුම පක්ෂ එක්ක සාකච්ඡා කරලා මේක නිවැරදි කිරීම වෙනුවෙන් අපට විසඳුමක් ගෙනෙන්න පුළුවන් ද? රටට ඔරොත්තු දෙන, අනාගතයට ගැළපෙන,- අද තිබෙන අලුත් අධ්‍යාපන ක්‍රම, artificial intelligence, e-commerce, කියන සියල්ලම එක්ක - සවිස්තර ධවල පත්‍රිකාවක් ගෙනෙන්න පුළුවන් ද කියලා මම මේ අවස්ථාවේදී අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම සිසු සිසුවියන් 100ට වඩා අඩුවෙන් සිටින පාසල් කීයක් වැහෙනවා ද කියන එකටත් උත්තරයක් දෙන්න.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, මේක ඇත්තටම අපේ අධ්‍යාපන ප්‍රතිපත්තීන්ට අනුකූලව අපි හදපු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මාලාවක්. ඇත්තටම මේ ධවල පත්‍රිකාව අපි කෙළින්ම ගෙන යාමක් නොවෙයි මේ කරන්නේ කියන එකත් මා සඳහන් කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමා මතු කරපු නිශ්චිත කාරණාවට අදාළව මම උත්තර දෙන්නම්. මේ පාසල් සංඛ්‍යාව සම්බන්ධයෙන් අපි දත්ත, තොරතුරු ගනිමින් ඉන්නවා. ඇත්තටම පාසල් වසා දැමීමක් ගැන අපි කථා කරන්නේ නැහැ. දැනට සිසු සිසුවියන් 50ට වඩා අඩුවෙන් සිටින පාසල් ප්‍රමාණයක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අපි දැන් තීරණයක් ගෙන තිබෙනවා. එයට සම්බන්ධ කර ගන්නේ කවුද කියන එකත් අපි තීරණය කර තිබෙනවා. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශයට විතරක් මේකට මැදිහත් විය නොහැකියි. මහජන නියෝජිතයන්, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, ඒ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරු සහ ග්‍රාම නිලධාරින් ඇතුළු සියලුදෙනා එකතුව තමයි මේ පාසල් සම්බන්ධයෙන් තීරණයක් ගන්නේ. එතකොට සමහර වෙලාවට ළමයින් අඩුවෙන් සිටින පාසල් පවත්වාගෙන යන්න සිදු වෙන්න පුළුවන්. මේ තුළින් ඇත්තටම අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමක් තමයි සිද්ධ වෙන්නේ. මේ තුළින් පාසල් වසා දැමීමක් සිද්ධ වෙන්නේ නැහැ කියන එක මා අවධාරණය කරනවා, ගරු කථානායකතුමනි.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ: වැටුප් සහ දීමනා
## பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் தலைவர் மற்றும் முகாமைத்துவப் பணிப்பாளர்: சம்பளம் மற்றும் கொடுப்பனவுகள்
## CHAIRMAN AND MANAGING DIRECTOR OF CEYLON PETROLEUM CORPORATION: SALARIES AND ALLOWANCES

334/2024

**2. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023 වර්ෂය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති තනතුරට සහ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට හිමි වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එම තනතුරුවලට හිමි වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැටුපට අමතරව එම තනතුරු සඳහා හිමි වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2023 වර්ෂය වන විට සහ මේ වන විට එම වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත තනතුරු සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන දෙකෙන්ම වෙන් වෙන් වශයෙන් වැටුප් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම ආයතනවලින් ලබා දෙන වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීම වෙනුවෙන් සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ සෙසු අධ්‍යක්ෂවරුන්ට ගෙවන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සෙසු අධ්‍යක්ෂවරුන්ට ලබා දෙන වැටුප් සහ මාසික දීමනා එක් එක් අධ්‍යක්ෂවරයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2023ஆம் ஆண்டாகும்போது இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் தலைவர் பதவிக்கும் முகாமைத்துவப் பணிப்பாளர் பதவிக்கும் உரிய சம்பளத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) தற்போது அந்தப் பதவிகளுக்குரிய சம்பளத் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) சம்பளத்துக்கு மேலதிகமாக, அந்தப் பதவிகளுக்குரிய பிற கொடுப்பனவுகள் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) 2023ஆம் ஆண்டாகும்போதும் தற்போதும் மேற்படி பிற கொடுப்பனவுகள் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பதவிகளுக்காக, இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் மற்றும் இலங்கை பெற்றோலியக் களஞ்சிய முனைய நிறுவனம் ஆகிய இரண்டு நிறுவனங்களிலிருந்தும் வெவ்வேறாகச் சம்பளம் வழங்கப்படுகின்றதா என்பதையும்;

(ii) அவ்வாறெனில், அந்த நிறுவனங்களால் வழங்கப்படும் சம்பளம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) பணிப்பாளர் சபைக் கூட்டங்களில் கலந்துகொள்வதற்காக தலைவர், முகாமைத்துவப் பணிப்பாளர் மற்றும் பிற பணிப்பாளர்களுக்கு வழங்கப்படும் தொகை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) பிற பணிப்பாளர்களுக்கு வழங்கப்படும் சம்பளம் மற்றும் மாதாந்தக் கொடுப்பனவானது ஒவ்வொரு பணிப்பாளருக்கும் ஏற்ப வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the salary entitlement for the positions of the Chairman and the Managing Director of the Ceylon Petroleum Corporation, as at 2023, separately;

(ii) the salary entitlement for those positions, as at today, separately;

(iii) the other allowances, apart from the salary, that are entitled to the positions concerned, separately; and

(iv) such other allowances, as at 2023 and as at today, separately?

(b) Will he also inform this House -

(i) whether salaries for the above positions are provided separately by the Ceylon Petroleum Corporation and the Ceylon Petroleum Storage Terminals Limited;

(ii) if so, the salary that is provided by each institution, separately;

(iii) the amounts paid to the Chairman, the Managing Director and other Directors for participating in Director Board Meetings, separately; and

(iv) the salaries and monthly allowances paid to each of the other Directors, separately?

(c) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) සභාපති - රු.100,000.00
කළමනාකාර අධ්‍යක්ෂ - රු.402,122.50

(ii) සභාපති - රු.100,000.00
කළමනාකාර අධ්‍යක්ෂ - රු.502,653.10

(2024.09.18 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි සියයට 25කින් වැටුප් වැඩි වීම)

(iii) සභාපති - දුරකථන දීමනාව කළමනාකාර අධ්‍යක්ෂ - දුරකථන දීමනාව, වෘත්තිය දීමනාව සහ ජීවන වියදම් දීමනාව

(iv) 2023 මේ වන විට

| | | |
|---|---|---|
| සභාපති දුරකථන | රු.6,000.00 | රු.6,000.00 |
| කළමනාකාර අධ්‍යක්ෂ | | |
| දුරකථන | රු.4,250.00 | රු.4,250.00 |
| වෘත්තිය දීමනාව | රු.40,212.25 | රු.50,265.31 |
| ජීවන වියදම් දීමනාව | රු.5,250.00 | රු.5,250.00 |

(2024.09.18 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි සියයට 25කින් වැටුප් වැඩි වීම මත වෘත්තිය දීමනාවද වැඩි වී ඇත)

(ආ) (i) සභාපති - ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙන් පමණක් වැටුප් ලබා ගනියි.

කළමනාකාර අධ්‍යක්ෂ -ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙන් සම්පූර්ණ වැටුපද, ලංකා ඛනිජ තෙල් සංස්ථා වැටුපෙන් 50%ක්ද ලබා ගනියි.

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

| | | |
|---|---|---|
| සභාපති | ලබා නොගනී. | රු.625,000.00 |
| කළමනාකාර අධ්‍යක්ෂ | රු.502,653.10 | රු.251,326.57 |

**මුදල රුපියල්**

(iii) සභාපති නොගෙවයි
කළමනාකාර අධ්‍යක්ෂ නොගෙවයි

**සෙසු අධ්‍යක්ෂවරුන්**

**ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම**

| | පැමිණීමේ දීමනාව රුපියල් | ප්‍රවාහන දීමනා රුපියල් |
|---|---|---|
| 1. එච්.ටී.පී. චන්දන මහතා | 20,000 | 7,500 |
| 2. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | 20,000 | 7,500 |
| 3. දීපක් දාස් මහතා, (LIOC) | 20,000 | 7,500 |
| 4. අවිනාශ් සිංහාල් මහතා,(LIOC) | 20,000 | 7,500 |
| 5. සුනිල් කාන්ත මහාරාණ මහතා, (LIOC) | 20,000 | 7,500 |
| 6. එම්.එම්.සී. ෆේරුස් මහතා | ලබා නොගනී | ලබා නොගනී |
| 7. ඩබ්ලිව්.එස්. හේමන්ත කුමාර මහතා (විධායක අධ්‍යක්ෂ) | ලබා නොගනී | ලබා නොගනී |

[ගරු කුමාර ජයකොඩි මහතා ]

**සෙසු අධ්‍යක්ෂවරුන්**

**ලංකා ඛනිජ තෙල් නීතිගත සමාගම**

| | පැමිණීමේ දීමනාව රුපියල් | ප්‍රවාහන දීමනා රුපියල් |
|---|---|---|
| 1. ආර්.එම්.එස්.පී.එස්. බණ්ඩාර මහතා | 25,000 | 3,000 |
| 2. එම්.කේ. ගරුසිංහ මහතා | 25,000 | ලබා නොගනී |
| 3. එච්.ටී.පී. චන්දන මහතා | 25,000 | 3,000 |
| 4. එම්.එම්.සී. ඩෝස් මහතා | ලබා නොගනී | ලබා නොගනී |

(iv) සෙසු අධ්‍යක්ෂවරුන් (ආ) (iii)හි සඳහන් ගෙවීම්වලට අමතරව වැටුප් හා මාසික දීමනා කිසිවක් නොගනී.

(ඇ) අදාළ නොවේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නයක් අහන්න බලාපොරොත්තු වනවා. හෙට දවසේ ඉදිරිපත් කිරීමට නියමිත ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මම ගරු ඇමතිතුමාගෙන් විමසීමක් කරනවා.

ගරු ඇමතිතුමනි, බලශක්ති අමාත්‍යාංශයේ පූර්ණ එකඟතාවත් සහිතව 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත පිළිබඳව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මගින් සිදු කරන ලද සංශෝධන මාලාවක් 2005.07.22වැනි දින එම කමිටුවේ සභාපතිවරයා විසින් සභාගත කළා. ඊට පස්සේ ඒක කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, ඊයේ අනුමත වෙලා තිබෙනවා. සිකුරාදා දවසේ මම දුරකථනයෙන් කථා කරලා කිව්වාට පස්සේ ලේකම්වරයා විසින් සංශෝධන කිහිපයක් එවා තිබුණා. නමුත් පූර්ණ ලියවිල්ලක් එවා තිබුණේ නැහැ. සංශෝධන කිහිපය, කාරක සභාවේ එකඟතාව සහ පාර්ලිමේන්තුවට සභාගත කරපු ලියවිල්ලත් එක්ක ගැළපෙනවා නම් නැවත එකක් අවශ්‍ය නැහැ කිව්වා. නමුත් ස්ථාවර නියෝග 50 (2) අනුව, කැබිනට් මණ්ඩලයෙන් අනුමත වුණු සම්පූර්ණ ලියවිල්ල හෙට දවසේ මේ දේ වෙන්න කලින් කාරක සභාවට අවශ්‍යයි. ඒක අද උදේ වරුවේ ලේකම්වරයා මගින් අපට ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔව්, මම ඒක ලබා දෙන්නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, ඔබතුමා එය ලේකම්තුමා මගින් අද දහවල් 12ට පෙර ලැබෙන්න සලස්වන්න. එතකොට අපි එය කාරක සභාවේදී සලකා බලා එම කටයුත්ත අවසන් කරන්නම්.

## ජනාධිපති අරමුදල: උසස් අධ්‍යාපනය සඳහා පුද්ගලයන්ට ලබා දුන් මුදල්

சனாதிபதி நிதியம்: உயர் கல்விக்காக தனிநபர்களுக்கு வழங்கப்பட்ட நிதி

PRESIDENT'S FUND: MONEY PROVIDED TO INDIVIDUALS FOR HIGHER EDUCATION

569/2025

**3. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණ සේවය කළ යුතුය යන දැඩි කොන්දේසිය යටතේ විදේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය හෝ වෙනත් වැඩිදුර අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ජනාධිපති අරමුදල මගින් මුදල් ලබා දී ඇති බව දන්නේද;

(ii) ඒ යටතේ හිටපු ජනාධිපතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඥාතීන්ට සහ හිතවතුන්ට 2005 වර්ෂයට පසුව ජනාධිපති අරමුදල මගින් මුදල් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එසේ මුදල් ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ දේශපාලඥයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත පුද්ගලයන් අතරින් ආචාර්ය උපාධිය අවසන් කර ශ්‍රී ලංකාවට නැවත පැමිණ ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vii) ඔවුන් වෙනුවෙන් රජය විසින් වැය කරන ලද මුදල් අය කර ගෙන තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு மீண்டும் வந்து பணிபுரிய வேண்டும் என்ற கடுமையான நிபந்தனையின்கீழ், வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் கலாநிதிப் பட்டம் அல்லது பிற உயர் கல்வியை நிறைவுசெய்வதற்காக சனாதிபதி நிதியத்திலிருந்து நிதி வழங்கப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அதன்கீழ், 2005ஆம் ஆண்டின் பின்னர் முன்னாள் சனாதிபதிகள், அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களின் பிள்ளைகள், உறவினர்கள் மற்றும் நண்பர்களுக்கு சனாதிபதி நிதியத்திலிருந்து நிதி வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அந்நிதி வழங்கப்பட்டுள்ள நபர்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் சம்பந்தப்பட்ட அரசியல்வாதிகளின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) அத்தகையோரில் கலாநிதிப் பட்டம் பெற்று மீண்டும் நாடு திரும்பிய மற்றும் நாடு திரும்பாதோரின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(v) இலங்கைக்கு மீண்டும் திரும்பாத நபர்கள் குறித்து எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(vi) அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(vii) அவர்களுக்காக அரசாங்கத்தால் செலவிடப்பட்ட நிதி அறவிடப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that money has been provided to various individuals by the President's Fund for completing a PhD or other higher education programmes at foreign universities under the strict condition that they must return to Sri Lanka and serve this country;

(ii) whether money has been provided accordingly by the President's Fund to the children, relatives and friends of the former Presidents, Ministers and Members of Parliament after 2005;

(iii) if so, the number of individuals to whom money has been provided in this manner, their names and the names of the respective politicians to whom they are related, separately;

(iv) out of the above-named individuals, the number of those who have returned to Sri Lanka after completing their PhDs and the number of those who have not returned to Sri Lanka, separately;

(v) the action that has been taken regarding the individuals who have not returned to Sri Lanka;

(vi) whether legal action has been taken against them; and

(vii) whether the money spent by the Government on their behalf has been recovered from them?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ජනාධිපති අරමුදලෙන් මුදල් ලබා දී ඇත.

පවතින තොරතුරු අනුව, පනවා තිබූ කොන්දේසි පිළිබඳව තොරතුරු නැත.

(ii) ඔව්, ලබා දී තිබෙනවා.

2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ජනාධිපති අරමුදලින් විදේශ ශිෂ්‍යත්ව සඳහා ලබා දුන් මුදල් සහ ඊට අදාළ පුද්ගලයන් පිළිබඳ සියලු තොරතුරු ඇමුණුමෙහි දක්වා ඇත. දීර්ඝ පිළිතුරක් සහිත ඇමුණුම **සභාගත*** කරමි.

(iii) එසේ මුදල් ලබා දී ඇති බවට හෙළිදරව් වූ පුද්ගලයින් කිහිප දෙනෙකු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | දේශපාලනඥයාගේ නම | දරුවාගේ/ඥාතියාගේ/ හිතවතාගේ නම | ශිෂ්‍යත්වයේ වටිනාකම රුපියල් |
|---|---|---|---|
| 2005 | සරත්චන්ද්‍ර රාජකරුණා මහතා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - ගම්පහ දිස්ත්‍රික්කය | හර්ෂණ සුපුන් රාජකරුණා මහතා | 500,000.00 |
| 2006 | කරුණාසේන කොඩිතුවක්කු මහතා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - කොළඹ දිස්ත්‍රික්කය | අයි.එන්. කොඩිතුවක්කු මහත්මිය | 1,200,000.00 |
| 2006 | පී. රාධක්‍රිෂ්ණන් මහතා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී - ජාතික ලැයිස්තුව | කේ. රාධක්‍රිෂ්ණන් මහත්මිය | 803,006.00 සහ 396,994.00 |
| 2006 | දේශපාලන සබඳතා | දිනේෂ් ඩී. දොඩම්ගොඩ මහතා | 1,000,000.00 |
| 2006 | දේශපාලන සබඳතා | කේ.කේ. පරණවිතාන මහතා | 1,500,000.00 |

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර කරුණාතිලක මහතා]

ඒ අනුව, එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් ලබා දී ඇති මුදල් පහත පරිදි වේ.

| වර්ෂය | පුද්ගලයන් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල (රුපියල්) |
|---|---|---|
| 2005 | 89 | 73,435,406.61 |
| 2006 | 102 | 65,019,897.00 |
| 2007 | 42 | 33,347,783.00 |
| 2008 | 18 | 11,055,250.00 |
| 2009 | 04 | 3,952,906.00 |
| 2010 | 03 | 3,400,000.00 |
| 2011 | 02 | 1,600,000.00 |
| 2012 | 02 | 3,236,238.00 |
| 2014 | 01 | 700,000.00 |

මේ අනුව ජනාධිපති අරමුදලේ මුදල් පොත් පරීක්ෂා කිරීමේදී ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඥාතීන්ට හා හිතවතුන්ට ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබා දී ඇති බව නිරීක්ෂණය වෙනවා. අනෙක් අයගේ තොරතුරු ඇතුළත් දීර්ඝ ලේඛනයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. එම ලේඛනය මම ඇමුණුම වශයෙන් සභාගත කළා.

(iv) දැනට පවතින තොරතුරුවලට අනුව, නැවත පැමිණ ඇති සහ පැමිණ නැති පුද්ගලයන් පිළිබඳව තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය සතුව නැහැ.

(v) මම කලින් පිළිතුරේදී සඳහන් කළා, ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු නැහැ කියලා. ඒ අනුව, විදේශ ශිෂ්‍යත්ව සඳහා ගිහිල්ලා නැවත ලංකාවට පැමිණ නැති අය සම්බන්ධයෙන් මේ වනකොට කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

(vi) පවතින තොරතුරු අනුව එවැනි නීතිමය ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ.

(vii) දැනට අපිට ලැබී තිබෙන තොරතුරු අනුව ශ්‍රී ලංකාවට නැවත නොපැමිණි පුද්ගලයින් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොමැති බැවින් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරන ලද මුදල් අයකර ගැනීම පිළිබඳ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට තොරතුරු අනාවරණය වෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්න දෙකක් ගරු ඇමතිතුමාට යොමු කරනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ පිළිතුර ඉතාම පැහැදිලියි. ජනාධිපති අරමුදල අවභාවිත කිරීම ගැන අපි මීට පෙරත් මේ පාර්ලිමේන්තුවේදී කථා වුණා. නමුත්, අද ඒකේ වෙනස් මානයක් තමයි දක්නට ලැබෙන්නේ. වැඩිදුර අධ්‍යාපනය ලැබීම කියන කාරණයේදීත් දේශපාලනඥයන්ගේ හිතවත්තු, පුත්තු, ඥාතීන් තමයි ඒ වරප්‍රසාද ලබාගෙන තිබෙන්නේ. ඒ කොන්දේසි උල්ලංඝනය කර තිබෙන බව අපට පැහැදිලිව ආරංචි වෙනවා. ඔවුන්ගෙන් ඒ මුදල් අය කරගෙන නැහැ. ඒ වාගේම අපි දැක්කා, පාර්ලිමේන්තුවේ කෑම එක අපි ඔතාගෙන යනවා කියලා සමහර අය බොරු කතන්දර කියනවා. ඒ වාගේම ජනාධිපති අරමුදලේ මුදල් අවභාවිත කළාය කිව්වා. අදත් මේ පාර්ලිමේන්තුවේදී මෙතැන ඉන්න අයගේ නම් කියැවුණා. කලිනුත් ඒ වාගේ නම් කියැවුණා. එම නිසා ඒ මුදල් අයකර ගැනීම වෙනුවෙන් රජය ලෙස යම් ක්‍රියාමාර්ගයක් කඩිනමින් ගන්නේ ද කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය වෙන්නේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ ඇත්තටම ජනාධිපති අරමුදල තිබෙන්නේ දුප්පත් මිනිස්සුන්ගේ සෞඛ්‍ය සහ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය විටකදී උපකාර කරන්නයි. නමුත්, ඔබතුමා සඳහන් කළා වාගේ මේ ජනාධිපති අරමුදල අවභාවිත වෙච්ච අවස්ථා පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදීත්, ඒ වාගේම එළියේදීත්, සමාජය තුළත් දීර්ඝ වශයෙන් සාකච්ඡාවක් තිබෙනවා. ඒ පිළිබඳව තොරතුරු හෙළිදරව් වෙලාත් තිබෙනවා. ඔබතුමා සඳහන් කළා වාගේ මේ අය නැවත පැමිණිලා තිබෙනවාද, එහෙම පැමිණ නැත්නම් ඒ අය සම්බන්ධයෙන් ගත යුතු පියවර මොනවාද කියන එක සම්බන්ධයෙන් 2014 සිට 2025 දක්වා කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. නමුත්, ඒ අය නැවත පැමිණිලා තිබෙනවාද, ඒ අය නැවත පැමිණිලා තිබෙනවා නම් ඔවුන් තමන්ගේ කටයුතු සම්පූර්ණ කරලා තිබෙනවාද, නැවත පැමිණිලා නැත්නම් ඒ අය ඇවිල්ලා නැත්තේ ඇයි, මේ ශිෂ්‍යත්ව අරමුදල් ලබා දෙනකොට ඒගොල්ලන් කිසියම් විධියක ගිවිසුම්ගතවීමක් තිබෙනවාද කියන කාරණා පිළිබඳව නිශ්චිත තොරතුරු සොයා බලා ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න කැමැතියි. ඒ වාගේම අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඇත්තටම අධ්‍යාපනයට සම්බන්ධයි, මුල් ප්‍රශ්නයෙන් උපාධි සහ උසස් අධ්‍යාපනය ගැන කියැවෙන නිසා. මේ වනකොට අපේ රටේ තිබෙන ඉංජිනේරු පීඨ අතර ප්‍රධාන ඉංජිනේරු පීඨයක් තමයි, රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය. ඒක අපි කවුරුත් දන්නවා. රුහුණ විශ්වවිද්‍යාලයේ විදුලි හා තොරතුරු තාක්ෂණ ඉංජිනේරු පීඨයේ මේ වනකොට බරපතළ අර්බුදයක් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පරිගණක ඉංජිනේරු විද්‍යාව - Computer Engineering - පිළිබඳව මම දන්න විධියට දැනට 1,000ක පමණ සිසු පිරිසක් ඉගෙනුම ලබමින් සිටිනවා. එතැන batches හයක් ඉන්නවා. එහි තිබෙන ගැටලුව තමයි, academic staff එකේ හිඟය. ඒ කියන්නේ, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟය නිසා පරිගණක ඉංජිනේරු විද්‍යාව සඳහා පස්වන සහ අටවන

semesters - ඒ අධ්‍යයන වාර - ආරම්භ කිරීමට නොහැකි වන තැනට එම ප්‍රශ්නය ඔඩුදුවා තිබෙනවා. රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය කියන්නේ, ඉංජිනේරු පීඨ අතර ඉතාම කීර්තිමත් ඉංජිනේරු පීඨයක්.

ඊළඟට මට දැනගන්න අවශ්‍යයි, ගොඩනැඟිලි සම්බන්ධව. රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ඉදි කළාට එහි ගොඩනැඟිලිවලත් තවම අඩුපාඩු තිබෙනවා. විශේෂයෙන්ම Computer Engineering අංශයේ. ඒ සම්බන්ධව ඔබතුමන්ලා දැනුවත්ද, ඒ වෙනුවෙන් ගන්නා ඉක්මන් ක්‍රියාමාර්ගය මොකක්ද කියාත් මම අපේ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සම්බන්ධයෙන් වූ කාරණා පිළිබඳව අපට පැමිණිලි ලැබී තිබෙනවා. එහි ඉඩකඩ මදිකම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟත් අපි සාකච්ඡා කරලා තිබෙනවා. එහි semesters දෙකක් මේ මොහොතේදී ක්‍රියාත්මකයි. ගොඩනැඟිලි ඇතුළුව ඒ කාරණා තුනම අපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවධානයට යොමු කරලා තිබෙනවා.

ඊට අමතරව ඉංජිනේරු පීඨයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතර සාකච්ඡාවකට අපි දින නියම කරගෙන තිබෙනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -806/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## බස්නාහිර පළාත් සභාව සතු වාහන: විස්තර
## மேல் மாகாண சபைக்குச் சொந்தமான வாகனங்கள்: விபரம்
## VEHICLES IN POSSESSION OF WESTERN PROVINCIAL COUNCIL: DETAILS

856/2025

**5. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බස්නාහිර පළාත් සභාව සතු වාහන සංඛ්‍යාව කොපමණද;
(ii) එම වාහන භාවිත කරනු ලබන නිලධාරින් කවරේද;
(iii) මහජන නියෝජිතයන් විසින් එම වාහන පරිහරණය කරන්නේද;
(iv) එසේ නම්, එම එක් එක් මහජන නියෝජිතයාගේ නම සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරවරුන්ගේ නම් එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;
(ii) එම එක් එක් පළාතේ සංවර්ධන කටයුතු සඳහා 2025 වර්ෂයේදී වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) එම එක් එක් පළාත් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) ඒ අතරින් මේ වනවිට මුදල් වෙන් කර ඇති ව්‍යාපෘති කවරේද;
(v) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி, அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மேல் மாகாண சபைக்குச் சொந்தமான வாகனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;
(ii) மேற்படி வாகனங்களைப் பயன்படுத்துகின்ற அலுவலர்கள் யாவர் என்பதையும்;
(iii) மேற்படி வாகனங்களை மக்கள் பிரதிநிதிகள் பயன்படுத்துகின்றார்களா என்பதையும்;
(iv) ஆமெனில், மேற்படி ஒவ்வொரு மக்கள் பிரதிநிதியின் பெயர் மற்றும் பதவி வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையின் மாகாண ஆளுநர்களின் பெயர்கள் ஒவ்வொரு மாகாண வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;
(ii) மேற்படி ஒவ்வொரு மாகாணத்தினதும் அபிவிருத்தி நடவடிக்கைகளுக்கென 2025ஆம் ஆண்டில் ஒதுக்கப்பட்டுள்ள நிதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;
(iii) மேற்படி ஒவ்வொரு மாகாணத்திலும் நடைமுறைப்படுத்த உத்தேசிக்கப்பட்டுள்ள கருத்திட்டங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;
(iv) அவற்றில் இன்றளவில் நிதி ஒதுக்கப்பட்டுள்ள கருத்திட்டங்கள் யாவை என்பதையும்;
(v) மேற்படி ஒவ்வொரு கருத்திட்டத்துக்கும் ஒதுக்கப்பட்டுள்ள நிதி வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -
(i) the number of vehicles in possession of the Western Provincial Council;
(ii) the officers who use the vehicles concerned;
(iii) whether the aforesaid vehicles are used by people's representatives; and
(iv) if so, the name and position of each of those people's representatives, separately?

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා ]

(b) Will he also inform this House the -

(i) names of the provincial governors of Sri Lanka, separately in respect of each province;

(ii) amount of money allocated for the development activities of each of the provinces in the year 2025, separately;

(iii) projects proposed to be implemented in each of the provinces, separately;

(iv) projects among them for which funds have already been allocated; and

(v) amount of funds allocated for each of those projects, separately?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 4,003කි.

(ii) නිලධාරින් විසින් වාහන 202ක් භාවිත කරනු ලබන අතර එහි තොරතුරු ඇමුණුම 01 මඟින් දැක්වේ.

(iii) ඔව්.

ඒ මහජන නියෝජිතයන් කියන්නේ බස්නාහිර පළාත් සභාවට අයත් ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාවල සභාපතිවරු. ඒ වාගේම, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති.

(iv) ඇමුණුම 02 මඟින් දැක්වේ.

(ආ) (i)

| අනු අංක | පළාත | ගරු ආණ්ඩුකාරවර |
|---|---|---|
| 01 | බස්නාහිර | ගරු ආණ්ඩුකාරවර හනීෆ් යුසුෆ් මැතිතුමා |
| 02 | වයඹ | ගරු ආණ්ඩුකාරවර තිස්ස වර්ණසූරිය මැතිතුමා |
| 03 | දකුණ | ගරු ආණ්ඩුකාරවර එම්.කේ. බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා |
| 04 | නැගෙනහිර | ගරු ආණ්ඩුකාරවර ජයන්ත ලාල් රත්නසේකර මැතිතුමා |
| 05 | උතුර | ගරු ආණ්ඩුකාරවර නාගලිංගම් වේදනායගම් මැතිතුමා |
| 06 | මධ්‍යම | ගරු ආණ්ඩුකාරවර සරත් අභයකෝන් මැතිතුමා |
| 07 | උතුරු මැද | ගරු ආණ්ඩුකාරවර වසන්ත ජිනදාස මැතිතුමා |
| 08 | සබරගමුව | ගරු ආණ්ඩුකාරවර චම්පා ජානකී රාජරත්න මැතිනිය |
| 09 | ඌව | ගරු ආණ්ඩුකාරවර නීතිඥ ජේ.එම්. කපිල ජයසේකර මැතිතුමා |

(ii)

| අනු අංක | පළාත | සංවර්ධන කටයුතු සඳහා 2025 වර්ෂයේදී වෙන් කර ඇති මුදල (රු. මිලියන) |
|---|---|---|
| 01 | බස්නාහිර | 8,358.60 |
| 02 | වයඹ | 10,844.63 |
| 03 | දකුණ | 9,736.25 |
| 04 | නැගෙනහිර | 8,776.10 |
| 05 | උතුර | 13,623.00 |
| 06 | මධ්‍යම | 13,246.50 |
| 07 | උතුරු මැද | 11,873.18 |
| 08 | සබරගමුව | 12,237.00 |
| 09 | ඌව | 8,971.00 |

(iii)

| අනු අංක | පළාත | ඇමුණුම් අංකය |
|---|---|---|
| 01 | බස්නාහිර | ඇමුණුම 03 |
| 02 | වයඹ | ඇමුණුම 04 |
| 03 | දකුණ | ඇමුණුම 05 |
| 04 | නැගෙනහිර | ඇමුණුම 06 |
| 05 | උතුර | ඇමුණුම 07 |
| 06 | මධ්‍යම | ඇමුණුම 08 |
| 07 | උතුරු මැද | ඇමුණුම 09 |
| 08 | සබරගමුව | ඇමුණුම 10 |
| 09 | ඌව | ඇමුණුම 11 |

(iv)

| අනු අංක | පළාත | ඇමුණුම් අංකය |
|---|---|---|
| 01 | බස්නාහිර | ඇමුණුම 12 |
| 02 | වයඹ | ඇමුණුම 04 |
| 03 | දකුණ | ඇමුණුම 05 |
| 04 | නැගෙනහිර | ඇමුණුම 06 |
| 05 | උතුර | ඇමුණුම 07 |
| 06 | මධ්‍යම | ඇමුණුම 08 |
| 07 | උතුරු මැද | ඇමුණුම 09 |
| 08 | සබරගමුව | ඇමුණුම 13 |
| 09 | ඌව | ඇමුණුම 11 |

(v)

| අනු අංක | පළාත | ඇමුණුම් අංකය |
|---|---|---|
| 01 | බස්නාහිර | ඇමුණුම 12 |
| 02 | වයඹ | ඇමුණුම 04 |
| 03 | දකුණ | ඇමුණුම 05 |
| 04 | නැඟෙනහිර | ඇමුණුම 06 |
| 05 | උතුර | ඇමුණුම 07 |
| 06 | මධ්‍යම | ඇමුණුම 08 |
| 07 | උතුරු මැද | ඇමුණුම 09 |
| 08 | සබරගමුව | ඇමුණුම 13 |
| 09 | ඌව | ඇමුණුම 11 |

සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ඇමුණුම් 01 සිට 13 දක්වා ලිපි ගොනු 13ක් **සභාගත*** කරමි.

(ඈ) පැන නොනඟී.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ (අ) (i) කොටසට පිළිතුර වශයෙන් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා, බස්නාහිර පළාත සතු වාහන සංඛ්‍යාව 4,003යි කියලා. ගරු ඇමතිතුමා, ඒ 4,003යි කියන ගණන හරි නේද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔව්, බස්නාහිර පළාත සතු වාහන සංඛ්‍යාව 4,003යි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, මෙතැනදී මම ඇත්තටම බලාපොරොත්තු වුණේ බස්නාහිර පළාත් සභාව සතු වාහන ගැන දැනගන්න. දැන් ඔබතුමාගේ පිළිතුර අනුව පළාත් පාලන ආයතනවල ඒවාත් මේකට එකතු වුණා. පළාත් පාලන ආයතනවල ඒවාත් එකතුව තමයි මේ වාහන සංඛ්‍යාව ආවේ. ඒ කියන්නේ, බස්නාහිර පළාතේ තිබෙන පළාත් පාලන ආයතනවල තිබෙන වාහනත් එක්ක. ඔබතුමා මේ විෂයය භාර ඇමතිතුමා නොවුණත් උත්තර දුන්නා. මට දැන ගන්න ඕනෑ මේකයි, ගරු ඇමතිතුමා. බස්නාහිර පළාතේ විතරක් නොවෙයි, උතුරු පළාත්වලත් දැන් අවුරුදු ගණනාවක් තිස්සේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු අනෙක් ඇමතිවරු හතරදෙනෙකු ගත්තොත්, - එතකොට ඇමතිවරු පස් දෙනායි - ඒ ඇමතිවරු පස්දෙනාම ඉතාම හොඳ වාහන පාවිච්චි කළා. දැන් පළාත් සභාවල මහජන නියෝජිතයෝ නැහැ. ප්‍රධාන අමාත්‍යතුමාත්, ඉතිරි අමාත්‍යවරු හතරදෙනාත් ඇතුළුව ඔක්කෝම අමාත්‍යවරු පස්දෙනෙකු හැම පළාතකම හිටියා. එතකොට, මේ පළාත්වල පාවිච්චි කරපු වාහන දැන් නිලධාරින් පාවිච්චි කරනවාද? එහෙම නැත්නම් ඒ වාහන වෙන්දේසි කරලා රජයට මුදල් අය කරගෙන තිබෙනවාද? මේ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක මම ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, එහෙම එක වාහනයක් ගැන සඳහන් කරනවා. "බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින CAY -1981 දරන ජීප් රථය විෂයභාර අමාත්‍යවරයා විසින් භාවිත කර ඇත" කියා සඳහන් වනවා. "වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2024 ප්‍රකාරව අපහරණය කිරීමට නියමිත සුබෝපභෝගී රථයකි" යනුවෙන් ද සඳහන් වනවා. ඒක තමයි වාර්තා වෙලා තිබෙන්නේ. ඉතිරි වාහන ගැන මේ වාර්තාවේ නැහැ. ඉතිරි ටික තිබෙන්නේ පළාත් පාලන ආයතනවල. ඔබ ප්‍රශ්නය අහලා තිබෙන්නේ, "මහජන නියෝජිතයන් පරිහරණය කරන..." කියලායි. මහජන නියෝජිතයන් පරිහරණය කරන කිව්වාම, දැන් මහජන නියෝජිතයන් හැටියට ඉන්නේ පළාත් පාලන සභාපතිවරු. ඒ අයට දීලා තිබෙන ප්‍රාදේශීය සභාවේ කැබ් එක තමයි සඳහන් කර තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි අතුරු ප්‍රශ්නය,-

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

දෙවැනි ප්‍රශ්නය නොවෙයි, මේ මගේ පළමු ප්‍රශ්නයට අතුරු ප්‍රශ්න, ගරු කථානායකතුමනි. දෙවැනි ප්‍රශ්නය ඇහුවේ නැහැ. ගරු කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවැනි ප්‍රශ්නය කියලා කථාවක් නැහැ. මේ අතුරු ප්‍රශ්න තමයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

හයියෙන් කියන්නකෝ, ගරු කථානායකතුමා. මට ඇහෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමාගේ කන ඇහෙන්නේ නැති එක මට ප්‍රශ්නයක් නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ඉතින් ඇහෙන්නේ නැති නිසා නේ ඇහෙන්නේ නැහැ කියන්නේ, මම.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා අහනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, එතුමාගේ අවසරය පරිදි මේ අමාත්‍යාංශයට සම්බන්ධ ප්‍රශ්නයක් මම අහන්නේ. විෂය භාර ගරු අමාත්‍යතුමා නැතත් මම හිතනවා මෙතුමා කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා නිසා මේකට පිළිතුරක් දෙන්න පුළුවන් වෙයි කියලා.

මේ දවස්වල අලුතින් පත් වුණු ප්‍රාදේශීය සභා නියෝජිතයෝ - හැම පක්ෂයකම - බොහොම උනන්දුවක් දක්වනවා, තමන්ගේ ගමේ ප්‍රශ්න ටික විසඳා ගන්න. සම්බන්ධීකරණ කමිටුව තමයි දේශපාලනඥයෝත්, මහජන නියෝජිතයෝත්, නිලධාරිනුත් එකට එකතු වෙලා ගමේ ප්‍රශ්න විසඳන්න තිබෙන හොඳම තැන. අපිට දැනගන්න ලැබී තිබෙනවා, චක්‍රලේඛයක් මඟින් දැනුම් දී තිබෙනවා කියලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගිවීමේ අවස්ථාව - ඒ මහජන නියෝජිතයන්ගෙන්, පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ගෙන් - එක පක්ෂයකින් එක්කෙනෙකුට සීමා කරන්න යනවා කියලා. සමහරු කියනවා, ඒ ඉඩකඩ මදි කියලා. හැබැයි, අපි ඉල්ලීමක් කරනවා, ඒ හැමෝටම අවස්ථාවක් දෙනවා නම් හොඳයි කියලා. මොකද, ඒ මිනිස්සුන්ගේ ප්‍රශ්නය, ගමේ ප්‍රශ්නය හොඳටම දන්නා අය තමයි එ් අය. එතකොට ඒ තිබෙන ප්‍රශ්න විසඳා ගන්නත් පහසු වෙනවා, වැඩි පිරිසකට එහෙම ඉඩක් දෙනවා නම්. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, අපි අලුතින් කිසිදු චක්‍රලේඛයක් මේ පිළිබඳව නිකුත් කරලා නැහැ. 2018දී මෙතුමන්ලාගේ ආණ්ඩුව විසින් නිකුත් කළ චක්‍රලේඛය ප්‍රකාරව තමයි කටයුතු කරමින් පවතින්නේ. අපි කිසිදු අලුත් චක්‍රලේඛයක් නිකුත් කළේ නැති බව මා කියන්න කැමැතියි. වැඩිදුර විස්තර වුවමනා නම් පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා සිටින වෙලාවක ඒ ගැන කථා කරන්න පුළුවන්.

ඇත්තටම වාහන ගැන -*[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි ඔය අහන්නේ. ඒ නිසා කාලය අවම කරගන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
චක්‍රලේඛයක් නිකුත් කරලා - *[බාධා කිරීමක්]* චක්‍රලේඛයක් පවතිනවා නම් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර ලබා දීමටත් කාලය අවම කරගන්න. ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි අහන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
චක්‍රලේඛයක් පවතිනවා නම්, ඒ අනුව තමයි අපට කටයුතු කරන්න සිද්ධ වෙන්නේ එය සංශෝධනය කරනකම්. *[බාධා කිරීමක්]* පළාත් පාලන විෂයය ගැනයි, වාහන ගැනයි ගරු පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා විසින් ඉදිරි දිනයකදී සවිස්තර උත්තරයක් ලබා දෙයි.

## මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය: මහජන ආරක්ෂක අංශය
## பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு: பொதுமக்கள் பாதுகாப்புப் பிரிவு
## MINISTRY OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS: PUBLIC SECURITY SECTION

858/2025

**6. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ, මහජන ආරක්ෂක අංශය යටතේ පවතින ආයතන කවරේද;

(ii) වර්තමාන රජය බලයට පැමිණීමෙන් පසු එම ආයතන විසින් සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන සිදු කරන ලද්දේ කවර කරුණු සම්බන්ධයෙන්ද;

(iv) එම විමර්ශන අනුව මේ වනවිට අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් විමර්ශනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම විමර්ශන අනුව මේ වනවිට පවරා ඇති නඩු සංඛ්‍යාව කවරේද;

(vi) එක් එක් විමර්ශනයට අදාළව අත්අඩංගුවට ගෙන ඇති අවි ආයුධ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சின், பொதுமக்கள் பாதுகாப்புப் பிரிவின்கீழ் இயங்கும் நிறுவனங்கள் யாவை;

(ii) தற்போதைய அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர், மேற்படி நிறுவனங்கள் மேற்கொண்டுள்ள விசாரணைகளின் எண்ணிக்கை யாது;

(iii) அத்தகைய விசாரணைகள் எவ்வாறான விடயங்கள் தொடர்பில் மேற்கொள்ளப்பட்டுள்ளன;

(iv) அத்தகைய விசாரணைகளுக்கு அமைய, இன்றளவில் கைது செய்யப்பட்டுள்ள ஆட்களின் எண்ணிக்கை ஒவ்வொரு விசாரணையின்படி வெவ்வேறாக யாது;

(v) மேற்படி விசாரணைகளுக்கு அமைய, இன்றளவில் தாக்கல் செய்யப்பட்டுள்ள வழக்குகளின் எண்ணிக்கை யாது;

(vi) ஒவ்வொரு விசாரணை தொடர்பிலும் கைப்பற்றப்பட்டுள்ள ஆயுதங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the institutions which function under the Public Security section of the Ministry of Public Security and Parliamentary Affairs;

(ii) the number of investigations that have been conducted by the institutions concerned after the present Government came into power;

(iii) the matters regarding which the investigations concerned have been conducted;

(iv) the number of persons arrested so far pursuant to the investigations concerned, in respect of each such investigation, separately;

(v) the number of cases that have been filed pursuant to the investigations concerned; and

(vi) the number of arms and ammunitions that have been taken into custody in respect of each such investigation, separately?

(b) If not, why?

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු කථානායකතුමනි, සම්බන්ධීකරණ කමිටු සම්බන්ධයෙන් circular එකක් යවා තිබෙනවා. නමුත් දැන් ගරු ඇමතිතුමා කිව්වා, අලුත් circular එකක් යවා නැහැ කියලා. ඒ වුණාට ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට, මන්ත්‍රීතුමන්ලාට එහෙම අලුත් circular එකක් යවා තිබෙනවා කියලා මම කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා, 6වන ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

- ශ්‍රී ලංකා පොලීසිය
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
- ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

(ii)

- ශ්‍රී ලංකා පොලීසිය - 128
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - 149
- අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය - විමර්ශන සිදුකර නොමැත.
- රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - විමර්ශන සිදුකර නොමැත.
- ජාතික පොලිස් අභ්‍යාස ආයතනය - විමර්ශන සිදුකර නොමැත.

(iii)

- ශ්‍රී ලංකා පොලීසිය
  * ගිනි අවි යොදා ගනිමින් සිදුකළ මනුෂ්‍ය ඝාතන සම්බන්ධව
  * ගිනි අවි භාවිත කරමින් මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම හා තුවාල කිරීම් සම්බන්ධව
  * ගිනි අවි යොදා ගනිමින් ඝාතනය කිරීම්, තහනම් සතුන් ඝාතනය කිරීම් සම්බන්ධව
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
  * වීසා කාලය ඉක්මවා මෙරට රැඳී සිටින විදේශිකයන් සම්බන්ධව
  * වීසා කොන්දේසි කඩ කරමින් මෙරට රැඳී සිටින විදේශිකයන් සම්බන්ධව
  * ශ්‍රී ලාංකික ගමන් බලපත්‍ර ලබා ගැනීම සඳහා ව්‍යාජ තොරතුරු /කූට ලේඛන ඉදිරිපත් කර ඇති පුද්ගලයන් සම්බන්ධව

[ගරු ආනන්ද විජේපාල මහතා ]

(iv)

- ශ්‍රී ලංකා පොලීසිය

| මනුෂ්‍ය ඝාතනවලට සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව | මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම් හා තුවාල කිරීම් සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව | ඝාතනය කිරීමට තහනම් සතුන් ඝාතනය කිරීම් සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 241 | 180 | 04 | 425 |

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යටතේ අත්අඩංගුවට ගෙන තිබෙනවා,

| | |
|---|---|
| වියට්නාම ජාතිකයන් | 23 |
| පාකිස්තාන ජාතිකයන් | 2 |
| බංග්ලාදේශ | 106 |
| ඉන්දියානු | 56 |
| චීන | 04 |
| තායි | 06 |
| පිලිපීන | 02 |
| බුරුන්ඩි | 02 |
| ඉතියෝපියානු | 01 |
| කෙන්යානු | 02 |
| උගන්ඩා | 01 |
| නේපාල | 01 |
| රුසියානු | 03 |
| නෙදර්ලන්ත | 01 |
| යේමන් | 02 |
| ඊශ්‍රායල් | 04 |
| ඕස්ට්‍රේලියා | 01 |
| ඉතාලි | 01 |
| සුඩාන | 01 |
| එකතුව | 219 |

(v)

- ශ්‍රී ලංකා පොලීසිය

| මනුෂ්‍ය ඝාතන සම්බන්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව | මනුෂ්‍ය ඝාතනවලට තැත් කිරීම් හා තුවාල කිරීම් සම්බන්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව | ඝාතනය කිරීමට තහනම් සතුන් ඝාතනය කිරීම් සම්බන්ධව පවරා ඇති නඩු සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 03 | 03 | - | 06 |

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නඩු පැවරීම් සිදු කර නොමැත.

  1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ සඳහන් පරිපාලන විධිවිධාන අනුව රටින් ඉවත්/ පිටුවහල් කිරීම සිදු කරනු ලබයි.

(vi) ශ්‍රී ලංකා පොලීසිය

| මනුෂ්‍ය ඝාතන සම්බන්ධව අත් අඩංගුවට ගෙන ඇති ගිනි අවි | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ටී 56 | පිස්තෝල | රිවෝල්වර් | බඳින තුවක්කු, බෙහෙත් කොටන තුවක්කු | බෝර 12 | ගල්කටස් | වෙනත් | එකතුව |
| 10 | 05 | 01 | 05 | 03 | - | 03 | 27 |
| මනුෂ්‍ය ඝාතනවලට තැත් කිරීම් හා තුවාල කිරීම් සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇති ගිනි අවි | | | | | | | |
| 02 | 07 | 02 | 10 | 07 | 01 | 04 | 33 |
| ඝාතනය කිරීමට තහනම් සතුන් ඝාතනය කිරීම් සම්බන්ධව අත්අඩංගුවට ගෙන ඇති ගිනි අවි | | | | | | | |
| - | - | - | - | 03 | - | - | 03 |

ඉහත අපරාධමය වැරදිවලට අමතරව සැකකරුවන් ඇතිව හෝ නොමැතිව සොයා ගන්නා සමස්ත ගිනි අවි සංඛ්‍යාව 2025.07.31 දිනට 2,089ක් වේ.

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - අදාළ නොවේ.

| ටී 56 | පිස්තෝල | රිවෝල්වර් | AK 47 | බඳින තුවක්කු, බෙහෙත් කොටන තුවක්කු | බෝර 12 | ගල් කටස් | රිපීටර් | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 18 | 49 | 44 | 01 | 1,733 | 189 | 43 | 07 | 05 | 2,089 |

(ආ) පැන නොනඟී.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය කාලය පුරාවට, විශේෂයෙන්ම මේ ගෙවුණු මාස 8කට, 10කට ආසන්න කාලය තුළ විමර්ශන විශාල ප්‍රමාණයක් කරලා, අත්අඩංගුවට ගැනීම් විශාල ප්‍රමාණයක් කර තිබෙන බව පෙනෙනවා. අපි දන්නවා, මේ වන විට අපේ රටේ කෙරෙන විෂ මත් ද්‍රව්‍ය ජාවාරම පිළිබඳව. මේ අත්අඩංගුවට ගැනීම් පිටුපස සිටින බොහෝදෙනෙකු වාගේම, බොහෝ ආයුධ ඒ ජාවාරම වෙනුවෙන් පාවිච්චි වෙනවා. මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි, ඒ විෂ මත් ද්‍රව්‍ය මැඬලීම සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශය මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද කියලා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මේ වන විට විෂ මත් ද්‍රව්‍ය වැටලීම් වඩාත් පුළුල් කර තිබෙනවා. ඒ සඳහා පොලිස් ස්ථාන මඟින් සෑම පොලිස් වසමකම සෝදිසි මෙහෙයුම් සිදු කරමින් පවතිනවා. ඊට අමතරව, ත්‍රිවිධ හමුදා සාමාජිකයන් හා පොලිස් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් යොදාගෙන පොලීසියත් ඒකාබද්ධව සෝදිසි මෙහෙයුම් දිගින් දිගටම සිදු කරමින් පවතිනවා. ඒ හරහා විෂ මත් ද්‍රව්‍ය සමාජයට සැපයීම අඩාළ කිරීම තමයි මූලික අරමුණ.

ඒ වාගේම, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හරහා මත් ද්‍රව්‍ය සඳහා තිබෙන ඉල්ලුම අඩු කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් 6,134ක් මේ අවුරුද්දේ පවත්වන්න සැලසුම් කරලා තිබෙනවා. මේ වන කොට ඒවායෙන් වැඩසටහන් 3,000ක් පමණ කරලා තිබෙනවා. ඊට අමතරව, විදුහල්පතිවරුන්ගේ, ශිෂ්‍ය නායකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් කමිටු පිහිටුවමින් තිබෙනවා. ඊටත් අමතරව, මහජන ආරක්ෂක කමිටු හරහා මෙම විෂ මත් ද්‍රව්‍ය මර්දනය කිරීම සඳහා මහජන සහභාගිත්වය ලබා ගන්න අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුරුවලදී විශේෂයෙන්ම සඳහන් වුණා, වීසා අවසන් වීමෙන් අනතුරුව අපේ රටේ රැඳී සිටින විදේශිකයන් විශාල පිරිසක් හසු වෙලා තිබෙනවා කියලා. මේ වන විටත් අපට ආරංචි ලැබෙනවා, වීසා අවසන් වීමෙන් අනතුරුවත් ඒ අය අපේ රටේ රැඳී සිටිනවා කියලා. ඒ සම්බන්ධයෙන් වැඩි අවධානය යොමු කරලා ක්‍රියාමාර්ග ගැනීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය සූදානම්ද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, වීසා කාලය ඉක්ම වීමෙන් අනතුරුවත් රට තුළ රැඳී සිටින පිරිස් සම්බන්ධයෙන් මේ වන විට නීතිය ක්‍රියාත්මක කරමින් පවතිනවා. වීසා කාලය අවසන් වීමෙන් පසුත් මේ රටේ රැඳී සිටින අය සම්බන්ධයෙන් ආගාමික හා විගාමික පනත යටතේ මේ වන විට විමර්ශන ආරම්භ කරලා තිබෙනවා.

ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට උපදෙස් දීලා තිබෙනවා.

## පිරිවෙන් අධ්‍යාපනය: විස්තර
### பிரிவெனாக் கல்வி: விபரம்
### PIRIVEN EDUCATION: DETAILS

863/2025

**7. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ගීකරණය කවරේද;

(ii) එම පිරිවෙන්වල උගන්වනු ලබන විෂයයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම විෂයයන් කවරේද;

(iv) මේ වන විට ඉහත පිරිවෙන්වල ඉගෙන ගනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025 වර්ෂයේ අය වැය මඟින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් පිරිවෙන් අධ්‍යාපනයට අදාළ විෂය පථය සංශෝධනය කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பிரிவெனா வகைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பிரிவெனாக்களில் கற்பிக்கப்படும் பாடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) அத்தகைய பாடங்கள் யாவை என்பதையும்;

(iv) இன்றளவில் மேற்படி பிரிவெனாக்களில் கல்வி கற்கும் மாணவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2025ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தில் பிரிவெனாக் கல்விக்காக ஒதுக்கப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(ii) புதிய கல்விச் சீர்திருத்தங்கள் ஊடாக பிரிவெனாக் கல்வியுடன் தொடர்புடைய விடயப்பரப்பு திருத்தப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) classification of Pirivenas in Sri Lanka;

(ii) number of subjects taught in Pirivenas;

(iii) subjects so taught; and

(iv) number of students currently studying in the above-mentioned Pirivenas?

(b) Will she also inform this House -

(i) the amount of money that had been allocated for Piriven education in the Budget, 2025; and

(ii) whether the curriculum of Piriven education will be revised under the new education reforms?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(අ) (i)
- මූලික පිරිවෙන්
- මහා පිරිවෙන්
- පිරිවෙන් විද්‍යායතන
- ද්විභාෂා පිරිවෙන්
- විශේෂ පිරිවෙන් (විද්‍යෝදය, විද්‍යාලංකාර පිරිවෙන්)
- සීල මාතා අධ්‍යාපන ආයතන
- පිරිවෙන් අභ්‍යාස ආයතන

(ii)
- මූලික පිරිවෙන් විෂයය 14
- ප්‍රාචීන විෂයයන් 08

(iii) <u>අනිවාර්ය විෂයන්</u>

පාලි, සිංහල, සංස්කෘතික, ඉංග්‍රීසි, ත්‍රිපිටක ධර්මය, ගණිතය

<u>වෛකල්පිත විෂයයන්</u>

ඉතිහාසය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, හින්දි, දෙමළ හා පිරිවෙන් මණ්ඩලය අනුමත විෂයයන්

<u>මහා පිරිවෙන්</u>

පාසල් විෂයයන්ට අදාළ විෂයයන්

ප්‍රාචීන විභාගවලට අදාළ විෂයයන්

<u>පිරිවෙන් විද්‍යායතන</u>

පාසල් විෂයයන්ට අදාළ විෂයයන්

(iv) මේ වන විට ඉහත පිරිවෙන්වල ඉගෙනගනු ලබන සිසුන් සංඛ්‍යාව 69,108කි.

(ආ) (i) 2025 වර්ෂයේ අය වැය මඟින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති මුදල

| | |
|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා | - රුපියල් මිලියන 210 |
| පුනරාවර්තන | |
| වියදම් සඳහා | - රුපියල් මිලියන 7,308 |
| **එකතුව** | **-** රුපියල් මිලියන 7,518 |

(ii) ඔව්.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ පිරිවෙන් පද්ධතියට ඉතාම දිගු ඉතිහාසයක් තිබෙනවා. විශේෂයෙන් සම්භාව්‍ය විෂයයන් බොහෝ ප්‍රමාණයක් පිරිවෙන් පද්ධතිය තුළ උගන්වනු ලබනවා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියූ ආකාරයට ඒ පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය ඇතුළු විෂයයන්. නමුත්, මේ වන විට ලංකාව තුළ අධ්‍යාපනය ලැබූ භික්ෂූන් වහන්සේලා අතිබහුතරයක් දෙනා විදේශීය රටවල ධර්ම ප්‍රචාරක කටයුතුවල නිතර වෙනවා. නමුත්, අපේ පිරිවෙන් අධ්‍යාපනය තුළ විශේෂයෙන් දත්ත විද්‍යාව, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, අන්තර්ජාල සම්බන්ධතා වැනි විෂයයන් ඉගැන්වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා මම පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්නේ වර්තමානයේ ඉදිරිපත් වන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ එවැනි විෂයයන් හා සම්බන්ධයෙන් පිරිවෙන් අධ්‍යාපනයට අවධානයක් යොමු කරලා තිබෙනවාද කියන එකයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය ඇසීම ගැන මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඔව්, මෙතැනදී මම මුලින් සඳහන් කළ විධියට පාසල් විෂයයන්ට අදාළව පිරිවෙන් විද්‍යායතන තිබෙනවා. මේ මොහොතේ පාසල් විෂයයන් ඉගැන්වෙන සියලු පිරිවෙන්වල ඉදිරි වසර තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළ ක්‍රියාවලිය සිද්ධ වෙනවා. මේ කියපු තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව සහ අන්තර්ජාල සම්බන්ධතා සම්බන්ධයෙන් ලෝකයට ගැළපෙන විධියට ප්‍රතිසංස්කරණ සිද්ධ වෙනවා. ඒ ප්‍රතිසංස්කරණ මාලාව ඒවායේත් ක්‍රියාත්මක වෙනවා.

ඉතිරි පිරිවෙන් සම්බන්ධයෙන් 1979 පිරිවෙන් අධ්‍යාපන පනත යටතේ විෂය මාලා සංශෝධනය කිරීම සඳහා පනත් සංශෝධනයකට යෑමේ අවශ්‍යතාවක් තිබෙනවා. මේ සඳහා උපදේශක කාරක සභාවක් පත් කරලා තිබෙනවා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය ආණ්ඩුව යටතේ විශේෂයෙන් දහම් පාසල් සහ පිරිවෙන් යන ක්ෂේත්‍ර හා සම්බන්ධව රාජ්‍ය අමාත්‍යාංශයක් ක්‍රියාත්මක වුණා. නමුත්, ඒ අමාත්‍යාංශය හරහා පිරිවෙන් අධ්‍යාපනයට දැනෙන යමක් සිදු වුණා කියලා අපට පෙනුණේ නැහැ. මේ ආණ්ඩුව පැමිණෙනවාත් එක්කම, ඒ රාජ්‍ය අමාත්‍යාංශය විසිරිලා යනවා. නමුත්, ඒ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සිටි ඇතැම් නිලධාරින් තවමත් ඊට අදාළ යම් යම් සේවාවල නිරත වෙලා සිටිනවා.

විශේෂයෙන්ම නව රජය කැබිනට් මණ්ඩලය තුළ අනුකමිටු පත් කරලා තිබෙනවා පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීම සඳහා. ඉහත කී නිලධාරින්ගෙන් පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට යම් යම් බාධා සිදු වෙනවා. එම නිසා ඒ නිලධාරින් සම්බන්ධයෙන් අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, 1979 පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වන උපදේශක කාරක සභාවේ සංයුතිය ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලාගේ නියෝජිත ස්වාමීන් වහන්සේලා, එකී විෂයයන් හා සම්බන්ධ ප්‍රාමාණික වියතුන්ගෙන් සමන්විත වෙනවා. එම කාරණයට අදාළ නිර්දේශ එතැනින් තමයි එන්නේ. අපි හිතනවා ඒ සංශෝධන ක්‍රියාවලියට අදාළ විභවතා සහිත කමිටුවක් අපට තිබෙනවා කියලා. එම නිසා ඒ ක්‍රියාවලිය ඉදිරියට කරගෙන යන්න බාධාවක් ඇති නොවේවි කියලා මම හිතනවා. අපි ඒ කමිටුව සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබෙනවා, පිරිවෙන් විෂයමාලා සංශෝධනය කිරීම සම්බන්ධයෙන්. ඒ නිසා එ් ඉදිරි කටයුතු සම්බන්ධයෙන් අප සුබදායී තැනක ඉන්නවා කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

## මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් මාතර දිස්ත්‍රික්කයේ රෝහල්: විස්තර

மாத்தறை மாவட்டத்தில் மத்திய அரசாங்கம் மற்றும் மாகாண சபைக்குக் கீழுள்ள வைத்தியசாலைகள்: விபரம்

HOSPITALS IN MATARA DISTRICT BELONGING TO CENTRAL GOVERNMENT AND PROVINCIAL COUNCIL: DETAILS

867/2025

**8.** ගරු ලාල් ප්‍රේමනාත් මහතා
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් රෝහල් සංඛ්‍යාව, රජයේ රෝහල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමය අනුව එම එක් එක් රෝහල අයත් වන ශ්‍රේණිය සහ එම එක් එක් රෝහලෙන් සේවය ලබා ගන්නා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති දෙනියාය මූලික රෝහල වර්ෂ 100කට වඩා පැරණි රෝහලක් බව පිළිගන්නේද;

(iii) එම රෝහල මේ වන විට නාය යෑමේ තර්ජනයට මුහුණ දී ඉතාම අවදානම් තත්ත්වයක පවතින බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தில் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலுமுள்ள மத்திய அரசாங்கம் மற்றும் மாகாண சபைக்குரிய வைத்தியசாலைகளின் எண்ணிக்கை, அரசாங்க வைத்தியசாலைகளின் தரவரிசைப்படுத்தலுக்கு அமைவாக மேற்படி ஒவ்வொரு வைத்தியசாலையும் உள்ளடங்கும் தரம் மற்றும் ஒவ்வொரு வைத்தியசாலையிலிருந்தும் சேவையைப் பெற்றுக்கொள்ளும் ஆட்களின் எண்ணிக்கை வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) கொடபொல பிரதேச செயலாளர் பிரிவிலுள்ள தெனியாய ஆதார வைத்தியசாலை 100 ஆண்டுகளுக்கு மேல் பழமையான வைத்தியசாலை என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) அந்த வைத்தியசாலை தற்போது மண்சரிவு அச்சுறுத்தலை எதிர்கொண்டு மிகவும் ஆபத்தான நிலைமையில் உள்ளதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அது தொடர்பாக மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of hospitals in each Divisional Secretary's Division in the Matara District belonging to the Central Government and the Provincial Council, the grade to which each of those hospitals belong according to the Government Hospital Grading System and the number of individuals receiving services from each of those hospitals, separately;

(ii) whether he accepts that the Deniyaya Base Hospital in the Kotapola Divisional Secretary's Division is a hospital that is more than 100 years old;

(iii) whether he is aware that the hospital referred to above is currently faced with the risk of landslides and is in a very vulnerable state; and

(iv) if so, the steps that have been taken in this regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික් මහ රෝහල ඇතුළු ප්‍රාදේශීය වෛද්‍ය සත්කාර ඒකක දක්වා ගත්තාම, ඔක්කොම 38ක් පවතිනවා. ඒ 38න් 2024 වර්ෂයේදී බාහිර රෝගී අංශයෙන් 2,160,903ක් ප්‍රතිකාර ලබාගෙන තිබෙනවා. අභ්‍යන්තර රෝගීන් 237,205ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා. සායනවලින් 1,131,443ක් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා. ඒ සියලු තොරතුරු ඇතුළත් ලේඛනය ***ඇමුණුම 01*** වශයෙන් මම **සභාගත*** කරනවා.

(ii) ඔව්. දැනට සොයාගෙන ඇති ලිඛිත සාධක අනුව දෙනියාය මූලික රෝහල වසර 127ක් පැරණි වේ.

(iii) ඔව්.

(iv) දැනට මේ රෝහල නව ස්ථානයක ඉදිකිරීමට සැලසුම් සකස් කර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. තවද, ඊට අවශ්‍ය ප්‍රතිපාදන 2026 අය වැය යෝජනා මඟින් වෙන්කර දෙන ලෙසට මහා භාණ්ඩාගාරය වෙතින් ඉල්ලීම් කර ඇත. ශක්‍යතා අධ්‍යයනයකින් පසු සකස් කරනු ලැබූ ව්‍යාපෘති යෝජනාව අනුව පවතින මූල්‍ය ප්‍රතිපාදන සහ රෝගී සත්කාර සේවා ධාරිතා අවශ්‍යතා අනුව ඇඳන් 300ක මූලික රෝහලක් ලෙස ඉදිකිරීමට යෝජිතය.

නව රෝහල ඉදිකරන තෙක් පවතින ස්ථානයේ සුරක්ෂිත රෝගී සත්කාර සේවාවක් වෙනුවෙන් අධිඅවදානම් නායයෑම් ස්ථාන ස්ථායීකරණය හා අභ්‍යන්තර අවකාශ කළමනාකරණ ක්‍රියාවලියක් මේ වන විටත් සිදු කරමින් පවතී.

(ආ) පැන නොනඟී.

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

**ඇමුණුම 01**

(අ) (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රෝහල් පිළිබඳ තොරතුරු - 2024
Information on Government Hospitals by D.S. Division - 2024

| ප්‍රා.ලේ. කොට්ඨාසය D.S. Division | රෝහලේ නම Name of the Hospital | රෝහල් වර්ගය Type of Hospitals | බාහිර රෝගීන් ගණන (2024) | අභ්‍යන්තර රෝගීන් ගණන (2024) | සායනික රෝගීන් ගණන |
|---|---|---|---|---|---|
| අකුරැස්ස Akuressa | ප්‍රාදේශීය රෝහල අකුරැස්ස Divisional Hospital Akuressa | ප්‍රාදේශීය රෝහල - ඒ Divisional Hospital - A | 104763 | 13868 | 32376 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය- මාරඹ Primary Medical Care Unit Maramba | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 23429 | No | 2566 |
| දෙවිනුවර Devinuwara | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය දෙවිනුවර | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical | 52541 | No | 15176 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය කපුගම Primary Medical Care Unit Kapugama | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 26729 | No | 5430 |
| | ප්‍රාදේශීය රෝහල තලල්ල Divisional Hospital Talalla | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 44037 | 2142 | 13970 |
| දික්වැල්ල Dickwella | ප්‍රාදේශීය රෝහල දික්වැල්ල Divisional Hospital Dicklwella | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 61378 | 5459 | 22065 |
| | ප්‍රාදේශීය රෝහල ඌරුගමුව Divisional Hospital Urugamuwa | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 50873 | 1472 | 9205 |
| හක්මණ Hakmana | ප්‍රාදේශීය රෝහල නරවැල්පිට Divisional Hospital Narawelpita | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 62858 | 2638 | 15697 |
| | ප්‍රාදේශීය රෝහල ගංගොඩගම Divisional Hospital Gangodagama | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 81548 | 4485 | 15724 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය හක්මණ Primary Medical Care Unit Hakmana | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 24473 | No | 1748 |
| කඹුරුපිටිය Kamburupitiya | මූලික රෝහල කඹුරුපිටිය Base Hospital Kamburupitiya | මූලික රෝහල - ඒ Base Hospital - A | 164648 | 34593 | 116293 |
| | ප්‍රාදේශීය රෝහල රුහුණුගම Divisional Hospital Ruhunugama | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 48539 | 1518 | 12350 |
| කිරින්ද පුහුල්වැල්ල | ප්‍රාදේශීය රෝහල කිරින්ද Primary Medical Care Unit Kirinda | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 46783 | No | 16753 |
| කොටපොල Kotapola | මූලික රෝහල දෙනියාය Base Hospital Deniyaya | මූලික රෝහල - බී Base Hospital - B | 71694 | 15588 | 50834 |
| | ප්‍රාදේශීය රෝහල කොටපොල Primary Medical Care Unit Kotapola | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 24666 | No | 6373 |
| | ප්‍රාදේශීය රෝහල පල්ලෙගම Primary Medical Care Unit Pallegama | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 30772 | No | 10179 |
| මාලිම්බඩ Malimbada | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය තෙලිජ්ජවිල Primary Medical Care Unit Thelijjavila | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 33804 | No | 6973 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය හොරගොඩ Primary Medical Care Unit Horagoda | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 27615 | No | 863 |
| මාතර Matara | දිස්ත්‍රික් රජයේ රෝහල මාතර Districk General Hospital Matara | දිස්ත්‍රික් රජයේ රෝහල Districk General Hospital | 256793 | 111060 | 514640 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය කැකණදුර Primary Medical Care Kekanadura | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 70478 | No | 4878 |
| මුලටියන Mulatiyana | ප්‍රාදේශීය රෝහල දෙයියන්දර Divisional Hospital Deiyandara | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 74667 | 2849 | 24872 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය මාකදුර Primary Medical Care Unit Makandura | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 36496 | No | 4995 |
| | | ප්‍රාදේශීය රෝහල - බී | | | |

| ප්‍රා.ලේ. කොට්ඨාසය D.S. Division | රෝහලේ නම Name of the Hospital | රෝහල් වර්ගය Type of Hospitals | බාහිර රෝගීන් ගණන (2024) | අභ්‍යන්තර රෝගීන් ගණන (2024) | සායනික රෝගීන් ගණන |
|---|---|---|---|---|---|
| පස්ගොඩ Pasgoda | ප්‍රාදේශීය රෝහල ඌරුබොක්ක Divisional Hospital Urubokka | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 62892 | 7098 | 14206 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය බෙරලපනාතර Primary Medical Care Beralapanathara | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 32533 | No | 17160 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය රොටුඹ Primary Medical Care Rotumba | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 23777 | No | 3151 |
| | ප්‍රාදේශීය රෝහල මාවරල Divisional Hospital Mawarala | ප්‍රාදේශීය රෝහල - ඒ Divisional Hospital - A | 54196 | 2560 | 15184 |
| පිටබැද්දර Pitabeddara | ප්‍රාදේශීය රෝහල මොරවක Divisional Hospital Morawaka | ප්‍රාදේශීය රෝහල - බී Divisional Hospital - B | 82027 | 7735 | 18061 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය- දැරංගල Primary Medical Care Unit Darangala | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 19949 | No | 3859 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය දෙහිගස්පෙ Primary Medical Care Dehigaspe | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 44698 | No | 6125 |
| තිහගොඩ Thihagoda | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය තිහගොඩ Primary Medical Care Thihagoda | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 25995 | No | 3630 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය යටියන Primary Medical Care Yatiyana | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 43708 | No | 9873 |
| වැලිගම Weligama | ප්‍රාදේශීය රෝහල වැලිගම Divisional Hospital Weligama | ප්‍රාදේශීය රෝහල - ඒ Divisional Hospital - A | 85792 | 6566 | 22670 |
| | නව දිස්ත්‍රික් රජයේ රෝහල කඹුරුගමුව New District General Hospital kamburugamuwa | නව දිස්ත්‍රික් රජයේ රෝහල New Districk General Hospital | 70453 | 17574 | 70453 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය කඹුරුගමුව Primary Medical Care Kamburugamuwa | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 28162 | No | 3910 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය මිරිස්ස Primary Medical Care Mirissa | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 43619 | No | 12356 |
| | ප්‍රාදේශීය රෝහල මිදිගම Primary Medical Care Midigama | ප්‍රාදේශීය රෝහල - සී Divisional Hospital - C | 50304 | No | 7708 |
| | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය ගල්බොක්ක Primary Medical Care Galbokka | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical Care Unit | 48648 | No | 11112 |
| වැලිපිටිය Welipitiya | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය දෙනිපිටිය | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය Primary Medical | 24566 | No | 8025 |
| එකතුව - Total | | 38 | 2160903 | 237205 | 1131443 |

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ පිළිබඳ පුළුල් දැනුමක් අපට ලැබුණා. මේ රෝහල ඓතිහාසික රෝහලක්. සුදු ජාතිකයන් විසින් වතු කම්කරුවන් වෙනුවෙන් ඉදිකරපු ඓතිහාසික රෝහලක්. මාලිමා රජය සෞඛ්‍යය ක්ෂේත්‍රයට වැඩිම මුදලක් වෙන් කරලා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි වැඩ පිළිවෙළ තුළ මේ දෙනියාය රෝහල වෙනුවෙන් ඉදි කරන නව රෝහල ස්ථානගත වෙන තත්ත්වය මොකක්ද කියලා මට දැනගන්න අවශ්‍යයි, ගරු ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, දැනට ඒක මූලික රෝහලක් හැටියට පවතින්නේ. රෝහල් වර්ගීකරණයේදී ඒ වර්ගකර තිබෙන රෝහලට අවශ්‍ය පහසුකම් සම්පූර්ණ කිරීම තමයි අපේ ඊළඟ බලාපොරොත්තුව. මේ රෝහල මෙතැනින් එහාට දිස්ත්‍රික් මහ රෝහලක් බවට පත් කරන්නයි තිබෙන්නේ. මාතර දිස්ත්‍රික්කයේ දැනට දිස්ත්‍රික් මහ රෝහලක් පවතිනවා. මෙය "B" category එකේ තිබෙන රෝහලක්. අපේ ජාතික සැලැස්මට අනුව තවත් පහසුකම් දෙන්න පුළුවන් නම් එය "A" රෝහලක් බවට පත් කරන්න තමයි තිබෙන්නේ.

නමුත්, අපි තවම ඒ ගැන සාකච්ඡා කරලා නැහැ. මේ මූලික රෝහලට උපරිම පහසුකම් ලබා දීමට කටයුතු කරන්න පුළුවන්.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම මේක ඉතා ඈත, දුෂ්කර ප්‍රදේශයක පිහිටපු රෝහලක්. අපි දන්නවා, වෛද්‍යවරු බොහෝ ප්‍රමාණයක් රට හැර ගිය මොහොතක, සමහර අය නාගරික රෝහල් කරා සංක්‍රමණය වෙමින් වෘත්තීය කටයුතු කරන කාලයක, මෙම රෝහලේ වෛද්‍ය අධිකාරිතුමා ඇතුළු තවමත් රැඳිලා ඉන්න විශේෂඥ වෛද්‍යවරු පිරිසක් සහ සේවකයන් ඉතා සුළුතර ප්‍රමාණයක් ඒ අයගේ ආකල්ප වෙනස් කර නොගෙන තවමත් පැරණි ආකල්පවල ඉඳගෙන කටයුතු කරන බව මා නිරීක්ෂණය කරලා තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි, එවැනි විශේෂ තත්ත්ව තුළ, දුෂ්කර තත්ත්ව තුළ සෞඛ්‍ය සේවයේ වැඩ කරන එවැනි නිලධාරීන් ඇගැයීමක් හෝ ඔවුන්ගේ ඒ සේවාව ප්‍රබෝධවත් කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ඇත්තටම අපේ රටේ සෞඛ්‍ය සේවාව මේ තත්ත්වයෙන් පවත්වාගෙන යෑමේදී මේ කාර්ය මණ්ඩලය කරන සේවය ගැන ඔබතුමාට අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. මේ ප්‍රදේශයේ පමණක් නොවෙයි, බොහෝ රෝහල්වල ඒ තත්ත්වය තමයි පවත්වාගෙන යන්නේ. මම හිතනවා, ඒ අය වෙනුවෙන් අපට කරන්න පුළුවන් හොඳම ඇගැයීම තමයි, ඒ රෝහලේ කටයුතු පවත්වාගෙන යෑමට අවශ්‍ය භෞතික සම්පත් සහ තාක්ෂණය උපරිම ප්‍රමාණයෙන් ලබා දෙන එකත්, ඒවාට අවශ්‍ය සහාය කාර්ය මණ්ඩලය ලබා දෙන එකත්. ඔය ටික දුන්නොත් ඒ අය ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉතා සතුටෙන් සේවය කරාවි. අපි පසුගිය අය වැයේදිත් රෝහල් කාර්ය මණ්ඩලයට පමණක් නොවෙයි, සමස්ත රජයේ සේවකයන්ට හොඳ මූලික වැටුප් වැඩිවීමක් ලබා දුන්නා. ඒ මූලික වැටුප් වැඩිවීම මත පදනම් වෙලා OT, අමතර දීමනා, PH දීමනා ඇතුළු දීමනා ලබා දෙනවා. ආර්ථිකය වර්ධනය වෙන ප්‍රමාණයට මේ අයට තවත් දීමනා ලබා දෙන්න අපි කටයුතු කරනවා. ආර්ථිකය වර්ධනය වීමත් සමඟ ඒ ගැන මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කරවන්න බලාපොරොත්තු වෙනවා.

## මන්මුනෛපත්තු ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩම්: දීමනා පත්‍ර හෝ ඉඩම් බලපත්‍ර හිමියන්
## மண்முனைபற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரச காணிகள்: அளிப்பு அல்லது உரிமப் பத்திரங்களைப் பெற்றவர்கள்
## STATE LANDS IN MANMUNAIPATTU DS DIVISION: HOLDERS OF LAND GRANTS OR LAND PERMITS

878/2025

9. **ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ `ඉඩම් බලපත්‍ර' ලබාදුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i ) 2017.01.01ஆம் திகதி தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப் பகுதியில், மட்டக்களப்பு மாவட்டத்தின், மண்முனைபற்று பிரதேச செயலாளர் பிரிவில், அரசாங்கத்தால் ’ அளிப்புப் பத்திரங்கள்' அல்லது ’காணி உரிமப் பத்திரங்கள்' ஊடாக வழங்கப்பட்ட அரச காணிகளில் மக்கள் வசிக்கின்றார்கள் என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய தகவல்கள் என்பன யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that people have settled in the lands for which Land Grants or Land Permits were given during the period from 01.01.2017 to 31.03.2025 out of the State lands situated in the Divisional Secretary's Division of Manmunaipattu in the Batticaloa District; and

(ii) if so, the total number of such people and their names and other relevant information?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලවකවානුව තුළ රජයේ ඉඩම් සඳහා ලබා දුන් දීමනා පත්‍ර ඉඩම්වල පදිංචි පුද්ගලයන්ගේ නාම ලේඛනය ඇමුණුම I ලෙස ඉදිරිපත් කරනවා.

ඇමුණුම 1

| අනු අංකය | හිමිකරුගේ නම සහ ලිපිනය | ප්‍රදානයේ අංකය | පදිංචිවී සිටින බව, ඔව් / නැත |
|---|---|---|---|
| 1 | ෂන්මුගලිංගම් ශංකර් | GR/15/041367 | ඔව් |
| 2 | කන්දසාමි සිරිදේවි | GR/15/039740 | ඔව් |
| 3 | ඉලයතම්බි සරෝජාදේවි | FGR/51/27/22853 | ඔව් |
| 4 | තම්බිමුත්තු චන්ද්‍රාවතී | GR/15/039730 | ඔව් |
| 5 | අන්නම්මා මයිකල් | GR/15/039733 | ඔව් |
| 6 | ප්‍රේමසුදන් සෙල්වමාලා | GR/15/039734 | ඔව් |
| 7 | වසන්තකුමාරි නඩරාජා | GR/15/039739 | ඔව් |
| 8 | ජයසීලන් ජෝන් සතීස්කුමාර් | GR/15/039743 | ඔව් |
| 9 | මලර් කන්දප්පෝඩි | GR/15/041354 | ඔව් |
| 10 | මාර්කු ලියොන් | GR/15/041356 | ඔව් |
| 11 | සංකරපිල්ලේ චන්ද්‍රමලර් | GR/15/041355 | ඔව් |
| 12 | ජේරින්බරාසා ක්ලේරා ශිරෝනි | GR/15/041361 | ඔව් |
| 13 | සුන්දරලිංගම් වරුණා | GR/15/041360 | ඔව් |
| 14 | විනයගම් වසන්ති | GR/15/041363 | ඔව් |
| 15 | තට්චනමූර්ති පද්මාවතී | GR/15/041366 | ඔව් |
| 16 | වල්ලිපුරම් පුෂ්පලතා | GR/15/039731 | ඔව් |
| 17 | මර්සි ඉමාකුලට් මරියනේසන් | GR/15/039742 | ඔව් |
| 18 | ඇන්ජලෝ සහායමේරි | GR/15/039732 | ඔව් |
| 19 | සෙල්ලතුරෙයි සත්තිශීලි | GR/15/041370 | ඔව් |
| 20 | සුරේෂ්කුමාර් කලාදේවි | GR/15/039741 | ඔව් |
| 21 | තම්බිරාසා සෞන්දරම්මා | GR/15/039735 | ඔව් |
| 22 | සින්නප්පන් කැතරින් | FGR/51/27/22899 | ඔව් |
| 23 | ඉරුදයරාජා සහායමේරි | GR/15/041353 | ඔව් |
| 24 | තංගවේල් මහාදේවි | GR/15/041357 | ඔව් |
| 25 | කුමාරසිංහම් රෝස්මේරී | GR/15/041359 | ඔව් |
| 26 | විසුවාසම් ආනන්දරාජා | GR/15/041362 | ඔව් |
| 27 | ගනේෂන් ක්‍රිෂ්ණ කුමාරි | GR/51/27/36863 | ඔව් |
| 28 | කෛලායප්පිල්ලෙයි ගුණනායකී | GR/51/27/36865 | ඔව් |
| 29 | වසන්තකුමාරි පුනීතවතී | FGR/51/27/22921 | ඔව් |
| 30 | සුදාකර් සිරිතා | FGR/51/27/22922 | ඔව් |
| 31 | සෙල්ලත්තම්බි යෝගමලර් | FGR/51/27/840 | නඩත්තු කරයි |
| 32 | විමලේන්ද්‍රන් ලියානුදන් | FGR/51/27/836 | ඔව් |
| 33 | පෙරියතම්බි රවී | GR/51/27/36860 | ඔව් |
| 34 | දේවරාසා ධනුසියා | FGR/51/27/837 | ඔව් |
| 35 | මයිලිප්පෝඩි ඉලයතම්බි | FGR/51/27/14672 | ඔව් |
| 36 | ගජන් නිලෝජිනී | FGR/51/27/15443 | ඔව් |
| 37 | අලහයියා කන්නිමලර් | FGR/15/27/48 | ඔව් |
| 38 | ගජන්තිනී රංජිත්කුමාර | GR/15/041364 | ඔව් |
| 39 | නවනීදන් කලෛප්‍රියා | GR/15/041352 | ඔව් |
| 40 | වෙට්රිවේල් තම්බිරාජා | GR/15/041351 | ඔව් |
| 41 | තම්බිමුත්තු ලිංගේෂ්වරන් | GR/15/041365 | ඔව් |
| 42 | භූපාලපිල්ලේ සිවකුමාර් | FGR/15/27/14679 | ඔව් |
| 43 | පාලිප්පෝඩි අමලරෝහිණීදේවි | GR/15/04/01369 | ඔව් |
| 44 | සුන්දරරාජා දයානන්දිනී | GR/15/041372 | ඔව් |
| 45 | පෙරියතම්බි සෞන්දරම් | GR/15/041371 | ඔව් |

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

| | | | |
|---|---|---|---|
| 46 | මාර්ක් ජෝර්ජ් | GR/15/034940 | ඔව් |
| 47 | තම්බිමුතු තම්බිපිල්ලේ | GR/15/038572 | නවත්තු කරයි |
| 48 | කලාමෝහන් සිවාජිනී | GR/15/038588 | ඔව් |
| 49 | වේලු ප්‍රකාස් | GR/15/038586 | නවත්තු කරයි |
| 50 | තම්බිරාජා ප්‍රලාවති | GR/15/039736 | ඔව් |
| 51 | මුත්තුලිංගම් වසන්තා | GR/15/039737 | ඔව් |
| 52 | කුමාරසිංහම් මරියනායගම් | GR/15/039738 | ඔව් |
| 53 | සෝමසුන්දරම් සෙල්ලම්මා | FGR/15/27/22568 | ඔව් |
| 54 | සින්නප්පන් ඇන්තනී ජෙගනාදන් | GR/15/039744 | ඔව් |
| 55 | කණපදිපිල්ලේ සිවලිංගම් | GR/15/032794 | ඔව් |
| 56 | කුමාරප්පෝඩි දර්මේස්වරි | GR/15/043093 | නවත්තු කරයි |
| 57 | යෝගේන්ද්‍රන් කර්සිනි | GR/51/27/36903 | ඔව් |
| 58 | අහමදු ලෙබ්බෙ අලියාර් | GR/15/054463 | ඔව් |
| 59 | මොහොමඩ් ඉබ්‍රාහිම් ජෙසීමා | GR/15/050760 | ඔව් |
| 60 | දාවුදු ලෙබ්බෙ ෆාතිමා ෆසියා | GR/15/053472 | නවත්තු කරයි |
| 61 | මොහිදීන් බාවා අහමඩ් ලෙබ්බෙ | GR/15/033146 | නවත්තු කරයි |
| 62 | අහමඩ් ලෙබ්බෙ ජෙමිලා බීබි | GR/15/032798 | ඔව් |
| 63 | දාවුදු ලෙබ්බෙ මොහොමඩ් සන්කීර් | GR/15/032797 | ඔව් |
| 64 | අහමඩ් ලෙබ්බෙ සිත්ති ජමීනා | GR/15/054360 | ඔව් |
| 65 | කච්චි මුහම්මදු උම්මු සල්මා | GR/15/032448 | නවත්තු කරයි |
| 66 | අහමඩ් ලෙබ්බෙ මුහමද් අබුබක්කර් | GR/15/038571 | නවත්තු කරයි |
| 67 | ආදම් ලෙබ්බෙ මුහම්මදු ජමීල් | GR/15/038573 | නවත්තු කරයි |
| 68 | හාලිදු මුහම්මදු ජෙමීල් | GR/15/038574 | නවත්තු කරයි |
| 69 | ඉ. රාවියත්තුම්මා | FGR/51/27/22852 | නවත්තු කරයි |
| 70 | පක්කිර්තම්බි සර්ෆානා බේගම් | FGR/51/27/22885 | ඔව් |
| 71 | ආදම් ලෙබ්බෙ සිත්ති ජරිනා | FGR/51/27/22859 | නවත්තු කරයි |
| 72 | වෙල්ලතම්බි ජම්හිදා | FGR/51/27/22902 | ඔව් |
| 73 | අලියාර් ජනූල් රෂීදා | GR/15/053464 | ඔව් |
| 74 | මුහම්මද් ජුසුෆ් මුහම්මද් අස්කර් | GR/15/038575 | ඔව් |
| 75 | ලතා වීරසිංහම් | GR/15/032796 | ඔව් |
| 76 | කෛලායපිල්ලේ කෝනේසලිංගම් | GR/51/27/36844 | ඔව් |
| 77 | උමා මහේන්ද්‍රන් | GR/51/27/36851 | ඔව් |
| 78 | තෝමස් මනෝසියා | GR/51/27/36864 | ඔව් |
| 79 | දරුමලිංගම් විමලාවතී | GR/51/27/36873 | ඔව් |
| 80 | අලහුමනි කුමාරවේල් | GR/51/27/36890 | ඔව් |
| 81 | රාජේන්ද්‍ර ප්‍රසාද් සුජිතා | GR/51/27/36892 | ඔව් |
| 82 | මාසිලාමනී තවමනී | GR/51/27/36894 | ඔව් |
| 83 | පොන්නම්බලම් විනෝජන් | FGR/51/2722835 | ඔව් |
| 84 | අලහයියා පූරණකුමාර් | GR/51/27/32468 | ඔව් |
| 85 | කෝනේසමනී පීලෝජනා | GR/51/27/32484 | ඔව් |
| 86 | පංචාට්චරම් සෙන්දිල්රාජ් | GR/51/27/32486 | ඔව් |
| 87 | පංචාට්චරම් කින්දූනිජා | FGR/51/27/20179 | ඔව් |
| 88 | සුගන්දිනී දේවේන්ද්‍රා | GR/51/27/32489 | ඔව් |
| 89 | පද්මාවතී සිංගරාසා | FGR/51/2720177 | ඔව් |
| 90 | පරමේශ්වරී ආරුමුගම් | GR/51/27/32491 | ඔව් |
| 91 | ගුණසේකරම් ජයමාලාදේවි | GR/51/27/32492 | ඔව් |
| 92 | කුලසේකරම් පිල්ලේ සිවමනී | FGR/51/27/20176 | ඔව් |
| 93 | වෛරමුත්තු සුසීලාදේවි | FGR/51/27/20180 | ඔව් |
| 94 | අමරසිංහම් සරෝජා | GR/51/27/32497 | ඔව් |
| 95 | රාජා ජූලියස් ගෞරී | GR/51/27/32498 | ඔව් |

| | | | |
|---|---|---|---|
| 96 | රවීන්ද්‍රන් සසිදේවි | GR/51/27/32499 | ඔව් |
| 97 | නල්ලතම්බි විජයලෙට්චුමි | GR/51/27/36804 | ඔව් |
| 98 | කිරුපෛරාසා චන්ද්‍රසෝති | GR/51/27/36806 | ඔව් |
| 99 | ඉලයතම්බි රදිදේවි | GR/51/27/3689 | ඔව් |
| 100 | සින්නරාසා ජෙයප්‍රියා | GR/51/27/36824 | ඔව් |
| 101 | පූබාලපිල්ලේ ලෙට්චුමි | FGR/51/27/22226 | ඔව් |
| 102 | ඉලයතම්බි ගණපතිපිල්ලෛ | FGR/51/27/22419 | ඔව් |
| 103 | පොන්නම්බලම් දරනිමාලා | FGR/51/27/21479 | ඔව් |
| 104 | යෝගරාසා සුවානි | FGR/51/27/14664 | ඔව් |
| 105 | සෙල්ලත්තම්බි විජයරාණි | FGR/51/27/14665 | ඔව් |
| 106 | ප්‍රකාශ් සුලක්ෂණා | FGR/51/27/14234 | ඔව් |
| 107 | ධර්මරංජන් සංගීතා | FGR/51/27/14667 | ඔව් |
| 108 | ඉලයතම්බි රාසමනී | FGR/51/27/14610 | ඔව් |
| 109 | මෝහනසුන්දරම් සුභකාන්ත් | FGR/51/27/14668 | ඔව් |
| 110 | කන්නදාසන් රුශාන්තකුමාරි | FGR/51/27/15448 | ඔව් |
| 111 | රාජජූලියස් වසන්තකෝකිලම් | FGR/51/27/15451 | ඔව් |
| 112 | තිල්ලයම්මා ජෙබනේසන් | FGR/51/27/15456 | ඔව් |
| 113 | රාමක්කුට්ටි පූබාලරත්නම් | FGR/51/27/15515 | ඔව් |
| 114 | නේසරාසා විදූසනා | FGR/51/27/15517 | ඔව් |
| 115 | වේලූප්පිල්ලෙයි විජයකලා | GR/51/27/36847 | නවත්තු කරයි |
| 116 | පෙරියතම්බි ඉරුදයනාදන් | GR/15/053459 | ඔව් |
| 117 | සිවමනි සෙල්වනායගම් | GR/15/053460 | නවත්තු කරයි |
| 118 | තම්බිරාසා කෝකිලදාස් | GR/15/053461 | ඔව් |
| 119 | තෝමස් භවානි | GR/15/039757 | ඔව් |
| 120 | මාසිලාමනී වර්ණකුලසිංහම් | GR/15/038576 | නවත්තු කරයි |
| 121 | සිවකුමාර් සුවන්තිනී | GR/51/27/20724 | ඔව් |
| 122 | තම්බිමුත්තු භාග්‍යවතී | GR/51/27/20725 | ඔව් |
| 123 | නේසරාසා දයානිදි | GR/51/27/20726 | නවත්තු කරයි |
| 124 | සුන්දරලිංගම් මල්ලිකා | GR/15/070704 | ඔව් |
| 125 | තිරුච්චෙල්වම් වසන්ති | GR/15/070712 | ඔව් |
| 126 | සිවජෝදි සිවනේෂ්වරන් | GR/51/27/36837 | ඔව් |
| 127 | සුවිභාකරන් ජෙයරජනීදේවි | GR/51/27/36838 | ඔව් |
| 128 | විනයාගමූර්ති පොන්නම්මා | GR/51/27/36840 | නවත්තු කරයි |
| 129 | දයාලිංගම් රාගිනී | GR/51/27/36842 | ඔව් |
| 130 | තම්බිමුත්තු රාසමනී | GR/51/27/36845 | නවත්තු කරයි |
| 131 | පූරණලිංගම් කමලාවතී | GR/51/27/36811 | ඔව් |
| 132 | නාගමනී කමල්රාජ් | FGR/51/27/838 | ඔව් |
| 133 | ධර්මරාසා ජේසුරාසා | GR/51/27/36825 | ඔව් |
| 134 | සාමිත්තම්බි තම්බිරාසා | FGR/51/27/14754 | ඔව් |
| 135 | කිරුපාකරන් ප්‍රදීපා | GR/51/27/36836 | ඔව් |
| 136 | සීනිත්තම්බි අරුලම්මා | FGR/15/27/22854 | ඔව් |
| 137 | සීනිත්තම්බි නේසරත්තිනම් | FGR/15/27/22566 | ඔව් |
| 138 | පොන්නුතුරෙයි රංජිනී | GR/51/27/36839 | ඔව් |
| 139 | චාන්දනී කේදීස්වරන් | GR/51/27/36889 | ඔව් |
| 140 | මලර්විලි රවීන්ද්‍රන් | GR/51/27/36893 | ඔව් |
| 141 | සුන්දරම් ජීවිතා | GR/51/27/36904 | ඔව් |
| 142 | සංකර් රාමන් | GR/51/27/32061 | නවත්තු කරයි |
| 143 | දේවලිංගම් රේණුකා | GR/51/27/32063 | ඔව් |
| 144 | ධර්මලිංගම් මයිනාවතී | GR/51/27/32475 | ඔව් |
| 145 | කදිරවේලු රවීන්ද්‍රන් | GR/51/27/32476 | ඔව් |

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

| | | | |
|---|---|---|---|
| 146 | සත්‍යසීලන් මංගලේශ්වරී | GR/51/27/32477 | ඔව් |
| 147 | වඩිවෙල් නලිනී | GR/51/27/32478 | නඩත්තු කරයි |
| 148 | සිවරාසා ඉන්බමලර් | GR/51/27/32479 | නඩත්තු කරයි |
| 149 | ගෝපාලපිල්ලේ තංගමනී | GR/51/27/32481 | ඔව් |
| 150 | ජෙයන්තන් වසන්තා | GR/51/27/32482 | ඔව් |
| 151 | සෙල්ලයියා කුබේරලෙච්චුමී | GR/51/27/32483 | ඔව් |
| 152 | දුරෙයප්පා ජයරානි | GR/51/27/36594 | ඔව් |
| 153 | බුවනේන්ද්‍රරාජා චාන්දනී | GR/51/27/36596 | ඔව් |
| 154 | මයිල්වාහනම් මනියම්මා | GR/51/27/36597 | ඔව් |
| 155 | ඇන්තනි මාග්‍රට් | GR/51/27/36807 | ඔව් |
| 156 | බාලසුන්දරම් දසකෝබරන් | GR/51/27/36808 | ඔව් |
| 157 | තම්බිරාසා සාමිත්තම්බි | GR/51/27/36810 | ඔව් |
| 158 | තම්බිමුත්තු නල්ලයියා | GR/51/27/36812 | ඔව් |
| 159 | කරුවල්තම්බි කනහරත්නම් | GR/51/27/36815 | ඔව් |
| 160 | සිවානන්දරාසා භගවතී | GR/51/27/36818 | ඔව් |
| 161 | පොන්නම්බලම් සරස්වතී | GR/15/038584 | ඔව් |
| 162 | සෙල්ලතම්බි නල්ලම්මා | GR/15/041368 | ඔව් |
| 163 | මහේන්ද්‍රරාසා මයුරතන් | GR/15/032795 | නඩත්තු කරයි |
| 164 | තංගරාසා චන්ද්‍රා | GR/15/034942 | නඩත්තු කරයි |
| 165 | තංගරාසා කනකනායකී | GR/15/034941 | නඩත්තු කරයි |
| 166 | ක්‍රිෂ්ණපිල්ලේ මාරිමුත්තු | GR/15/053462 | ඔව් |
| 167 | විනයාගමූර්ති විග්නේශ්වරී | GR/15/054368 | නඩත්තු කරයි |
| 168 | ඉන්ද්‍රානි තිසවීරසිංහම් | GR/51/27/20727 | ඔව් |
| 169 | නාගමනී සුභාකරන් | GR/51/27/36827 | ඔව් |
| 170 | තම්බිරාසා සුන්දරම් | GR/51/27/36834 | ඔව් |
| 171 | මයිල්වාහනම් තංගපාක්කියම් | GR/51/27/36829 | ඔව් |
| 172 | සෙල්වරාසා සුදර්ශිනි | GR/51/27/36830 | ඔව් |
| 173 | මයිල්වාහනම් විජයලෙච්චුමී | GR/51/27/36832 | ඔව් |
| 174 | කන්දසාමි තිරුනාමම් | GR/51/27/36820 | ඔව් |
| 175 | ගෝපාලපිල්ලේ පරමේශ්වරී | GR/51/27/36821 | ඔව් |
| 176 | චින්නතම්බි කෛලායපිල්ලේ | GR/51/27/36826 | ඔව් |
| 177 | කන්දසාමි චන්ද්‍රකුමාර් | GR/51/27/32480 | ඔව් |
| 178 | ඉන්බාදේවි අරුලානන්දම් | GR/51/27/36870 | නඩත්තු කරයි |
| 179 | සෙල්ලතම්බි භවානිදේවි | GR/51/27/36872 | නඩත්තු කරයි |
| 180 | ආරුමුගම් ජීවා | GR/51/27/36817 | ඔව් |
| 181 | චන්ද්‍රබෝස් රංජිත් නික්ෂන් | FGR/51/27/19241 | ඔව් |
| 182 | සුබ්‍රමනියම් ශාන්තකුමාරි | GR/15/034943 | ඔව් |
| 183 | යෝගනාදන් තවම් | FGR/51/27/21483 | ඔව් |
| 184 | අලියාර් මුහම්මදු නාච්චි | GR/15/043087 | නඩත්තු කරයි |
| 185 | ප්‍රේමදීපන් සුමත්‍රා | GR/51/27/36814 | නඩත්තු කරයි |
| 186 | පොන්නම්බලම් තවරාසා | GR/51/27/36816 | ඔව් |
| 187 | තම්බිරාසා සිරිදේවි | FGR/51/27/22858 | නඩත්තු කරයි |
| 188 | සබාපතිපිල්ලේ සිවම් | GR/51/27/36871 | ඔව් |
| 189 | කන්දයියා ජෙයජෝති | FGR/51/27/22864 | ඔව් |
| 190 | චන්ද්‍රාමනී රත්තිනසිංහම් | FGR/51/27/22832 | ඔව් |
| 191 | විජයරත්නම් විජයදර්ෂිණී | GR/51/27/36867 | ඔව් |
| 192 | පාලිප්පෝඩි මෝට්ටනාදන් | GR/51/27/36848 | ඔව් |
| 193 | නොබිල්මරියසීලන් ජෙයරානි | GR/51/27/36857 | ඔව් |
| 194 | අබ්දුල්කරීම් කුසලකුමාරි | GR/51/27/36843 | නඩත්තු කරයි |
| 195 | යෝගරාසා සෙන්දිල්සෙල්වන් | GR/51/27/36828 | නඩත්තු කරයි |

| | | | |
|---|---|---|---|
| 196 | කන්දයියා කුලන්දෙ වඩිවේල් | GR/51/27/20728 | ඔව් |
| 197 | මෝහන් දිව්‍යා | GR/51/27/20729 | නවත්තු කරයි |
| 198 | සුරේෂ්කුමාර් සුමංගලා | GR/51/27/20730 | ඔව් |
| 199 | ගුණේන්ද්‍රන් වනජා | GR/51/27/20731 | ඔව් |
| 200 | ගුණේන්ද්‍රන් ගිරිජා | GR/51/27/20732 | ඔව් |
| 201 | කන්දසාමි උදයරාණි | GR/51/27/20733 | ඔව් |
| 202 | බුවනේශ්වරි මාර්කණ්ඩු | GR/51/27/20734 | ඔව් |
| 203 | නන්දකුමාර් ප්‍රේමකුමාරි | GR/51/27/20735 | නවත්තු කරයි |
| 204 | විශ්වලිංගම් නන්දිනී | GR/51/27/20736 | ඔව් |
| 205 | යෝගරාසා රවිචන්ද්‍රන් | GR/51/27/20737 | ඔව් |
| 206 | සිවනායකම් නිර්මලාදේවි | GR/51/27/20738 | ඔව් |
| 207 | ගනේෂන් දයාලේශ්වරි | GR/15/032446 | ඔව් |
| 208 | තවමනි ක්‍රිෂ්ණමූර්ති | GR/15/053465 | ඔව් |
| 209 | කන්දයියා නඩරාජා | GR/15/053466 | ඔව් |
| 210 | සුන්දරලිංගම සුභාජිනී | GR/15/053467 | ඔව් |
| 211 | මානිකප්පෝඩි තංගේශ්වරී | GR/15/053468 | ඔව් |
| 212 | සංකරපිල්ලෙයි රාජසිංහම් | GR/15/053469 | ඔව් |
| 213 | වේලු උදයකුමාර් | GR/15/053470 | ඔව් |
| 214 | තියාගරාසා දසමුහරාසා | GR/15/053471 | ඔව් |
| 215 | ආරුමුගම් වනසාසනි අම්බාල් | GR/15/034944 | ඔව් |
| 216 | සෝමසුන්දරම් ජෙයන්තිරන් | GR/15/032447 | ඔව් |
| 217 | තිරුචෙල්වම් සුචිත්‍රා | GR/15/038582 | ඔව් |
| 218 | ප්‍රමියා සුත්තානන්දම් | GR/15/032449 | ඔව් |
| 219 | ගජේන්දිනී දයාලන් | GR/15/038577 | ඔව් |
| 220 | නඩරාජා සර්මිලා | GR/15/038581 | ඔව් |
| 221 | පංචනාදන් නිදිකලා | GR/15/038579 | ඔව් |
| 222 | චන්ද්‍රකුමාරි ජෙයනාදන් | GR/15/038578 | නවත්තු කරයි |
| 223 | සෙල්ලන් ගෝවින්දන් | FGR/51/27/11443 | නවත්තු කරයි |
| 224 | සාමිත්තම්බි මීනලෝසනී | FGR/51/27/14758 | ඔව් |
| 225 | කේදීස්වරන් නිලෝජිනී | FGR/51/27/14675 | ඔව් |
| 226 | සිවරාසා සංගවි | FGR/51/27/14669 | ඔව් |
| 227 | සසිකුමාර් ලනුජිකා | FGR/51/27/14756 | ඔව් |
| 228 | ක්‍රිෂ්ණපිල්ලේ තේවරාසා | GR/15/034943 | ඔව් |

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෛපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලවකවානුව තුළ රජයේ ඉඩම් සඳහා ලබා දුන් බලපත්‍ර ඉඩම්වල පදිංචි පුද්ගලයන්ගේ නාම ලේඛනය ඇමුණුම II ලෙස ඉදිරිපත් කරමි.

දීර්ඝ පිලිතුරක් සහිත ඇමුණුම II **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "උරුමය" වැඩසටහන තවම ක්‍රියාත්මක වෙනවා ද, නැද්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, "උරුමය" නිදහස් දීමනා පත්‍ර ලබා දීමේ ජාතික වැඩසටහන සම්බන්ධයෙන් නීතිමය ගැටලුවක් තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කැබිනට් මණ්ඩලය විසින් විද්වත් කමිටුවක් පත් කළා. ඒ විද්වත් කමිටුවේ වාර්තාව ඉදිරිපත් කළා. ඒ වාර්තාව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබෙනවා. මේ සඳහා නීතිපතිගේ උපදෙස් ගන්න කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙනවා. ඒ නිසා තමයි මේ වැඩසටහන තාවකාලිකව නවත්වා තිබෙන්නේ. නීතිපතිගේ උපදෙස් ලැබුණු වහාම අපි ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න සූදානම්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මහ නගර සභා, නගර සභා බල ප්‍රදේශවලත් විශාල දුප්පත් ප්‍රදේශ තිබෙනවා. නමුත්, ඒ ප්‍රදේශවලට මේ "උරුමය" වැඩසටහන ක්‍රියාත්මක වුණේ නැහැ. මේ Land Grant එක දෙන්නේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට විතරයි. මහ නගර සභා, නගර සභා තුළ තිබෙන දුප්පත් ගම්මානවලටත් මේ "උරුමය" වැඩසටහන ක්‍රියාත්මක කරන්න, නැත්නම් මේ Land Grants දෙන්න ඔබතුමා කටයුතු කරනවා ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, "උරුමය" නිදහස් දීමනා බලපත්‍ර ලබා දීමේ ජාතික වැඩසටහන තාවකාලිකව නවත්වා තිබෙන නිසා මම ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙන එක ඇත්තටම ගැළපෙන්නේ නැහැ. නමුත්, එතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරක් ලබා දිය යුතු වෙනවා. මහ නගර සභා විධියට ගැසට් කළාට පස්සේ ඒවාට අදාළ සියල්ලටම අපි දෙන්නේ දීර්ඝ කාලීන බලපත්‍ර. යම් කෙනෙක් නිවසක් හදාගෙන ඉන්නවා කියමුකෝ. ඒ අයට දීර්ඝ කාලීන බලපත්‍රයක් දුන්නාම, ඒ අය අවුරුදු 30ක් මුදල් ගෙවලා ඉවර වුණාම සින්නක්කර ඔප්පු හම්බ වෙනවා. එම නිසා මම දන්නා විධියට නිදහස් දීමනා පත්‍රයක් දෙන්න බැහැ, බදු මුදල් ගෙවන කෙනෙකුට. ඔහු ඒ බදු මුදල ගෙවන්න එපායැ. බදු ගෙවලා ඉවර වුණාම තමයි ඔහුට ඒක අයිති වෙන්නේ. නමුත්, ප්‍රාදේශීය සභා බලප්‍රදේශවල එහෙම නොවෙයි. එහිදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නොමිලේ ඉඩමක් දෙන්න පුළුවන් ගොවි පන්තියේ උදවියට. නමුත්, මහ නගර සභා සීමාව ඇතුළේ සිටින අය ගොවි පන්තියේ උදවිය කියලා සැලකෙන්නේ නැහැ. ඒක වෙන්න පුළුවන් ඒ තිබෙන ගැටලුව. කෙසේ වෙතත්, "උරුමය" වැඩසටහන තාවකාලිකව නවත්වා තිබෙන නිසා අපට එතුමාගේ ඉල්ලීම ගැන බලන්න වෙන්නේ ඒකට නිශ්චිත තීරණයක් ආවාට පස්සේ තමයි, ගරු කථානායකතුමනි.

## පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළබඩ තීරයේ මත් ද්‍රව්‍ය ජාවාරම: වැළැක්වීම
## புத்தளம் மாவட்டத்தின் கடற்கரைப் பகுதியில் போதைவஸ்து கடத்தல்: தடுத்தல்
## SMUGGLING OF NARCOTICS IN COASTAL BELT OF PUTTALAM DISTRICT: PREVENTION

957/2025

**10.ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය කාලයේදී, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරයෙන් නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය, මත්කුඩු හා වෙනත් භාණ්ඩ රට තුළට ගෙන් වූ බවත්;

(ii) එම නීති විරෝධී ක්‍රියා මේ වන විටත් සිදු කරමින් පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது மக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தின் கடற்கரை வழியாக, கடந்த காலத்தில் சட்டவிரோதமான முறையில் போதைவஸ்துகள், போதைப்பொருட்கள் மற்றும் பிற பொருட்கள் நாட்டுக்குள் கொண்டுவரப்பட்டு உள்ளதையும்;

(ii) அத்தகைய சட்டவிரோதச் செயல்கள் இன்றளவிலும் மேற்கொள்ளப்படுவதையும்;

அவர் அறிவாரா?

(ஆ) அவ்வாறாயின், அந்த நிலைமையைத் தடுப்பதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Is he aware of that -

(i) narcotics, intoxicants and other substances were illegally brought into the country from the coastal belt of the Puttalam District during recent past; and

(ii) the illegal activities referred to above are still being carried out?

(iii) If so, will he inform this House of the measures that will be taken to prevent the situation referred to above ?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) වරින් වර එවැනි අවස්ථා නිරීක්ෂණය වේ.

(ආ) * හලාවත කොට්ඨාසයේ, වෙන්නප්පුව සිට පුත්තලම කොට්ඨාසයේ වනාතවිල්ලුව පොලිස් බල ප්‍රදේශය දක්වා වූ වෙරළ තීරයේ මුහුදු මාර්ගයෙන් නීති විරෝධී මත්ද්‍රව්‍ය ඇතුළු නීති විරෝධී භාණ්ඩ රැගෙන එන බැවින්, එම මුහුදු ප්‍රදේශ ආවරණය වන පරිදි ඒ ඒ පොලිස් ස්ථාන මඟින් රාත්‍රී ජංගම සංචාර, දිවා යතුරු පැදි සංචාර හා වෙනත් සංචාර මඟින් සැක කටයුතු පුද්ගලයන් හා වාහන පරීක්ෂාව සිදු කිරීම සහ පෞද්ගලික ඔත්තුකරුවන්, බුද්ධි අංශ නිලධාරීන් හා විශේෂ කාර්යාංශ නිලධාරීන් මඟින් තොරතුරු ලබා ගනිමින් මෙහෙයුම් සිදු කිරීමද, නාවික හමුදා නිලධාරීන්ගේද සහාය ලබා ගනිමින් වැටලීම් රාජකාරි සිදු කිරීම.

* ස්ථිර මාර්ග බාධක හා ක්ෂණික මාර්ග බාධක මඟින් නිරතුරුව වාහන හා පුද්ගලයන් පරීක්ෂා කිරීම්වලට ලක්වන අතර, ඒ මඟින් මුහුදු මාර්ග ඔස්සේ ගෙන එනු ලබන මත්ද්‍රව්‍ය හා වෙනත් නීති විරෝධී ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

* නාවික හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය අතර ඒකාබද්ධ මෙහෙයුම් වැඩි කිරීමට පියවර ගැනීම හා මනා සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

* ධීවර තොටුපොළ පරීක්ෂා කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

* මහජන ආරක්ෂක කමිටු මඟින් හා ඔත්තුකරුවන් මඟින් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පෙර වැරදිකරුවන් සම්බන්ධව තොරතුරු ලබා ගැනීමේ ක්‍රමයක් සකස් කර තිබීම.

* වෙරළ තීරය  ආශ්‍රිත මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩලීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ නිලධාරින් විසින් එම ප්‍රදේශ ආවරණය වන පරිදි නිරන්තර විමර්ශන හා ආවේක්ෂණ රාජකාරි සඳහා නිලධාරින් යොමු කරමින් විෂ මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු අඩාළ කිරීමට හා ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම.

* විෂ මත්ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, ජාවාරම් කිරීම සහ ඊට අනුබල දීම සම්බන්ධයෙන් වන ආදීනව පිළිබඳව ධීවර ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය හා එක්ව පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් වැඩසටහනක් සකස් කර ඇති අතර, එය ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට නියමිතව ඇත.

* ශ්‍රී ලංකා පොලීසිය සඳහා වෙරළ තීරයේ ගමන් කළ හැකි වාහන - ATV / UTV - ලබා ගැනීමට අවශ්‍ය වැඩ කටයුතු ආරම්භ කිරීම.

(ඇ) පැන නොනඟී.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

එම වෙරළ තීරය ඉතිහාසයේ ඉඳලාම ජාවාරම්වලටම ප්‍රසිද්ධ වෙරළ තීරයක් බව අපි දන්නවා. මේ වෙනකොටත් ඒ ක්‍රියාවලිය බරපතළ විධියට සිදු වෙනවා. ඊයේත් මත්කුඩු සහ මත්ද්‍රව්‍යවලට අමතරව ඖෂධ සහ වෙනත් සායනික භාණ්ඩ ප්‍රමාණයක් ඒ ප්‍රදේශයට ගෙනැල්ලා තිබුණා, අපි දැක්කා. මම හිතන විධියට කිලෝ 800ක විතර එන්නත් සහ ඖෂධ ප්‍රමාණයක් ගෙනැල්ලා තිබුණා. ඒ විධියට ගත්තාම විෂ මත්ද්‍රව්‍ය වාගේම අනෙකුත් දේවලුත් ගොඩක් ගෙනෙනවා. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව වෙන්න පුළුවන්, දෛනිකව එවැනි ද්‍රව්‍ය  ගෙනෙන බවට තමයි අපට තොරතුරු ලැබී තිබෙන්නේ. මේ අත්අඩංගුවට ගන්නා ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයක් ඒ ප්‍රදේශවලට ගෙනෙන බවට තොරතුරු තිබෙනවා.

මම ඔබතුමාගෙන් අහන ප්‍රශ්නය මේකයි. මේ විධියට වැටලීම් කරලා අත්අඩංගුවට ගන්නා ද්‍රව්‍ය භාර දීමේදී රේගු පනත අනුව තමයි ඔවුන්ට වැඩ කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. එක්කෝ නාවික හමුදාවෙන් ඒ භාණ්ඩ ගෙනෙන්න ඕනෑ, රේගුවට. හැබැයි ඒ ක්‍රියාවලියේදී ඔවුන් මුහුණ දෙන අපහසුතා තිබෙනවා. එක්කෝ, පොලීසියට භාර දෙනවා. එහෙම නැත්නම් සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට භාර දෙනවා. අපට දැනෙන විධියට ඒ ක්‍රියාවලියේ තිබෙන අවිධිමත් බව නිසා ඒ වැටලීම් හරියට සිදු වෙන්නේ නැහැ.

Sri Lanka Customs office එකක් දලුව ප්‍රදේශයේ තිබුණත්, ඒ ක්‍රියාවලියේ අඩුපාඩු නිසා එතැන ඒ භාණ්ඩ භාර ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. එම නිසා Sri Lanka Customs office එකක් පුත්තලම් දිස්ත්‍රික්කයට; ඒ ප්‍රදේශයට යොදවලා මේ සම්බන්ධව කටයුතු කරන්න විධිමත් වැඩ පිළිවෙළක් තිබෙනවාද කියා මම අහන්න කැමැතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරලා විධිමත් වැඩ පිළිවෙළක් යොදන්න කටයුතු කරන්නම්. මේ අවස්ථාවේ මම ප්‍රකාශ කළේ පොලිස් දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන සහ නාවික හමුදාව ඒකාබද්ධව කරන වැටලීම් සම්බන්ධයෙන්. කෙසේ වුවත්, ගරු මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කරලා ඒ වැඩ පිළිවෙළ විධිමත් කරන්න කටයුතු කරන්නම්.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අමාත්‍යතුමනි.

අපි දන්නවා, Indian bottom trawling නිසා එක පැත්තකින් මේ සීමාවට බලපෑමක් තිබෙන බව. අනෙක් කාරණය තමයි, බෝට්ටුවලිනුත් මත් ද්‍රව්‍ය සහ නීති විරෝධී භාණ්ඩ රැගෙන එනවා කියලා නාවික හමුදාව පැත්තෙන් අපට වාර්තා කරනවා. හැබැයි, ඒ අයට ඒ පුද්ගලයන් අත්අඩංගුවට ගන්න බැහැ. මොකද, විශාල බෝට්ටු පරීක්ෂා කිරීමට නොහැකි නිසා. ඒ නිසාම මේ ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා. මේ සැම දෙයක්ම ගත්තාම, ඔබතුමා පැහැදිලි කළා වාගේම මේ කලාපය තුළ විශේෂ මෙහෙයුමක් විධියට කෙටි කාලීන මෙහෙයුමක් දියත් කරලා මේ අත්අඩංගුවට ගැනීම් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. මේ සඳහා කඩිනමින් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා ඉල්ලනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, පසුගිය සතියේ දිනෙකත් අපි කල්පිටිය ප්‍රදේශය ආශ්‍රිතව සෝදිසි මෙහෙයුම් දියත් කළා, ත්‍රිවිධ හමුදාව ඒකාබද්ධ කරගෙන. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදිම ඉදිරි කාලයේදී නාවික හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් - ඒ සියලු ආයතන - ඒකාබද්ධව -ධීවර අමාත්‍යාංශය සමඟ අපි සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා- විෂ මත් ද්‍රව්‍ය මෙරටට පැමිණීම වාගේම නීති විරෝධී භාණ්ඩ මෙරටට පැමිණීම සම්බන්ධයෙන් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් සකස් කරන්න කටයුතු කරන බව මේ ගරු සභාවට දැනුම් දීමට කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## තාක්ෂණ, විද්‍යා සහ ගණිත විෂය ධාරා හැදෑරීම ප්‍රවර්ධනය: මාතලේ දිස්ත්‍රික්කය
## தொழில்நுட்பம், விஞ்ஞானம் மற்றும் கணித பிரிவுகளில் கல்வி கற்பதை மேம்படுத்துதல்: மாத்தளை மாவட்டம்
## PROMOTION OF STUDY OF TECHNOLOGY, MATHEMATICS AND SCIENCE STREAMS: MATALE DISTRICT

806/2025

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් අ.පො.ස (උ. පෙළ) සඳහා තාක්ෂණ, ගණිත සහ විද්‍යා යන අංශවලින් පන්ති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) මාතලේ දිස්ත්‍රික්කයේ තාක්ෂණ, විද්‍යා සහ ගණිත යන විෂය ධාරා හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்திலுள்ள அரசாங்கப் பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளுள் தொழில்நுட்பம், கணிதம் மற்றும் விஞ்ஞானம் ஆகிய பிரிவுகளில் க.பொ.த. (உ/த) வகுப்புகள் நடைபெறுகின்ற பாடசாலைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iv) மாத்தளை மாவட்டத்தில் தொழில்நுட்பம், விஞ்ஞானம் மற்றும் கணித பிரிவுகளில் கல்வி கற்பதை மேம்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of government schools in the Matale District;

(ii) number of those that conduct classes in Technology, Mathematics and Science streams for G.C.E.(A/L), among the schools referred to above;

(iii) names of those schools; and

(iv) steps that will be taken to promote taking up the Technology, Mathematics and Science streams for G.C.E.(A/L) in the Matale District?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව 310කි.

(ii)

| පන්ති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව | අ.පො.ස. (උ.පෙළ) | | |
|---|---|---|---|
| | තාක්ෂණ අංශය | ගණිත අංශය | විද්‍යා අංශය |
| | 14 | 19 | 20 |

(iii) අ.පො.ස (උ/පෙළ) තාක්ෂණ අංශය පන්ති පැවැත්වෙන පාසල් නාමලේඛනය ඇමුණුම 01 මඟින්ද,

අ.පො.ස (උ/පෙළ) ගණිත අංශය පන්ති පැවැත්වෙන පාසල් නාමලේඛනය ඇමුණුම 02 මඟින්ද,

අ.පො.ස (උ/පෙළ) විද්‍යා අංශය පන්ති පැවැත්වෙන පාසල් නාමලේඛනය ඇමුණුම 03 මඟින්ද,

ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස(උ.පෙළ) තාක්ෂණ අංශ පන්ති පැවත්වෙන පාසල් නාම ලේඛණය

| S/N | School Censu No | School Name | Province | District | Zone | Division |
|---|---|---|---|---|---|---|
| 1 | 04003 | RANGIRI DAMBULLA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Dambulla |
| 2 | 04040 | MEDABEDDA M.V. | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 3 | 04062 | GALEWELA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 4 | 04093 | NAULA SRI NAGA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Naula | Naula |
| 5 | 04119 | NAMINI OYA M.M.V. | 2.Central | 22.Matale | Wilgamuwa | Wilgamuwa |
| 6 | 04175 | MATALE ST. THOMES COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 7 | 04180 | GOVERNMENT SCIENCE COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 8 | 04204 | KAIKAWALA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Rattota |
| 9 | 04260 | MATALE ZAHIRA COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 10 | 04262 | PAKKIYAM NATIONAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 11 | 04263 | UKUWELA AJMEER NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Ukuwela |
| 12 | 04265 | RATTOTA HINDU MAHA VIDYALAYAM | 2.Central | 22.Matale | Matale | Rattota |
| 13 | 04266 | MATALE HINDU NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 14 | 04316 | AKURAMBODA WEERA KEPPETIPOLA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Galewela | Pallepola |

ඇමුණුම 02

මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස(උ.පෙළ) ගණිතඅංශ පන්ති පැවත්වෙන පාසල් නාම ලේඛණය

| S/N | School Censu No | School Name | Province | District | Zone | Division |
|---|---|---|---|---|---|---|
| 1 | 04003 | RANGIRI DAMBULLA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Dambulla |
| 2 | 04044 | MAHABODHI SECONDARY SCHOOL | 2.Central | 22.Matale | Galewela | Pallepola |
| 3 | 04062 | GALEWELA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 4 | 04093 | NAULA SRI NAGA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Naula | Naula |
| 5 | 04119 | NAMINI OYA M.M.V. | 2.Central | 22.Matale | Wilgamuwa | Wilgamuwa |
| 6 | 04172 | MATALE SRI SANGAMITHTHA BALIKA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 7 | 04173 | MATALE VIJAYA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 8 | 04175 | MATALE ST. THOMES COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 9 | 04179 | YATAWATTA WEERAPARAKRAMA SECONDARY SCHOOL | 2.Central | 22.Matale | Matale | Yatawatta |
| 10 | 04180 | GOVERNMENT SCIENCE COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 11 | 04189 | MATALE CHRIST CHURCH COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 12 | 04204 | KAIKAWALA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Rattota |
| 13 | 04260 | MATALE ZAHIRA COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 14 | 04261 | MATALE AMINA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 15 | 04262 | PAKKIYAM NATIONAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 16 | 04263 | UKUWELA AJMEER NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Ukuwela |
| 17 | 04264 | AL-FURKHAN MUSLIM M.V. | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 18 | 04266 | MATALE HINDU NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 19 | 04316 | AKURAMBODA WEERA KEPPETIPOLA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Galewela | Pallepola |

ඇමුණුම 03

මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස(උ.පෙළ) විද්‍යා අංශ පන්ති පැවත්වෙන පාසල් නාම ලේඛණය

| S/N | School Censu No | School Name | Province | District | Zone | Division |
|---|---|---|---|---|---|---|
| 1 | 04003 | RANGIRI DAMBULLA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Dambulla |
| 2 | 04044 | MAHABODHI SECONDARY SCHOOL | 2.Central | 22.Matale | Galewela | Pallepola |
| 3 | 04062 | GALEWELA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 4 | 04093 | NAULA SRI NAGA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Naula | Naula |
| 5 | 04119 | NAMINI OYA M.M.V. | 2.Central | 22.Matale | Wilgamuwa | Wilgamuwa |
| 6 | 04172 | MATALE SRI SANGAMITHTHA BALIKA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 7 | 04173 | MATALE VIJAYA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 8 | 04175 | MATALE ST. THOMES COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 9 | 04176 | MATALE VIJAYAPALA MAHA VIDYALAYA | 2.Central | 22.Matale | Matale | Matale |
| 10 | 04179 | YATAWATTA WEERAPARAKRAMA SECONDARY SCHOOL | 2.Central | 22.Matale | Matale | Yatawatta |
| 11 | 04180 | GOVERNMENT SCIENCE COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 12 | 04189 | MATALE CHRIST CHURCH COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 13 | 04204 | KAIKAWALA CENTRAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Rattota |
| 14 | 04260 | MATALE ZAHIRA COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 15 | 04261 | MATALE AMINA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 16 | 04262 | PAKKIYAM NATIONAL COLLEGE | 2.Central | 22.Matale | Matale | Matale |
| 17 | 04263 | UKUWELA AJMEER NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Ukuwela |
| 18 | 04264 | AL-FURKHAN MUSLIM M.V. | 2.Central | 22.Matale | Galewela | Galewela |
| 19 | 04266 | MATALE HINDU NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Matale | Matale |
| 20 | 04316 | AKURAMBODA WEERA KEPPETIPOLA NATIONAL SCHOOL | 2.Central | 22.Matale | Galewela | Pallepola |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(iv) • අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරා තෝරාගැනීම සම්බන්ධව 9 වන ශ්‍රේණි සිසුන් දැනුවත් කිරීම - පාසල්/ කලාප මට්ටමින් සිදු කිරීම.

• එම විෂය ධාරා හැදෑරීම මඟින් අනාගතයේ පිවිසිය හැකි වෘත්තීන් පිළිබඳව දැනුවත් කිරීම.

• අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් සිසුන් උසස් පෙළ තාක්ෂණ, ගණිත සහ විද්‍යා විෂය ධාරා සඳහා දිශානතිමුඛ කිරීම.

• ගුරු තුලනය මඟින් පාසල්වල ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම.

• විෂය කඳවුරු/ ප්‍රායෝගික පරීක්ෂණ කඳවුරු පැවැත්වීම.

• තෝරාගත් විෂය ධාරාවන් සඳහා ගුරු භවතුන් පුහුණු කර පාසල් වෙත යෙදවීම.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### යෞවන සමාජ පිහිටුවීම සහ ප්‍රතිසංවිධානය කිරීම
### இளைஞர் கழகங்களை ஸ்தாபித்தலும் மறுசீரமைத்தலும்
### ESTABLISHMENT AND REORGANIZATION OF YOUTH CLUBS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, මෑතකදී ජාතික තරුණ සේවා සභාව විසින් නිකුත් කළ අංක තසං.සං./2-11/25/01 දරන චක්‍රලේඛය මඟින් 2025 මැයි 23 දිනට පෙර පිහිටුවා තිබූ සියලු යෞවන සමාජවල නීත්‍යානුකූලභාවය අහෝසි කර, නව යෞවන සමාජ පිහිටුවීමේ හෝ ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර තිබෙනවා. එහිදී සියලු යෞවන සමාජ දේශපාලනීකරණයට ලක්කොට ඇති බවට ආණ්ඩුවට චෝදනා රැසක් එල්ල වී තිබෙනවා.

විශේෂයෙන්ම මෙහිදී දේශපාලන වුවමනාව මත යෞවන සමාජ සඳහා විධායක නිලධාරීන් පත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් දියත් වන බවට ඉතාම පැහැදිලිව සාක්ෂි සහිතව තොරතුරු වාර්තා වෙනවා. මෙය යෞවන සමාජ පද්ධතියේ ස්වෛරීභාවය හා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් ක්‍රියාත්මක වීම අවදානමකට ලක් කරමින් නව නියෝග මාලාව මඟින් දේශපාලන හිතවතුන් සඳහා වාසියක් ලබා දීමේ උත්සාහයක් බව බොහොම පැහැදිලිව පෙනී යනවා. එම නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුව මෙම සභාවට කරුණු දැක්වීමක් සිදු කළ යුතු යැයි අවධාරණය කර සිටිනවා. ඒ අනුව, පහත සඳහන් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් රජයෙන් බලාපොරොත්තු වෙනවා.

01. ජාතික තරුණ සේවා සභාව විසින් අංක තසං.සං./2-11/25/01 යටතේ නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව නව යෞවන සමාජ පිහිටුවීමට හෝ ප්‍රතිසංවිධානයට කටයුතු කිරීමේදී යෞවන සමාජ දේශපාලනීකරණයකට ලක්කොට ඇති බවට එල්ල වන චෝදනා රජය පිළිගන්නේද?

02. නොඑසේ නම්, දිවයිනේ බොහෝ යෞවන සමාජවල (කළුතර, පොළොන්නරුව, බදුල්ල, කෑගල්ල, ගම්පහ, හම්බන්තොට, නුවරඑළිය, කොළඹ ඇතුළු ප්‍රදේශ ගණනාවක) විධායක තනතුරු සඳහා ආණ්ඩුව සිය දේශපාලන හිතවතුන් පමණක් පත් කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් දියත් කිරීම යෞවන සමාජ දේශපාලනීකරණය කිරීමක් නොවන්නේද?

03. නැතහොත්, ජාතික තරුණ සේවා සභාව විසින් නිකුත් කර ඇති 2025.05.16 දිනැති ලිපිය මඟින් 2025.05.23 දිනට පෙර පිහිටුවා ඇති සියලු යෞවන සමාජවල නීත්‍යානුකූලභාවය අහෝසි කොට නව යෞවන සමාජ පිහිටුවීම හෝ ප්‍රතිසංවිධානය කිරීමේ ආණ්ඩුවේ මූලික පරමාර්ථය කුමක්ද?

04. ජාතික තරුණ සේවා සභාව විසින් සමස්ත යෞවන සමාජ සඳහා බලපැවැත්වෙන පරිදි එක් ස්ථාවර නියෝග මාලාවක් ඉදිරිපත් කර තිබේද? එම ස්ථාවර නියෝග මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

05. ජාතික තරුණ සේවා සභාව මඟින් ඉදිරිපත් කර ඇති නව ස්ථාවර නියෝග මඟින් යෞවන සමාජයක විධායක තනතුරක් දැරීම සඳහා අවම වශයෙන් වසර 2ක් හෝ කාලයක් ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් කටයුතු කළ යුතු බවට වන නියෝග වෙනස් කොට ඇත්තේද? එය හුදෙක් සිය දේශපාලන හිතවතුන් යෞවන සමාජයේ විධායක තනතුරු සඳහා පත් කර ගැනීමට සිදු කළ ක්‍රියාදාමයක් නොවන්නේද? එය යෞවන සමාජ ව්‍යවස්ථාව අතික්‍රමණය කිරීමක් වශයෙන් රජය පිළිගන්නේද?

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම දේශපාලනීකරණයට ලක්වීම නිසා ඇති වූ මෙම සිදුවීම් සියල්ලක්ම ලේඛනගත වෙලා තිබෙනවා. එම ලේඛන සභාගත කරන්නට මම බලාපොරොත්තු වෙනවා. නාරම්මල, මාවනැල්ල, නුවරයාය, කෑගල්ල, රඹුක්කන, උඩුගම වැනි ස්ථාන කිහිපයක් ගැන විතරයි මම සඳහන් කරන්නේ. එම තොරතුරුවලට අදාළ ලේඛන ටික මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මේ පිළිබඳව නිශ්චිත පිළිතුරක් අදාළ අමාත්‍යවරයාගෙන් මම මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙනවා. එම පිළිතුර ගැන පෙරළා ප්‍රශ්න කරන්නටත් මට අවස්ථාව ලබා දෙන්න කියලා මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු එරංග ගුණසේකර මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Youth Affairs)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. පිළිනොගනී. අංක තසං.සං./2-11/25/01 චක්‍රලේඛය මඟින් දේශපාලනීකරණයක් සිදුකර නොමැත.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

02. වයස අවුරුදු 15-29 අතර තරුණ තරුණියන් සම්බන්ධ කරගනිමින් දිවයින පුරා යෞවන සමාජ පිහිටුවා, තරුණ තරුණියන්ගේ බහුතර ඡන්දයෙන් තේරී පත්වන තරුණ තරුණියන් ප්‍රාදේශීය මණ්ඩලවලටත්, දිස්ත්‍රික් මණ්ඩලවලටත් තෝරා පත් කර ඇත. මෙම ක්‍රියාවලිය තරුණ තරුණයන් අතර පවත්වන ඡන්දයක් මාර්ගයෙන් සිදුකරන අතර, මෙය කිසිදු දේශපාලන ක්‍රියාවලියකට හෝ හිතවත්භාවයකට හෝ පදනම්ව සිදු කරන ක්‍රියාවලියක් නොවන බව ඉතා පැහැදිලිව සඳහන් කරමි.

03. සෑම වසරකම යෞවන සමාජ සම්මේලනය ප්‍රතිසංවිධානය කිරීම ජාතික තරුණ සේවා සභාවේ සාමාන්‍ය ක්‍රියාවලියක් වන අතර එහිදී ක්‍රියාකාරී යෞවන සමාජ ප්‍රතිසංවිධානයත්, ක්‍රියාකාරී නොවන යෞවන සමාජ අලුතින් පිහිටුවීමත් සිදු කරනු ලබයි. ඒ අනුව, නව වසර සඳහා යෞවන සමාජ පිහිටුවීමට හෝ ප්‍රතිසංවිධානය කිරීමට තරුණ සේවා නිලධාරින්ට බලය ලැබෙන්නේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් විසින් චක්‍රලේඛයකින් බලය ලබා දීමෙන් පසුව වේ. ඒ අනුව, 2025 වර්ෂයේදීත් ජාතික තරුණ සේවා සභාවේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛවලට යටත්ව සක්‍රිය යෞවන සමාජ ප්‍රතිසංවිධානය හා සක්‍රිය නොවන යෞවන සමාජ වෙනුවට නව යෞවන සමාජ පිහිටුවීමත් සිදුකර ඇත.

04. මෙම යෞවන සමාජ පිහිටුවීමේ ක්‍රියාවලිය සඳහා ස්ථාවර නියෝග මාලාවක් නිකුත් කර ඇති අතර, එය සභා සම්මත කිරීම හෝ එයට තවදුරටත් ස්ථාවර නියෝග එකතු කිරීමට යටත්ව ජාතික තරුණ සේවා සභාව විසින් ස්ථාවර නියෝග නිකුත් කර ඇත.

05. යෞවන සමාජයක විධායක තනතුරක් දැරීම සඳහා අවම වශයෙන් වසර දෙකක කාලයක් ක්‍රියාකාරී සාමාජිකත්වය දැරිය යුතුය යන්න සම්බන්ධ කිසිදු නියෝගයක් නොමැති අතර, මේ වසරේදී ඉදිරිපත් කර ඇති චක්‍රලේඛ මඟින් සෑම තරුණයෙකුටම යෞවන සමාජ ව්‍යාපාරයට ඇතුළත්වීමට ඉඩ ප්‍රස්ථාව විවර කර ඇත. ඒ තුළින් ව්‍යවස්ථාවට හා චක්‍රලේඛවලට අනුකූලව තරුණ තරුණියන්ට තනතුරු දැරීමට ඇති අයිතිය තහවුරු කර ඇත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට එක් පැහැදිලි කර ගැනීමකට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්තුතියි.

විශේෂයෙන්ම මේ ප්‍රශ්නය අපි ඉදිරිපත් කළේ මේ නිසායි. ග්‍රාම නිලධාරි වසමෙන් බිහි වෙලා, ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට, දිස්ත්‍රික් මට්ටමට, ඉන් පසුව ජාතික මට්ටමට එන යෞවන සමාජ ක්‍රියාත්මක වෙන්න ඕනෑ පක්ෂ භේදයකින් තොරවයි. ඕනෑම තරුණයෙකුට, තරුණියකට තමන්ගේ හැකියාව, කුසලතාව, දක්ෂතාව, නිපුණතාව මත පහළම තලයේ සිට -ගමේ යෞවන සමාජයේ සිට- ඉහළට එන්නට ඒ ඉණිමඟ නිර්මාණය වෙලා තිබෙනවා. මම ඒ සඳහා හොඳ නිදසුනක් කියන්න කැමැතියි. ඒ එකමුතුභාවය පක්ෂ භේදයෙන් තොරව හෝ වෙනත් ජාති, ආගම්, කුලමල, තරාතිරම් භේදයෙන් තොරව ක්‍රියාත්මක වීමට හොඳම නිදසුනක් තිබෙනවා.

ප්‍රථම වතාවට යොවුන් පාර්ලිමේන්තුව හා යෞවන සමාජ සම්මේලනය එකතු වෙලා ජාතික තරුණ සේවා සභාවට සහ යෞවන සමාජවලට සම්බන්ධ සියලු තරුණයන් සම්බන්ධ කරගෙන තමන් නියෝජනය කරන බලප්‍රදේශයේ වැඩ කටයුතු කරන්න රජයෙන් එහෙම රුපියල් ලක්ෂ 1,500ක් ලබා දුන්නා. ඇත්තවශයෙන්ම ඒ තරුණ තරුණියන් ඒක රුපියල් ලක්ෂ 4,500ක් වටිනා ව්‍යාපෘති බවට පරිවර්තනය කළා. එහිදී හැම පක්ෂයකම, හැම කණ්ඩායමකම අය එකට එකතු වුණා. ඒකේ සාර්ථකත්වය තුළ "ගමට කෝටියක්" කියන වැඩසටහන ක්‍රියාත්මක වුණා. ඒ තුළින් රුපියල් ලක්ෂ 4,500ක් ලබා දුන්නා. ඒ ලබා දුන් රුපියල් ලක්ෂ 4,500න් ඒ යෞවන යෞවනියන් එකතු වෙලා කිසිදු භේදයකින් තොරව රුපියල් ලක්ෂ 9,000ක සේවාවක් ඉෂ්ට සිද්ධ කළා. ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ දේ සිදු වුණේ, පක්ෂ භේදයෙන් තොරව තමන් නියෝජනය කරන බලප්‍රදේශය ගැන හිතලා කටයුතු කරමින්. ඒක නිසා විශේෂයෙන්ම - *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ප්‍රශ්නය - *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට බාධා කරන්න එපා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේක රටේ ප්‍රශ්නයක්. තරුණයන්ගේ ප්‍රශ්නයක්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බාධා කරන්න එපා. කරුණාකරලා මට අවස්ථාව ලබා දෙන්න. ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කළාම එතුමාට කථා කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මම දැනගන්න කැමැතියි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රකාශය කරන අවස්ථාවද, ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවද, කොයි අවස්ථාවද මේ පාවිච්චි කරන්නේ කියලා. එච්චරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට පුළුවන් වන්නේ, පැන නැඟුණු ප්‍රශ්නයට අතුරු ප්‍රශ්නයක් අහන්න මිසක් විග්‍රහයක් කරන්න නොවෙයි. ඔබතුමා දැන් විනාඩි තුනක් අරගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම මගේ ප්‍රශ්නය අහලා අවසන් කරනකොට, ඔබතුමාගේත් අවසර ඇතිව තමයි මේ කරුණ ඉදිරිපත් කරන්නේ. *[බාධා කිරීමක්]* මේක කෙටියෙන් අහලා අවසන් කරන්න මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි දෙකක් දෙන්න පුළුවන්. නමුත්, ඔබතුමා එම විනාඩි දෙක අරගෙන ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොඳයි, විනාඩි දෙකක් දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉවරයි, ඉවරයි. ඔබතුමා විනාඩි දෙක අරගෙන ඉවරයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ පෙන්වා දුන්නේ මේ තරුණයෝ, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණාව විවාදයක් වෙන්න බැහැ නේ, ගරු විපක්ෂ නායකතුමනි. මේක විවාදයක් වෙන්න බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට විනාඩි දෙකක් දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි දෙකක් දෙන්න බැහැ. දැන් විනාඩි දෙක ඉවරයි. *[බාධා කිරීම්]* ඔබතුමා විනාඩි පහක් ප්‍රශ්නය ඉදිරිපත් කළා. මේ සම්බන්ධව අපේ එකඟතාවක් තිබෙනවා නේ, ගරු විපක්ෂ නායකතුමනි. ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්. එතැනින් ඔය ප්‍රශ්නය ඉවර කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ කරුණ අහන්න කැමැතියි. තරුණ සේවා සභාව දැන් යෞවන සමාජවල නමත් වෙනස් කරලා Youth Club කියලා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තරුවකුත් ගහලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම සමාජවාදී තරුණ සංවිධානය - Socialist Youth Movement එක - ඒ කියන්නේ, ජේවීපී එකේ තරුණ සංවිධානය තමයි මේක මෙහෙයවන්නේ. *[බාධා කිරීම්]* ඒ වාගේම ලාංඡනයත් වෙනස් කරලා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ වාගේ දේවල් කරන්නේ ඇයි, ඉතිහාසය පුරාවටම තාරුණ්‍යය, ජාති, ආගම්, කුලමල, පන්ති, පක්ෂ, තරාතිරම් භේදයකින් තොරව හැමෝම එකට එකතුවෙලා ක්‍රියාත්මක කරපු ව්‍යාපාරය ඇයි කෙලෙසන්නේ කියලා.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීමක්]*

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා නොදන්නවා වුණාට මේක තමයි අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" තුළින් ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ. *[බාධා කිරීම්]* ඒකේ 88වන පිටුවේ ඉතාම පැහැදිලිව තිබෙනවා, මේ යෞවන සමාජ ප්‍රතිසංවිධානය කරනවා කියන එක. *[බාධා කිරීම්]* මේකට තමයි ජන වරම ලැබුණේ. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට කවුරුන් හෝ යම් තොරතුරු ටිකක් දීලා තිබෙනවා. ඒකට කමක් නැහැ. හැබැයි, ඒ තොරතුරු ගැන හරියට හොයන්න, අධ්‍යයනය කරන්න. 2020 සිට මේ යෞවන සමාජ ප්‍රතිසංවිධානය කරලා නැහැ. ඔබතුමා කිව්වා වාගේ අපි බලයට ආ පසු සියලු ග්‍රාම නිලධාරි වසම්වල සිටින තරුණ තරුණියන් දැනුවත් කරලා, ඒ අයට අවබෝධ කර දීලා යෞවන සමාජ ටික ප්‍රතිසංවිධානය කිරීම ආරම්භ කරලා තිබෙනවා. ඒක වැරැද්දක්ද? නැහැ, ඒකේ කිසි වැරැද්දක් නැහැ. ඔබතුමන්ලා කල්පනා කර බලන්න, මේ කාරණය ගැන. ලංකාවේ පළමුවැනි වතාවට ක්‍රියාකාරී ග්‍රාම නිලධාරි වසම් 14,002ක් තිබෙනවා. ඒ වාගේම මේ මොහොත වෙද්දී 12,700කට වැඩි ප්‍රමාණයක යෞවන සමාජ ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඇයි, ඔබතුමන්ලාට පසුගිය කාලයේ ඒක කරන්න බැරි වුණේ? එතකොට මේක හොර රහසේ කරපු එකක්ද? නැහැ, විපක්ෂ නායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

මේක ජාතික තරුණ දිනයේ සිට ජාත්‍යන්තර තරුණ දිනය දක්වා හදා ගත් වැඩ පිළිවෙළක්. ඔබතුමන්ලා වාගේ හොරෙන් මේක කළේ නැහැ. ඒක වෙනුවෙන් මාධ්‍ය සාකච්ඡා තියලා, පෝස්ටර් ගහලා, ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරලා, දිස්ත්‍රික් ලේකම්තුමා දැනුවත් කරලා දැවැන්ත ප්‍රචාරයක් ලබා දීලා තිබුණේ. *[බාධා කිරීම්]* ඉතින්, ඒක නිසා මොකක්ද වෙන්නේ? *[බාධා කිරීමක්]* මතක තබාගන්න, ලංකාවේ පළමුවැනි වතාවට පාර්ලිමේන්තුව ඇතුළේත්, ඒ වාගේම එළියේත් යෞවන සමාජ පිළිබඳ සක්‍රිය සංවාදයක් ඇතිවෙලා තිබෙනවා කියන එක. ඉතින් හොඳයි නේ. *[බාධා කිරීම්]* එහෙම ඇති වෙන්න ඕනෑකමකුත් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

"නිල් බලකාය" වාගේ නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

මේක වෙන වෙන බලකායන්වලට හදපුවා වාගේ නොවෙයි. මේක හදන්නේ මේ රටේ තරුණයන්ගේ ව්‍යාපාරයක් බවට පත් කරන්න. *[බාධා කිරීම්]* ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා මේ ගැන තව හොයන්න, තව හොයන්න. මේ වැඩ පිළිවෙළ තුළ ප්‍රජාතන්ත්‍රවාදීව එන සාමාජිකයන්ට පමණයි මේ කමිටුවට එන්න පුළුවන්කම තිබෙන්නේ. *[බාධා කිරීම්]* එහෙම සාමාජිකයෝ ඇවිල්ලා ඔවුන්ගේ ඡන්දයෙන් තමයි මේ නිලධාරින් පත් වෙන්නේ. *[බාධා කිරීමක්]* දිස්ත්‍රික්ක ගණනාවක් තුළ මේක සිදු වුණා. දේශපාලන පක්ෂවලට සම්බන්ධ කීප දෙනෙක් එළියට ඇවිල්ලා voice-cuts දුන්නා. ඉතින්, ඒකට අපට කරන්න දෙයක් නැහැ. හැබැයි, තරුණයාගේ ප්‍රශ්න වෙනුවෙන් අපි පොදුවේ මැදිහත් වෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මට වෙලාව දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Point of Order එකක් නැත්නම් බැහැ. එහෙම වෙලාව දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මට වෙලාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මම 31වන ස්ථාවර නියෝගය යටතේ මෙම කාරණය ගන්නේ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* මේක ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයක්. *[බාධා කිරීම්]* මම කියන්නම්. *[බාධා කිරීම්]* මට මේක කියන්න දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, කියන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, නඩු තීන්දුවක් දීලා තිබෙනවා. මෙය විශේෂයෙන්ම ඔබතුමන්ලාට වටිනා කාරණයක් නිසා මම කියන්නේ. *[බාධා කිරීම්]* මෙය තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට වැදගත් වනවා. *[බාධා කිරීම්]* එවකට හිටපු ජනාධිපතිවරයා විධියට 2022දී ප්‍රකාශයට පත් කරපු Emergency Regulations සම්බන්ධව අධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ Emergency Regulations පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවෙන් සම්මත කරලා තිබෙනවා. ඇත්තටම ඔබතුමාත් දන්නවා, අරගළය පැවති සමයේ පාර්ලිමේන්තුවත් විශාල අභියෝගයකට ලක් වෙලා තිබුණු බව. පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙන කාරණයක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුවක් දීලා තිබෙනවා, මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳව. ආණ්ඩුවෙන් මම අහන්නේ, ඔබතුමන්ලා මොකක්ද මේ සම්බන්ධව දරන මතය කියන එකයි. මොකද, මේක මේ ආණ්ඩුවට විතරක් නොවෙයි, ඕනෑම ආණ්ඩුවකට, ඕනෑම ජනාධිපතිවරයෙකුට මුහුණ දෙන්න සිද්ධ වන කාරණයක්. රට ඇතුළේ විශාල භීෂණයක් ඇති වුණාම ගරු කථානායකතුමනි, හදිසි නීතිය පනවලා, පාර්ලිමේන්තුව තුළ ඒවා සම්මත කළායින් පස්සේ මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයට එය අභියෝගයට ලක් කරන්න පුළුවන්ද කියන කාරණය මෙතැන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මට අදාළ නැහැ, මොන ජනාධිපතිද කියන එක. මේ ආණ්ඩුවට වුණත් හෙට අනිද්දා හෝ අවුරුද්දකින්, දෙකකින් හෝ කවදා හරි මොකක් හෝ ප්‍රශ්නයක් ඇති වුණාම රට ඇතුළේ හදිසි නීතිය පනවලා අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ටික ගන්න බැරි නම්, ඒක පාර්ලිමේන්තුවේ සම්මත කළායින් පස්සේ එය ශ්‍රේෂ්ඨාධිකරණයට භාජන වනවා නම්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4. (ඇ) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක්.

ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4. (ඇ) ව්‍යවස්ථාව යටතේ මෙසේ සඳහන් වනවා:

> "නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;"

[ගරු නිහිණු දයාසිරි ජයසේකර මහතා]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4. (ඇ) ව්‍යවස්ථාව මේ විධියට දිගින් දිගටම උල්ලංඝනය වනවා නම්, පාර්ලිමේන්තුවේ බලය පිළිබඳව අපට කථා කරන්න කොහේවත් ඉඩක් හම්බ වෙන්නේ නැහැ කියන එක මම කියන්න කැමතියි, ගරු කථානායකතුමනි. මෙතැන කථා කරන්නේ නැතුව අපි වෙන කොහේද කථා කරන්නේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, Standing Order 31 මෙම කාරණයට අදාළ වන්නේ නැති බව මා මුලින්ම ඔබතුමාට කියන්න කැමැතියි. වැදගත් කරුණු ගරු සභාවේ ඉදිරිපත් කරන්න ගරු මන්ත්‍රීවරුන්ට ඇති තරම් අවස්ථාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ඔබතුමා එතුමාට අවස්ථාව දුන් නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කාලය කළමනාකරණයට යටත්ව අපටත් විනාඩි දෙකකවත් කාලයක් අවශ්‍යයි කියන එක. එතුමාට දුන් කාලය හා සමාන කාලයක් අපටත් අවශ්‍යයි.

පළමුවන කාරණය මේකයි, ගරු කථානායකතුමනි. නීති කියන ඒවා මහජන අවශ්‍යතාව මත, මහජන උද්ඝෝෂණ සහ බලපෑම් මත evolve වන බව අපි දන්නවා. හිටපු ජනාධිපතිවරු අවස්ථා රාශියකදී මරණ දඬුවම නියම කරපු අය නිදහස් කරලා තිබුණා. එම නිසා දැන් ශ්‍රේෂ්ඨාධිකරණය ඒ අය පිළිබඳව නැවත තීන්දු දීගෙන යනවා. අපි දන්නවා, පසුගිය කාලයේ -අවුරුදු ගණනක් තිස්සේ- ඒ මරණ දඬුවම් නියම කිරීම් පවා හිටපු ජනාධිපතිවරු හරියාකාරව ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දැන් නැවත තීන්දු දීගෙන යන බව. මම හිතන විධියට, නඩු තීන්දු මත සමහර අය සිරගත කරලාත් තිබෙනවා. ඒ වාගේම තමයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ජනාධිපතිවරුන්ව පවා ප්‍රශ්න කිරීම්වලට ලක් කරලා තිබෙනවා. මොකද, ඒ ජනාධිපතිවරු පාර්ලිමේන්තුවේ සහ එතුමන්ලාට තිබෙන වෙනත් බලතල පාවිච්චි කරමින් නීති විරෝධී ආකාරයෙන් කටයුතු කිරීම නිසා. ඒ කියන්නේ, ඒ දීලා තිබෙන බලතලවල හරය, ඒ නීතියේ අරමුණ හරියාකාරව යොදා ගන්නේ නැතුව භාවිත කිරීම පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබෙනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීම පිළිබඳ ඉතාම හොඳ උදාහරණය.

මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. අපි ගනිමු, ජනාධිපති අරමුදල. එහි පැහැදිලිව තිබෙනවා, ජනාධිපති අරමුදලෙන් මුදල් වෙන් කළ හැක්කේ කාටද කියලා. එහි අරමුණු තිබෙනවා. හැබැයි, සමහර ජනාධිපතිවරු එම අරමුණු අනුව අරමුදලේ මුදල් යොදවලාත් තිබෙනවා. සමහර ජනාධිපතිවරු එම අරමුණුවලට වෙනස් අරමුණුවලට මුදල් යොදවලාත් තිබෙනවා. නමුත්, ඒවා ගැන මීට කලින් ප්‍රශ්න කළේ නැහැ. හැබැයි, අද සමාජය ඒ ගැන ප්‍රශ්න කරනවා. එම නිසා අපි හිතනවා, අධිකරණය පාර්ලිමේන්තුවේ කටයුතුවලට - විධායකයේ කටයුතුවලට- මැදිහත් වෙන්න අවශ්‍යත් නැහැ, පාර්ලිමේන්තුව සහ විධායකය අධිකරණයේ කටයුතුවලට මැදිහත් වෙන්නත් අවශ්‍ය නැහැ කියලා. නමුත්, ඒ තුනම එක ecosystem එකක තිබෙන්නේ. මේකේ සීමා - margins - කවුරුත් හරියටම වෙන් කරලා නැහැ. නමුත්, අපි දකිනවා, පසුගිය කාලයේ හිටපු ජනාධිපතිවරු නිසා විශේෂයෙන්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සුවිශාල ගැටලුවක් ඇති වුණු බව. එතුමන්ලා නීතිය අවභාවිතයේ යෙදෙව්වා, මිල මුදල් නාස්ති කළා. එම නිසා ඒ පිළිබඳව යම්කිසි විශේෂ අවශ්‍යතාවක් තිබෙනවා නම් ඔබතුමාට පුළුවන්, වෙන අවස්ථාවක ඒ ගැන සාකච්ඡා කරන්න. මේ, ඒකට අවස්ථාව නොවෙයි. නමුත් ගරු කථානායකතුමනි, ඔබතුමා එතුමාට වෙනත් ස්ථාවර නියෝගයක් මත පදනම් වෙලා අවස්ථාව දුන් නිසා, ඔබතුමා අපට ලබා දුන් අවස්ථාව පිළිබඳවත් මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා.

# II

## රේගු පරීක්ෂාවකින් තොරව බහලුම් 323ක් නිදහස් කිරීම පිළිබඳව සොයා බැලීමට පත් කරන ලද කමිටුවේ වාර්තාව
## சுங்கச் சோதனையின்றி 323 கொள்கலன்களை விடுவித்தல் தொடர்பில் விசாரணை செய்வதற்கு நியமிக்கப்பட்ட குழுவின் அறிக்கை
## REPORT OF COMMITTEE APPOINTED TO INQUIRE INTO RELEASE OF 323 CONTAINERS WITHOUT CUSTOMS INSPECTION

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු බිමල් රත්නායක මැතිතුමාගෙන් මෙම ප්‍රශ්නය කෙටියෙන් විමසීමට මම කැමැත්තෙමි.

1. බහලුම් 323ක් රේගු පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරන ලද්දේද?
2. එම කමිටුවේ සාමාජිකයන් ගණන කීයද? ඔවුන්ගේ නම් හා තනතුරු මොනවාද?
3. එම කමිටුවේ විෂය පථය කුමක්ද?
4. එම කමිටුව ඔවුන්ගේ විමර්ශනය අවසන් කර වාර්තාවක් භාර දුන්නේද? එසේ නම් ඒ කවදාද?
5. එම වාර්තාව කමිටු සාමාජිකයන් කී දෙනෙක් අත්සන් කර තිබේද? එසේ නම් ඒ කවුරුන්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙත තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ. නමුත්, මේ ප්‍රශ්නය අදාළ වන්නේ එම අමාත්‍යාංශයට නොවෙයි, මුදල් අමාත්‍යාංශයටයි. මුදල් ඇමතිවරයා හැටියට ගරු ජනාධිපතිතුමා යටතේ තමයි එම කමිටුව පත් කළේ. එම නිසා පිළිතුරු ලබා දිය යුතු අමාත්‍යාංශය වන මුදල් අමාත්‍යාංශයට අප විසින් මෙම ප්‍රශ්නය යොමු කර පිළිතුරු ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

## පැල්වත්ත සහ සෙවනගල උක් ගොවීන්ගේ ගෙවීම් ප්‍රමාද වීම: කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## பெல்வத்த மற்றும் செவனகல கரும்பு விவசாயிகளுக்கு கொடுப்பனவு மேற்கொள்வதில் தாமதம்: கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று
## DELAY IN MAKING PAYMENTS TO SUGARCANE FARMERS IN PELWATTE AND SEVANAGALA: STATEMENT BY MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, කාලීන මෙන්ම ජාතික වශයෙන් වැදගත් පැල්වත්ත සහ සෙවනගල උක් ගොවි ජනතාවගේ ප්‍රශ්නය පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා ලෙස මෙම ගරු සභාවට කරුණු දැක්වීමට ඉඩ ලබා දීම පිළිබඳව පළමුව ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

අවස්ථා කිහිපයකදීම මෙම ගරු සභාවේ මන්ත්‍රීවරුන් මෙන්ම විපක්ෂ නායකතුමා ද මේ පිළිබඳව අදහස් පළ කළා. ලංකා සීනි සමාගමට අයත් පැල්වත්ත හා සෙවනගල ආයතන දෙකෙහි උක් ගොවීන් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් ප්‍රමාද වීම නිසා මෙම අර්බුදකාරී වාතාවරණය ඇති වූ බව පැහැදිලියි. මෙම ආයතන එවැනි මූල්‍ය අර්බුදයකට පත්වීමට බලපාන ලද හේතු අවස්ථා කිහිපයකදීම මෙම ගරු පාර්ලිමේන්තුවට පැහැදිලි කර ඇති නිසා මම ඒ පිළිබඳව යළි යළිත් ප්‍රකාශ කිරීමට අපේක්ෂා නොකරමි.

වත්මන් ආණ්ඩුව පාලන බලය භාර ගන්නා විට අපහට ලැබුණු මෙම සමාගමේ පැල්වත්ත ආයතනයෙහි සේවකයින් 3,847ක්ද, සෙවනගල ආයතනයෙහි සේවකයින් 1,269ක්ද විය. එමෙන්ම අප භාර ගන්නා අවස්ථාවේදී ස්ථාවර ව්‍යවස්ථාපිත ගෙවීම් රුපියල් මිලියන 3,977ක්, ගොවීන්ට ගෙවිය යුතු රුපියල් මිලියන 609ක්, සැපයුම්කරුවන්ට ගෙවිය යුතු රුපියල් මිලියන 510ක්, බැංකු ණය වෙනුවෙන් ගෙවිය යුතු රුපියල් මිලියන 1,176ක් සහිතව මුළු අගය රුපියල් මිලියන 6,272ක් - රුපියල් බිලියන 6ක් - වගකීම් හැටියට තිබුණු ආයතනයක් තමයි අපි ලබා ගත්තේ. මීට අමතරව මෙට්‍රික්ටොන් 33,000ක පමණ නිෂ්පාදිත සීනි තොගයක් ද, ලීටර් 5,500,000ක පමණ එතනෝල් තොගයක් ද සමඟ මෙම ආයතනය භාර ගන්නා ලදී. 2025 පළමු මාස 6 තුළ සියලු දුෂ්කරතා මැද අපි පැල්වත්ත ආයතනයේ සීනි මෙට්‍රික්ටොන් 14,201ක් නිෂ්පාදනය කළා. අළෙවි කළා, සීනි මෙට්‍රික්ටොන් 8,468ක්. අපි ආදායම වශයෙන් ලබා ගත්තා, රුපියල් මිලියන 1,652ක්.

සෙවනගල ආයතනයේ අපි නිෂ්පාදනය කළා, සීනි මෙට්‍රික්ටොන් 4,045ක්. අළෙවි කළා, සීනි මෙට්‍රික්ටොන් 4,568ක්. ඒ කියන්නේ, කලින් ඉඳලා තිබුණු තොගයත් එක්ක. ආදායම ලැබුවා, රුපියල් මිලියන 877ක්. අපේ මේ මාස 6ක කාලය තුළ පැල්වත්ත සහ සෙවනගල ආයතනවල සිදු කළ නිෂ්පාදනයේ එකතුව ගත්තොත්, සීනි මෙට්‍රික්ටොන් 18,246යි. අළෙවි කළා, මෙට්‍රික්ටොන් 13,036ක්. අපි ආදායම වශයෙන් ලැබුවා, රුපියල් මිලියන 2,529ක්.

ඒ වාගේම අපේ මේ මාස 6ක කාලය තුළ පැල්වත්ත ආයතනයේ එතනෝල් ලීටර් 3,539,109ක් නිෂ්පාදනය කළා. අපි අළෙවි කළා, ලීටර් 3,666,120ක්. ආදායම වශයෙන් ලැබුවා, රුපියල් මිලියන 2,125ක්. සෙවනගල ආයතනයේ එතනෝල් ලීටර් 904,185ක් නිෂ්පාදනය කළා. අපි ලීටර් 1,166,773ක් අළෙවි කළා. රුපියල් මිලියන 563ක ආදායමක් ලැබුවා. එකතුව හැටියට ගත්තොත්, 2025 අවුරුද්දේ පළමු මාස 6 තුළ අපි නිෂ්පාදනය කර තිබෙනවා, එතනෝල් ලීටර් 4,443,294ක්. අළෙවි කළා, ලීටර් 4,832,893ක්. ආදායම වශයෙන් ලැබුවා, රුපියල් මිලියන 2,688ක්. ඒ වාගේම ගරු කථානායකතුමනි, අපට විකිණීමට තිබෙන තොග හැටියට දැනට - ජූලි 31වැනි දා වෙනකොට - පැල්වත්ත හා සෙවනගල ආයතන දෙකේම සීනි මෙට්‍රික්ටොන් 27,292ක්, එතනෝල් ලීටර් 857,185ක් තිබෙනවා. ඒක තමයි දැන් අපේ තත්ත්වය.

ගරු කථානායකතුමනි, අපට මාස දෙකක ගෙවීම් ප්‍රමාදයක් සිදු වූ බව අපි පිළිගන්නවා. 2025 ජූනි 02වැනි දා සිට 2025 අගෝස්තු 01වැනි දා දක්වා අපි ගොවීන්ට ගෙවීම් කර තිබෙනවා. මම ඒ විස්තර දැන් කියන්නම්. අගෝස්තු 31 දිනට ගෙවීමට තිබූ මුළු මුදල රුපියල් 1,541,472,630ක්. අගෝස්තු 01 දිනට අපි ගෙවා ඇති මුළු ගෙවීම් ප්‍රමාණය රුපියල් 871,863,442ක්. මේ මුළු ගෙවීම් කියන්නේ ගරු කථානායකතුමනි, advance payment, ප්‍රවාහන දීමනා, අත්තිකාරම් දීමනා සහ final payment. අගෝස්තු 01වැනි දාට අපට ගෙවන්නට තිබෙන හිඟ මුදල රුපියල් 669,609,187ක්. මෙම කාලය තුළ සෙවනගල ගොවීන් 422කගෙන් සහ පැල්වත්ත ගොවීන් 1,898කගෙන් අපි උක් ලබාගෙන තිබෙනවා. ඒ කියන්නේ, ජූනි 02වැනි දා සිට අගෝස්තු 01වැනි දා දක්වා කාලය තුළ. අදත් ගන්නවා, දිගටමත් ගන්නවා. එයින් 1,084ක් outgrowersලා ලෙසත්, 832ක් settler farmersලා ලෙසත් අපේම ගොවිපළේ කටයුතු කරනවා, වැඩ කරනවා. ඒ හැම දෙනාගේම නාමලේඛන - ගොවීන් 422කගේ නම් ඇතුළත් ලේඛනය, "Outgrower and ISFO Farmer Payment Details, 2025 Maha" සහ "Settler Farmers Commercial Cane, Final Payment Details in 2025 Maha" කියන ලේඛන - මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මම මේ ගොවීන් සියලු දෙනාගේ නාමලේඛන සභාගත කරන්නේ මෙන්න මේ නිසා. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා උද්ඝෝෂණය කරන වාරයක් වාරයක් ගණනේ ගොවීන් කියා කට්ටියක් එනවා. සමහර අය ඒ ප්‍රදේශවල අයත් නොවෙයි. සමහර අය ඇවිල්ලා උද්ඝෝෂණ කරනවා, ගිහින් සොයා බලනකොට ඒගොල්ලන් සමාගමට ණයයි. ඔවුන් සමාගමෙන් ණය අරගෙන තිබෙනවා. එක් කෙනෙක් ප්‍රකාශයක් නිකුත් කළා, ඔහු සමාගමට රුපියල් 500,000ක් ණයයි. සමහර අයට ඉඩම් අයිතියකුත් නැහැ, සේවා අංකයකුත් නැහැ. ඒ නිසා මම මේ ලේඛන ඔක්කොම සභාගත කරනවා. ජූනි 02වැනි දා සිට අගෝස්තු 01වැනි දා වන විට පැල්වත්ත ආයතනයේ අත්තිකාරම්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා ]

ගෙවීම් වශයෙන් රුපියල් 427,857,218ක් අපි සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර තිබෙනවා. ඒ කියන්නේ, පැල්වත්තේ අපට තවත් අත්තිකාරම් ගෙවන්න නැහැ. දැන් තිබෙන්නේ ඉදිරියට ගන්නා ඒවාට ගෙවන්නයි. ඔවුන්ට තව ගෙවීමට ඇත්තේ රුපියල් 448,402,070ක් වන අවසාන ගෙවීම් පමණයි, final payments විතරයි. සෙවනගල ගොවීන් 422ට ගෙවිය යුතුව තිබූ අත්තිකාරම් මුළු මුදල මේ කාලයට රුපියල් මිලියන 127යි. එයින් රුපියල් මිලියන 125ක්ම ගෙවා අවසන්. ඉතිරි රුපියල් 2,950,000 මේ වන විට ගිණුම්වලට යවනවා. අද ඒ ගෙවීම් අවසන් කරනවා.

සෙවනගල ප්‍රවාහන දීමනා වශයෙන් රුපියල් මිලියන 81ක් ගෙවිය යුතු වුණා. එයින් රුපියල් මිලියන 73ක් මේ වන විට ගෙවා තිබෙනවා. ඉතිරි රුපියල් 7,774,000ක මුදල මෙම සතියේ ගෙවා අවසන් කරනවා. සෙවනගල අපට ගෙවීමට ඉතිරිව ඇත්තේ රුපියල් 210,483,117ක් වන අවසාන ගෙවීම පමණයි. ලංකා සීනි සමාගම ලෙස ගෙවිය යුතු වූ මිලියන 1,541න් මිලියන 871ක්ම අප ගෙවා අවසන්. තවත් ගෙවීමට ඇති මුළු මුදල මිලියන 669යි. හරියටම කිව්වොත්, රුපියල් 669,609,187යි. මෙම මුදල් ගෙවීමට ආදායම ලෙස මිලියන 918ක් අප සතුයි. අපි දැනට මිලියන 918ක් හොයා ගෙන තිබෙනවා. දැනටමත් මිලියන 412ක් අගෝස්තු 01 දින වන විට සීනි විකිණීමෙන් අපි උපයා ගෙන තිබෙනවා. අපි සීනි වෙළෙඳාමක් කළා අගෝස්තු පළමුවැනිදා. අගෝස්තු 15වන දා වන විට තවත් මිලියන 412ක් අපට ලැබීමට නියමිතයි. ඒ කියන්නේ, අපට ලැබෙන ආදායම. ඊට අමතරව ENA ethanolවලින් අපි මිලියන 94ක් උපයා ගෙන තිබෙනවා. මුළු ආදායම ලෙස මිලියන 918ක් දැනට අප සතුයි. අප ඉදිරියට මිලදී ගන්නා උක් වෙනුවෙන් අත්තිකාරම් හා ප්‍රවාහන ගාස්තුවලට වෙන් කිරීමට දැන් අපි සූදානම්. ඒ කියන්නේ දැන් මේක අවසන් වෙන්නේ නැහැ. දිගටම ගන්නවා නේ. ඒ නිසා අපි අත්තිකාරම් ගෙවන්න මුදල් වෙන් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර-

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, තව පොඩි වෙලාවක් දෙන්න, මම අවසන් කරන්නම්. මේක වැදගත් ප්‍රශ්නයක්, ජාතික ප්‍රශ්නයක්, උද්සෝෂණ තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා මට අවස්ථාව දෙන්න.

ඉන්ධන හා උපකරණ මැෂින් සැපයුම්කරුවන්ට ගෙවීම් කළ යුතුයි. ජූලි මස වැටුප් සම්පූර්ණයෙන් අපි ගෙවා අවසන්. ආයතන දෙකේම. අගෝස්තු වැටුප් වෙන් කිරීම් කළ යුතුයි. ඊට අමතරව නීතිමය වශයෙන් සිදු කළ යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා ද වෙන් කළ යුතුයි. ඒ සියල්ල සිදු කරමින්, ගෙවීමට ඇති අවසන් ගෙවීම්වලින් සියයට 40ක් අද සිට ගෙවීමට අපි ආරම්භ කරනවා.

ගරු කථානායකතුමනි, අපි දැන් සීනි විකුණුම් මිල හා එතනෝල් විකුණුම් මිල ස්ථාවර කර ගනිමින්, අවදානම් අවස්ථාව පසු කර පහසු තත්ත්වයට පැමිණ තිබෙනවා. අපට පහසු මාවත් කිහිපයක්ම තිබියදී අමාරු දුෂ්කර මාවත අපි තෝරා ගත්තා. අපට මෙට්‍රික්ටොන් 23,000ක් පමණ තිබුණු සීනි තොගය අඩු මිලකට විකුණා මුදල් සොයා ගත හැකිව තිබුණා. ලීටර් 289,000ක්ව තිබුණු එතනෝල් තොගය අඩු මිලකට විකුණා ගොවීන්ට ගෙවිය යුතු මිලියන 1,500ක මුදල පහසුවෙන් සොයා ගත හැකිව තිබුණා. එසේ කළා නම් ඒ පරණ වැරැද්දම අපි නැවත කරනවා හැර අන් අලුත් දෙයක් කරන්නේ නැහැ. ඒ වෙනුවට ආයතනයේ අනාගතයත් ආරක්ෂා කර ගනිමින් ගොවීන් සඳහා සාධාරණ මිලක් ලබා දීම අපේ අපේක්ෂාව වුණා. විශේෂයෙන්ම ඊළඟ යල කන්නය වන විට තවත් මූල්‍ය අර්බුදයකට ආයතනය පත් නොකර, මෙම කර්මාන්තය -සීනි කර්මාන්තය- ආරක්ෂා කර ගැනීමට මෙම අසීරු මොහොත පසු කිරීම අපේ බලාපොරොත්තුව වුණා. දැන් අපි ඒ අවස්ථාවට ඇවිල්ලා තිබෙනවා.

මෙහිදී විශේෂයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ අසීරු මොහොතේ ගොවි ජනතාව වෙනුවෙන් හා ආයතනයේ පැවැත්ම වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස මැදිහත් වී රුපියල් කෝටි 100ක් -බිලියනයක්- අප වෙත වෙන් කර තිබෙනවා. එය මාසිකව මිලියන 100 බැගින් අපේ ආයතනයට දැන් ලබා දෙනවා. එමඟින් ගොවීන්ට අවශ්‍ය පොහොර ලබා දීමට, උක් තවාන් වගා හෙක්ටෙයාර ප්‍රමාණය වැඩි කිරීමට, විශේෂයෙන් අපේ එතනෝල්වල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා අපේ කොලම් ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ලංකා සීනි සමාගම මඟින් බෙදා හැරීම් මෙහෙයවන තොග වෙළෙඳ මධ්‍යස්ථාන ජාලයක් ඉදිරි මාසය තුළ දිස්ත්‍රික්ක 25හිම ආරම්භ කර පාරිභෝගික ජනතාවට ද මේ ලබා දීපු මුදල්වලින් මිල සහනයක් ලබා දීමට, සීනි මිල අඩු කරන්නට ඒ මුදල් යෙදවීමට අපි බලාපොරොත්තු වෙනවා. විපක්ෂයේ විවිධ පිරිස් ගොවි ජනයා මෙහෙයවමින් පැල්වත්ත - සෙවනගල ආණ්ඩු විරෝධී මධ්‍යස්ථානයක් බවට -මම දැක්කා "අනුරගෝගම" කියලාත් කියනවා කියලා- පත් කිරීමට උත්සාහ දැරීමෙන් අපව දිරිමත් කරන ලදී. ඒ නිසා අපි අපගේ නාස්තිය අවම කරමින්, සාමූහිකව වැඩ කරමින් මෙම මූල්‍ය අර්බුදය පියමන් කිරීමට සමත් වී ඇත. එම නිසා විපක්ෂ නායකතුමා ඇතුළුව විපක්ෂයේ පක්ෂ නායකවරුන් විපක්ෂයේ උද්සෝෂණ මෙහෙයවලා අප වෙත ලබා දුන් සහයෝගයට මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා. එහෙම ස්තුති නොකරම බැහැ.

ගරු කථානායකතුමනි, දැන් ඉදිරි ගෙවීම් නිසි පරිදි සිදු කරමින් ගොවීන්ගේ මිලදී ගැනීම් අප සිදු කරන අතර, මෙවර කලින් වගාවට වඩා උක් ටොන් 100,000කට වැඩි අස්වැන්නක් අපි අපේක්ෂා කරන අතර, එය අපි නිෂ්පාදන ආයතන හතරම බෙදා ගෙන සාමූහිකව මිල තීරණයක් මඟින් කළමනාකරණය කිරීමට අපේක්ෂා කරනවා. දැන් සියලු ගෙවීම් අවසන් කර ඇති බැවින් විපක්ෂයට වෙනත් උද්සෝෂණ භූමියක් සොයා ගන්නා ලෙස ආරාධනා කරමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් සඳහා මට අවස්ථාව දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෙර වරු 11.30 වන විට ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කරන්න තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක්- *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මෙතුමා පාර්ලිමේන්තුවේ සිටින ජ්‍යෙෂ්ඨම මන්ත්‍රීවරයෙක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ජ්‍යෙෂ්ඨද, කනිෂ්ඨද කියන එක නොවෙයි, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට අනුව වැඩ කටයුතු කරන්න ඕනෑ.

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

## යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන ගැටලු: වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## யாழ்ப்பாண மாவட்ட விவசாயிகள் எதிர்நோக்கும் பிரச்சினைகள்: வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று
## ISSUES FACED BY FARMERS IN JAFFNA DISTRICT: STATEMENT BY MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ, 2025 ජූලි 09 දින අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

රතු ලූනු අස්වනු නෙළන කාලයේදී ගොවීන් ආරක්ෂා වන ආකාරයට රජය විසින් ආනයන මත බදු පැනවීමක් සිදු කරන්නේද යන්නත්, පසුගිය අවුරුදු 3ක් තිස්සේ එබඳු බදු පැනවීමක් සිදු නොවීමට හේතු කවරේද යන්නත් එතුමා පළමු ප්‍රශ්නයෙන් අසා තිබුණා. එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

අපේ රටේ වාර්ෂික රතු ලූනු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 75,000ක් පමණ වෙනවා. අපි 2019 වසරේදී සියයට 65කට වැඩි රතු ලූනු නිෂ්පාදනයක් සිදු කළත්, මේ වනවිට අපේ නිෂ්පාදනය 1/3කට පහළ බැස තිබෙන්නේ. 2024 වසරේ රතු ලූනු නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 29,966යි. ඒ අනුව ගත්තාම 1/3කට ආසන්න නිෂ්පාදනයක් අපි සිදු කරනවා.

දේශීය ගොවියාගේ ආරක්ෂාව වෙනුවෙන් රතු ලූනු කිලෝ එකක් සඳහා රුපියල් 50ක ආනයන තීරු බද්දක්, Special Commodity Levy එකක් -SCL - අපි පනවා තිබෙනවා. ඒ වාගේම රතු ලූනු නිෂ්පාදනය ගත්තාම, සියයට 70ක් පමණ යාපනය දිස්ත්‍රික්කය තුළත්, සියයට 14ක් පමණ පුත්තලම දිස්ත්‍රික්කය තුළත්, සියයට 16ක් පමණ සෙසු දිස්ත්‍රික්ක තුළත් වශයෙන් තමයි නිෂ්පාදන කටයුතු සිදු කරන්නේ.

පසුගිය කාලයේ බදු නොගැසීම සම්බන්ධයෙන් ඒ පැවැති රජයන්ගෙන් තමයි විමසන්න වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. දැනට අනුගමනය කරන බදු ප්‍රතිපත්තියක් යටතේ අපි රුපියල් 50ක ආනයන තීරු බද්දක් අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කරනවා.

ගරු මන්ත්‍රීතුමා දෙවැනි ප්‍රශ්නයෙන් අසා තිබෙනවා, මේ වසරේදී අඛණ්ඩව ඇද හැළුණු වර්ෂාව නිසා රතු ලූනු ගොවීන් වගාවට යෙදවූ මුදල් අහිමිවීමක් සහ නිෂ්පාදන භාණ්ඩ ප්‍රමිතියෙන් බිඳ වැටීමක් සිදුවී ඇති බැවින්, එසේ පීඩාවට පත් ගොවීන් සඳහා වන්දි ගෙවීමක් සිදු කරනවාද, ඒ සඳහා රක්ෂණ ක්‍රමයක් තිබෙනවාද කියන කාරණා. එයට පිළිතුර මෙසේයි.

ගරු මන්ත්‍රීතුමනි, රතු ලූනු ගොවීන් සඳහා රක්ෂණ ක්‍රමයක් තිබෙනවා, රක්ෂණය වුණු ගොවීන්ට. ගරු කථානායකතුමනි, රක්ෂණය වුණු ගොවීන්ට මේ වන්දි ක්‍රමය තිබෙනවා. නමුත් රක්ෂණය නොවුණු ගොවීන් සඳහා වන්දි ලබා දීමේ ක්‍රමවේදයක් නැහැ.

ගරු මන්ත්‍රීතුමා තුන්වැනි ප්‍රශ්නයෙන් යාපනය දිස්ත්‍රික්කයේ අර්තාපල් ගොවීන් පිළිබඳව අසා තිබෙනවා. යාපනය දිස්ත්‍රික්කයේ අර්තාපල් වගා කිරීම සඳහා රජය මුදල් වෙන් කර තිබෙනවාද කියා අසා තිබෙනවා. එයට පිළිතුර මෙසේයි.

විවිධ අවස්ථාවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පැත්තෙන් යම් යම් පරීක්ෂණ කර තිබෙනවා. හැබැයි, පෞද්ගලික අංශයෙන් තමයි යාපනය දිස්ත්‍රික්කය තුළ අර්තාපල් වගාව සඳහා ආයෝජනය කරමින් තිබෙන්නේ. අර්තාපල් වගාව ආරම්භ වෙන්නේ නොවැම්බර් මාසයේ, ගරු මන්ත්‍රීතුමා. ඒ නිසා 2025 වර්ෂයේ නොවැම්බර් මාසය වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ අර්තාපල් වගා කිරීම සඳහා එම ගොවීන්ට උචිත බීජ සියයට 50ක දායකත්වයක් යටතේ ලබා දීමට කටයුතු සූදානම් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා හතරවැනි ප්‍රශ්නයෙන් අසා තිබෙනවා, බැර ලෝහ අඩංගු වී තිබෙන බවට පැවසීම මත සහ පළිබෝධ නාශක භාවිතය අඩු වී ඇති තත්ත්වයක් තුළ ආනයනය කරනු ලබන ලොකු ලූනුවල බැර ලෝහ පවතින්නේද කියලා. එයට පිළිතුර මෙසේයි.

ශ්‍රී ලංකාවේ ලොකු ලූනු නිෂ්පාදනය සඳහා භාවිත කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත පළිබෝධ නාශක පමණක් බැවින්, දේශීය ලොකු ලූනුවල බැර ලෝහ අඩංගු නොවේ. ආනයනය කරනු ලබන ලොකු ලූනු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන පරිපාලන ඒකකය මඟින් මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු දැයි පරීක්ෂා කරන අතර, සුවිශේෂී අවශ්‍යතාවක් ඇති වුවහොත් අවශ්‍ය පරිදි වැඩිදුර පරීක්ෂා කරනු ලබයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට එක පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ அமைச்சர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் என்னால் கேட்கப்பட்ட வினாவுக்கு விடையளித்தமைக்கு நன்றி!

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

யாழ்ப்பாண மாவட்டத்தின் வலிகாமம் கிழக்கில் அச்சுவேலி, பத்தமேனி, இடைக்காடு, வளலாய், தோப்பு, நவக்கிரி, ஈவினை, புன்னாலைக்கட்டுவன், ஊரெழு, அச்செழு, உரும்பிராய், கோண்டாவில், கோப்பாய், நீர்வேலி, சிறுப்பிட்டி, புத்தூர், ஆவரங்கால், வாதரவத்தை கிராமங்களிலுள்ள விவசாயிகள் உப உணவு உற்பத்தியில் ஈடுபடுகின்றார்கள். அதேபோன்று, வலிகாமம் வடக்கில் பலாலி, கட்டுவன், குரும்பசிட்டி, தெல்லிப்பளை, காங்கேசன்துறை, வசாவிளான், தையிட்டி, மாவிட்டபுரம், பன்னாலை, அளவெட்டி, மல்லாகம், ஏழாலை கிராமங்களிலுள்ள விவசாயிகளும் சின்ன வெங்காயம், பீற்றூட், கரட், உருளைக்கிழங்கு, திராட்சை போன்ற உற்பத்திகளில் ஈடுபடுகின்றார்கள். அதேபோன்று, வடமராட்சியில் அம்பன், குடத்தனை, போக்கறுப்பு, கேவில், கரவெட்டி, நெல்லியடி, யாக்கரை, தம்பசிட்டி, மண்டான், கரணவாய் கிராமத்திலுள்ள விவசாயிகளும் பெரிய அளவில் உப உணவு உற்பத்தியில் ஈடுபடுகின்றார்கள். அதேபோன்று, தென்மராட்சியில் மிருசுவில், மட்டுவில், நுணாவில், விடத்தல்பளை, எழுதுமட்டுவாள், வரணி, கெற்பேலி கிராமங்களிலுள்ள விவசாயிகளும் உப உணவு உற்பத்தியில் ஈடுபடுகின்றார்கள். இவை அனைத்தும் விவசாயக் கிராமங்கள்! வலிகாமம் மேற்கில் பண்டத்தரிப்பு, சாந்தை, மாதகல், இளவாலை, சித்தங்கேணி, வட்டுக்கோட்டை, பாண்டுவெட்டை, பொன்னாலை கிராமங்களிலுள்ள விவசாயிகளும் உப உணவு உற்பத்தியில் மிகப் பெரியளவில் ஈடுபடுகின்றார்கள். அதேபோன்று, தீவகத்தில் வேலனை, அல்லைப்பிட்டி, மண்கும்பான், மண்டைதீவு, அனலைதீவு, புளியங்கூடல், சுருவில் கிராமங்களிலுள்ள விவசாயிகளும் உப உணவு உற்பத்தியில் ஈடுபடுகின்றார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කෙටියෙන් කියන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த விடயம் முக்கியமானது. ஏனென்றால், இந்தக் கிராமங்களில் உற்பத்தி நடைபெறும் காலப்பகுதியில், அந்தப் பொருட்களின் இறக்குமதிக்கு காலங்காலமாக வரி விதிக்கப்பட்டு வந்திருக்கிறது. எனினும், கடந்த இரண்டு ஆண்டுகளாக அவ்வாறு வரி விதிக்கப்படவில்லை. இதனால் சின்ன வெங்காய உற்பத்தியாளர்கள் கடுமையாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். கொழும்புக்குக் கொண்டுவரப்பட்ட வெங்காயத்தை அப்படியே லொறியில் இருந்து தெருவில் கொட்டிவிட்டுச் சென்ற நிலைமையும் இருக்கிறது. இதனால் இளம் விவசாயிகளும் புதிதாக விவசாயத்தில் ஈடுபட்டவர்களும் கடுமையாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். அங்குள்ள மக்கள் கடற்றொழிலிலும் பாதிக்கப்படுகின்றார்கள்; விவசாயத்திலும் பாதிக்கப்படுகின்றார்கள். அதுமாத்திரமன்றி, வெள்ளத்தாலும் பாதிக்கப்படுகின்றார்கள். அவர்களுக்கான நிவாரணம் என்ன என்பதைத்தான் நான் இந்த இடத்தில் கேட்கின்றேன்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නයට පිළිතුර, "ඔව්" කියන එකයි. පසුගිය කාලය ගත්තොත්, බදු නොපැනවීම හේතුවෙන් 2019දී සාමාන්‍යයෙන් මෙට්‍රික්ටොන් 58,000ක්, ඒ කියන්නේ වාර්ෂික පරිභෝජනයෙන් සියයට 70කට ආසන්න රතුලූනු ප්‍රමාණයක් නිෂ්පාදනය කරපු රටක්, මේක. නමුත් ඒ ප්‍රමාණය අඛණ්ඩව පහළ ගිහින් තිබෙනවා. 2024දී මෙට්‍රික්ටොන් 29,000කට වැඩියි; මෙට්‍රික්ටොන් 30,000කට ආසන්නයි. 2025 ඇස්තමේන්තුව මෙට්‍රික්ටොන් 35,000-40,000 අතර වනවා, ගරු මන්ත්‍රීතුමනි. අපි ගොවීන්ට අවශ්‍ය පොහොර සහනාධාරය ලබා දෙනවා; බීජ සඳහා අවශ්‍ය සහන ලබා දෙනවා. විශේෂයෙන් යාපනය ප්‍රදේශයේ තමයි අපේ රටේ රතු ලූනු නිෂ්පාදනයෙන් සියයට 70ක් සිදු කරන්නේ. දැන් මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ ගොවියාගේ රතු ලූනු ටික මිල දී ගෙන, ගබඩා කරලා වෙළෙඳ පොළ අවශ්‍යතාව අනුව නිදහස් කිරීම සඳහා යන්ත්‍රණයක් නොමැතිකමයි. ඒකට තිබිච්ච යන්ත්‍රණය තමයි සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව. පසුගිය ආණ්ඩුව ඒවා විකුණා දැම්මා. විකුණා දැම්මා විතරක් නොවෙයි, බඩු ටික ප්‍රවාහනය කරන්න තිබුණු ලොරි ටිකත් කුණු කොල්ලයට විකුණා දැම්මා. ලොරි 40ක්, 2023 සැප්තැම්බර් මාසය වනකොට කුණු කොල්ලයට විකුණා දැම්මා. එක්කෝටි තිස්ලක්ෂයක් වටිනා ලොරිය රුපියල් හැටපන්ලක්ෂයකට විකුණා තිබෙනවා. ඒ වාගේ වැඩ කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ආණ්ඩුව ලෙස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදීත් මේ පිළිබඳව අපි සාකච්ඡා කළා. විශේෂයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයත් මේ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා එ් කමිටුවේදී එකඟ වුණා, මේ පිළිබඳ වැඩ පිළිවෙළ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න. ඒ නිසා ගොවියාගේ ලූනු ටික මිල දී ගැනීම සඳහා වෙච්ච යන්ත්‍රණයක් හදන්නත්, ඒ වාගේම ගබඩා කිරීම සඳහා වෙච්ච ක්‍රියාවලියකට යන්නත් අපි කටයුතු කරනවා, වෙළෙඳ පොළ තුළ මිල පිළිබඳ ප්‍රශ්නයක් එන වෙලාවට. මොකද, ගරු මන්ත්‍රීතුමා, වෙළෙඳ පොළේ රතු ලූනු කිලෝවක් රුපියල් 400ත්, 600ත් අතර මිලකට තමයි පසුගිය කාලය පුරාම -මේ වන කොටත්- අලෙවි වෙමින් තිබෙන්නේ. ගොවියා ගොවිතැනට උනන්දු කරවීමට නම්, ගොවියාගේ අස්වැන්න මිල දී ගැනීමට වැඩ පිළිවෙළක් ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් නැතිව, market එකේදි මිල වැට්ටුවාට පස්සේ ගොවියා වගාවෙන් ඉවත් වෙනවා. එවැනි තත්ත්වයක් මතු වුවහොත්, ඒ පිළිබඳව අවධානය යොමු කරලා ගොවියාගේ අස්වැන්නේ ප්‍රමාණයක් මිල දී ගැනීම, ගොවියාට සාධාරණ මිලක් ලබා දීම සහ පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම කියන කාරණා සැලකිල්ලට ලක් කරලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න රජය සාකච්ඡා කර තිබෙනවා. ඒ පිළිබඳව ඉදිරියේදී පියවර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, එක් පැහැදිලි කරවා ගැනීමකටයි ඉඩ දෙන්න පුළුවන්. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, පසුගිය දවසක ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයකට මම පිළිතුර ඉදිරිපත් කරන්නයි හදන්නේ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, හැම මන්ත්‍රීවරයෙකුටම එක් පැහැදිලි කරවාගැනීමකට විතරයි අවස්ථාව ලබා දෙන්නේ, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයකට අදාළව. *[බාධා කිරීමක්]*

ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நீங்கள் மற்றைய உறுப்பினர்களுக்குச் சந்தர்ப்பம் கொடுக்கிறீர்கள். எனவே, என்னுடைய இரண்டாவது வினாவைக் கேட்பதற்குரிய சந்தர்ப்பத்தை நீங்கள் தடுக்கக் கூடாது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ, ඔබතුමාට එක අවසරයක් දුන්නා. *[බාධා කිරීමක්]* ගරු ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමනි, අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට දේශීය සිසුන් බඳවා ගැනීම අත්හිටුවීම: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழக மருத்துவ பீடத்தில் உள்ளூர் மாணவர்களின் உள்ளீர்ப்பு இடைநிறுத்தம்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று

## SUSPENSION OF ENROLMENT OF LOCAL STUDENTS TO MEDICAL FACULTY OF GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY: STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.06.17 දින ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මා ඉදිරිපත් කරනවා. එය කොටස් දෙකකින් ඉදිරිපත් කරන්නේ. එම ප්‍රශ්නයේ කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය සම්බන්ධයෙන් අසා ඇති 1, 2, 3 සහ 7 කියන කොටස්වලට මම පිළිතුරු සපයනවා. එහි 4, 5, 6 කොටස් අපේ ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන්නේ නැහැ. ඒ ප්‍රශ්න අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කළා. ඒවාට ඒ අමාත්‍යාංශය පැත්තෙන් පිළිතුරු සපයයි.

1. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ගොඩනැගීම සඳහා මේ වන විට ශ්‍රී ලංකා රජය විසින් වැය කර ඇති මුදල (වාර්ෂික පුනරාවර්තන වියදම් හැර) රුපියල් මිලියනක 12,462කි. මෙම වසර සඳහා යෝජිත වෛද්‍ය උපාධි පාඨමාලා ගාස්තුව රුපියල් මිලියන 17.5ක් වන අතර, පසුගිය වසරේ අය කරන ලද ගාස්තුව රුපියල් මිලියන 15කි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Speaker, it is just to get this clarified. On a Question under Standing Order 27(2), අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්ද, බැරිද? සමහර දවස්වල එහෙම දීලා තිබෙනවා. නමුත්, අද ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව දීලා නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට පැහැදිලි කර ගන්න එක් අවස්ථාවක් දුන්නා. ඔබතුමා කොහේද හිටියේ කියන එක මට ප්‍රශ්නයක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

අතුරු ප්‍රශ්න දෙකක්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, දෙකක් නොවෙයි. එකයි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්. ස්ථාවර නියෝග 27(2) යටතේ එහෙම අහන්න ඉඩක් නැහැ. සම්ප්‍රදායක් විධියට, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත් එක වතාවක් මගෙන් ඉල්ලීමක් කළාට පස්සේ ස්ථාවර නියෝග 27(2) යටතේ පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ලබා දීලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

1. එක් වෛද්‍ය ශිෂ්‍යයකු වෙනුවෙන් රජය විසින් වැය කරනු ලබන මුදල වාර්ෂිකව ආසන්න වශයෙන් රුපියල් 495,000ක් වන අතර, වසර පහක් සඳහා ආසන්න වශයෙන් රජය විසින් දරනු ලබන වියදම රුපියල් මිලියන 2.475ක් වේ.

   මෙම වියදමට ආචාර්යවරුන්ගේ හා කාර්ය මණ්ඩලයේ වේතන, පාඨමාලාව සඳහා අවශ්‍ය සැපයුම්, ගමන් වියදම්, නඩත්තු වියදම් හා වෙනත් පුනරාවර්තන වියදම් ඇතුළත් වේ.

   මීට අමතරව වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා මෙන්ම එම සායනික පුහුණු කටයුතු සිදු කරනු ලබන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රෝහල නඩත්තු කිරීමට අමතර පිරිවැයක් වැය වේ. එම පිරිවැය ඉහත අගයට ඇතුළත් නොවේ.

2. 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා කැඩෙට් නොවන දේශීය වෛද්‍ය සිසුන් බඳවා ගැනීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ මේ වනවිට අයදුම්පත් කැඳවා ඇත.

   ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන වෛද්‍ය සිසුන්ගේ පුහුණුව සඳහා එම විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විශේෂඥ වෛද්‍යවරුන්ට අමතරව, එම විශ්වවිද්‍යාලයීය රෝහලේ, රජයේ රෝහල්වල සහ ත්‍රිවිධ හමුදා රෝහල්වල සේවය කරනු ලබන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

3. 2025/2026 අධ්‍යයන වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත කැඩෙට් නොවන දේශීය වෛද්‍ය සිසුන් බඳවා ගැනීම සඳහා මේ වනවිට අයදුම්පත්‍ර කැඳවා ඇත.

   ප්‍රශ්න අංක 4, 5, 6 සඳහා අදාළ අමාත්‍යාංශය විසින් පිළිතුරු සපයනවා ඇති.

7. 2025/2016 අධ්‍යයන වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙත කැඩෙට් නොවන දේශීය වෛද්‍ය සිසුන් බඳවා ගැනීම සඳහා මේ වනවිට අයදුම්පත්‍ර කැඳවා කටයුතු කරගෙන යනවා.

   බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා, අපි පොඩ්ඩක් ඉමු. විපක්ෂ නායකතුමාගේ කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දෙමු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයේ කොටසකට විතරයි උත්තර දුන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යාංශයෙන් අප වෙත යොමු කළ ප්‍රශ්නවලට අපි ඉදිරියේදී මේ ගරු සභාවට පිළිතුරු ඉදිරිපත් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා 2025.07.26 දින කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: 2025.07.26ஆம் திகதிய மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸவினது கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY HON. (DR.) NALINDA JAYATISSA ON 26.07.2025

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ අ කොටසේ 8 වගන්තිය යටතේ වරප්‍රසාද කඩවීම.

කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වූ මම, කළුතර දිස්ත්‍රික්කයේ මෙන්ම සමස්ත රටේම ප්‍රසාදය දිනාගෙන සිටින මහජන නියෝජිතයෙක්. ජාතික ජන බලවේගය පළාත් පාලන ආයතන වැඩි ගණනක බලය ලබා ගත් මොහොතක, මතුගම ප්‍රාදේශීය සභාවේ බලය සමගි ජන බලවේගයට ලබා ගැනීමට මට හැකියාව ලැබුණා. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු නලින්ද ජයතිස්ස මහතා විසින් පසුගිය දිනෙක සිදුකරන ලද ප්‍රකාශයක් තුළ මා සන්තකයේ නීති විරෝධී අවි ආයුධ තිබෙන බව පැවසීමට නිර්දය උත්සාහයක් ගන්නා බව මේ අවස්ථාවේ පෙන්වා සිටිනවා. 2025.07.26 වන දින සිදුකළ ප්‍රකාශය පහත පරිදි වේ.

"කිසි කෙනෙක් මූණ බලලා අත්අඩංගුවට ගන්නේ නැහැ. පරීක්ෂණ නිසි පරිදි මෙහෙයවලා තමා අත්අඩංගුවට ගන්නෙ. මම දැක්කා ජගත් විතාන කියනවා මතුගම ප්‍රාදේශීය සභාවේ බලය මාලිමාවෙන් ගිලිහිච්ච නිසා තමයි මොකක්ද මේ එයාගේ පුතා අත්අඩංගුවට ගත්තෙ කියලා. මම ජගත් විතානට කියන්න කැමතියි..."

මේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශක අපේ ඉස්කෝලේ එකා; එක ඉස්කෝලේ ඉගෙන ගත්තේ. අඩු ගණනේ "මන්ත්‍රීතුමා" කියන වචනයවත් මෙතැනට දමන්න තරම් සදාචාරයක්, වැදගත්කමක් නැහැ. "... ආරම්භ වෙලා තිබෙන්නේ මීට මාස දෙකකට කලින්. මේ අයට ඊට අමතරව තිබෙන නීති විරෝධී අවි ආයුධ මොනවද මේ සියල්ල ගැන පරීක්ෂණ ඒ අදාළ අංශවලින් සිදුකරමින් පවතිනවා, ඒවා අධිකරණයට වාර්තා වෙයි. ඉතින්, ඒ ගොල්ලන්ට පුළුවන් වෙයි අධිකරණයේදී තමන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කරන්න."

ගරු කථානායකතුමනි, මෙවැනි ප්‍රකාශ කිරීම තුළින් මා ජනතාව තුළ දැඩි අප්‍රසාදයට පත් කිරීමටත්, මට විරුද්ධව කිසියම් කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවත් පැහැදිලි වෙනවා. එබැවින් ගරු පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයෙකු ලෙස මහජනතාව වෙනුවෙන් සේවය කිරීමට මාහට බාධා කිරීම මගේ වරප්‍රසාද කඩවීමක් බව මම කියනවා.

මෙම මැතිවරණ භූමියේදී ජනතාවගේ ආශිර්වාදයෙන් පත් වූ මන්ත්‍රීවරයෙකු ලෙස මාගේ පෞද්ගලික නාමයත්, මාගේ පවුලේ සත්කාරයත් ආරක්ෂා කර ගැනීම පිණිසත්, වඩාත්ම වැදගත් වශයෙන් "අපේ රාජ්‍යයේ අධිකරණ ස්වාධීනත්වයත්, බලතලවල දූෂණයත් පිළිබඳව මෙම මැති සභාවට අවධානය යොමු කිරීම පිණිසත්" තමයි මා අද ඉදිරිපත් වන්නේ.

මෑතකදී මාගේ පුත්‍රයාට චෝදනා කරමින්, වාහන නීතිවිරෝධීව එකලස් කර ඇති බව කියමින්, මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයටද ඉදිරිපත් කරන ලදී. මේ වන විට එම නඩුව විභාග වෙමින් පවතින අතර, මා හෝ මාගේ පවුලේ කිසිවෙකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කර නොමැත. කිසිදු අධිකරණයකින් වරදකරු බවට තීන්දුවක් ද නිකුත් කර නොමැත.

නමුත්, කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයෙකු වන ගරු නලින්ද ජයතිස්ස මහතා පසුගිය දිනවලදී මාගේ පවුලේ නාමය ආශ්‍රයෙන් යුතුව නීතිමය නොවන, අසත්‍යම සහ අපහාසාත්මක ප්‍රකාශ මාධ්‍යයෙන් ප්‍රකාශ කළේය. එපමණක් නොව, අධිකරණයේ අනාගත තීන්දුවක් ගැනත් ව්‍යවස්ථාවට එහා යමින් නිවැරදි නොවන නඩු විභාගයේ තොරතුරු පවා ජන සමූහය හමුවේ පවසමින් සිටී.

ගරු කථානායකතුමනි, අධිකරණ කටයුතු සම්බන්ධයෙන් පිළිගත් නීතියේ මූලධර්මයක් ලෙස *sub judice* නමැති සම්ප්‍රදායක් පවතී. ඒ අනුව අධිකරණය ඉදිරියේ පවතින නඩුවක් සම්බන්ධයෙන් අනෙකුත් ස්ථානවලදී අදහස් දැක්වීම තහනම්ය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ලබා දීලා තිබෙන ලිපියට අමතරව වැඩි යමක් මේ අවස්ථාවේදී පවසමින් සිටිනවා.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
නැහැ, මම මේ ටිකත් කියලා අවසන් කරන්නම්.

මෙම නඩුවේ විමර්ශන කටයුතු, අනාගත නඩු පියවර සහ අවි රඳවා ගැනීමේ චෝදනා සම්බන්ධයෙන්, ගරු කථානායකතුමනි, මා අත්අඩංගුවට ගත්තොත්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ලබා දී තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය කියවලා ඉවරයි. වැඩිමනත් දේවල්,-

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
වැඩිමනත් දේවල් මට කියන්න අයිතියක් නැද්ද? මේ චෝදනාව බරපතළයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන එක විතරයි ඔබතුමාට කරන්න පුළුවන්.[බාධා කිරීමක්] ඔබතුමා භාර දීලා තිබෙන වරප්‍රසාද ප්‍රශ්නයට අමතරව වැඩියමක් කියනවා නේ, දැන්. [බාධා කිරීම්]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට අවසන් කරන්න දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට අවසන් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා වැඩියමක් දැන් කියවනවා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමන්ලා තේරුම් ගන්න. මට ලබා දුන්නු ලිපියයි එතුමාට කියවන්න පුළුවන්. *[බාධා කිරීම්]* මොනවා කියවනවාද මම දන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට අවසන් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, මට ලියලා දීලා තිබෙන එකට අමතරවයි මෙතුමා මේ කියවන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාට තේරෙන්නේ නැද්ද? ගරු මන්ත්‍රීතුමාට තේරෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]* නැහැ, නැහැ. මොකක්ද ඔබතුමන්ලා කියන්නේ? ගරු විපක්ෂ නායකතුමා, මෙන්න මේක හොඳට තේරුම් ගන්න. වරප්‍රසාද කඩවීම සම්බන්ධ ලිපියක් කථානායකතුමාට දුන්නාම, ඒ ලිපිය කියවීමට පමණයි තිබෙන්නේ. දැන් ඔබතුමා මේ ලිපියට අමතරව වැඩියමක් කියවනවා, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* මේක හරි කථාවක් නේ. ඔබතුමන්ලාට ඒක තේරෙන්නේ නැද්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට අවසන් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ලිපිය කියවලා ඉවරයි. ඒකයි මම මේ කියන්නේ. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් අවසන් කරන්න.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු කථානායකතුමනි, මේ අසාධාරණය සිද්ධ කරන්න දෙන්න එපා. එතුමාට මේ චෝදනාව කරන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොනවා කියනවාද මම දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
අවි ආයුධ අල්ලා ගත්තා නම් කමක් නැහැ. අවි ආයුධ තිබෙනවා කියලා කරන ප්‍රකාශයම කොයිතරම් නීති විරෝධීද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඊට පෙර -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මොකක්ද කාරණාව?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
රීති ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රීති ප්‍රශ්නය මොකක්ද?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ සඳහා කියවිය යුත්තේ ඉංග්‍රීසියෙන් නම් ස්ථාවර නියෝග 91(f), සිංහලෙන් නම් 91(ඊ).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එය කියවන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා රීති ප්‍රශ්නය පිළිබඳව කථා කරපු නිසා කියන්නේ. ස්ථාවර නියෝග 29(1) යටතේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද සම්බන්ධයෙන් කථා කළත් - විශේෂයෙන් පාර්ලිමේන්තුවේ- මන්ත්‍රීවරයෙකුගේ නොවෙයි. ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(f) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "No Member shall refer in any motion or debate, to any matter which is under adjudication by a court of law or to any matter on which a judicial decision is pending. The Speaker or the Chair may direct any Member who speaks in violation of the rule against sub judice to resume his seat:"

ගරු කථානායකතුමනි, අද ගෙනෙන මේ යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාගේ මතය විමසන්නයි මම මේ කාරණය සඳහන් කළේ. ස්ථාවර නියෝග 91(f) යටතේ අධිකරණයේ නඩුවක් පවතින අවස්ථාවක් සම්බන්ධයෙන් සඳහන් වෙනවා. මේ විවාද කරන්න නියමිත කාරණයට අදාළව Supreme Court එකේ නඩු 9ක් මේ වෙනකොට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්නේ දැනට කථා වෙච්ච කාරණයක් සම්බන්ධයෙන්ද, ඉදිරියට තිබෙන එකක් සම්බන්ධයෙන්ද?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා අද ප්‍රධාන වැඩ කටයුතුවලට යෑමට පෙර කිව යුතු කාරණයක් මේක. මොකද, ප්‍රධාන වැඩ කටයුතුවලට ගියාට පස්සේ මේ ප්‍රශ්නය අහලා වැඩක් වෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාට අදාළ වෙන්නේ නැහැ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේක ඔබතුමාට අදාළ ප්‍රශ්නයක්. මට අදාළ එකක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මට අදාළ ප්‍රශ්නයකදී මගේ රාමුව තුළ මම ක්‍රියාත්මක වෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට mike එක දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් රීති ප්‍රශ්නයක් ඇහුවාම, මේ රීතිය යටතේ ගරු කථානායකවරයා,- *[බාධා කිරීමක්]* ඔබතුමා ඒක කියවන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නවා ඒක. ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඒක කියවලා කථා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ කාරණය දන්නවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා දන්නවා නම්, ඉංග්‍රීසියෙන් නම් ස්ථාවර නියෝග 91 (f), සිංහලෙන් නම් 91(ඊ).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම සිංහලත් දන්නවා, ඉංග්‍රීසිත් දන්නවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා භාෂා දෙකම දන්න බව මම දන්නවා. මම මතක් කරන්නයි කිව්වේ. එහෙම නම්, ඔබතුමා සෑහීමකට පත් විය යුතුයි, අද මේ විවාදය පැවැත්වීම අධිකරණ ක්‍රියාදාමයට බාධාවක් වෙන්නේ නැහැ කියලා. එහෙමත් නැත්නම් substantial damage එකක් හෝ prejudice එකක් මේ outcome එක මත සිදු වෙන්නේ නැහැයි කියන කාරණය පිළිබඳව ඔබතුමා සෑහීමකට පත් විය යුතුයි. ඒ පිළිබඳව ඔබතුමා පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරලා, අපි විවාදය පටන් ගනිමු.

ගරු කථානායකතුමනි, අපි ස්ථාවර නියෝගවලට යනවා නම් ස්ථාවර නියෝගවලට යමු. ස්ථාවර නියෝග අනුව යනවා නම් එක කාරණයකට එක විධියකුයි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් අදහසක් ඉදිරිපත් කරනකොට තව විධියකුයි බැහැ. ඉතින් මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලන්නේ මෙයයි. මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ මතය ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ මේ ගරු සභාවට ප්‍රකාශ කරලා, ඊට පසුව ස්ථාවර නියෝගවලට අනුව මේ Motion එක move කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන සලකා බැලීමෙන් පසු ස්ථාවර නියෝග කියවලා බලලා තමයි අදාළ Motion එක ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරලා තිබෙන්නේ.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා. *[බාධා කිරීමක්]* ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා වාඩි වෙන්න. මම ඔබතුමාට පිළිතුරක් දුන්නා නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට මම පිළිතුරක් ලබා දුන්නා. ස්ථාවර නියෝග 91(ඊ) සලකා බලලා, පරිශීලනය කරලා තමයි මම මේ තීරණය අරගෙන තිබෙන්නේ.

ගරු සභානායකතුමා. *[බාධා කිරීමක්]* වාඩි වෙන්න, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තත්පර 30ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඔබතුමාට කාලය ලැබෙන්නේ නැහැ. මම ඔබතුමාට පිළිතුරක් ලබා දුන්නා. *[බාධා කිරීම්]* මේක විවාදයක් නොවෙයි. ස්ථාවර නියෝග පරිශීලනය කරලා මම ඔබතුමාට තීරණය දුන්නා නේ.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### නොමඟ යවන චෝදනා මත පදනම්ව සජීවී කථා විකාශය අත්හිටුවීම
### தவறான குற்றச்சாட்டுகளை அடிப்படையாகக்கொண்டு உரையின் நேரடி ஒலி/ ஒளிபரப்பை இடைநிறுத்தியமை
### SUSPENSION OF LIVE TELECAST OF SPEECHES BASED ON MISLEADING ALLEGATIONS

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

"පාර්ලිමේන්තු මන්ත්‍රී (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 මැයි 09 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු චතුර ගලප්පත්ති මහතා**
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය

## 2002ஆம் ஆண்டின் 5ஆம் இலக்க, அலுவலர்களை அகற்றுதல் (நடவடிக்கைமுறை) சட்டத்தின் 17ஆம் பிரிவின் பிரகாரம், பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களை பொலிசுப் பரிசோதகர் தலைமையதிபதி பதவியிலிருந்து அகற்றுவதற்கான தீர்மானம்

## RESOLUTION TO REMOVE THE INSPECTOR-GENERAL OF POLICE, MR. T.M.W. DESHABANDU TENNAKOON FROM THE OFFICE OF THE INSPECTOR-GENERAL OF POLICE IN TERMS OF SECTION 17 OF THE REMOVAL OF OFFICERS (PROCEDURE) ACT, NO. 5 OF 2002

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ 2025.04.08 දිනැති න්‍යාය පත්‍රයේ සඳහන් අංක පා.29/2025 දරන යෝජනා සම්මතය 2025 අප්‍රේල් 08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදුව, එකී යෝජනාවේ ඇතුළත් චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂා කොට, සිය සොයාගැනීම් වාර්තා කරනු පිණිස 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5 (2) වන වගන්තිය සහ 6(ආ) වන වගන්තිය යටතේ (මෙහි මින් මතු "කමිටුව" නමින් සඳහන් කරනු ලබන) පරීක්ෂණ කමිටුවක් පත් කරනු ලැබූ හෙයින් ද;

එකී පනතේ 8(1)(ආ) වගන්තිය ප්‍රකාරව එකී කමිටුව විසින් කරුණු සොයා බලා, සිය තීරණ කථානායකවරයා වෙත 2025.07.21 දින දැනුම් දී තිබූ හෙයින් ද;

එම තීරණ ඇතුළත් වාර්තාව කථානායකවරයා විසින් 2025.07.22 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරනු ලැබූ හෙයින් ද;

කමිටුව සිය පරීක්ෂණය පවත්වා, ඉහත කී සභාගත කරන ලද වාර්තාවට අමුණා ඇති චෝදනා පත්‍රය තුළ පොලිස්පතිවරයාට එරෙහිව නඟන ලද මුළු චෝදනා 23 අතරින් චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 13, 14, 15, 16, 17, 18, 19, 22 සහ 23 සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වරදකරු බව තීරණය කර ඇති හෙයින් ද;

පරීක්ෂණ කමිටුව විසින් වාර්තාගත කරන ලද සහ මෙම සභාවේ සභාගත කරන ලද එකී වාර්තාවේ සඳහන් වරදකරු බවට වන තීරණ පදනම් කර ගනිමින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ(3) ව්‍යවස්ථාව ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක් තිබෙනවා.

[පූ.භා. 11.50]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ඉතිහාසගත වන වැදගත්ම කාරණයක් තමයි අද අපි විවාද කරන්නේ. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5වැනි වගන්තිය යටතේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි පොලිස්පති වැනි ධුරයක කටයුතු කළ පුද්ගලයෙක් ඔහුගේ විෂමාචාර ක්‍රියා හේතුවෙන් ගරු කථානායකතුමාගේ යෝජනාවක් අනුව ඉවත් කිරීම සඳහා යෝජනා සම්මතයක් ලබා ගන්න අද කටයුතු කරන්නේ. විශේෂයෙන් මේ පනතේ සියලු විධිවිධාන අනුගමනය කරමින් විධිමත්ව විනිවිදභාවයෙන් සිදු කළ විමර්ශනයක් හැටියට අපට මෙම විමර්ශනය හඳුන්වා දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යටතේ පත් කළ කමිටුව, 2025 මැයි 19 වැනි දින, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ඉටු කිරීම අත්හිටුවා ඇති පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාහට බාර දුන් කරුණු 23කින් යුත් චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා 04ක් හැර, සෙසු චෝදනා සියල්ලටම වරදකරු බව තීන්දු කර තිබෙනවා. දේශබන්දු තෙන්නකෝන් මහතා වැරදිකරු බවට තීන්දු නොකළ චෝදනා 04න් 02ක් සම්බන්ධයෙන් අධිකරණමය කටයුත්තක් පවතින හෙයින් අදාළ කමිටුව විසින් විමර්ශනයක් පවත්වා නොතිබුණු අතර, පොලිස්පතිවරයා වරදකරු නොවේ යැයි තීන්දු කර ඇත්තේ චෝදනා 02කට පමණයි.

ගරු කථානායකතුමනි, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත අනුව නීතිපතිවරයා හෝ පොලිස්පතිවරයා ඉවත් කිරීමට පෙර, ඔවුන් විසින් විෂමාචාර ක්‍රියා

සිදු කර ඇත්දැයි සොයා බැලීමට පත් කරන කමිටුවේ සාමාජිකයෙකු අග්‍ර විනිශ්චයකාරවරයා විසින් පත් කරන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවෙකු විය යුතු අතර, තවත් සාමාජිකයෙකු පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතුය. සෙසු සාමාජිකයා අග්‍රාමාත්‍යවරයා සහ විපක්ෂ නායකවරයාගේ එකඟත්වය ඇතිව පත් කරන සාමාජිකයෙක් විය යුතුය. ඒ අනුව මෙම කමිටුවට එවකට අග්‍ර විනිශ්චයකාරවරිය විසින් නම් කර තිබුණේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුට පසුව සිටින ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරයා වීම විශේෂත්වයකි. එසේම ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිවරයාද හිටපු මහාධිකරණ විනිසුරුවරයෙකු වන අතර, අග්‍රාමාත්‍යතුමිය සහ විපක්ෂ නායකතුමාගේ එකඟත්වය ඇතිව පත් කළ සාමාජිකයා වූයේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිවරයාය. ඒ මහතා ද විනිශ්චයකාරවරයෙකි.

ඒ අනුව, විෂමාචාර ක්‍රියා සහ බලය අවභාවිත කිරීමේ ක්‍රියා 19කට පොලිස්පතිවරයා වැරදිකරු යැයි තීරණය කර ඇත්තේ අත්දැකීම් බහුල විනිසුරුවරුන් තිදෙනෙකු වීම විශේෂත්වයකි. පොලිස්පතිවරයා චෝදනා 19කට වැරදිකරු යැයි මෙම කමිටුව විසින් ඒකමතිකව තීන්දු කරනු ලැබුවේ නීතිපති විසින් දෙපාර්ශ්වයෙන් කැඳවූ සාක්ෂිකරුවන් 38දෙනෙකුගේ සාක්ෂි ලබා ගැනීමෙන් පසුවයි.

2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යටතේ පොලිස්පති ධුරයෙන් දේශබන්දු තෙන්නකෝන් මහතා ඉවත් කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සිදු වී ඇත්තේ පොලිස්පති ධුරය දැරීමට නුසුදුස්සෙකු වන ඒ මහතා මෙම තනතුරට පත් කිරීම හේතුවෙනි. ඔහුගේ පත් කිරීමට අදාළව 2024 ජූලි මාසයේ පැවති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු විභාගයේදී ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහතාද, තමන් අත්අඩංගුවට ගැනීම වළක්වන ලෙස නියෝගයක් ඉල්ලා දේශබන්දු තෙන්නකෝන් මහතා ඉදිරිපත් කළ රිට් පෙත්සමට අදාළව 2025 මාර්තු 12වැනි දා පැවති විභාගයේදී අතිරේක සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතාද ප්‍රකාශ කළේ තෙන්නකෝන් මහතා පොලිස්පති තනතුරට තබා පොලිස් කොස්තාපල් තනතුරටවත් නුසුදුසු පුද්ගලයෙකු ලෙසයි.

දේශබන්දු තෙන්නකෝන් 1998 පෙබරවාරි මස 23වැනි දා සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලීසියට සම්බන්ධ වූ දිනයේ සිට 2024 පෙබරවාරි මස 29 වැනි දා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් ඔහු පොලිස්පති ලෙස පත් කරනු ලබන තෙක් අවස්ථා ගණනාවකදී ආන්දෝලනයට තුඩු දුන් කරුණු කිහිපයක් හේතුවෙන් කථාබහට ලක් වූ පුද්ගලයෙක් විය. ඉන් සිදුවීම් කිහිපයක් මම සඳහන් කරන්න කැමතියි, ගරු කථානායකතුමනි.

- **ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී පෝද්දල ජයන්ත මහතා සම්බන්ධ සිදුවීම**

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකු වන පෝද්දල ජයන්ත මහතා පැහැරගෙන ගොස් වධහිංසා කිරීමේ සිද්ධියේ විමර්ශන නිසි ලෙස සිදු නොකිරීම සහ පැමිණිල්ල සටහන් කර ගැනීමේදී බලපෑම් කිරීම සම්බන්ධයෙන් ඔහුට චෝදනා එල්ල වී තිබුණි. 2009 වසරේ ජූනි 01 හෝ ඊට ආසන්න දිනයකදී පෝද්දල ජයන්ත මහතා පැහැරගෙන ගොස් දරුණු වධහිංසාවලට ලක් කිරීමෙන් පසු මිරිහාන පොලීසිය ඔහුගේ ප්‍රකාශ සටහන් කරගත්තේ රෝහලේදී වන අතර, එළි ප්‍රකාශ ලබාගන්නා ස්ථානයට දේශබන්දු තෙන්නකෝන් මහතා පැමිණ බලපෑම් කළ බවට පෝද්දල ජයන්ත මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර තිබේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ විමර්ශනයට අදාළව 2019 වර්ෂයේ ජනවාරි මාසයේදී දේශබන්දු තෙන්නකෝන් මහතා කැඳවා ප්‍රකාශයක් ලබා ගත් අතර, 2019 නොවැම්බර් මාසයේදී ජනාධිපතිවරණයෙන් පසු මෙම විමර්ශන යටපත් විය.

- **භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ ඝාතනය හා සම්බන්ධ සිදුවීම**

මැතිවරණ දිනයක් යනු, ප්‍රදේශයේ නීතිය හා සාමය පවත්වා ගැනීමට ශ්‍රී ලංකා පොලීසියේ කොට්ඨාස භාර නිලධාරියෙකුට අත්හළ නොහැකි දැවැන්ත වගකීමක් තිබෙන දිනයක්. එසේ වුවත්, 2011 ඔක්තෝබර් 08වැනි දා පැවති පළාත් පාලන ඡන්ද විමසීම් දිනයේ ශ්‍රී ලංකාවේ ආන්දෝලනාත්මක සිදුවීමක් වූ ජනාධිපති උපදේශක භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා ඇතුළු පිරිසක් වෙඩි තබා ඝාතනය කිරීමේ සිදුවීම වාර්තා විය. මෙම ඝාතනවලට අදාළ මරණ පරීක්ෂණය පැවැත්වූයේ එවකට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ප්‍රසන්න අල්විස් මහතා ඉදිරිපිටදීය. මරණ පරීක්ෂණයේදී 2011 ඔක්තෝබර් 21වැනි දින සාක්ෂි ලබා දුන් භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ රියදුරු සමන්ත පෙරේරා මහතා ප්‍රකාශ කළේ, නුගේගොඩ කොට්ඨාස භාර පොලිස් අධිකාරි දේශබන්දු තෙන්නකෝන් මහතාගේ වාහනය මේ වන විට මරණීය දණ්ඩනයට නියම වී ඇති, ශ්‍රේෂ්ඨාධිකරණ පංච පුද්ගල විනිසුරු මඬුල්ලකින් දඬුවම ස්ථිර කර ඇති ආර්. දුමින්ද සිල්වා මහතාගේ වාහන පේළිය පසුපස තිබෙනු දුටු බවයි. එසේම මරණ පරීක්ෂණයේදී සාක්ෂි ලබා දුන් ආර්. දුමින්ද සිල්වා මහතාගේ රියදුරු බී.ඒ. චමින්ද ප්‍රකාශ කළේ වෙඩි හුවමාරුවට මීටර් 150ක් පමණ දුරින් දේශබන්දු තෙන්නකෝන් සිටිනු දක්නට ලැබුණු බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේදී පංච පුද්ගල විනිසුරු මඬුල්ලේ තීන්දුව අනුව ආර්. දුමින්ද සිල්වා ඇතුළු කණ්ඩායම එදින උදේ සිට මැතිවරණ නීති උල්ලංඝනය කරමින් නීති විරෝධී රැස්වීමක සාමාජිකයන් වෙමින් කටයුතු කර තිබේ. එවැනි නීති විරෝධී රැස්වීමක් නතර කිරීමේ වගකීම ඇති කොට්ඨාස භාර නිලධාරියා ද එම නීති විරෝධී රැස්වීම පිටුපසින් සිටීම ම ඔහු පොලිස්පති ධුරයට සුදුස්සකු නොවන බවට තීරණය කිරීමට ප්‍රබල සාධකයකි. දේශබන්දු තෙන්නකෝන් මහතා එදින එම නීති විරෝධී ක්‍රියාව නතර නොකිරීමේ අවසන් ප්‍රතිඵලය වූයේ ජනාධිපති උපදේශකයෙකු ඇතුළු හතරදෙනෙකු මරණයට පත්වීම සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඇතුළු පිරිසකට මරණීය දණ්ඩනය නියම වීමයි.

- **වධහිංසා නඩු තීන්දුව**

දේශබන්දු තෙන්නකෝන් මහතා නුගේගොඩ කොට්ඨාස භාර නිලධාරියා ලෙස කටයුතු කළ සමයේ පුද්ගලයන්ට වධහිංසා කිරීම සම්බන්ධයෙන් වන SC FR 107/2011 දරන මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව 2023 සැප්තැම්බර් 11වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශයට පත් කළා. එස්. තුරෙයිරාජා, කුමුදුනී වික්‍රමසිංහ සහ කේ. ප්‍රියන්ත ප්‍රනාන්දු යන ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල විසින් ප්‍රකාශයට පත් කළ තීන්දුව අනුව මූලික අයිතිවාසිකම් පෙත්සමේ පස්වැනි වගඋත්තරකරු වූ දේශබන්දු තෙන්නකෝන් මහතා වරදකරු කර ඇත.

දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පතිවරයා ලෙස පත් කිරීමට එවකට ව්‍යවස්ථා සභාවේ කිහිපදෙනෙකු සහ ජනාධිපතිවරයා කටයුතු කළේ ඔහු නුගේගොඩ කොට්ඨාස භාර නිලධාරියාව සිටියදී පුද්ගලයන් නිරුවත් කර ඔවුන්ගේ ලිංගේන්ද්‍රවල සිඩාලේප ආලේප කරවීමට සැලැස් වූ සහ පුද්ගලයන්ට කෲර, අමානුෂික සහ අවමන්සහගත ලෙස සැලකීමට ආධාර අනුබල දුන් පුද්ගලයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කර තිබියදීය.

[ගරු ආනන්ද විජේපාල මහතා ]

- **පාස්කු ඉරිදා ප්‍රහාරයේ වගකීම පැහැර හැරීම**

පාස්කු ඉරිදා එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාර මාලාවේ මීගමුව, කටුවාපිටිය ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දේශබන්දු තෙන්නකෝන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම ගැන සලකා බලන ලෙස එම ප්‍රහාර ගැන සෙවූ ජනාධිපති කොමිෂන් සභාව නිර්දේශ කර තිබුණි. 2019 අප්‍රේල් 21වැනි පාස්කු ඉරුදින මෙම ප්‍රහාර මාලාව එල්ල වන අවධියේදී දේශබන්දු තෙන්නකෝන් මහතා බස්නාහිර උතුර දිසාව, එනම් ගම්පහ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කරමින් සිටියේය. නුදුරේදීම කතෝලික දේවස්ථාන ඉලක්ක කර ගනිමින් සහරාන් හෂීම් ඇතුළු පිරිසක් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන බවට ලැබුණු බුද්ධි තොරතුරු එවකට බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතා විසින් දේශබන්දු තෙන්නකෝන් මහතා වෙත 2019 අප්‍රේල් පළමුවැනි දා ලබා දුන්නේය. එම බුද්ධි තොරතුර සමඟ ඇති එස්/ඩීඅයිජී/ඩබ්ලිව්පී/3649/2019 අංක දරන උපදෙස් ලිපියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙම ප්‍රහාරය වළක්වා ගැනීම සඳහා උපදෙස් හතරක් ලබා දී තිබුණි. එම උපදෙස් හතර මෙසේය.

මේ පිළිබඳව නිලධාරින් දැනුවත් කර පොලිස් බුද්ධි අංශ නිලධාරින් උපක්‍රමශීලිව යොදවා මෙම බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමට කටයුතු කළ යුතුය. එහිදී,

- ලිපියේ සඳහන් එම පුද්ගලයන්ගේ ඡායාරූප ලබාගෙන, එම ඡායාරූප බුද්ධි අංශ නිලධාරින් වෙත ලබා දී ඔවුන් අදාළ ඉලක්කගත ස්ථානවල හෝ ඒ අවට සිටීදැයි පරීක්ෂා කළ යුතුය. තවම ඔවුන් නවාතැන්පොළවල්, කුලී නිවාස යනාදියෙහි නවාතැන් ගෙන සිටිය හැක. එම ස්ථාන පරීක්ෂා කළ යුතුය.

- බුද්ධි තොරතුරු රහසිගතව තබාගෙන විමර්ශන කළ යුතු අතර, මහජනතාව අනිසි බියගැන්වීමකට ලක් කළ යුතු නොවන බව අවධාරණය කරමි.

- කතෝලික පල්ලිවලට ආරක්ෂාව ප්‍රමාණවත් නොවන බවට වැටහෙන්නේ නම් ඒ සඳහා නිසි ආරක්ෂක වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාවට නැංවිය යුතුය. එසේම, එල්ල විය හැකි ප්‍රහාර කල්වේලා ඇතිව හඳුනා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාවට නැඟිය යුතුය.

- එමෙන්ම, මහජනයා වැඩිපුර ගැවසෙන ස්ථානවල වැඩසටහන්/ප්‍රසංග වැනි කරුණු සඳහා අනුමැතිය ලබා දීමේදී ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතුය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලබා දුන් උපදෙස් අනුව කටයුතු කරනවා වෙනුවට දේශබන්දු තෙන්නකෝන් කළේ අදාළ ලිපිය කෙටි ආවරණ ලිපියක් ද සමඟ පහළ නිලධාරින්ට සන්නිවේදනය කිරීම පමණි. ඉන් එහා ගොස් පසුවිපරම් කිරීමක්වත් නොකළ බව ජනාධිපති කොමිසමේදී අනාවරණය විය. ප්‍රහාර එල්ල වූ අප්‍රේල් 21වැනි දා වන විට ඔහු නිවාඩු දමා පවුලේ පිරිස ද සමඟ කොළඹින් පිට ගොස් තිබුණු බව පසුව හෙළිදරව් විය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලබා දුන් උපදෙස් අනුව කටයුතු කළේ නම් දේශබන්දු තෙන්නකෝන් නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කළ බල ප්‍රදේශයේ තිබූ සහරාන් හෂීම් කල්ලියේ මීගමුව සහ එඬේරමුල්ල ආරක්ෂිත නිවාස ගැන තොරතුරු අනාවරණය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව තිබුණි. එසේම, 2019 අප්‍රේල් මුල් සතියේ ලැබී තිබුණු බුද්ධි තොරතුරේ, ප්‍රහාරය එල්ල කරන පිරිස ලෙස නම් සඳහන් වූ පිරිසගෙන් දෙදෙනෙක් සැඟවී සිටියේ දේශබන්දු තෙන්නකෝන්ගේ බල ප්‍රදේශයට අයත් එඬේරමුල්ලේ ආරක්ෂිත නිවාසයේ බව පසුව අනාවරණය විය.

මෙලෙස බරපතළ ලෙස ධුරයේ වගකීම් පැහැර හැරි මෙම පුද්ගලයා සම්බන්ධයෙන් එවකට යහ පාලන ආණ්ඩුව කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැත. ඉන් පසු බලයට පත්වූ ආණ්ඩුව ද කිසිදු ප්‍රතිකර්මයක් ඒ වෙනුවෙන් යෙදුවේ නැත; කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැත. ක්‍රියාමාර්ගයක් නොගත්තා පමණක් නොව, දේශබන්දු තෙන්නකෝන්හට වැටුප් වර්ධක දෙකක් ලබා දීමට ද 2021 ජූනි මාසයේදී කැබිනට් මණ්ඩලය තීන්දු කළේය. එසේම, දේශබන්දු තෙන්නකෝන් ඇතුළු පිරිසකට චෝදනා පත්‍ර ලබා දිය යුතු බව සඳහන් කරමින් මහජන ආරක්ෂක අමාත්‍යාංශයට 2021 වසරේදී එවකට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එවනු ලැබීමෙන් පසු ඔවුන් ඇතැම් නඩුවල සාක්ෂිකරුවන් විය හැකි බැවින් චෝදනා පත්‍ර ලබා නොදෙන ලෙස එවකට පොලිස්පති චන්ද්‍රන වික්‍රමරත්න මහතා ලිපියක් යොමු කළ අතර, ඒ අනුව චෝදනා පත්‍ර ලබා දීම නතර විය. 2023 වසරේදී එලෙස නතර වූ චෝදනා පත්‍ර නිකුත් කර තිබුණ ද, සාක්ෂිකරුවන් නිසි ලෙස කැඳවා චෝදනා විභාග කිරීමෙන් තොරව ඔහු චෝදනාවලින් නිදහස් කර තිබිණි.

- **ගාලු මුවදොර සාමකාමී අරගළයට පහරදීම**

2022 අප්‍රේල් මස 09වැනි දා සිට ගාලු මුවදොර ප්‍රදේශයේ පැවති "ගෝඨාගෝගම" නම් සාමකාමී අරගළ ස්ථානයට සහ අරලියගහ මන්දිරය අසල පිහිටි "මයිනාගෝගම" නම් අරගළ ස්ථානයට පහර දීම සම්බන්ධයෙන් ද දේශබන්දු තෙන්නකෝන් මහතාට චෝදනා එල්ල විය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට තවත් විනාඩි 5ක කාලයක් ලබා දෙන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
අරලියගහ මන්දිරයේ එවකට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමක් අවසන් වී යකඩ පොලු අතැති පිරිසක් ගාලු පාරට පැමිණ "මයිනාගෝගම" නම් අරගළ ස්ථානයට පහර දුන් අතර, පසුව ඔවුන් "ගෝඨාගෝගම" නම් අරගළ ස්ථානයට පහර දී ඇතැම් දේපළ ගිනිබත් කරනු ලැබීය. මේ අවස්ථාවේදී දේශබන්දු තෙන්නකෝන් මහතා ද එම ස්ථානයේ සිට ඇති බවත්, අරලියගහ මන්දිරයේ සිට පැමිණි කලහකාරී පිරිසගේ ක්‍රියාව නතර කරන ලෙස සාමකාමී විරෝධතාවේ සිටි පිරිස් දේශබන්දු තෙන්නකෝන් මහතාගෙන් ඉල්ලා ඇති බවත්, එහෙත් ඔහු එය නතර කිරීමට කටයුතු කර නැති බවත් මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ විමර්ශනයේදී අනාවරණය විය.

විමර්ශනවලින් පසු උද්ධෘත 2022 ජුනි 08වැනි දින සහ 2022 ඔක්තෝබර් 10වැනි දින නීතිපතිවරයාට යොමු කළ අතර, එම උද්ධෘත අධ්‍යයනය කිරීමෙන් පසු කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ 22046/22 දරන නඩුවට දේශබන්දු තෙන්නකෝන් මහතා සැකකරුවෙකු ලෙස නම් කරන ලෙස නීතිපති සංජය රාජරත්නම් මහතා 2023 අප්‍රේල් 19වැනි දා උපදෙස් ලබා දී තිබුණි.

නීතිපතිවරයා උපදෙස් ලබා දීමෙන් පසු එම උපදෙස් අත්හිටුවන නියෝගයක් ඉල්ලමින් 2023 අප්‍රේල් 24වැනි දා අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කළ අතර, අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මහතා විසින් 2023 ජුනි 26වැනි දා ඊට අදාළ රිට් ආඥාව නිකුත් කළේය. එම රිට් ආඥාව අවලංගු කරන ලෙස ඉල්ලමින් නීතිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණයට විශේෂ අභියාචනා පෙත්සමක් ගොනු කර තිබේ. එම අභියාචනා පෙත්සම කැඳවූ අවස්ථාවේදී 2025 ජූලි 20වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනාධිකරණ රිට් ආඥාව වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කර ඇත.

එම අතුරු තහනම් නියෝගයෙන් පසු තමා අත්අඩංගුවට ගැනීම වළක්වන නියෝගයක් ඉල්ලා දේශබන්දු තෙන්නකෝන් ගොනු කළ අපේක්ෂිත ඇප අයදුම් පත්‍රයේ 13වැනි ඡේදයේ සඳහන් වන්නේ 2022 මැයි 09වැනි දා තමා කටයුතු කළේ විධායක ජනාධිපතිවරයාගෙන් කරුණු තහවුරු කර ගැනීමෙන් පසුව බවයි. පොලිස්පතිවරයා ලබා දුන් උපදෙස් නොතකමින් ජනාධිපතිවරයාගෙන්ම එම අවස්ථාවේ ඔහු උපදෙස් ගෙන ඇත්තේ කුමන හේතුවක් නිසාද යන්න මෙතෙක් පැහැදිලි වී නැත. ඔහු කලහකාරී පිරිස විසුරුවා හැරීමට පියවර ගත් බව ඔහුගේ පෙත්සමේ සඳහන් කළද, විමර්ශනවලදී අනාවරණය වී ඇත්තේ පිරිස් "මයිනාගෝගම" සාමකාමී විරෝධතාවට ප්‍රහාර එල්ල කරද්දීත්, "ගෝඨාගෝගම" සාමකාමී විරෝධතාවට ප්‍රහාර එල්ල කරද්දීත් පියවරක් නොගෙන සිට කලහකාරී පිරිස සාමකාමී විරෝධතාකරුවන් රැසකට පහරදී ඔවුන්ගේ දේපළවලට හානි කළ පසු අදාළ පිරිස විසුරුවා හැරීමට උත්සාහ දරා ඇති බවයි. දේශබන්දු තෙන්නකෝන් මහතා ඉදිරිපිටදීම මෙම ප්‍රහාර එල්ල වී ඇතත් ඔහු අදාළ කලහකාරී පිරිස්වලින් එකදු පුද්ගලයකු හෝ එම අවස්ථාවේදී අත්අඩංගුවට ගැනීමට උපදෙස් දී ඇති බවක් විමර්ශනවලින් අනාවරණය වී නැත.

2022 ජූලි මස 09වැනි දා මහජන උද්ඝෝෂණ හමුවේ ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති මන්දිරයෙන් පිටව ගිය පසු ජනාධිපති මන්දිරයේ තිබී හමු වූ බව කියන රුපියල් 17,850,000ක මුදලක් අරගළකරුවන් පිරිසක් විසින් පොලීසියට භාර දීමෙන් පසු ඒ ගැන කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ බී 22516/22 දරන අංකය යටතේ නඩු කටයුත්තක් ආරම්භ විය.

2022 මැයි 09වැනි දින කොටුව ජනාධිපති මන්දිරයේ තිබී සොයා ගන්නා ලද එම මුදල 2022 ජූලි 28වැනි දා තෙක් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට භාර නොදීම, එම මුදල අධිකරණයට භාර දෙන ලෙසට කොටුව පොලිස් ස්ථානාධිපතිට නියම කර තිබියදී කොටුව පොලිස් ස්ථානය විසින් නොවන, කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය විසින් භාර දීම සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් පවත්වන ලෙසට 2022 ජූලි 29වැනි දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයක් ලබා දුන් අතර, නියෝගය ප්‍රකාරව පොලිස්පතිගේ උපදෙස් පරිදි පොලිස් විශේෂ විමර්ශන ඒකකය විමර්ශනයක් සිදු කර ඇත.

එම විමර්ශනයේදී අනාවරණය වී ඇත්තේ ජනාධිපති මන්දිරයේ කාමරයක තිබී අරගළකරුවන් විසින් සොයා දෙනු ලැබූ රුපියල් 17,850,000ක මුදල කොටුව පොලිස් ස්ථානයට ගෙන ගොස් ලේඛනගත කළ පසු එවකට බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා කොටුව පොලිස් ස්ථානාධිපතිගේ නිල ජංගම දුරකථනයට ඇමතුමක් ලබා දී එම අදාළ මුදල පසු දින ගෙන ගොස් එවකට මහජන ආරක්ෂක ඇමතිවරයාට භාර දෙන ලෙසට නියෝග ලබා දී ඇති බවයි. එම නීති විරෝධී නියෝගය සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සාගර ලියනගේ මහතා 2022 ජූලි 09වැනි දා රාත්‍රී 10.45ට පොලිස් ස්ථානයේ දෛනික තොරතුරු සටහන් පොත් අංක 01හි පිටු අංක 20හි ඡේද අංක 1172 යටතේ සටහන් තබා ඇත. එම සටහනේ කොටුව පොලිස් ස්ථානාධිපතිවරයා සඳහන් කර ඇත්තේ එසේ නඩු භාණ්ඩ ලෙස සකස් කර ඇති බවට ප්‍රකාශ කළද, දේශබන්දු තෙන්නකෝන් මහතා එය නොසලකා වහාම ඔහු පෙර ප්‍රකාශ කළ පරිදිම කටයුතු කරන ලෙසට නියෝග දී ඇති බවයි.

මේ සම්බන්ධයෙන් පොලිස් විශේෂ විමර්ශන ඒකකයේ අවසන් වාර්තාව 2023 පෙබරවාරි මස 09වැනි දින පොලිස්පතිවරයා වෙත භාර දී ඇති අතර, එමඟින් දේශබන්දු තෙන්නකෝන් මහතාට කොටුව පොලිස් ස්ථානයට භාර දී තිබූ රුපියල් 17,850,000ක මුදල සම්බන්ධව නීත්‍යනුකූල නොවන නියෝගයක් කොටුව පොලිස් ස්ථානාධිපති වෙත ලබා දීම සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් ලබා දීමට නිර්දේශ කර තිබිණි.

ඒ අනුව දේශබන්දු තෙන්නකෝන්හට චෝදනා පත්‍ර ලබා දීම සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත එවකට පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණි.

**වැලිගම W15 හෝටලයට වෙඩි තැබීම**

මාතර වැලිගම W15 හෝටලයට 2023 සැප්තැම්බර් 31වැනි දා අලුයම වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදු කළේ වැලිගම පොලිස් ස්ථානය විසින් වන අතර, ඊට අදාළව මාතර මහෙස්ත්‍රාත්වරයා වෙත බී 6314/253 යටතේ කරුණු වාර්තා කර තිබේ.

එම සිදුවීමේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරියකු මරණයට පත්වීම සම්බන්ධයෙන් වන මරණ පරීක්ෂණය මාතර මහෙස්ත්‍රාත් බී.ඒ. අරුණ ඉන්ද්‍රජිත් බුද්ධදාස මහතා ඉදිරියේ සිදු කෙරුණු අතර, 2024 ඔක්තෝබර් 22වැනි දින මෙම විමර්ශන පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබිය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන සිදු කරගෙන යන අතරතුරදී 2025 පෙබරවාරි මස 27වැනි දින මාතර මහෙස්ත්‍රාත් බී.ඒ. අරුණ ඉන්ද්‍රජිත් බුද්ධදාස මහතා විසින් මරණ පරීක්ෂණයේ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් දේශබන්දු තෙන්නකෝන් මහතා ඇතුළු පිරිසක් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කළේය.

ඒ අනුව දේශබන්දු තෙන්නකෝන් මහතා අත්අඩංගුවට ගැනීම සඳහා ඔහුගේ නිවසට විමර්ශන කණ්ඩායම් ගියද, ඔහු නිවසේ නොසිටි අතර, දින ගණනාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ඔහු සොයා දිවයිනේ විවිධ ප්‍රදේශවල විමර්ශන සිදු කළහ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ වේලාවෙන් මෙතුමාට තව විනාඩි 5ක් ලබා දෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
අනතුරුව ඔහු අත්අඩංගුවට ගැනීමෙන් වැළැකී සැඟවී සිටීම හේතුවෙන් මාතර මහෙස්ත්‍රාත් අධිකරණය ඔහුට 2025 මාර්තු 11වැනි දින විවෘත වරෙන්තු නිකුත් කළේය.

තමා අත්අඩංගුවට ගැනීම වළක්වන ලෙස ඉල්ලා දේශබන්දු තෙන්නකෝන් මහතා අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කර තිබූ අතර 2025 මාර්තු 17වැනි දින අභියාචනාධිකරණය එම රිට් පෙත්සම විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කළේය. එම පෙත්සම ප්‍රතික්ෂේප කිරීමේ නියෝගයේදී දේශබන්දු තෙන්නකෝන් මහතා නීතියට අවනත නොවීම ගැන දැඩි දෝෂාරෝපණයට ලක් විය.

දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පතිවරයා ලෙස කටයුතු කරද්දී වගඋත්තරකරුවකු, සැකකරුවකු වාගේම වූදිතයකු වශයෙන් නම් කරමින් මහාධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණ, අභියාචනාධිකරණ ඇතුළු සියලු අධිකරණවල නඩු 40කට වැඩි ප්‍රමාණයක් ඔහුට විරුද්ධව ගොනු කර තිබෙන බව මේ අවස්ථාවේදී ගරු කථානායකතුමනි, මම මේ සභාවට ප්‍රකාශ කළ යුතු වෙනවා. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ලෙස පත් කර ඇත්තේ ඔහුට එරෙහිව පැවති නඩු, ඔහුට එරෙහිව ඇති විමර්ශන සහ ඔහු සම්බන්ධයෙන් වන නඩු තීන්දු ගැන කිසිම සැලකිල්ලක් දැක්වීමකින් තොරවයි. එසේම ඔහු පොලිස්පතිවරයා ලෙස පත් කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය නීත්‍යනුකූලව ලැබී නොමැති තත්ත්වයක් යටතේයි. දේශබන්දු තෙන්නකෝන් නම් පුද්ගලයා පොලිස්පති තනතුරට නොගැළපෙන බවත්, ඔහුගේ පත්වීම නීත්‍යනුකූල නොවන බවත් සඳහන් කරමින් කාදිනල් මැල්කම් රංජිත් කොළඹ අගරදගුරුතුමා, නීතිය පිළිබඳ විද්වතකු වන මහාචාර්ය සාවිත්‍රි විජේසේකර මහත්මිය, තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය ඇතුළු පාර්ශ්ව කිහිපයක් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කළ අතර එම පෙත්සම් මූලික ඇගැයීමට ලක් කිරීමෙන් පසු දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ධුරයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම වළක්වාලමින් ශ්‍රේෂ්ඨාධිකරණය 2024 ජූලි මාසයේදී අතුරු තහනම් නියෝගයක් නිකුත් කළේය.

**පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය**

ඉතිහාසයේ පළමු වතාවට 2002 අංක 5 දරන පනත අනුව නිලධරයකු ඉවත් කිරීමේ කටයුතු ආරම්භ වූයේ පසුගිය මාර්තු 25වැනි දා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසකගේ අත්සන් සහිතව කථානායකතුමාට යෝජනාවක් භාර දීමෙන් පසුව ය. එම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු 2002 අංක 5 දරන පනත අනුව චෝදනා පරීක්ෂා කර බැලීම සඳහා කමිටුව පත් කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය හිමි විය.

මෙම කමිටුවේ කටයුතු අවසන් වීමෙන් පසු එහි වාර්තාව ගරු කථානායකතුමා වෙත භාර දීමෙන් පසු කථානායකවරයා එම තීන්දුවේ සංක්ෂිප්තයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. දේශබන්දු තෙන්නකෝන් මහතා විෂමාචාර ක්‍රියා හෝ බලය අවභාවිත කිරීම් සිදු කර ඇති බව එම කමිටුව ඒකමතිකව තීන්දු කර ඇති බව පසුව කථානායකවරයා දැනුම් දුන්නේය. එහි ප්‍රධාන තීන්දුව පිටු 207කින් සමන්විතය. චෝදනා පත්‍රයේ 16වැනි චෝදනාව දක්වා වූ චෝදනා කෙටුම්පත් කර තිබුණේ මාතර වැලිගම W15 හෝටලයට වෙඩි තැබීමේ සිද්ධියට අදාළවය. ඒ අනුව එම පළමු චෝදනා 16න් චෝදනා 14කටම දේශබන්දු තෙන්නකෝන් මහතා වැරදිකරු බව තීරණය කර තිබීම මෙහි විශේෂත්වය විය.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මෙම කමිටු වාර්තාවේ උපුටා ගැනීමක් සඳහන් කරමින් මගේ කථාව අවසන් කිරීමට සූදානම්.

> "මෙම වාර්තාවේ දක්වා ඇති හේතු නිසා කමිටුව නිගමනය කර ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිගේ ඉල්ලීම පරිදි ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම W15 හෝටලයට වෙඩි තැබීමට වැලිගමට ගිය බවයි. රටේ පොලිස්පතිවරයා එවැනි භයානක, නීති විරෝධී ක්‍රියාවලට පහසුකම් සපයනු ඇතැයි කිසිවෙකුට සිහිනෙන්වත් සිතිය නොහැකි විය. ශ්‍රී ලංකා පොලීසියට අයත් T-56 අවියකින් පෞද්ගලික හෝටලයකට වෙඩි තැබීමේ ක්‍රියාව, ඒ සඳහා ශ්‍රී ලංකා පොලීසියට අයත් වෑන් රථයක් භාවිත කිරීමේ ක්‍රියාව, එම නීති විරෝධී වෙඩි තැබීමේ ක්‍රියාවෙහි යෙදීමට ඔහු අණදෙන බලය ක්‍රියාත්මක කළ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් යොදවා ගැනීමේ ක්‍රියාව, අනාරක්ෂිත පුරවැසියෙකුගේ එම පෞද්ගලික හෝටල් දේපළට හානි කර ඔහුව බිය ගැන්වීමේ ක්‍රියාව. මේ අනුව කිසිම රටක පුරවැසියෙකුට එවැනි හැසිරීමක් ඇති පොලිස්පතිවරයෙකු තම රටේ පොලීසියේ සිටීම අවශ්‍ය නොවනු ඇත."

ගරු කථානායකතුමනි, ආරම්භයේ ඉඳලාම මෙවැනි විෂමාචාර ක්‍රියා රාශියකට වගකිව යුතු අපේ රටේ හිටපු අපකීර්තිමත්ම පොලිස් නිලධාරියෙක්, පොලිස්පතිවරයෙක් තමයි අද මේ පාර්ලිමේන්තු යෝජනා සම්මතයෙන් ඉවත් කිරීමට සූදානම් වෙන්නේ. ගරු කථානායකතුමනි, එම නිසා මෙම විවාදය පාර්ලිමේන්තුවේ ඉතිහාසගත වන විවාදයක් බවට පත් වෙනවා නොඅනුමානයි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Mujibur Rahuman. You have ten minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[අ.භා. 12.17]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම පොලිස්පති තනතුරේ ඉන්න දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා ඉවත් කිරීම සම්බන්ධයෙන් වන යෝජනාව ගැන අපට කිසිම ගැටලුවක් නැහැ. අපි එම යෝජනාවත් එක්ක ඉන්නවා. මොකද, දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති කරන්න 2024.02.24වැනි දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යෝජනාව ඉදිරිපත් කළාම, එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හිටපු විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, ගරු කබීර් හෂීම් මැතිතුමාත් දෙදෙනාම, එතුමා පත් කරන්න එපා කියලා ඡන්දය දුන්නා. ඒ වාගේම එදා තිබුණු ආණ්ඩුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මහින් නීති විරෝධීව එම යෝජනාව සම්මත කරගෙන එතුමා පත් කළාට පසුවත් සමගි ජන බලවේගය හැටියට අපේ පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියත්, හිටපු පළාත් සභා මන්ත්‍රී නිරෝෂන් පාදුක්ක මැතිතුමාත් 2024.07.24 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා එතුමාට විරුද්ධව තහනම් නියෝගයක් ගත්තා. ඒ තහනම් නියෝගය ගත්ත හින්දා තමයි දේශබන්දු තෙන්නකෝන්ට පොලිස්පති තනතුර අහිමි වුණේ; පොලිස්පති ධුරයේ වැඩ බලන්න බැරි වුණේ. සමගි ජන බලවේගය හැටියට එදා අපට පුළුවන්කම ලැබුණා, නිවැරදි දේශපාලන තීන්දුවක් ගන්න. එදා ඒ ගත් දේශපාලන තීන්දුව උඩ අද අපට පුළුවන් වෙලා තිබෙනවා, තමුන්නාන්සේලා ඉදිරිපිට නැඟිටලා මේ ගැන කථා කරන්න.

දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති තනතුරට ගෙන ඒම නීති විරෝධීයි කියන එක විතරක් නොවෙයි, ඔහුට තිබෙන චෝදනා හේතුවෙන් අපි ඔහු මේ තනතුරට පත් කරනවාට එරෙහි වුණාය කියන එක අද නැඟිටලා පැහැදිලිව කථා කරන්න අපට අයිතිය ලැබිලා තිබෙනවා, එදා අපි ගත් ඒ නිවැරදි තීන්දුව උඩ. නමුත් ඒ වෙලාවේ තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු තුන්දෙනෙකුත් විපක්ෂයේ සිටියා. ඒ අය උසාවි ගියාද? තමුන්නාන්සේලා පසුගිය ආණ්ඩුවේ හැමදේකටම හැමදාම උසාවි ගියා. නමුත්, දේශබන්දු තෙන්නකෝන්ගේ පත් කිරීමට විරුද්ධව එදා උසාවි ගියේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලාගේ නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා. එතුමා හැමදාම ශ්‍රේෂ්ඨාධිකරණයේ පඩිපෙළේ තමයි ඉන්නේ. හැමදාම voice-cuts දෙනවා. එතුමා හැම දේකටම උසාවි ගියා. නමුත්, දේශබන්දු තෙන්නකෝන් අයින් කරන්න උසාවි ගියේ නැහැ. ඇයි ඒ? ඇයි ගියේ නැත්තේ කියලා පොඩ්ඩක් කියන්න එපායැ. ඒක කියන්න බැහැ. ගියේ නැත්තේ ඇයි කියලා ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් අහගන්න. දේශබන්දු තෙන්නකෝන්ට විරුද්ධව උසාවියට ගියේ නැත්තේ මොකද, එදා ඩීල් තිබුණ නිසා. ඩීල් තිබුණු නිසා තමයි උසාවි ගියේ නැත්තේ.

ඒක තමයි ඇත්ත කථාව. තමුන්නාන්සේලා කියනවා නේ තමුන්නාන්සේලා කාත් එක්කවත් ඩීල් නැහැ කියලා. හැම දේකටම උසාවි ගිය තමුන්නාන්සේලා දේශබන්දු තෙන්නකෝන්ගේ පත්වීම නවත්වන්න උසාවි ගියේ නැහැ. ඒ ගියේ නැත්තේ, ඩීල් එකක් හින්දා. රවුෆ් හකීම් හිටපු ඇමතිතුමාගේ කථාවේදී ඒ අදාළ කෙනාගේ නමත් කියයි. ඒ ඩීල් එක හින්දා තමයි ගියේ නැත්තේ. ඒ ඩීල් එක හින්දා තමුන්නාන්සේලා එදා එහෙම හිටියා.

දේශබන්දු තෙන්නකෝන්ට තමුන්නාන්සේලා දැන් චෝදනා රාශියක් කළා. ඒ චෝදනාවල නොතිබුණු දේවල් තිබෙනවා. දේශබන්දු තෙන්නකෝන් මහත්තයා ගැන මේ පරීක්ෂණ කමිටු වාර්තාවේ තිබෙන්නේ W15 එක ගැන චෝදනාව විතරයි. ඒක තමයි මේ පරීක්ෂණ කමිටු වාර්තාවේ තිබෙන්නේ. ඇයි, අනෙක් චෝදනා දැම්මේ නැත්තේ? පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයේ පුපුරණ ද්‍රව්‍ය අරගෙන ගිය ලොරිය ගැලනිගම exit එකේදී ආරක්ෂක අංශ විසින් නැවැත්වුවත් call කරලා ඒකට යන්න දෙන්න කියලා අණ දුන්නේ එතුමා කියලා, ඇයි ඒ චෝදනාව ගෙනාවේ නැත්තේ? මෙතැන ඒ චෝදනාව නැහැ නේ. ඇමතිතුමා චෝදනා රාශියක් කිව්වා. නමුත් ඒ චෝදනාව මග හැරලා. ඇයි ඒක මග හැරුණේ? ඒක මග හරින්න විධියක් නැහැ නේ. ඒකත් ගෙනෙන්න. පානදුරට පුපුරණ ද්‍රව්‍ය ගෙනිච්ච වාහනය ගැලනිගම exit එකෙදී ආරක්ෂක අංශ නැවැත්වූවාම telephone කරලා ඒ ලොරිය release කරන්න කිව්වේ කවුද? ඇමතිතුමාගේ චෝදනා list එකේ ඒක නැහැ. තමුන්නාන්සේලාගේ වාර්තාවේත් නැහැ.

ඊළඟට, අරගළය. අරගළයට පහර දෙන එක ගැන ඇමතිතුමා කිව්වා. ඒක හරි. තෙන්නකෝන් මහත්තයා ඒක බලාගෙන හිටියා. අරගළයට පහර දෙන එකට එතුමාගේ සහයෝගයක් තිබුණා. ඒක ඇත්ත. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය තමයි, ඒ අරගළයේදී පහර කාපු, එදා දේශබන්දු තෙන්නකෝන් නඩු දාපු උදවිය තවම උසාවි යනවා. ඒගොල්ලන් නිදහස් කරන්න කිසිම දේශපාලන තීන්දුවක් ගන්නේ නැහැ නේ. ඇයි ඒ? දේශබන්දු තෙන්නකෝන් නඩු දාපු උදවිය තවම උසාවි යනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඇවිල්ලාත් මාස නවයක් වෙනවා. ඇයි, ඒ නඩු ටික අයින් කර ගන්නේ නැත්තේ? ඒ නඩු අයින් කරන්නේ නැහැ. ඇයි, ඒ නඩු තියාගෙන ඉන්නේ? සමහර විට නැවත අරගළයක් එයි කියලා බයට ඒ නඩු තියාගෙන ඉන්නවාද දන්නේත් නැහැ. ඇයි, ඒක අයින් කරන්නේ නැත්තේ?

ඊළඟ එක තමයි, "යුක්තිය" මෙහෙයුම. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා කළා නේ, "යුක්තිය" මෙහෙයුම කියලා එකක්. ඒ "යුක්තිය" මෙහෙයුමේදී වෙච්ච නීතියේ අවභාවිතාව ගැන ඔබතුමන්ලා පරීක්ෂණයක් කරනවාද? "යුක්තිය" මෙහෙයුමේදී නීතිය අවභාවිත කිරීම ගැන පරීක්ෂණයක් කරනවාද? ඒකත් කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මොකක්ද තමුන්නාන්සේලාගේ ස්ථාවරය? අපට කියන්න තිබෙන්නේ, "City of Dreams" නම් අපට පෙන්වන්න එපා කියන එකයි. අපට "City of Dreams" පෙන්වන්න එපා. අපරාධකාරයන්, වැරැදිකාරයන් ඉහළ තනතුරුවලට පත් නොවෙන්න අවශ්‍ය නීති ගෙනෙන්න. අපරාධකාරයන්, වැරැදි කරන අය ඉහළ තනතුරුවලට එන එක වළක්වන්න නීති ගෙනෙන්න.

ඒ වාගේම තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේත් ඉන්නවා, චෝදනා ලබපු අය. චෝදනා තිබෙන අය ඉන්නවා. නඩු තිබෙන අය ඉන්නවා. පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරය සම්බන්ධවත් චෝදනා තිබෙන එක්කෙනෙක් ඉන්නවා. ඒ අයට දේශපාලන ආවරණය දෙනවා. නීතියේ ආධිපත්‍යය හදන්න ඕනෑ නම් ඒගොල්ලන් අයින් කරන්න. ඒත් ඒ කිසිදු ක්‍රියාමාර්ගයක් නැහැ. ඒගොල්ලන් ආරක්ෂා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේලාගේ හිටපු කථානායකතුමාට ආචාර්ය උපාධිය ගැන ප්‍රශ්නයක් ආවා. එතුමා කිව්වා, මාස හයකින් ආචාර්ය උපාධිය ඉදිරිපත් කරනවා කියලා. ඒක තවම ඉදිරිපත් කරලා නැහැ. ජපානයට සුනාමියක් ආවා. ඒ සුනාමිය නිසා ආචාර්ය උපාධිය සොයා ගන්න බැරුව ඇති. දැන් කියන්න, එතුමා සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා? මොකද, එතුමාත් වංචාවක් කළා. එතුමා මේ රටටම වංචාවක් කළා. එතුමාට ආචාර්ය උපාධියක් තිබෙනවා කියලා ජනතාවට පෙන්වලා ඡන්දය අරගෙන එතුමා මේ සභාවට ආවාට පස්සේ, ආචාර්ය උපාධිය බොරුවක් කියලා ඔප්පු වුණා. අද වෙනකල් තමුන්නාන්සේලා ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. තමුන්නාන්සේලා නිකම් හිටියා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථාවක් තිබෙනවා, "ඔක්කෝම කුණු බෙංගාල බොක්කට" කියලා. දැන් දේශබන්දු මහත්මයාටත් වෙලා තිබෙන්නේ ඒක තමයි. ඇමතිතුමාත් කියපු විධියට, දේශබන්දු තෙන්නකෝන්ට මේ වාගේ දේවල් කරන්න උපදෙස් දීපු දේශපාලන අධිකාරියකුත් තිබුණා. ඇයි, ඒ දේශපාලන අධිකාරිය ගැන කථා කරන්නේ නැත්තේ? එහෙම නැතුව දේශබන්දු තෙන්නකෝන් නීතිය කඩාගෙන යන්න ඉඩ දුන්නේ නැහැ නේ. එදා හිටපු දේශපාලන නායකයන්ගේ වුවමනා ඉෂ්ට කරන්න ගිහිල්ලා තමයි අද දේශබන්දු තෙන්නකෝන් "බිලි බෝයි" වෙලා තිබෙන්නේ. අර පරණ කථාවකුත් තිබෙනවා නේ, පහළ තැනින් තමයි ජලය ගලා බහින්නේ කියලා. මම කලිනුත් ඒ ගැන කිව්වා. ඒ හින්දා තමයි දේශබන්දු තෙන්නකෝන් අද "බිලි බෝයි" බවට පත් වෙලා තිබෙන්නේ. නමුත්, අද ඒ දේශපාලන අධිකාරිය බේරිලා තිබෙනවා. ඒ නිලධාරියා වැඩ කරන්න ඕනෑ විධිය පිළිබඳව උපදෙස් දීපු, ඔහු මෙහෙයවපු දේශපාලන අධිකාරිය තමුන්නාන්සේලා නිදහස් කරලා තිබෙනවා. ඒ දේශපාලන අධිකාරිය ගැනත් හොයන්න ඕනෑ. නමුත්, දැන් ඒ දේශපාලන අධිකාරිය ගැන කථාවක් නැහැ. දේශපාලන අධිකාරියේ සහයෝගයක් නැතුව, දේශපාලන අධිකාරියේ වුවමනාවක් නැතුව එතුමාට විතරක් එහෙම තනියෙන් වැඩ කරගෙන යන්න බැහැ. එදා දේශබන්දු තෙන්නකෝන්ගේ ඒ හැසිරීමට බලපෑවා, දේශපාලන අධිකාරියේ තිබුණු වුවමනාවත්. තමුන්නාන්සේලා අද වන කොට ඒ චෝදනාව කෙටි කරලා තිබෙනවා, කොටු කරලා තිබෙනවා. ඒ හින්දා අද ඒ හැම දේම දේශබන්දු තෙන්නකෝන්ගේ පිටින් යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේක හැමෝටම හොඳ පණිවුඩයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, your time is up.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් කාලය අවශ්‍යද?

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ඔව්, මට තව කාලය ඕනෑ. තවත් මිනිත්තු 5ක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේකෙන් ලබා දෙනවා පණිවුඩයක්. අද ඉන්න රාජ්‍ය නිලධාරින්ටත් ලබා දෙනවා, පණිවුඩයක්. ඒ රාජ්‍ය නිලධාරින්ට ඉගෙනගන්න දෙයක් තිබෙනවා, දේශබන්දු තෙන්නකෝන්ට අද සිදු වෙච්ච දේ තුළින්. රාජ්‍ය නිලධාරින් මතක තබා ගන්න ඕනෑ, අද තිබෙන මේ ආණ්ඩුවේ දේශපාලන වුවමනා මත වැඩ කරන්න ගියොත් දේශබන්දු තෙන්නකෝන්ට වෙච්ච දේ තමයි තමුන්නාන්සේලාටත් වෙන්නේ කියන එක. ආණ්ඩු එනවා, යනවා. ආණ්ඩු සදාකාලික නැහැ. ජන මතය කියන්නේ කළු ගලේ කොටපු එකක් නොවෙයි. ඒක වෙනස් වෙනවා, කාලයෙන් කාලයට. තමුන්නාන්සේලාගේ ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් කියන විධියට වැඩ කරන රාජ්‍ය නිලධාරින් ටිකදෙනෙක් අපි අද හඳුනාගෙන තිබෙනවා. අපි දැක්කා, ඒගොල්ලෝ පසුගිය කාලයේ දේශපාලන වුවමනා මත වැඩ කළ බව. අන්න ඒ හින්දා ඒ රාජ්‍ය නිලධාරින්ට දේශබන්දු තෙන්නකෝන්ගෙන් පාඩමක් ඉගෙන ගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දඬුවම් විඳින දාට රාජ්‍ය නිලධාරින් බේරා ගන්න කවුරුවත් එන්නේ නැහැ. අද දේශබන්දු තෙන්නකෝන් වෙනුවෙන් කවුරුවත් පෙනී ඉන්නේ නැහැ නේ. අද ඔහු වෙනුවෙන් කවුරුවත් පෙනී ඉන්නේ නැහැ. ඒ හින්දා රාජ්‍ය නිලධාරින් තේරුම් ගන්න ඕනෑ, තමන්ගේ වපසරිය හා තමන්ට තිබෙන වගකීම දේශපාලන බලපෑම්වලින් තොරව ඉෂ්ට කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ගෙදර යවන්න අපි අත උස්සනවා. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. එතුමා ගෙදර යවන්න ඕනෑ. එතුමා ගෙදර යවලා අලුතින් පත් කරන කෙනා -ඒ එන කෙනා- මේ විධියට ගෙදර නොයන්න වැඩ කරන කෙනෙකු වෙන්න ඕනෑ. මොකද, ආයෙත් දේශබන්දු කෙනෙක් ගෙනැල්ලා වැඩක් නැහැ නේ. එහෙම කටයුතු නොකරන කෙනෙකු ගෙනෙන ක්‍රමය හදන එකට තමයි අපි system change කියන්නේ. ඒ system change එක කරනවා කියලා තමයි තමුන්නාන්සේලා බලය ලබා ගත්තේ. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා system change කරනවා කියලා බලයට ඇවිල්ලා අද මේ රාජ්‍ය යන්ත්‍රණය තුළ තමුන්නාන්සේලාට හිතවත්, පක්ෂයේ උදවිය හැම තැනටම පත් කරගෙන යනවා. ඒක system change එක නොවෙයි. ඒ ක්‍රමය තමයි දේශබන්දු ආපු ක්‍රමයත්. ඒක හොඳට මතක තබා ගන්න. දේශබන්දු ආපු ක්‍රමයටම තමයි තමුන්නාන්සේලාත් වැඩ කරගෙන යන්නේ. දැන් හැම තැනටම තමුන්නාන්සේලාගේ කට්ටිය පත් කරනවා නේ. තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු උදවිය, පක්ෂයට හිතවත් උදවිය, පක්ෂයට වැඩ කරපු උදවිය, මන්ත්‍රීවරුන්ගේ පුතාලා, මන්ත්‍රීවරුන්ගේ හිතවත්තු, ජනාධිපතිතුමාගේ කැම්පස් එකේ batchmatesලා, ජනාධිපතිතුමා එක්ක කාමරයේ නිදාගත්තු කට්ටිය, කේලම් කියන කට්ටිය පත් කරනවා. ඒ වාගේම, කැලණිය කැම්පස් එකේ හිටපු ඒ ඔක්කෝම දැන් මේ ආණ්ඩුවේ ඉන්නවා. ඉස්සර ඔබතුමන්ලා කිව්වා, Royal College එකේ කට්ටිය තමයි ඉන්නේ කියලා. දැන් අපට කියන්න තිබෙන්නේ ඔක්කෝම ඉන්නේ කැලණිය කැම්පස් එකේ කට්ටිය කියලායි. ඒ විතරක් නොවෙයි, රාජපක්ෂලාත් එක්ක හිටපු හොරුත් ඉන්නවා. මතක තබා ගන්න. රාජපක්ෂලාත් එක්ක හිටපු, දූෂණවලට, වංචාවලට අසු වුණු, එවැනි චෝදනා තිබෙන ඒ ඔක්කෝම එකතු වෙලා එක මිටකට අරගෙන තමයි තමුන්නාන්සේලා ආණ්ඩුව හදලා තිබෙන්නේ. දැන් හැම තැනම එවැනි එකතුවීම් තිබෙනවා.

තමුන්නාන්සේලා අද මේ කටයුත්තෙන් බලාපොරොත්තු වන්නේ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීම ලු. අපට කියන්නකෝ, අර නිදහස් කරපු කන්ටේනර් 309 සම්බන්ධයෙන් කොහේද නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වුණේ කියලා. ඇයි, ඒකට තවම නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ? ඇයි, ඒ ගැන තමුන්නාන්සේලා පරීක්ෂණ පවත්වන්නේ නැත්තේ? අඩුම ගණනේ ජනාධිපතිතුමා ඒ වාර්තාවවත් තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඇයි ඒක හංගන්නේ? හංගන්නේ තමුන්නාන්සේලාට අවාසි නිසා.

ඒ විතරක් නොවෙයි, ඊයේ පෙරේදා අපි දැක්කා ජනාධිපතිතුමාගේ ලේකම් පාවිච්චි කරන වාහනයේ එතුමාගේ නෝනා ගිහිල්ලා accident වෙලා තිබෙනවා. හරි නම් ජනාධිපති ලේකම් අයින් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා වේදිකාවල කිව්වා, එහෙම කරන්නේ නැහැ කියලා. නමුත්, තමුන්නාන්සේලා ආදර්ශයෙන් පෙන්වූයේ නැහැ. ජනාධිපති ලේකම්තුමා තවම තනතුරේ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mujibur Rahuman, you have only one minute remaining from your additional time.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
මට තවත් විනාඩි තුනක කාලයක් ලබා දෙන්න, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, we have to suspend for lunch.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
කථාව අවසන් කරන්න මට විනාඩි තුනක කාලයක් ලබා දෙන්න, please.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
හොඳයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරි නම්, ජනාධිපති ලේකම්තුමා අයින් වෙන්න ඕනෑ. තමුන්නාන්සේලා පසුගිය කාලයේ වේදිකාවල කියපු කථාවලට අනුව ඒක ආදර්ශයෙන් පෙන්වන්න ඕනෑ. නමුත්, තමුන්නාන්සේලා එය ආදර්ශයෙන් පෙන්වූයේ නැහැ. ඊළඟට, ජනාධිපතිතුමාගේ ආරක්ෂකයෝ රට ගිහින් එනකොට Airport එකෙන් අරක්කු අරගෙන ආවා. ඒ අයට මොකක්ද කළේ? ඒ අය transfer කළා. නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ.

දැන් යෞවන සමාජ ටිකේ බලය අල්ලන්න තමුන්නාන්සේලාගේ ඇමතිවරු, මන්ත්‍රීවරු ගිහින් ඍජුවම වැඩ කරනවා. තමුන්නාන්සේලා නීතියේ ආධිපත්‍යය හදනවා කියලා බලයට ඇවිත් නීතියේ ආධිපත්‍යය හදන්නේ නැතුව අද තමුන්නාන්සේලා සියලුදෙනාම තමුන්නාන්සේලාගේ පක්ෂ දේශපාලනය තහවුරු කරන්න වැඩ කරගෙන යනවා. තමුන්නාන්සේලා සැබෑ system change එක කරන්නේ නැතුව, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම ඇත්තටම කරන්නේ නැතුව දේශබන්දු තෙන්නකෝන් අයින් කරලා, තෙන්නකෝන් වෙනුවට තව කෙනෙක් ගෙන ඒම තුළින් -මේ ක්‍රමය තුළින්- දේශබන්දු තෙන්නකෝන්ලා වාගේ අය නැවත වතාවක් බිහි කරනවාය කියන එක මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Harshana Nanayakkara. You have an allocation of 14 minutes.

[අ.භා. 1.00]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මෙය ඓතිහාසික, ඉතාම වැදගත් විවාදයක් බව නොකිවමනායි. මීට පෙර මෙම විවාදයට සම්බන්ධ වූ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා විසින් දේශබන්දු තෙන්නකෝන්ගේ සමස්ත ඉතිහාසය, කළු ඉතිහාසය පිළිබඳ එකින් එක, එකින් එක කරුණු පැහැදිලි කරන්න යෙදුණා. එතුමා පැහැදිලි කර පෙන්වූවා, දේශබන්දු තෙන්නකෝන් වැනි අයෙක් මේ රටේ පොලිස්පති නොවිය යුත්තේ ඇයි කියන කාරණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, what is most important for a country is the rule of law. The absence of the rule of law will make people go wild; they do not feel it. Look at 2022, the "*Aragalaya*" time. Yes, there were problems with power cuts and issues relating to gas and petrol. All that is true. But, what the people felt most was a deep sense of injustice, which is being caused to them. When there is no rule of law in a country, රටක නීතියේ විධානය, නීතියේ ආධිපත්‍යය නැත්නම්, මිනිසුන්ට ඒ වේදනාව නිතරම තිබෙනවා. ඒක තමයි අරගළයෙන් දුන් පණිවුඩය. අන්න ඒ පණිවුඩය හොඳාකාරව කියවා ගත්ත අපි, ජාතික ජන බලවේගය වශයෙන් නීතියේ විධානයේ ආධිපත්‍යයට සැම කෙනෙක්ම යට විය යුතුයි කියන තත්ත්වය ගෙනාවා. දැන් අපේ ආණ්ඩුව පත් වෙලා, කැබිනට් අමාත්‍ය මණ්ඩලය පත් වෙලා මාස නවයකට ආසන්න කාලයක් වනවා.

අද වෙනකල් ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක් නීතිය කඩ කරමින්, නීතියට උඩින් ඉන්නවා කියලා මහජනතාවගෙන් කිසි කෙනෙක් කියන්නේ නැහැ. ඇයි ඒ? අපි ජනතාවට ආදර්ශයක් දුන්නා, නීතියට යටත් වෙලා. හැමෝම නීතියට යට විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අලුත් දේශපාලන සංස්කෘතිය ගෙනෙන්න උත්සාහ කළාට තවමත් කඩා බිඳුණු, සුන්බුන් වෙච්ච විපක්ෂය අපි දෙන්නා වූ ඒ යහපත් පණිවුඩය, ඒ යහපත් සංස්කෘතිය භාරගන්නා බවක් පෙනෙන්නේ නැහැ. ඔවුන් මෙතැනට ඇවිල්ලා අසත්‍ය, පදනම් විරහිත කථා කියමින් තමන්ම සුරාන්තයට පත් වන තත්ත්වයක් තමයි අපට දකින්නට තිබෙන්නේ. නීතියේ විධානයේ ආධිපත්‍යය කියන්නේ මොකක්ද? සුදු වෑන් එකකින් ගිහින් මිනිස්සු උස්සාගෙන යන එක ද, එහෙම නැත්නම් thugsලා දාලා ඔවුන්ට තඩිබාන එකද, බය කරන එකද? මෑත ඉතිහාසයේ පොලිස්පතිවරයෙක් impeach කරන්න we followed the rule of law; we followed the provisions of the Constitution, the provisions of the law. සමහර වෙලාවට අපට සහයෝගය දෙන අයත් කියනවා, "ඔයගොල්ලන්ට තුනෙන් දෙකක් තිබෙනවා නේ, ඇයි අත ගගා ඉන්නේ, මේක ගහලා දාලා ඉවරයක් කරන්න ඕනෑ නේ" කියලා. අන්න ඒ ක්‍රමය වැරදියි.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා ]

බලය තිබුණු අය එහෙම කළා. මෙම ස්ථානයටම මේ රටේ හිටපු Chief Justicesලා ගෙනැල්ලා සලකපු විධිය අපි දැකලා තිබෙනවා. Sir, it is not our weakness that we follow the law, but it is our strength; our patience is our strength; obeying the rule of law, even saying that the rule is subject to the law is our strength and not our weakness. අන්න ඒ මාර්ගයේ යමින් අපි අද 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ ප්‍රතිපාදන අනුව, ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව නීත්‍යානුකූලව මෙතැනට පැමිණ තිබෙනවා. නමුත්, අද විපක්ෂය මොකක්ද කියන්නේ? අපි නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැයි කියලා විපක්ෂයේ සමහර සුන්බුන් කෑලි, අර මැරෙන්න වාගේ කෑගහන කට්ටිය කියනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
බෙරිහන් දෙන කට්ටිය කියනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔව්, බෙරිහන් දෙන කට්ටියක්, බඩ වෙලිච්ච බැටලුවෝ වාගේ කට්ටියක් ඉන්නවා. ඊළඟට කියනවා, "යුක්තිය" මෙහෙයුම ගැන. බොරු පැමිණිලි දමපු කට්ටිය කියනවා, අපි යුක්තිය ඉටු කරන්නේ නැහැ ලු. මම පැහැදිලි කරන්නම්. අපි දන්නවා, දේශබන්දුගේ ඒ යුක්තිය මෙහෙයුම මාධ්‍ය සන්දර්ශනයක් විතරයි කියන එක. එයින් අහිංසක පුද්ගලයන්ට සෑහෙන හානියක් වුණා. ඒ සම්බන්ධයෙන් දැන් පැමිණිලි රාශියක් ලැබෙමින් පවතිනවා. දැන් ඒ සියල්ලම විමර්ශනය කරමින් ඔවුන්ට සහන දෙන්න සලකා බලනවා. අන්න ඒක තමයි මේ කරන්නේ.

ඊට පසුව කියන්නට යෙදුණේ මොකක්ද? තවම අර කන්ටේනර් වැඩේ අත හැරලාම නැහැ. කන්ටේනර් 309ක් ගැන කථා කළා. "නීතිය ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ වාර්තා පාර්ලිමේන්තුවට දෙන්නේ නැත්තේ ඇයි" කියලා අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැන අක්‍රමිකතාවක් වෙලා ඇති බවට හොයා ගත්තේ කවුද? ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කමිටුවකින්. එහෙම නැතුව ඒක විපක්ෂයෙන් පත් කළා නොවෙයි. ඒකේ තිබෙන කෑලි අල්ලාගෙන තමයි කට්ටිය දහලන්නේ. ඒ වාර්තාව ලබා ගත්තා. ඒක දෙන්න ඕනෑ පාර්ලිමේන්තුවට නොවෙයි. ඊට කලින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්නට ඕනෑ. විමර්ශනයක් කරලා සාක්ෂි අනාවරණය කරගෙන තමයි වැරදිකරුවන්ට දඬුවම් දෙන්න වෙන්නේ. එහෙම නැතුව අපේ ඇහේ හයියටවත්, තුනෙන් දෙකේ හයියටවත් නොවෙයි ඒක කරන්න වෙන්නේ. එහෙම කරන්න පුළුවන්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? රහසිගතව විමර්ශනය කරන්න ඕනෑ ඒවා ප්‍රසිද්ධ තොරතුරක් බවට පරිවර්තනය කරලා ඒ විමර්ශනය සාර්ථකව කරන්න බැහැ. කවුරු හරි කියනවා නම් එම වාර්තාව පාර්ලිමේන්තුවට ගෙනෙන්නය කියලා, එහි රහස්‍යභාවය නැති කරන්නය කියලා, එහෙම නම් බොහෝ වෙලාවට ඔහුට වුවමනාව ඇත්තේ අර මිනිස්සුන්ට -අක්‍රමිකතා කරපු කට්ටියට- උදව්වක් කරන්න වෙන්න ඇති. ඒ නිසා මම කියන්නේ ඒ විමර්ශන සිද්ධ වෙමින් පවතින බවයි; විමර්ශනයට භාර දී තිබෙන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට කියනවා, "මෙගොල්ලන් කථා කරන්නේ නැහැ, දේශබන්දු පිටුපස හිටපු දේශපාලන අධිකාරියට. මෙගොල්ලන් කථා කරන්නේ දේශබන්දු ගැන විතරයි" කියලා. ඉතින් පැහැදිලියි. අද මේ විවාදය තිබෙන්නේම දේශබන්දු කරපු විෂමාචාර සහ අක්‍රමිකතා ගැන කථා කරන්නයි. එයාගේ පිටුපස හිටපු දේශපාලකයන් කවුද? කලින් හිටපු රනිල්- රාජපක්ෂ ආණ්ඩුව; ගෝඨාභය ආණ්ඩුව. රනිල් ආණ්ඩුව, විශේෂයෙන්ම. ඒ නිසා මිනිස්සු කථාවෙලා රනිල් වික්‍රමසිංහ එකට බැස්සුවා මේ පාර්ලිමේන්තුව තුළ. ගෝඨාභය නැහැ, දැන්. මහින්ද රාජපක්ෂ මහත්තයා නැහැ, දැන්. ඒ කියන්නේ මොකක්ද? ජනතාව කථාවෙලා ඒගොල්ලන් ගෙදර යවලා ඉවරයි; ඒ දේශපාලන අධිකාරිය ගෙදර යවලා ඉවරයි. එතකොට, අර මන්ත්‍රීතුමා බලාපොරොත්තු වෙනවා නම් අපිත් මෙතැන ඒ ගැනම කථා කරන්න ඕනෑය කියලා, ඒක මෝඩ කථාවක්. මොකද, අපි මෙතැනට ආවේ දේශබන්දු සම්බන්ධයෙන් වූ කාරණාවට කරුණු දක්වන්නයි.

ඒ වාගේම මම තව එකක් කියන්නට ඕනෑ. අපි රාජ්‍ය නිලධාරින්ට කියනවා බය නැතුව වැඩ කරන්න කියලා. සද්භාවයෙන් ඔබ වැඩ කරන තාක්කල් මේ රජය ඔබ වෙනුවෙන් පෙනී සිටිනවා, ඔබ ආරක්ෂා කරනවා. ඒ ගැන රජයේ සේවකයෝ බය වෙන්න අවශ්‍ය නැහැ. රාජ්‍ය සේවය තුළ ඉන්න බහුතරයක් රාජ්‍ය සේවකයන් වැදගත්, හොඳ, ඒ වාගේම මහන්සි වෙන මිනිස්සු. නමුත් වංචනික, දූෂිත සහ වෙනත් දේශපාලන වුවමනාවලට කැරකෙන අතළොස්සක් වූ අතකොළු කිහිපයක් නිසා සමස්ත රාජ්‍ය සේවයටම සමහර වෙලාවට චෝදනා එල්ල වෙනවා. නමුත්, we will stand by the honest, hardworking employee. That is not a problem. We will stand by them. That is our duty.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා තවත් දේවල් කියන්න උත්සාහ කරනවා. ඒ සමහර ඒවාට උත්තර දිය යුතු නැහැ. මම ඒවා අතහැර දමන්නම්. මොකද, බල්ලන් ගෙනෙන්න plane යවපු කට්ටියත් දැන් කථා කරනවා, අපේ අය වාහන පාවිච්චි කරන එක ගැන. නමුත් එහෙම කිසිදු අවභාවිතයක් වෙලා නැහැ. නීතිය අනුව ඒ වැඩ කටයුතු කර තිබෙන්නේ. මේ විපක්ෂයේ වැඩ නිසා අපට විවාදයෙන් පිට තමයි ටිකක් කථා කරන්න වුණේ. මම දැන් නැවත අද මාතෘකාවට එන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි මූලිකවම සිද්ධ වෙන දේ මොකක්ද? කලින් හිටපු පොලිස්පති සී.ඩී. වික්‍රමරත්නගේ ධුර කාලය රනිල් වික්‍රමසිංහ විසින් අවස්ථා දෙකකදී පමණ -මාස තුන, තුන- "reload" ක්‍රමයට දීර්ඝ කරනු ලැබුවා. පසුව දේශබන්දු තෙන්නකෝන්ගේ පත් කිරීම සිදු වුණා. හැබැයි, ඒකත් ප්‍රශ්නයක් නැතුව නොවෙයි සිද්ධ වුණේ. මොකද, ඒකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ 4දෙනායි පක්ෂ වෙන්නේ. පක්ෂව 5දෙනෙක් අවශ්‍යයි. කථානායකවරයාත් ඔහුගේ තීරක ඡන්දය එම සභාවෙන් පිට දීලා තමයි ඒක අනුමත කළේ. ඒ කථානායකට එරෙහිව විශ්වාස භංග යෝජනාවකුත් ගෙනැවිත් මෙතැන විවාද කළා. නමුත් ඉතින් ඒ කාලයේ පැවැති ක්‍රමයේ හැටියට, සංයුතියේ හැටියට ඔහු ඒ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරනවා. හිටපු කථානායක වන මහින්ද යාපා අබේවර්ධන මහත්මයාට විරුද්ධව තමයි ඒක ඉදිරිපත් කළේ.

ඉන්පසුව සිද්ධ වෙන දේ තමයි අධිකරණ නියෝගයක් හරහා දේශබන්දු තෙන්නකෝන්ගේ වැඩ තාවකාලිකව නවත්වනු ලැබීම, ඔහුගේ පත්වීමට එරෙහිව තිබුණු FR එක නිසා. අපි මෙතැනදී ඒ තිබෙන චෝදනා එකක්වත් ගැන කථා කළේ නැහැ, අවශ්‍ය දේවල් කිව්වේ නැහැ යනාදී කරුණු විපක්ෂයෙන් කිව්වා. එම කමිටුවේ වාර්තාව තිබෙනවා. එම වාර්තාව සභාගත වෙලා තිබෙන්නේ හැම මන්ත්‍රීවරයාටම බලන්න පුළුවන් විධියට. ඒකේ පිටු හත්-අටසියයක් පමණ තිබෙනවා.

එතැන අංක 1 සිට 19 දක්වා චෝදනා තිබුණා. එයින් මූලිකවම අපි චෝදනා වෙන් කර ගත්තොත්, කොටස් දෙකකට දමා ගන්න පුළුවන්. එකක් තමයි වැලිගම හෝටලයේ වෙඩි තැබීමට අදාළ වූ චෝදනා ප්‍රමාණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒක අංකවලින් කිව්වොත්, අංක 1 සිට 10, අංක 13 සිට 16. අංක 11, 12 වෙනම ගන්නේ. අංක 1 සිට 10 සහ අංක 13 සිට 16 දක්වා වූ ඒ සියලු චෝදනාවල තිබෙන්නේ දේශබන්දු තෙන්නකෝන් විසින් වාචිකව, ලිඛිත කරුණු කිසිවක් නොමැතිව මෙහෙයුමක් සඳහා; නීති විරෝධී මෙහෙයුමක් සඳහා වැලිගමට යවන සිදුවීම සහ එතැන වන වෙඩි තැබීම ගැන. මෙතැන මූලිකම දේ තමයි, උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් පරීක්ෂක නිශාන්ත යන කණ්ඩායමට රාත්‍රියේ වැලිගමට ගොස් පැලැන W 15 හෝටලයට වෙඩි තැබීමට නීති විරෝධී නියෝගයක් දීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ චෝදනා පිළිබඳව විමර්ශන කමිටුවේ යම් නිරීක්ෂණ කිහිපයක් පමණක් මා ගෙන හැර දක්වන්නම්.

මධුරංග විසින් වෑන් රථයේ පිටුපස වම් පැත්තේ දොර විවෘත කර හෝටලයට වෙඩි තැබීය. එතැනට එනවා වැලිගම ජංගම මුර සංචාරයේ ජීප් රිය. ඔවුන්ට මේක හිතා ගන්න බැරිව මෙතැන අපරාධයක් වන බැවින් ඒක නවත්වන්න ඔවුන් වෙඩි පහරක් නිකුත් කරනවා. ඒ අනුව එක්කෙනෙක් තුවාල ලබලාත්, ඒකත් සඟවමින් කොළඹට එන්නේ නැතුව කරාපිටියට යන්න උත්සාහ කරන අවස්ථාවකදී ඔවුන් මුණ ගැහෙනවා. ඒ වාගේම මෙම සිද්ධිය වුණාට පස්සේ බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? අපක්ෂපාතී විමර්ශනයක්, මොකක්ද වුණේ කියලා සොයා බැලීමක්. නමුත් ඒක නොවෙයි වුණේ. ඒ කමිටුව නිරීක්ෂණය කරනවා, මෙම සිද්ධිය වසන් කිරීමට සහාය වූ සියලුදෙනා ආරක්ෂා කිරීමට දේශබන්දු කටයුතු කරන බව. මෙම වෙඩි තැබීමේ සිදුවීමට ඔහුගේ හවුල්කාරිත්වය පිළිබඳ පැහැදිලිව ඇඟවෙන්නේ අන්න ඒ කරුණු නිසාය කියලා නිරීක්ෂණය වෙනවා. මේ වෙඩි තැබීම සිදු වෙලා දින දෙකක් ඇතුළත, ඒ කියන්නේ විමර්ශනයක් කරලා කොහොමද ඒක වුණේ කියලා මොකුත් හොයන්නේ නැතුව, නාඳුනන කෙනෙකුගේ අතින් වෙඩි වැදුණා කියලා ඒ සිද්ධියෙන් මියගිය පොලිස් සැරයන් උපුල් යන අයට උසස්වීමක් ලබා දීමත්, රුපියල් මිලියන 1.5ක ත්‍යාගයක් නීතිවිරෝධී ලෙස අනුමත කර ප්‍රදානය කිරීමටත් මූලික වෙලා තිබෙන්නේ මේ වගඋත්තරකාර පොලිස්පතිවරයා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මියගිය පුද්ගලයාට එම මුදල ලැබුණු එක ගැන මම සන්තෝෂ වෙනවා. ඒක නොවෙයි, මම මේ කියන්නේ. පොලිස්පතිවරයා කටයුතු කරපු ආකාරය සම්බන්ධයෙන් තමයි මම කියන්නේ. ඉතින් එතැනින් පැහැදිලිව පෙනෙන්නේ මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපරාධයක් කරන එක වැරැදියි. කල්පනා කරලා බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රටේ පොලිස්පති රටේ නිල හමුදාව වන පොලීසිය යොදවලා අනාරක්ෂිත පුරවැසියන්ට වෙඩි තියන්න සලස්වනවා නම්, එවන් පොලිස්පතිවරයෙක් මේ රටට කුමටද? රට කොච්චර භයානකද? මෙන්න මේ වාගේ පුද්ගලයෙක් තමයි රනිල් -රාජපක්ෂ විසින් පොලිස්පති කරන්න උත්සාහ කරන්නේ. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා කිව්වා වාගේ මිනිස්සුන්ගේ රහස් ප්‍රදේශවල සිඩාලේප ගාලා, මානව හිමිකම් කඩ කෙරුවා කියලා ඔප්පුවෙලා Supreme Court එකෙන් තීන්දුව දීලා තිබෙන වෙලාවේ තමයි රනිල් වික්‍රමසිංහ මොහු පත් කරන්නේ. "සෑම ගෙදරකම සිටිය යුතු වෙද මහත්මයා සිඩාලේප" කිව්වාට, අන්තිමට ඒක දේශබන්දු වෙලා තිබෙන්නේ. මෙවැනි අමානුෂික කටයුතු කරපු පුද්ගලයෙක් පොලිස්පති බවට පත් කරන්නේ කෙසේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 17 සහ 19 චෝදනාවල තිබෙන්නේ ඔහු මාතර උසාවියෙන් වරෙන්තුවක් ලැබී තිබෙන අවස්ථාවේ සැඟවී සිටීම සම්බන්ධයෙන්. මම හිතන විධියට ඉතිහාසයේ පළමු වතාවට තමයි පොලිස්පතිවරයෙක් පොලීසියට බයේ හැංගුණේ. ඒකට හේතුව, ජාතික ජන බලවේග ආණ්ඩුවක් තිබෙන එක. මොකද, අපි නීතිය හරියට ක්‍රියාත්මක කරන නිසා. මීට කලින් එහෙම සිද්ධ වෙලා නැහැ. ඒ වාගේම ඔහුගේ ම රියදුරු සහ පෞද්ගලික ආරක්ෂක නිලධාරියාගේ සාක්ෂි අනුව, ඉදිරියේ දී සිදුවීමට නියමිත අත්අඩංගුවට ගැනීම වළක්වා ගැනීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා විචක්ෂණශීලී පියවර ගෙන, අනාවරණය නොවී පළා ගිය ආකාරය විස්තර කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔහුත් එක්ක හිටපු කට්ටිය කියනවා, ඔහු අධිකරණය මඟ හැර සැඟ වෙච්ච හැටි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාර්තාව අවසානයේ කියන්නේ මොකක්ද? වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ඉල්ලීම පරිදි අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් හෝටලයට වෙඩි තැබීමට වැලිගමට ගිය බවයි; ශ්‍රී ලංකා පොලීසියට අයත් T-56 අවියකින් පෞද්ගලික හෝටලයකට වෙඩි තැබීමේ ක්‍රියාව, ඒ සඳහා ශ්‍රී ලංකා පොලීසියට අයත් වෑන් රථයක් භාවිත කිරීමේ ක්‍රියාව, එම නීති විරෝධී වෙඩි තැබීමේ ක්‍රියාවෙහි යෙදීමට ඔහු අණදෙන බලය ක්‍රියාත්මක කළ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් යොදවා ගැනීමේ ක්‍රියාව, අනාරක්ෂිත පුරවැසියෙකුගේ එම පෞද්ගලික හෝටල් දේපළට හානි කර ඔහු බිය ගැන්වීමේ ක්‍රියාව සිදු වී ඇති බවයි. මෙය මාතර මහේස්ත්‍රාත් අධිකරණය විසින් අත්අඩංගුවට ගැනීම සඳහා නිකුත් කරන ලද නියෝගයක් හමුවේ සැඟවී සිටීමේ පසුකාලීන ක්‍රියාවලට අමතරව වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු සලකා බලන විට කිසිම රටක පුරවැසියෙකුට එවැනි හැසිරීමක් ඇති පොලිස්පතිවරයෙකු තම රටේ පොලීසියේ සිටීමට අවශ්‍ය වෙන්නේ නැහැ කියන සිතුවිල්ල එනවා කියලා අපි කියන්නේ මෙන්න මේ හේතුව නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙලෙස අවසන් කරන්නම්.

Hon. Deputy Speaker, why are we obeying the law? It is not just because we fear the law, but because there is a morality behind the law. That is why we obey the law. People must obey the law. Sir, let me quote from Romans 2:13.

> "For it is not the hearers of the law who are righteous before God, but the doers of the law who will be justified."

That is what God commands us. So, it is not those who hear the law, talk or rattle about the law, but the doers of the law who will be justified. Sir, we, the National People's Power are the doers. We are justified in the eyes of God and we will uphold the law in this country.

I thank you, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have nine minutes.

[අ.භා. 1.16]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ සියලු කථිකයන් එතුමන්ලාගේ කථාව ආරම්භ කළේ, "ඓතිහාසික දවසක්" කියලා. හැබැයි, ඔබතුමන්ලා මේක ඓතිහාසිකයි කියලා හිතනවා නම්, ඒ ඓතිහාසික කොටසට සමගි ජන බලවේගයත් සම්බන්ධයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ පුද්ගලයෙක් කේන්ද්‍ර කරගෙන කථා කරනවා නොවෙයි. මෙය දැනට අධිකරණයේ පවතින නඩුවක්. හැබැයි, අධිකරණ ඇමතිවරයාත් අධිකරණයේ පවතින නඩුවක් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ පූර්ණ විග්‍රහයක් කරනවා. මේ රටේ අධිකරණ ඇමතිවරයා සහ අනෙක් පැත්තෙන් පොලීසිය භාර ඇමතිවරයා. හැබැයි, ස්ථාවර නියෝග 91 (ඊ) යටතේ අධිකරණයේ පවතින නඩුවක් පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කිරීම සඳහා ක්‍රමයක් තිබෙනවා. නමුත් ඒ සියල්ල කඩාකප්පල් කරලා තිබෙනවා. ඒක ඉතිහාසගතයි. මොකද, කථානායකතුමා විධියට එතුමාත්, මේ ආණ්ඩුවත් පැහැදිලිවම ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීම කියන කාරණයට වගකියන්න ඕනෑ. පුද්ගලයෙක් ගැන නොවෙයි මේ කියන්නේ. මොකද, ඒ පුද්ගලයා පිළිබඳව තමුන්නාන්සේලා හැමෝටම තක්සේරුවක් තිබෙනවා. ඒ ගැන මම කථා කරන්නේ නැහැ. හැබැයි, මේ සිදුවීම කේන්ද්‍ර කරගෙන පාර්ලිමේන්තුවේ විවාදයක් ගොඩනඟලා, ඒ විවාදය ගොඩනැඟීම තුළ යම් කිසි බලපෑමක් අධිකරණ ක්‍රියාදාමයට සිදු වෙනවා නම් ඒක සාධාරණ නැහැ කියන මතයේ මම ඉන්නවා, ගරු ඇමතිතුමනි. ඒක සාධාරණ නැහැ.

ඒ වාගේම තමුන්නාන්සේලා නොයෙක් කාරණා කථා කළා. චෝදනා පත්‍රය බැලුවාම, ඒ චෝදනා පත්‍රයේ බහුතරයක් තමයි 'B' වාර්තාවෙන් මාතර දිසා අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. දිසා අධිකරණයෙන් ඉදිරිපත් කරපු චෝදනා පත්‍රය ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මම Parliamentary Business Committee එකේදිත් මේ පිළිබඳව සඳහන් කළා. එහෙම නම්, මේ විවාදය තුළ අධිකරණ ක්‍රියාදාමයට කිසිම හානියක් වෙන්නේ නැහැ කියලා කථානායකවරයා විවෘතව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළ යුතුයි, එතුමා ඒ පිළිබඳ satisfied, එතුමා ඒ පිළිබඳ වගකීම භාර ගන්නවා කියලා. එහෙම නැත්නම් සභානායකවරයාට තිබුණා, ස්ථාවර නියෝග අත්හිටුවන්න. එවැනි ක්‍රමයක් තිබියදී, තමුන්නාන්සේලා එම ක්‍රමයෙන් පිට යන්නේ ඇයි කියන එකයි මම අහන්නේ. දැන් ඔබතුමන්ලා කථා කරන්නේ, "කලින් අය මේ ක්‍රමයෙන් පිට ගියා, අපි පිට යන්නේ නැහැ" කියලා නේ. දැන් ඔබතුමන්ලා නේ පිට යන්නේ, අපි නොවෙයි නේ. හැබැයි, කලින් අයට චෝදනා කරන ගමන්, කලින් අය වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ වැරැද්ද ඊට වඩා හොඳට ඔබතුමන්ලා කරනවා. ගරු ඇමතිතුමා කිව්වා, සිඬාලේප ගෑවා කියලා. කාගේද? කොහේද? කවුද බලන් හිටියේ කියලා අහන්න වෙනවා. සිඬාලේප ගාපු කථා අපි ඉස්සරත් අහලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඔන්න, පටන් ගත්තා. පුළුවන් නම් point of Order එකක් අරගෙන නැඟිටලා කියන්න, බලන්න. නැඟිටලා කියන්න. කියන්නකෝ. ඒක නේ කියන්නේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා කිසිම පදනමක් නැතිව අවුරුදු 15ක් තිස්සේ එකම බොරුව කියලා, දැන් වෙනසක් කරන්න කියලා ඇවිල්ලා මොකක්ද කළ වෙනස? බොරු කියන එක විතර නේ, කරන්නේ. *[බාධා කිරීම්]* දැන් ආයේ පටන් ගන්නවා. ඔන්න, ආයේ පටන් ගන්නවා. මේක තමයි JVP එකේ විනය. මේ පරීක්ෂණ කරන්න එපා, තීන්දු ගන්න එපා කියලා ඔබතුමන්ලාට අපි කියන්නේ නැහැ. අපි කියන්නේ තීන්දු ගන්න. පරීක්ෂණයක් කරනවා නම් ඒක සාධාරණව කරන්න කියලායි.

හැබැයි, ඒ ක්‍රියාදාමය ඇතුළේ යම් කිසි පුද්ගලයෙකුට හෝ system එකට අසාධාරණයක් වෙනවා නම්, ඒකට අපි එකඟ නැහැ. මේ පොලිස්පතිවරයා කියන්නේ එක් පුද්ගලයෙක් විතරයි. හැබැයි, පොලීසිය කියන්නේ මේ පුද්ගලයා විතරක් නොවෙයි. අධිකරණයේ නඩුවක් තිබියදීත් ඔබතුමන්ලා මේ විවාදය කරලා මුළු පොලීසියටම අගෞරව කළාම හරිද? ඔබතුමන්ලාගේ දේශපාලන අවශ්‍යතාව මත කිසිම හේතුවක් නැතුව පොලිස් නිලධාරීන් transfer කරනකොට, OICලා මාරු කරනකොට, SIලා බඳවා ගැනීම නවත්වනකොට, ඒවා හොඳයි. ඒවායේදී හරි සාධාරණව ඔබතුමන්ලා හැසිරෙනවා. මේ විධියට හැම ආණ්ඩුවකින්ම යම් බලපෑමක් වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ඊට අඩු වැඩි වශයෙන් නොවෙයි, ඒ වාගේ දෙගුණයක් කරනවා. OIC කෙනෙක් transfer කරනවා නම්, අඩු ගණනේ ඒකට හේතුවක් කියන්න ඕනෑ. නමුත් එහෙම කරන්නේ නැහැ. පොලීසියට SIලා බඳවා ගැනීම නවත්වනවා නම්, අඩු ගණනේ ඒකට හේතුවක් කියන්න ඕනෑ. නමුත් එහෙම කරන්නේ නැහැ. හැබැයි, අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ? අනෙක් පැත්තෙන් මේ රටේ මරණාධාර සමිතියේ ඉඳන් යෞවන සමාජ ව්‍යාපාරය දක්වා දේශපාලනය කරනවා. එහෙම කරලා තමන්ගේ දේශපාලන හස්තය පුරවාගන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලනය කිරීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. හැබැයි ඒක කැත විධියට, ජරා විධියට, පහත් විධියට කරන්න එපා. *[බාධා කිරීමක්]* හරි, හරි. ඔන්න පටන් ගත්තා. මේ, පාපිසි කැලි. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපති කිව්වා නේ, පාර්ලිමේන්තුවට පාපිසි ආවා කියලා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, පාර්ලිමේන්තුවට පාපිසි ගෙනාවාම ඔන්න ඕක තමයි වෙන්නේ. යන්නෙ කොහෙද ඇහුවාම, මල්ලෙ පොල් කියනවා. කියන දේ තේරෙන්නේ නැහැ. දැන් මම කියන්නේ මොකක්ද? මම ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ මොකක්ද? ඔබතුමන්ලා මේ රටේ ජනතාවට පොරොන්දු වෙලා ආවා, හරියට වැඩ කරනවා කියලා. ඉතින්, හරියට වැඩ කරන්න. හරියට වැඩ කරනවා නම්, මේ එකම කාරණය නැවත නැවත කියන්නේ නැහැ නේ. දැන් මටත් ඒක කට පාඩම්. මොකද, මම නැඟිටපු වෙලාවේ ඉඳන් අර පැත්තෙන් කියන්න පටන් ගන්නේ එකම දේ. ගිය මාස අටේත් එහෙමයි, පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාගේ තුන්දෙනෙක් ඉන්නකොටත් එහෙමයි, හයදෙනෙක් ඉන්නකොටත් ඒ කථාවමයි, දැන් 159දෙනෙක් ඇවිල්ලාත් කියන්නේ ඒ කථාවමයි. අනේ, මමත් ආසයි අලුත් දෙයක් අහගන්න. *[බාධා කිරීමක්]* අලුත් දෙයක් අහන්න. ඔබතුමන්ලාට ඕනෑ නම් දේශබන්දු මහත්මයා එක්ක යන්න මගේ ලැම්බෝගිනිය දෙන්නම්. ඒකේ දමලා ගෙදර යවන්න. ඕනෑ නම් හෙලිකොප්ටරයත් දෙන්නම්. එහෙම නේ පටන් ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඉල්ලන්නේ එක දෙයයි. මේ ස්ථාවර නියෝග උල්ලංඝනය කරන එක නවත්වන්න. ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා, පාර්ලිමේන්තුව ඒකාධිපති පාලනයකට ගෙනැල්ලා, ආණ්ඩු පක්ෂයේම අතකොළුවක් බවට පත් කරන එක නවත්වන්න. මම ගරු විපක්ෂ නායකතුමාගෙනුත්, පක්ෂ නායකයන්ගෙනුත් ඉල්ලනවා, ඒකට ඉඩ දෙන්න එපා කියලා. මොකද, ඒක හොඳ නැහැ. *[බාධා කිරීමක්]* අන්න ආයෙත් පටන් ගත්තා. ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රය ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්න. හැබැයි, එය ස්ථාවර නියෝගවලට යටත්ව කරන්න පුළුවන්කම තිබෙනවා. කථානායකවරයාට පුළුවන්, මේ පිළිබඳව පාර්ලිමේන්තුවට පැහැදිලි ප්‍රකාශයක් කරන්න. මේ පිළිබඳව ප්‍රකාශයක් කරලා මේ විවාදය පටන් ගන්න තිබුණා. එහෙම නැත්නම්, Standing Orders අත්හිටුවලා මේ විවාදය කරන්න තිබුණා. අපි එපා කිව්වේ නැහැ නේ. හැබැයි, එහෙම තිබියදීත් තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? අපට 159දෙනෙක්

ඉන්නවා, ඒ නිසා අපට ප්‍රශ්නයක් නැහැ, අපි ඕනෑ විධියකට වැඩ කරනවා, ඔබතුමන්ලාට ඕනෑ විධියට ඔබතුමන්ලා කර ගන්න, අපි බලය පෙන්වන්නම් කියලා තමයි තමුන්නාන්සේලා ගනුදෙනු කරන්නේ.

තමුන්නාන්සේලා රාජ්‍ය සේවය සම්පූර්ණයෙන් මර්දනය කරලා තිබෙනවා. නාවික හමුදාපතිවරයා අත්අඩංගුවට අරගෙන තිබෙනවා. නාවික හමුදාපතිවරයා අත්අඩංගුවට අරගෙන, උසාවියට ඉදිරිපත් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසාවියට ඉදිරිපත් කරලා ඔහු හඳුනා ගැනීමේ පෙරට්ටුවකට දමනවා. හඳුනා ගැනීමේ පෙරට්ටුවකට දමලා, එල්ටීටී එකේ හිටපු බුද්ධි අංශ ප්‍රධානියා ගේනවා, නාවික හමුදාපතිවරයා හඳුනා ගන්න. *[බාධා කිරීමක්]* ඒ පුද්ගලයාගේ නම මම කියන්නම්. ඔබතුමන්ලා වාගේ පාර්ලිමේන්තුවේ නැති අයගේ නම් කියන්න මම කැමැති නැහැ. ඒ න්‍යාය අපට නැහැ. තරහා වෙන්න එපා. *[බාධා කිරීමක්]* නෑ, හික්, කික්, කික් කිය කියා ඔතැනට වෙලා ඉන්න. ඔහොම ඉඳලා බලන්න වෙන දේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තිබෙන්නේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශ්නයක්. හැබැයි, තමුන්නාන්සේලා නීතිය ක්‍රියාත්මක කරන්නේ දේශපාලන අරමුණක් ඇතිව නම්, තමුන්නාන්සේලාගේ පටු අරමුණකට නම්, ඒක සාධාරණ නැහැ කියන එකත් පක්ෂයක් විධියට අපි දැඩි සේ විශ්වාස කරනවා. ඒ නිසා අධිකරණ ක්‍රමයට හානියක් නොවන විධියට තමුන්නාන්සේලා මේ විවාදය කරන්න. ගරු අධිකරණ ඇමතිතුමා කථාව පටන් ගත්තේ එ් "බී" වාර්තාවේ කාරණා සම්බන්ධ කරලා නේ. ඒක තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය. හැබැයි අපි පක්ෂයක් විධියටත්, මම පෞද්ගලිකවත් මේ විවාදයේදී ඡන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මෙය අධිකරණයේ පවතින කාරණයක්. *[බාධා කිරීම්]* බලාගෙන ඉන්න, බළලා පැන්නේ කාගෙන්ද කියලා තව ටිකකින් දැනගන්න පුළුවන්. සිඩාලේප ගා ගන්නකොට තේරෙයි. *[බාධා කිරීම්]* ගාපු තැන දන්නේ ඔබතුමන්ලා නේ. බලාගෙන හිටියේ ඔබතුමන්ලා නේ. ටෝච් එක ගැහුවේ ඔබතුමන්ලා නේ. ඒ නිසා සිඩාලේප ගාපු කෙනායි, ටෝච් එක ගහපු කෙනායි අතර ඩීල් එක අපි දන්නවා. දෙදෙනාම පාර්ලිමේන්තුවේ නැහැ. එක්කෙනෙක් ජනාධිපති වෙලා හිටපු නිසා මම කියන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන මම කථා කරන්න යන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලන්නේ එකම දෙයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් මේ පාපකර්මයට අත ගහනවා. ඔබතුමා උගත්, හොඳ වෘත්තිකයෙක්. ඒ වාගේම ගරු කථානායකතුමාත් වෘත්තිකයෙක්. හැබැයි, මේ ආණ්ඩුවේ වුවමනාව ඔබතුමන්ලා ඉටු කරන්න ගිහිල්ලා, ස්ථාවර නියෝග උල්ලංඝනය කරලා, සමස්ත පාර්ලිමේන්තුවට වාගේම අධිකරණ පද්ධතියටත් කැලලක් ඇති කරන විධියට කටයුතු කරන්න එපා කියන ඉල්ලීම මා කරනවා.

ඔබතුමාගෙනුත් මම ඉල්ලන්නේ මේ ක්‍රියාදාමය ඇතුළේ යම් කිසි කෙනෙක් අධිකරණයට බලපෑමක් වෙන ආකාරයේ යම් කාරණයක් කරනවා නම් ඔබතුමා හෝ මැදිහත් වෙලා ඒක නවත්වන්න කියලායි. හැබැයි, අපි පැහැදිලිව විශ්වාස කරනවා, අධිකරණයේ තිබෙන නඩුවක් පිළිබඳව විවාද කිරීමෙන් වැළකී සිටිය යුතුයි කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Arun Hemachandra. You have 11 minutes.

[අ.භා. 1.25]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඓතිහාසික මොහොතක් කියලායි මම හිතන්නේ. අපි නීත්‍යානුකූලව, යම් කිසි රාමුවක් තුළ, රටේ පිළිගත් නීතිය අනුව මේ නිලධාරියා ඉවත් කරන්න හදද්දී, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය මෙම පාර්ලිමේන්තුවටම කැඳවා නීති විරෝධීව දෝෂාභියෝගයක් ඉදිරිපත් කරපු පුද්ගලයන් අපට ඇඟිල්ල දිගු කරන්නේ ඇයි කියලා අපට හිතාගන්න පුළුවන්. ඇත්තටම එතැනදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වුණාය කියන එක ඔප්පු වුණා. එවැනි පුද්ගලයන් අපට ඇඟිල්ල දිගු කරන හේතුව මොකක්ද කියලා අපට හිතාගන්න පුළුවන්. ඒ වාගේම දූෂිත, වංචනික, කෲර මෙම නිලධාරියා ආරක්ෂා කිරීම සඳහා දරන මේ උනන්දුව සම්බන්ධවත් අපට යම් කිසි අදහසක් තිබෙනවා. ඒකට අදාළ පිළිතුර ඉදිරි කාලයේදී එතුමන්ලාට ලැබෙයි කියලායි මම හිතන්නේ.

මෙතැන සිඩාලේප පිළිබඳ කථාවක් මතු වෙලා තිබුණා. ඒ කථාව පදනම් විරහිතව විහිළුවකට වාගේ ලක් කරලා තිබුණා. මේ quotation එකෙන්ම මගේ කථාව පටන්ගන්න කැමැතියි: "The Supreme Court found that Tennakoon had beaten the petitioner with a 'three-wheel rubber band' after stripping him naked and ordering him to rub Siddhalepa on his genitalia." මම හිතන විධියට මේක තේරුම් ගන්න පුළුවන් ප්‍රජාවක් තමයි මෙතැන ඉන්නේ. මේ පුද්ගලයා එවැනි කෲර පුද්ගලයෙක්. මම යළිත් වතාවක් මතක් කරන්න කැමැතියි, මීට කලින් සිද්ධ වෙච්ච දේවල් සම්බන්ධව. කැන්ගරු අධිකරණ තිබුණේ. නමුත් මෙතැනදී අපි උත්සාහ කරන්නේ යම් කිසි කාලයක් ගියත් පිළිවෙළට මේ වැඩේ කරගන්නයි. ඒ ඕනෑකම තමයි අපට තිබෙන්නේ. ඒ වාගේම අපි දිගින් දිගටම කිව්වා, මේ පුද්ගලයා පොලිස්පති විධියට පත් කරන්න එපා කියලා. කලින් හිටපු පොලිස්පතිතුමාට යම් කිසි නමක් පාවිච්චි කරලා තිබුණා, "රීලෝඩ් පොලිස්පතිවරයා" කියලා. ඒ කියන්නේ මෙතුමාට තමයි ඊළඟට පොලිස්පති ධුරය එන්නේ. කලින් හිටපු කෙනාට රීලෝඩ් විධියට පොලිස්පති ධුරයේ කාලය දීර්ඝ කරගෙන ගිය එක තමයි කළේ. ඒකට හේතුව තමයි, සමාජයේ ලොකු විරෝධයක් තිබීම. ඒ වාගේම විවිධ ක්‍රියාවලි උල්ලංඝනය කළාය කියන චෝදනා මේ පුද්ගලයාට එල්ල වෙලා තිබුණා. එවන් පුද්ගලයෙක් ගැන තමයි අද අපි කථා කරන්නේ. මෙම පුද්ගලයා ඉවත් කිරීමට අදාළ මෙම විවාදය සිද්ධ වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළයි. ඒ නිසා අපි සියලුදෙනාගෙන්ම ඉල්ලන්නේ මේ කාර්යභාරයට අපිත් එක්ක සම්බන්ධ වෙලා දායකත්වය ලබා දෙන්න කියලායි.

මෙතැනදී සිදුවීම් කිහිපයක් ගැන කථා කරන්න ඕනෑ. විශේෂයෙන් ගෝල්ෆේස් ප්‍රදේශයේ ඉතාම සාමකාමීව සිද්ධ කරපු අරගළයට, විරෝධතාවට සම්බන්ධ වෙච්ච පුද්ගලයන්ට ඉතාම කෲර විධියට පහර දීමක් සිද්ධ වෙලා තිබුණා. ඒ සිදුවීම ගත්තොත්, සමස්තයක් විධියට දේශපාලනය තමයි ඒ පිටුපස තිබුණේ කියලා අපි දන්නවා. ඊට අදාළ වීඩියෝ පටය අරගෙන බලද්දී පේනවා, ඒ කාලයේ බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට කටයුතු කළ දේශබන්දු තෙන්නකෝන් කියන මේ තැනැත්තා එතැන හිටියා කියලා. ඔහු ඒ සිදුවීම වළක්වන්න කිසිම උත්සාහයක් දැරුවේ නැහැ කියන එක අන්තිමේදී උසාවියේදීත් ඔප්පු වුණා. ඒක එකක්. ඒක තමයි chain of causation; ඒ සිදුවීමත් එක්ක තමයි එම තත්ත්වය දිගටම

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

ලංකාව පුරාම ව්‍යාප්ත වුණේ. එතුමා ඒ නිශ්චිත මොහොතේදී ඒක වැළැක්වූවා නම් එච්චර ලොකු ප්‍රශ්නයක් මේ රටේ මතු වෙන්නේ නැහැ කියන එක තමයි අපේ මතය.

ඊළඟ කාරණාව, වැලිගම W15 හෝටලයට එල්ල කළ ප්‍රහාරය. මේ සම්බන්ධයෙන් එක දෙයක් මම කියන්න කැමැතියි. අතිරේක නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මෙහෙම සටහනක් දාලා තිබුණා: "This suspect is no less than an organized criminal, second only to figures like "Makandure Madush" and "*Harak Kata"*. He is a master actor, evading his arrest, hiding his identity, only appearing when cornered."

ඇත්තටම මේ පුද්ගලයාට විවිධ තැන්වලදී චෝදනා එල්ල වෙලා තිබෙනවා. ඒ වාගේම මම ළඟ තවත් සාක්ෂි තිබෙනවා. මම ඒවාත් ඉදිරිපත් කරන්නම්.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ සිද්ධ වුණු "යුක්තිය" මෙහෙයුම ගැන. මීට කලිනුත් මන්ත්‍රීවරු මේ ගැන කථා කරලා තිබුණා. අපේ ආණ්ඩුවෙන් ඒ සිද්ධියට අදාළ පුද්ගලයන්ට යම්කිසි සාධාරණයක් ඉෂ්ට කරන්න ඇත්තටම බලාපොරොත්තු වෙනවා. තරුණයන් 30,000කට අධික සංඛ්‍යාවක් ඒ අවස්ථාවේදී අත්අඩංගුවට පත් වුණා, විශේෂයෙන්ම කිසිම warrant එකක් නැතුව. ඒ වාගේම සමහර නිලධාරින් අපිත් එක්ක කථා කරනකොට කියන කාරණයක් තමයි, යම්කිසි list එකක් එවනවා, ඒ list එකට අනුව ඒ අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නවාය කියන එක. විශේෂයෙන් මම දන්නවා, කිසිසේත්ම මේ වාගේ දේවල්වලට සම්බන්ධ නොවුණු විශාල පිරිසක් අත්අඩංගුවට පත් වෙලා තිබුණු බව. ඇත්තටම ඉන් පසුව ඒ සමහර අයට police clearance පවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබුණා. ඒ සියලු දේටම වග කියන්න ඕනෑ මේ වාගේ දූෂිත පොලිස් නිලධාරින්.

මේ අවස්ථාවේදී මම statements කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. CID Director, ප්‍රසන්න අල්විස් මහතාගේ statement එකක මෙහෙම තිබෙනවා.

"Case files involving sensitive subjects were routinely delayed or buried. We were asked not to proceed on files unless approved through unofficial channels. There were clear political interests in suppressing some investigations, especially those linked to the 2022 protest events. The chain of command was frequently bypassed or manipulated."

ඒ කියන්නේ, සාක්ෂි සම්බන්ධව හරියාකාරව ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වාගේම නීත්‍යානුකූලව යම්කිසි ක්‍රියාවලියක් කරන්න අවස්ථාව ලැබිලා තිබියදී හිතාමතාම සමහර දේවල් පරක්කු කරමින්, සමහර දේවල් නොමඟ යවපු අවස්ථා දක්නට තිබෙනවා. ඒ වාගේම ASP Waruni Bogahawattaගේ statement එකත් මම මේ අවස්ථාවේදී කියවන්න කැමැතියි. "Internal pressure and suppression" කියලා තමයි එහි තිබෙන්නේ. එහි තවදුරටත් සඳහන් වෙනවා, "I was specifically instructed through verbal communications from senior officers to refrain from pursuing legal action against politically affiliated individuals. When I questioned the legality of such instructions, I was warned about potential transfers. I stood my ground. I witnessed how certain investigations were stopped halfway or redirected under unofficial orders. It was a culture of fear" කියලා. විශේෂයෙන් මෙම පුද්ගලයා යටතේ වැඩ කළ ඒ පොලිස් නිලධාරින්ට සහ නිලධාරිනියන්ට තිබුණු ප්‍රධානම ප්‍රශ්නය තමයි, යම්කිසි සිදුවීමකට විරුද්ධව කථා කළා නම්, නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරන්න උත්සාහ කළා නම්, ඒකට විරුද්ධව කටයුතු කළ සංස්කෘතියක් පැවතීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන අපි නියෝජනය කරන්නේ අලුත් දේශපාලන සංස්කෘතියක් බව හැමෝම දන්නවා. අපි, අපේ පොලීසියට ආදරෙයි. අපි කිසිසේත්ම පොලීසියට බලපෑම් කරන්නේ නැහැ. උදාහරණයට ගත්තොත්, මම මේ නියෝජ්‍ය ඇමති ධුරයට පත් වෙලා අදට මාස 8ක් සම්පූර්ණ වෙනවා. මේ මාස 8ක කාලය තුළ මම දෙවතාවක් දඩ කොළ ගෙවලා තිබෙනවා. මගේ රියදුරු යම්කිසි ආකාරයක වැරැද්දක් කළා නම් මම කෙළින්ම කියනවා, ඔයගොල්ලන් ගිහිල්ලා ඒකට අදාළ දඩය ගෙවන්න, දඩ කොළ ගන්න කියලා. එවැනි සංස්කෘතියක් ඇති කරන්න තමයි අපි උත්සාහ කරන්නේ. එවැනි සංස්කෘතියක් තමයි අපි මේ රට තුළ ව්‍යාප්ත කරන්න හදන්නේ. නමුත් අවාසනාවන්ත විධියට බොහෝ දේශපාලකයන්ගේ දේශපාලන වැරදි පිටුපස්සේ කිසියම් නිලධාරින් කණ්ඩායමකුත් හිටියා. අද වනකොට ප්‍රධාන පෙළේ උසස් නිලධාරින් කිහිපදෙනෙකුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරමින් සිටිනවා. විශේෂයෙන්ම මෙම පොලිස්පතිවරයා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා, ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වාගේ විවිධ ආයතන ප්‍රධානීන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන තත්ත්වයක් තමයි අද වනකොට දක්නට තිබෙන්නේ. අපි දන්නවා, දේශපාලනයට සම්බන්ධ දිගටම ප්‍රශ්න තිබුණු බව. දැන් ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් වෙන්න පටන් ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී දේශපාලනයට සම්බන්ධ වුණු නිලධාරින් සම්බන්ධවත් ක්‍රියාත්මක විය යුතුයි කියලා අපි හිතනවා. ඒ වාගේම මම සඳහන් කරන්න ඕනෑ, මේක කිසිසේත් සමස්ත නිලධාරින්ට, එහෙම නැත්නම් සමස්ත විධායක ක්ෂේත්‍රයට විරුද්ධව සිද්ධ වෙන දෙයක් නොවෙයි කියන එක. අපි දන්නවා, බහුතරය ඉතා අවංක නිලධාරින් බව.

ඒ වාගේම අපි, අපේ පොලීසියට ආදරෙයි. ඕනෑම ප්‍රශ්නයකට මුහුණ දෙද්දී අපට මුලින්ම මතක් වෙන්නේ පොලිස් දෙපාර්තමේන්තුව. ඒක ගංවතුරක් වෙන්න පුළුවන්, traffic එකක් වෙන්න පුළුවන්, මොකක් හරි සිදුවීමක් වෙන්න පුළුවන්, අපරාධයක් වෙන්න පුළුවන්. එවැනි අවස්ථාවකදී අපි මුලින්ම උදවු ඉල්ලන්නේ පොලිස් දෙපාර්තමේන්තුවෙන්. අපරාධ වැරදි සහිත පුද්ගලයන් සුළු සංඛ්‍යාවක් විසින් සිදු කරන ක්‍රියා පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු සමස්ත විධායක ක්ෂේත්‍රයට බලපානවා නම් එවැනි වැරදි කරන පුද්ගලයන් ඉවත් කිරීමට අපි අනිවාර්යයෙන් කටයුතු කළ යුතුයි. අපි ඒ සඳහා සියලුදෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා.

අවසාන කාරණයත් කියලා මගේ කථාව මම නවත්වන්නම්. යම්කිසි raid එකක් කළ අවස්ථාවේ යම් පුද්ගලයකුගේ ගෙදරින් අරක්කු බෝතල් 1,000කට අධික සංඛ්‍යාවක් අත්පත් කර ගන්න හැකි වුණා. Foreign liquor, වයින් ඇතුළු අරක්කු බෝතල් 1,000කට අධික සංඛ්‍යාවක් අත්පත් කර ගන්න හැකි වුණා කියන්නේ ඒක සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. එක්කෝ මේ පුද්ගලයා අල්ලසක් විධියට ඒ ටික අරගෙන තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් නීති විරෝධීව අරක්කු ජාවාරම් කරන කෙනෙක් වෙන්න ඕනෑ. ඔහුට විරුද්ධව ඉදිරිපත් කරලා තිබුණු චෝදනාවලින් බහුතරයක් චෝදනා ඔප්පු වෙලා තිබෙනවා.

ඒ නිසා මේ යෝජනාවට පක්ෂපාතීවත්, මේ අදාළ පුද්ගලයාට විරුද්ධව යම්කිසි ආකාරයකින් කටයුතු කරමින් ඔහු ඉවත් කරන්න අපි බැඳිලා ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have seven minutes.

[අ.භා. 1.35]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිළිබඳ යෝජනාව සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී අපේ පැහැදිලි ස්ථාවරය තමයි, අපි මේ යෝජනාවට පක්ෂයි කියන එක. විශේෂයෙන්ම මේ කාරණාව පිළිබඳව සාකච්ඡා වෙනකොට අපි වර්තමානය වාගේම අතීත ක්‍රියාදාමය පිළිබඳවත් සොයා බලන්නට ඕනෑ. සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් අපේ ක්‍රියාව තුළින් වර්තමානයේ පමණක් නොවෙයි, අතීතයේ සිටම දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ධුරයට නුසුදුසුයි කියන ස්ථාවරයේ ඍජුවම හිටියා. ඒ ගැන කථා නොකර ඉන්නත්, නිරුපද්‍රිත ස්ථාවරයක සිටින්නටත්, එය මඟහරින්නටත් අපි කටයුතු කළේ නැහැ. පැහැදිලිවම මම කියන්න කැමැතියි, මේ පොලිස්පති පත් කිරීමේ යෝජනාව ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් වුණාම ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කරපු සමගි ජන බලවේගයේ මමත්, කබීර් හෂීම් මැතිතුමාත් එකහෙළාම ඒකට විරුද්ධ වුණු බව. ඒ වාගේම අපි ඒකට විරුද්ධව ඡන්දයත් දුන්නා.

අපි පොඩ්ඩක් බලමු, ඒ කාල වකවානුව තුළ - මට මතක හැටියට 2024 පෙබරවාරි මාසයේ - JVP එකේ ස්ථාවරය වුණේ මොකක්ද කියලා. මොකක්ද NPP එකේ ස්ථාවරය වුණේ? එතුමන්ලාට ස්ථාවරයක් තිබුණේ නැහැ. එතුමන්ලා නිහඬ ප්‍රතිපත්තියක හිටියා, අදහස් ඉදිරිපත් කළේ නැහැ. එතුමන්ලා නිහඬව බලාගෙන හිටියා, සිදුවීම් නිර්මාණය වෙන ආකාරය. මොකක්ද එදා ව්‍යවස්ථාදායක සභාවේ සිද්ධ වුණේ? ව්‍යවස්ථාදායක සභාව සම්පූර්ණයෙන්ම රටේ උත්තරීතර නීතිය අමු-අමුවේ උල්ලංඝනය කළා; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළා. ව්‍යවස්ථාදායක සභාවේ පොලිස්පති පත් කිරීමේ මේ ක්‍රියාකාරකම සම්බන්ධයෙන් මහින්ද යාපා අබේවර්ධන කථානායකවරයා එවකට සිටි ජනාධිපතිවරයාට යවපු 2024.02.26 දිනැති ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

එතැනදී මොකක්ද වුණේ? හතරදෙනෙක් දේශබන්දු තෙන්නකෝන්ගේ පත් කිරීමට පක්ෂ වුණා. මමත්, කබීර් හෂීම් මැතිතුමාත් ඒකට විරුද්ධ වුණා. තවත් සාමාජිකයෝ දෙපළක් ඡන්දය දීමෙන් වැළකී සිටියා.

නමුත් කථානායකවරයා තීන්දු කරනවා, වැළකී හිටපු ඒ ඡන්ද දෙක විරුද්ධ යැයි අර්ථකථනය කරන්නේ නම්, තීරක ඡන්දය කථානායකවරයාට පාවිච්චි කරන්න පුළුවන් කියලා. ඊට පස්සේ කථානායකවරයා ජනාධිපතිට ලියුම යවනවා. ඉන්පසුව ක්ෂණිකවම දින කිහිපයක් ඇතුළත ඒ පත් කිරීම සිද්ධ වෙනවා.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මම අහන්න කැමැතියි, මේ දේ සිදු වෙනකොට ජනතා විමුක්ති පෙරමුණ මේ කාරණාව පිළිබඳව වචනයක් කථා කළා ද කියලා. මේ සම්බන්ධයෙන් NPP එක අදහස් ඉදිරිපත් කළා ද? ඔවුන් මේ පාර්ලිමේන්තුවේ අදහස් ඉදිරිපත් කරලා ඒ පත් කිරීමට විරුද්ධ වුණාද? රටේ උත්තරීතර නීතිය අමු අමුවේ උල්ලංඝනය කරලා රටේ පොලිස්පතිවරයා පත් කරපු වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ ඒ වාගේ නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ඇයි? ඒක අපි දැනගන්න කැමැතියි.

සමගි ජන බලවේගය එතැනින් නතර වුණේ නැහැ. සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් -අපි- අධිකරණයට ගියා. නිරෝෂන් පාදුක්ක, හිරුණිකා ප්‍රේමචන්ද්‍ර යන අය මේකට විරුද්ධව මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කළා. අපි විතරක් නොවෙයි, තවත් සිවිල් සංවිධාන, තවත් පාර්ශ්වකරුවන් ගණනාවක් මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කළා. අපි දැනගන්න කැමැතියි, ජනතා විමුක්ති පෙරමුණ හෝ NPP එක මේ තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් නොකළේ ඇයි කියලා. එතැනදීත් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ඇයි? සමගි ජන බලවේගයේ අපි, සමගි ජන සන්ධානයේ අපි ඍජු ස්ථාවරයක හිටියා. ඒක හැංගි හොරා ස්ථාවරයක් නොවෙයි. එළිපිටම හිටපු ස්ථාවරයක්. කට වචනයෙන් පමණක් නොවෙයි, voice-cutsවලින් නොවෙයි, කථා කළා වාගේම ක්‍රියාවෙනුත් මේ නීති විරෝධී, ව්‍යවස්ථා විරෝධී ක්‍රියාවලියට විරුද්ධව අපි නැඟී සිටියා. JVP එක, NPP එක එදා නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළා. අපි අධිකරණයට ගිහිල්ලා interim order එකක් ලබා ගත්තා. Interim order එක ලැබුණු දිනට පසු දිනයේම වාගේ මොකක්ද එවකට හිටපු අගමැතිවරයා කරන්නේ? අගමැතිවරයා මේ සභාවට ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය ගත්ත තීන්දුව කෙළෙසමින්, අභියෝගයට ලක් කරලා මහා ලොකු කථාවක් කළා. එදා හිටපු අගමැතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවත් අභියෝගයට ලක් කරමින්, ඒ ලබා දුන් interim order එකට විරුද්ධව කථා කරපු කාරණා සියලුදෙනාගේ දැනගැනීම සඳහා මම **සභාගත*** කරනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන්නු තීන්දුවට විරුද්ධව අගමැතිවරයා කථා කරලා අවසන් වුණාට පස්සේ, සමගි ජන බලවේගය වෙනුවෙන් අපි නැඟී හිටලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අයිතිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සුජාතභාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන උල්ලංඝනය කරන්නට කථානායකවරයාටත් බැහැ, විධායක ජනාධිපතිවරයාටත් බැහැයි කියන කාරණාව මේ සභාවට ඉදිරිපත් කළා. අපි එසේ ඉදිරිපත් කළත්, එවකට හිටපු අගමැතිවරයා ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන්නු ඒ interim order එක අභියෝගයට ලක් කරනකොට, මේ සභාවේම හිටපු JVP, NPP මන්ත්‍රීවරු තුන්දෙනා ඒ ගැන වචනයක් කථා කළා ද? ඒකට කරුණු ඉදිරිපත් කළා ද? ඇත්තවශයෙන්ම නැහැ. ඔවුන් නිහඬ ප්‍රතිපත්තියක් තමයි අනුගමනය කළේ.

ඉතින් මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, වර්තමාන රජය දේශබන්දු තෙන්නකෝන්ට විරුද්ධව විමර්ශන කමිටුව ස්ථාපනය කරනකොට අපි ඒකට සහයෝගය දුන්නා; ඒකට එකඟ වුණා; අපේ අනුමැතියත් ආශීර්වාදයත් ලබා දුන්නාය කියන එක. ඒ නිසා දේශබන්දු තෙන්නකෝන් ඉවත් කිරීමේ යෝජනාව සාකච්ඡාවට භාජන වෙන මේ අවස්ථාවේදී අපි පැහැදිලිව කියන්නට ඕනෑ, අපි මුල ඉඳලාම ඉතාම ඍජු තැනක,

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

සෘජු ස්ථාවරයක හිටියාය කියන එක. අපේ ළඟ පතෝල න්‍යායක් තිබුණේ නැහැ. පතෝල ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. සෘජු ප්‍රතිපත්තියක ඉඳගෙන අපි කටයුතු කළා. ඇත්තවශයෙන්ම දේශබන්දු තෙන්නකෝන්ගේ පත් කිරීම අනීතිකයි; නීති විරෝධියි; ව්‍යවස්ථා විරෝධියි. එවන් තීන්දුවකට අපට ප්‍රවේශ වන්නට පුළුවන්කම ලැබුණේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට තිබුණු බලතලත් එක්ක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ස්ථාපනය කළේ, සංවරණ සහ තුලන ක්‍රමය ශක්තිමත් කරන්නයි, tripartite system of government යටතේ විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යන ආයතන තුනට එකිනෙකාට checks and balances කරන්න හැකි වෙන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපට ලැබී තිබෙන අලුත්ම ආරංචිය තමයි, රජය පිඹුරුපත් සකස් කරනවා ලු, සැලසුම් නිර්මාණය කරනවා ලු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බලය අඩු කරන්න; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බලය හීන කරන්න. එහෙම දෙයක් සිදු වුණොත් අපි අහන්න කැමැතියි JVP/NPP රජයෙන්, ඔබතුමන්ලාගේ සහ ගෝඨාභය රාජපක්ෂ රජය අතර තිබෙන වෙනස මොකක්ද කියලා. මොකද, ගෝඨාභය රාජපක්ෂ රජයත් තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව බලතල නැති Parliamentary Council එකක් බවට පත් කළා, පාර්ලිමේන්තු සභාවක් බවට පත් කළා. අපි කියනවා රජයට, ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කරන, බෙලහීන කරන මෙවන් කටයුත්තකට මුල පුරන්නට එපා කියලා. ඒක ඔබට වරම ලබා දුන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවට කරන ද්‍රෝහීකමක්ය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි. අප කළ යුත්තේ, සංවරණ සහ තුලනය වර්ධනය කිරීම මිස, checks and balances වැඩි කිරීම මිස අඩු කිරීම නොවෙයි. ඉතාම පැහැදිලියි, දේශබන්දු තෙන්නකෝන්ගේ පත් කිරීම නීති විරෝධියි; ව්‍යවස්ථා විරෝධියි කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලායි ඒක කළේ. හැබැයි ඒ හැම අවස්ථාවකදීම, උල්ලංඝනය කරලා කටයුතු කළ හැම අවස්ථාවකදීම සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් හැංගි මුත්තන් නටන්නේ නැතුව එළිපිටම මුල සිටම ඒ අනීතික පත් වීමට විරුද්ධ වුණු බව ප්‍රකාශ කරමින්, මේ යෝජනාවට අපේ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින්, මගේ අදහස් ඉදිරිපත් කිරීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Watagala. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.49]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතාම තීරණාත්මක මොහොතක, ඉතිහාසයේ පළමු වතාවට, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යටතේ මේ රටේ පොලිස්පතිවරයා ඉවත් කරන සංවාදයටයි මා සහභාගි වන්නේ.

අපි විශේෂයෙන්ම හිතන්න ඕනෑ, වෙනත් රාජ්‍ය සේවකයන්ට වඩා වෙනස් තත්ත්වයක් පොලිස් සේවයට තිබෙන බව. මොකද, පොලීසිය කියන්නේ එක්තරා ආකාරයක අර්ධ විනිශ්චිත ආයතනයක්. අර්ධ විනිශ්චිත ආකාරයට තමන්ගේ රාජකාරිය කරන ආයතනයක්. එම නිසා නීතිය හා විධානය ක්‍රියාත්මක කිරීමට අදාළව පොලීසිය කරන රාජකාරිය දිහා අනෙක් රාජ්‍ය සේවකයෝ බලාගෙන ඉන්නවා. අනෙක් රාජ්‍ය සේවකයන්ට ආදර්ශයක් වන විධියට පොලීසිය ක්‍රියාත්මක විය යුතුයි කියන එක ගැන විවාදයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඇත්තවශයෙන්ම දේශබන්දු තෙන්නකෝන් කියන පොලිස්පතිවරයා සම්බන්ධයෙන් තිබෙන background එක, විත්‍රය ගත්තාට පසුව ඔහු ආදර්ශයක් සපයන පොලිස්පතිවරයෙකු නොවන බවට ඕනෑ තරම් කරුණු තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර යසන්ත කෝදාගොඩ මැතිතුමා පසුගිය දවසක එක්තරා නඩු තීන්දුවක ප්‍රකාශයට පත් කළා, විශේෂයෙන් රජයේ සේවකයෙකු කටයුතු කළ යුතු ආකාරය මොකක්ද කියන කාරණයට අදාළව. ඇත්තවශයෙන්, එක පැත්තකින් ඒක guideline එකක් වාගේ. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ නඩු තීන්දුව ප්‍රකාශයට පත් කරමින් රජයේ සේවකයන් සම්බන්ධයෙන් එතුමා මොකක්ද කිව්වේ? ඒ මූලධර්මික කථාව තමයි, ව්‍යවස්ථාවෙන් පැවරෙන කාර්යයන් වාගේම ව්‍යවස්ථාවෙන් සෘජුවම නොපැවරෙන කාර්යයන් සම්බන්ධයෙන්ද තමන්ගේ අභිමතානුසාරී බලය මත කටයුතු කරන්න රජයේ සේවකයෙකුට පුළුවන්කමක් තිබෙන්න ඕනෑය කියන එක. හැබැයි, ව්‍යවස්ථාවෙන් පැවරෙන කාර්යයන් වාගේම, අභිමතානුසාරී බලය අයුතු ලෙස පාවිච්චි කළාය කියන එක ගැන විවාදය තමයි පසුගිය කාලාන්තරය පුරාවටම තිබුණේ. මේ කියන නඩුවේදී, "අභිමතානුසාරී බලය" කියන කාරණාව හරියටම පෙන්වා දෙමින් ඒ විනිශ්චයකාරතුමා කියනවා, ඒ අභිමතානුසාරී බලය පාවිච්චි කරන කොට ඕනෑම රජයේ නිලධාරියෙකු ප්‍රවේශම් වෙන්න ඕනෑ ඒ තීන්දුවට ආපු හේතුව කොහේ හරි තැනක සටහන් කරන්න. මොකද ඒක තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන හොඳම සාක්ෂිය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බස්නාහිර පළාත් පාලන කොමසාරිස්වරියගේ තීන්දුව අභියෝගයට ලක් කරලා පසුගිය දවස්වල ලොකු වාදයකුත් ඇති වුණා. විපක්ෂයේ චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාට මම විවෘත අභියෝගයක් කළා. එතුමාත් ඒ විවෘත අභියෝගය භාර ගත්තා. මම කිව්වා, "විවෘත ඡන්දය" කියන එකක් මෙකේ නැහැ කියලා. එතුමා කිව්වා, තිබෙනවා කියලා. එහෙම කියලා මෙතැනට බොරු ලියවිල්ලක් ගෙනැල්ලා පෙන්නුවා. ඒක expire වෙච්ච එකක්. ඇත්ත ලියවිල්ලේ ඒ "විවෘත" කියන වචනය අයින් කරලා. මොකක්ද

අභියාචනාධිකරණය කිව්වේ? අභියාචනාධිකරණය කිව්වා, පනතට අනුව කටයුතු කරන්න ඕනෑ, අභිමතය ප්‍රශ්න කරන්න අධිකරණයටත් බැහැ කියලා. නමුත්, මොකක්ද මේ පාර්ලිමේන්තුව කළේ? අභිමතය ප්‍රශ්න කළා. අභිමතය ප්‍රශ්න කරන්න බැහැ. අභිමතය ප්‍රශ්න කළොත්, ඒක අභිමතයක් වෙන්නේ නැහැ. ඒක තමයි අභියාචනාධිකරණය කිව්වේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රාජ්‍ය නිලධාරින්ගේ ස්වභාවයයි මම ඒ කිව්වේ.

එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිද්ධියට අදාළ නීතිමය කටයුතු කරද්දී රජයේ නිලධාරියෙකු විධියට හිටපු නීතිපතිතුමාගෙන් වෙච්ච වැරැදි කිහිපයක් ගැන කියලා තිබෙනවා. නීතිපතිතුමා කියන්නේ රජයේ නිලධාරියෙක්. රජයේ නිලධාරියෙකු ලෙස එතුමාගේ යුතුකම පැහැර හැරීම පිළිබඳව අවස්ථා තුනකදී කියා තිබෙනවා. ලංකාවේ වාණිජ මහාධිකරණයක් තිබියදී ඒ නඩුව සිංගප්පූරු වාණිජ අධිකරණයේ දැම්මේ ඇයි? ඒක වැරැදියි කියලා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ කියනවා. ඒ වාගේම, සාගර නීතිය පිළිබඳ ත්‍රිපුද්ගල කමිටුවක් කියලා තිබියදීත් එතුමා ඒක කළේ ඇයි කියලා අහනවා. ඒ වාගේම, MEPA එකේ සභාපතිතුමියත් රජයේ නිලධාරිනියක ලෙස ගත් තීන්දු තීරණ අතිශය වැරැදියි කියලා නඩු තීන්දුවේ ලියා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපරාධ නඩු පවරද්දී නැවේ අයිතිකාරයාට නඩු පැවරුවේ නැත්තේ ඇයි, ඒක රජයේ නිලධාරියෙක් තමන්ගේ යුතුකම පැහැර හැරීමක් කියලා කියා තිබෙනවා. වැඩ බලන පොලිස්පතිතුමා ඇතුළු පොලිස් නිලධාරින් මේ වෙලාවේ අපේ කථා අහගෙන ඉන්නවා. මා හිතන්නේ, එතුමන්ලා මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව follow කරන්න ඕනෑ, එතුමන්ලා මේ ආදර්ශය ගන්න ඕනෑ කියලායි. මොකද, නඩු තීන්දුවලින්, පවතින නීතියේ නැති තත්ත්ව උදා වෙනවා. ඒක තමයි, interpretation එක. රජයේ නිලධාරින් විධියට ඒවා follow කරලා තමයි, රජයේ නිලධාරිනුත්, අපිත් එකතු වෙලා මේ ගමන යන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණයට යටත්ව මම කාරණා කිහිපයක් පැහැදිලි කරන්න කැමැතියි.

දැන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා මේ ගරු සභාවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? මාර වැඩේ! ඔයගොල්ලෝ ස්ථාවර නියෝග අනුගමනය කරන්න දන්නේ නැහැ, ඔයගොල්ලෝ අධිකරණ ප්‍රවේශය පිළිබඳව හරියට දන්නේ නැහැ, ස්ථාවර නියෝග 91(f) යටතේ ඔයගොල්ලන් මේ කරන්නේ ලොකු වැරැද්දක් කිව්වා. ස්ථාවර නියෝග 91(f) යටතේ *sub judice* matter එක address කරලා තිබෙනවා, කමිටුවේදී. කමිටුවේ පළමුවෙනි විරෝධතාව ඒක. That was overruled; ඒක overrule කරලා තිබෙනවා, මේක කිසිසේත්ම පාර්ලිමේන්තු කටයුතුවලට බාධාවක් නොවෙයි කියලා. ඒ විතරක් නොවෙයි, ඒ නිර්දේශයේ කියා තිබෙනවා, "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91 අදාළ වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ කථිකයන් ලෙස ඇතුළත් වන අවස්ථාවලදීය. මෙම කමිටුවේ සාමාජිකයන් පාර්ලිමේන්තුවේ සාමාජිකයන් නොවේ. එය හුදෙක් විෂමාචාරී ක්‍රියාවක් පමණි" කියලා. අනේ නාමල්! මෙතැනට ඇවිල්ලා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ගැන කථා කරනවා. එදා ශිරානි බණ්ඩාරනායක මැතිනියට මොකක්ද කළේ? තාත්තාටයි, බාප්පාටයි ඕනෑ විධියට තීන්දු ලිව්වේ නැහැ කියලා ශිරානි බණ්ඩාරනායක මහත්මියව මෙතැනට ගෙනැල්ලා නඩු ඇහුවා. නඩු අහලා මොකක්ද කළේ? අද අපි ඉදිරිපත් කළ මේ motion එක එදා ඉදිරිපත් කළේ නැහැ. ඒ procedure එක වැරැදියි. ස්ථාවර නියෝග පිළිබඳ ඔස්තාර් මහත්වරු ඇවිල්ලා මේකට උත්තර දෙන්නකෝ. අද අපි ඉදිරිපත් කළ මේ motion එක පාර්ලිමේන්තුවට එදා ඉදිරිපත් කළේ නැහැ. ඒක කළේ නැති නිසා මොකක්ද වුණේ? ශිරානි බණ්ඩාරනායක මහත්මිය reinstate කරන්න සිද්ධ වුණා. ඒ වෙලාවේ නීතිඥ ප්‍රජාව එකහෙළා කියා සිටියා, ඒ procedure එක වැරැදියි කියලා. පාරේ සටනක් කරලා ශිරානි බණ්ඩාරනායක මහත්මිය දවසකට හරි යළි ඒ පුටුවේ ඉන්දුවා. එතුමිය එහෙම ඒ පුටුවේ ඉන්දුවේ නාමල් රාජපක්ෂලා කරපු වැරැදි නිසා. ඒ procedure එකේ වැරැද්ද නිසා තමයි එතුමිය යළි ඒ පුටුවේ ඉන්දන්න පුළුවන් වුණේ. අද මේ ගරු සභාවට ඇවිල්ලා වැදි බණ කියනවා. මෙතැනට ඇවිල්ලා කියනවා, ස්ථාවර නියෝග 91(f) ගැන. ස්ථාවර නියෝග 91(f) ගැන කථා කරන්නේ කොහොමද? එතුමා උසාවි යන මහත්මයෙක්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, HRC එකේත් rule එකක් තිබෙනවා, පවතින නඩුවක් තිබෙනවා නම් එතැනට ගෙනෙන්න එපා කියලා. හැබැයි, අපි ඒ ගැන අනන්තවත් තර්ක කරලා තිබෙනවා. ගරු අධිකරණයේ නඩුවක් පවතිද්දී මානව හිමිකම් කඩවීමට අදාළ කොටස පමණක් අපි HRC එකේ argue කර තිබෙනවා. මම දන්නේ නැහැ, තනි කාමරයක ඉඳන් විභාගය ලියලා මේවා කොහොම පෙනෙනවාද කියලා. එතුමා පෙනී හිටපු නඩුවක් කියන්නකෝ; තර්ක කරපු නඩුවක් පෙන්වන්නකෝ. මම අවුරුදු 26ක් අලුත්කඩේ උසාවියේ නඩු කථා කරපු මිනිහෙක් නේ. මම ජීවිතේටවත් දැකලා නැහැ, ඔහු නඩුවකට පෙනී හිටිනවා. මම ජීවිතේට දැකලා නැහැ, exam එකක් තනියම ලියන කුමාරයෙක්. හැබැයි, ඔහු exam එක තනියෙන් ලියලා පාස් වෙලා ඇවිල්ලා, ස්ථාවර නියෝග 91(f) ගැන මෙතැන ප්‍රශ්න කරනවා. *[බාධා කිරීමක්]* ගොඩ පෙරකදෝරුවෙක්ද? ඒක වෙන්න ඇති. ස්ථාවර නියෝග ගැන කථා කරන්න කලින් අඩු ගානේ නීතිය ඉගෙන ගෙන එන්න කියලා අපි එතුමාට කියනවා. එදා ශිරානි බණ්ඩාරනායක මහත්මිය සම්බන්ධයෙන් කටයුතු කරද්දී procedure එක වරද්දාගත්තු මිනිස්සු අද ජාතික ජන බලවේගයෙන් ප්‍රශ්න කරනවා, මාර වැඩේ නේ, ජාතික ජන බලවේගය procedure එක වරද්දාගෙන නේ කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

විපක්ෂ නායකතුමා මේ ගරු සභාවේදී කිව්වා, NPP එක ඒ දවස්වල ලොකුවට මේකට support කළේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි අපේ දේශපාලන ව්‍යාපාරය ඇතුළේ හරිහමන් විධියට කරුණු කාරණා බේරාගෙන වැඩ කරන මිනිස්සු. අපේ ජාතික ජන බලවේගය කිව්වා, ඊට අදාළ කරුණු කාරණා සියල්ලම ජාතික ජන බලවේගයේ නීතිඥයන්ට ගන්න කියලා. හර්ෂණ නානායක්කාර පෙත්සම්කරු වෙලා අපි ගරු අධිකරණයට ගියා. ඇයි අපි ඒක නැහැයි කියලා කියන්නේ? ඒ නඩුවේ අංකය 319. ඊට අමතරව ජාතික ජන බලවේගයේ නීතිඥයන් විධියට අපි දැවැන්ත විරෝධතා ප්‍රමාණයක් අරගෙන ගිහිල්ලා රටේ ජනතාව දැනුවත් කළා. අනේ ඉතින්, ගරු විපක්ෂ නායකතුමාගේ සංවිධාන ක්‍රියාවලිය ගැන අපි දන්නේ නැහැ. අපි ඉතා සංවිධානාත්මකව ඒ ක්‍රියාවලියට මුහුණ දීපු මිනිස්සු.

ඒ විතරක් නොවෙයි, හර්ෂණ නානායක්කාර මැතිතුමාගෙන් ඇහුවා සිඩාලේප උළනවා දැක්කාද කියලා. එක නඩුවකදී Supreme Court එකෙන් තමයි කියන්නේ. මොකක්ද ඒ නඩුවේ අංකය? SC (FR) 107/2011 කියන නඩුවේදී Supreme Court එකෙන් තමයි කියන්නේ, ලිංගේන්ද්‍රියේ සිඩාලේප උළලා

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

තියෙනවා, ලක්ෂ පහක දඩයක් ගහන්න ඕනෑ කියලා. කාටද? දේශබන්දු තෙන්නකෝන්ට. ඊට පස්සේ තමයි කථාව නිර්මාණය වුණේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කථාවක් තිබෙනවා නේ, "සෑම ගෙදරකම සිටිය යුතු වෙද මහත්මයා සිඩාලේප" කියලා. හැබැයි ඒක වෙනස් වුණා, "සෑම පොලීසියකම සිටිය යුතු වෙද මහත්මයා සිඩාලේප" කියලා. ඒක දැන් සෑම පොලීසියකටම ඇවිල්ලා තිබෙනවා. මොකද, දේශබන්දු සිඩාලේප උළන්න පටන් ගත්තාට පස්සේ හැම පොලීසියකටම සිඩාලේප ගේන්න ඕනෑ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
සිඩාලේප marketing.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔව්, සිඩාලේප marketing. ඒක නිසා මේ කියන කාරණා අපි බැහැර කරනවා විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපි තව දෙයක් කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය දැන් අවසන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම මේ කාරණාව කියලා කථාව අවසන් කරන්නම්. අපි දැක්කා, නාමල් රාජපක්ෂ ඊයේ බෙරුවලට ගිහිල්ලා, "අපි දැන් යාළුයි, අපි ළඟ ජාතිවාදය නැහැ අපේ history එක ගැන හොයලා බලන්න" කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මතක් වෙන්නේ දර්ගා නගරය ගිනි තියපු විධිය. දර්ගා නගරය ගිනි තියනකොට ඔය කියන වර්ණන්ලා හිටියේ. ඒගොල්ලෝ ගිහිල්ලා තමයි දර්ගා නගරයට ගිනි තැබුවේ. එදා හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ farm එකක් තිබුණා. ඒ farm එකේ හිටියේ එළුවෝ. මේගොල්ලන්ගේ සෙට් ගිහිල්ලා ඒ එළුවන්ගේ ගාත් පණ පිටින් කපලා ගත්තා. එහෙම තමයි ජාතිවාදය වැපිරුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එක දෙයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා, අසත්‍ය වැපිරූ භූමියක සත්‍යය කියන්නේ වල් පැළෑටි බව. දශක 7ක් තිස්සේ වැඩුණේ වල් පැළෑටි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් තත්ත්වය වෙනස් වෙලා. සත්‍යය වැපිරූ භූමියක අසත්‍යය පැළවෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒක නිසා නාමල් රාජපක්ෂලාට ඔය විධියට ජාතිවාදය කරපින්නාගෙන ගිහිල්ලා මේ රටේ පටු, පෞද්ගලික දේශපාලන වාසිවලට දේශපාලනය කරන්න ජාතික ජන බලවේගය ඉඩ දෙන්නේ නැහැයි කියන කාරණය මේ වෙලාවේ මම මතක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, මොන Standing Order එක යටතේද ඔබතුමා රීති ප්‍රශ්නය මතු කරන්නේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම එක රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නැහැ, නැහැ, මොකක්ද Standing Order එක කිව්වේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමිය ස්ථාවර නියෝග පොත අරගන්නකෝ. මෙහි ඉංග්‍රීසි පොතේ 38වැනි පිටුවේ 91(f) තිබෙනවා. මට රීති ප්‍රශ්නයක් අහන්න අයිතිය තිබෙනවා. මම මේක අහන්නම්. Standing Order 91(f) states, I quote:

> "No Member shall refer in any motion or debate, to any matter which is under adjudication by a court of law or to any matter on which a judicial decision is pending. The Speaker or the Chair may direct any Member who speaks in violation of the rule ....."

*[බාධා කිරීමක්]* මට මේ point එක කියන්න ඉඩ දෙන්නකෝ. බබා, වාඩි වෙන්නකෝ පොඩ්ඩක්. මේ බබාලා ඇයි දඟළන්නේ? Point එක කියවන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය point එක අද උදේ raise කළා. එම නිසා ඒක නැවත raise කරන්න ඉඩ දෙන්න බැහැ.

ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව පටන් ගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ point of Order එක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නකෝ. *[බාධා කිරීම්]* මට මගේ point එක කියන්න ඉඩ දෙන්නකෝ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය point එක අද උදේත් raise කළා නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු කථානායකතුමා ඒ ප්‍රශ්නයට උත්තරයක් දුන්නා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் தருகின்ற நேரத்தில், பேசுவதற்கு ஏற்ற விதத்தில் முதலில் நீங்கள் சபையை அமைதிப்படுத்துங்கள்! தயவுசெய்து, எங்களுக்கான நேரத்தில் சபையை அமைதிப்படுத்தித் தாருங்கள்!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට point of Order එකට අවස්ථාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුන් කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම point of Order එකක් ඉල්ලුවා. මට point of Order එක කියන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நீங்கள் முதலில் மற்றைய உறுப்பினர் கேட்கின்ற விடயத்துக்குப் பதிலைச் சொல்லுங்கள்! அதற்குப் பிறகு, என்னைப் பேசுவதற்கு விடுங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අර්ච්චුනා මන්ත්‍රීතුමනි, උදේ ඔය point එක ගැන කථා කළා. කථානායකතුමා ඒ ගැන තීන්දුවක් දුන්නා.

දැන් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමිය point of Order එක අදාළද, නැද්ද කියලා බලන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර ඉඳගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමිය කරන දේ සම්පූර්ණ වැරැදියි නේ. මගේ point of Order එක මොකක්ද කියලා අහන්න පුළුවන් නේ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නැහැ, නැහැ. මම කවුරුවත් කියන විධියට නොවෙයි කටයුතු කරන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කථා කරන කොට mike මයික් එක off කරනවා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
උදේ ඒ සම්බන්ධව තීරණයක් දුන්නා. ඔබතුමා ඉඳගන්න. *[බාධා කිරීම්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, එහෙම නම් ඔබතුමා ඉක්මනට කියලා අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම වැඩි වෙලාවක් ගන්නේ නැහැ. මට තත්පර 20ක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, තත්පර 15න් ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Deputy Chairperson, ඔබතුමිය decision එකක් අරගෙන තිබෙනවාද, මේ Debate එක පවතින නඩුවට කිසි බාධාවක් නැතුව පවත්වාගෙන යනවා කියලා? එහෙම තීන්දුවක් අරගෙන තිබෙනවාද නැද්ද? එච්චරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
උදේ කථානායකතුමා ඒ ගැන තීරණයක් දීලා තිබෙනවා. ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු මන්ත්‍රීවරුන් නිශ්ශබ්ද වන්න. *[බාධා කිරීම්]* ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකරලා නිහඬ වෙන්න.

ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමනි, දැන් කථා කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒருவருக்கு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கொடுத்தால், தயவுசெய்து முதலில் இந்தச் சபையை அமைதியாக வைத்திருக்கப் பழகுங்கள்! இன்று காலையிலிருந்து பி.ப. 2.00 மணிவரை நான் இங்கு பேசுவதற்காகக் காத்துக்கொண்டு இருக்கின்றேன். எதிர்க்கட்சியினர் என்ற வகையில், எங்கள் பக்கத்திலிருந்து முதலில் ஒருவர் பேசினார். அதன் பிறகு எங்களுக்குத் தரவேண்டிய சந்தர்ப்பம் இன்னொருவருக்குக் கொடுக்கப்பட்டது. திரும்பவும் எங்களுக்கு வழங்கப்பட வேண்டிய சந்தர்ப்பம் அடுத்த பக்கத்துக்குக் கொடுக்கப்பட்டது. இது என்ன அறம்! இது என்ன நீதி! இதனை நீங்கள் இந்தப் பாராளுமன்றத்தில் எவ்வாறு நீதியாகப் பார்க்கின்றீர்கள்! என்னைப் பேசுங்கள் என்று சொல்லி விட்டு, நீங்கள் வேறு என்னவோ கதைத்துக்கொண்டு இருக்கின்றீர்கள்! பாராளுமன்ற உறுப்பினர் கேட்கின்ற கேள்விக்குப் பதிலை அளித்துவிட்டு, அடுத்தவருக்குச் சந்தர்ப்பத்தைக் கொடுக்க வேண்டும். எனக்கு ஒதுக்கப்பட்டிருந்த நேரம் 7 நிமிடங்கள்! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தயவுசெய்து என்னுடைய நேரத்தை முழுமையாகப் பெற்றுத் தாருங்கள்!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාව අඩු වෙන්නේ නැහැ. ඔබතුමාගේ කාලය මේ වෙලාවේ ඉඳන් පටන් ගන්නවා.

[பி.ப. 2.07]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

நன்றி! கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் அரசாங்கத்தால் கொண்டுவரப்பட்டுள்ள பிரேரணை என்பது மிகப் பெரியதோர் அநீதிக்கு எதிரானது. அதாவது, மக்கள் பட்ட துயரங்கள், துன்பங்கள், சித்திரவதைகள், மனித குலத்துக்கு எதிரான குற்றங்களோடு சம்பந்தப்பட்ட பொலிஸ்மா அதிபர் தேசபந்து தென்னகோன் அவர்கள் தொடர்பானது என்பதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். அவரைப் பதவி நீக்கம் செய்வதற்காக அரசாங்கம் கொண்டுவந்திருக்கின்ற இந்தப் பிரேரணைக்கு நாங்கள் ஆதரவாக வாக்களிக்கவும் தயாராக இருக்கின்றோம். நாங்களும் இதே துன்பங்களையும் துயரங்களையும் சந்தித்த ஓர் இனம் என்ற அடிப்படையிலும், தொடர்ச்சியாக இந்த நாட்டில் பல்வேறுபட்ட பொலிஸ் அராஜகங்களுக்கும் இராணுவ அராஜகங்களுக்கும் முகங்கொடுத்துக்கொண்டு இன்றுவரை வாழுகின்ற ஓர் இனம் என்ற அடிப்படையிலும், இந்தப் பொலிஸ் அராஜகங்களுக்கு முடிவுகட்டும் வகையில், அரசாங்கம் கொண்டுவந்து இருக்கின்ற இப்பிரேரணைக்கு ஆதரவு தெரிவிப்பதில் உறுதியாக இருக்கிறோம். காரணம், சட்டம் என்பது எல்லோருக்கும் சமமானது. சட்டத்துக்கு முன்னால் அனைவரும் சமம் என்றால், இந்த நாட்டில் இருக்கின்ற தமிழர், சிங்களவர், முஸ்லிம்கள், பறங்கியர் என எல்லா இனத்தவரும் சட்டத்தின் முன் சமமாக மதிக்கப்பட வேண்டும்; இந்த நாட்டில் நியாயாதிக்கம் பேணப்பட வேண்டும்; இந்த நாட்டின் சட்டவாட்சி நேர்மையானதாக இருக்க வேண்டும்; பாராளுமன்றத்தினூடாக ஒரு தீர்ப்பை மக்களுக்குச் சொல்லக்கூடியதாக இருக்க வேண்டும். அந்த வகையில், தேசபந்து தென்னகோன் அவர்கள் நடந்துகொண்ட முறைக்கும் அவர் சித்திரவதைக் கூடங்களூடாக இந்த நாட்டில் செய்த அநியாயங்களுக்கும் எதிராக அவருக்குத் தீர்ப்புக் கிடைக்க வேண்டும் என்பதில் நாங்கள் மிகத் தெளிவாக இருக்கின்றோம்.

இந்த நாட்டில் அதிகமான துன்பங்களையும் துயரங் களையும் சந்தித்தவர்கள் தமிழர்கள்! 1998ஆம் ஆண்டு CSU என்னை வவுனியாவில் வைத்து கைதுசெய்தது. நான் 26 நாட்கள் வவுனியா பொலிஸ் நிலையத்தில் தடுத்து வைக்கப்பட்டேன்; பொலிசாரால் சித்திரவதைக்கு உள்ளாக்கப்பட்டேன். 26 நாட்களுக்குப் பிறகு என்னை நீதிமன்றத்தில் முன்னிலைப்படுத்தி, எந்தவொரு குற்றமும் செய்யாதவன் என்று சொல்லி விடுதலை செய்தார்கள். அந்தக் காலத்தில் பயங்கரவாத குற்றப் புலனாய்வுப் பிரிவினரால் மிக அதிகமாகப் பாதிக்கப்பட்டவர்களில் நானும் ஒருவன். என்னைப்போல எத்தனையோ ஆயிரம் இளைஞர், யுவதிகள் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் இந்த நாட்டில் தொடர் சித்திரவதைகளுக்கும் துன்பங்களுக்கும் உள்ளானார்கள். பயங்கரவாதத் தடைச் சட்டம் நடைமுறைக்கு வந்த பிற்பாடுதான் நாங்கள் நிறைய மக்களை இழந்திருக்கிறோம். குறிப்பாக, 60,000க்கும் மேற்பட்ட போராளிகளை இந்த மண்ணில் இழந்திருக்கிறோம். இந்தச் சட்டம் பலருடைய மரணங்களுக்குக் காரணமாக இருந்திருக்கிறது. இந்தச் சட்டத்தினூடாக அதிகாரங்களைத் தங்களுடைய கைகளில் வைத்திருக்கின்ற பொலிசாரின் மிக அநியாயமான பக்கங்கள் பல இன்றைக்கும் உண்டு. அந்த வகையில், தேசபந்து தென்னகோன் அவர்களுக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள இந்தப் பிரேரணை சரியானது என்பதைத்தான் நாங்கள் வலியுறுத்த விரும்புகின்றோம்.

தேசபந்து தென்னகோன் மட்டுமல்ல, இந்த நாட்டில் இருந்த பல பொலிஸ்மா அதிபர்களும் பொலிஸாரும் மிக மோசமாக நடந்து கொண்டார்கள் என்பதற்குப் பல ஆதாரங்கள் உண்டு. குறிப்பாக, மக்கள் படுகொலை செய்யப்பட்டார்கள் என்பதற்கு ஆதாரங்கள் உண்டு. உதாரணத்துக்கு, செம்மணி மனித புதைகுழியைக் குறிப்பிடலாம். நேற்றுவரை 155 மனித எலும்புக்கூடுகள் அங்கு கண்டெடுக்கப்பட்டு இருக்கின்றன. கடந்த முதலாம் திகதியான வெள்ளிக்கிழமை நான் செம்மணிக்குச் சென்று அவ்விடத்தைப் பார்வையிட்டேன். நேற்று scanner ஊடாக செம்மணியிலுள்ள அரியாலை சித்துப்பாத்தி இந்து மயானமும் அதனை அண்டிய பகுதிகளும் ஆய்வு செய்யப்பட்டு இருக்கின்றன. அங்கு இன்னும் பல மனித எலும்புக்கூட்டு வயல்கள் இருப்பதாகத் தகவல்கள் சொல்கின்றன. இப்படி இந்த நாட்டில் மனித எலும்புக்கூடுகள் குறிப்பாக, தமிழர்களுடைய எலும்புக்கூடுகள் கிடைப்பதற்குக் காரணமாக இருந்த கொலையாளிகள் யார்? இதை யார் செய்தார்கள்? தேசபந்து தென்னகோனுக்கு எதிராகப் பிரேரணை கொண்டுவருகின்ற நீங்கள், பாதிக்கப்பட்ட தமிழர்களுக்கு நீதியைப் பெற்றுக்கொடுப்பதற்கு இன்னும் தயாராக இல்லை. அது தொடர்பான தெளிவான ஒரு நிலைப்பாடு உங்களிடம் இல்லை. அதனை சர்வதேச மேற்பார்வையின்கீழ் கொண்டு வாருங்கள் என்று கேட்டால்கூட, அதில் ஒரு தெளிவில்லாத நிலையில் அரசு இருப்பதாகத்தான் தெரிகின்றது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்று முன்தினம் ஞாயிற்றுக்கிழமை வெளியான 'வீரகேசரி' பத்திரிகையில்,

" சர்வதேச விசாரணையில் சாட்சியமளிக்கத் தயார் கிருஷாந்தி குமாரசுவாமி படுகொலை வழக்கின் பிரதான குற்றவாளியான சோமரத்ன ராஜபக்ஷ அறிவிப்பு: அவரது மனைவி ஜனாதிபதிக்குக் கடிதம்"

என்ற தலைப்பில் செய்தியொன்று வெளிவந்து இருக்கிறது. அந்த செய்தி அடங்கிய பத்திரிகையின் பங்கங்களை நான் சபாபீடத்துக்குச் சமர்ப்பிக்கின்றேன். அத்துடன், சோமரத்ன ராஜபக்ஷவின் மனைவி, மாண்புமிகு ஜனாதிபதிக்கு சிங்களத்தில் எழுதிய 6 பக்கங்களைக்கொண்ட கடிதத்தின் பிரதியையும் நான் சபாபீடத்துக்குச் சமர்ப்பிக்கின்றேன். அந்தக் கடிதத்தை ஹன்சாட்டில் சேர்க்க முடியுமென்றால், தயவுசெய்து சேருங்கள்!

செம்மணியில் நடந்த மிக மோசமான மனிதப் படுகொலை தொடர்பில் சாட்சியமளிப்பதற்கு சர்வதேச நீதிமன்றத்துக்கு வருவதற்குத் தயாரென கிருஷாந்தி குமாரசுவாமி படுகொலை வழக்கின் பிரதான குற்றவாளியான சோமரத்ன ராஜபக்ஷ தெரிவித்திருப்பதாக அவரது மனைவி மாண்புமிகு ஜனாதிபதிக்குக் கடிதம் எழுதியிருக்கிறார். அதாவது, லான்ஸ் கோப்ரல் சோமரத்ன ராஜபக்ஷ செம்மணி மனிதப் புதைகுழி விவகாரம் தொடர்பில் சுயாதீன விசாரணை ஒன்றைக் கோருவதாக அவரது மனைவியான எஸ்.சி. விஜேவிக்ரம அவர்கள், மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க, கௌரவ பிரதம அமைச்சர் ஹரினி அமரசூரிய, கௌரவ நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு ஹர்ஷன நாணாயக்கார ஆகியோருக்கும் கடிதம் அனுப்பி வைத்திருக்கிறார்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு வழங்கப்பட்ட ஏழு நிமிடங்கள் இன்னும் முடியவில்லை. தயவுசெய்து, ஒரு நிமிடத்தை தாருங்கள்!

நாங்கள் உண்மையைச் சொல்ல முடியாமல் இருக்கின்றோம். நாங்கள் சொல்கின்ற விடயங்களுக்கு நீங்கள் கொஞ்சம் செவிசாயுங்கள்! தனது கணவர் சோமரத்ன ராஜபக்ஷ அவர்கள் சட்டவிரோதமான முறையில் தண்டிக்கப் படுகிறார். எனவே, செம்மணி விவகாரம் தொடர்பில் சர்வதேச விசாரணையொன்றை முன்னெடுக்குமாறும் அதில் சாட்சிய மளிப்பதற்குத் தயாராக இருப்பதாகவும் தனது கணவர் தெரிவித்துள்ளதாக திருமதி எஸ்.சி. விஜேவிக்கிரம அவர்கள் அந்தக் கடிதத்தில் தெரிவித்திருக்கிறார்.

தேசபந்து தென்னகோனின் விடயத்தில் மட்டுமல்ல, இந்த நாட்டில் நடந்த தமிழ் மக்கள் மீதான இனப்படுகொலை, அவர்கள்மீது தொடராகப் புரியப்படுகின்ற கட்டமைக்கப்பட்ட இன அழிப்புச் செயற்பாடுகள் தொடர்பிலும் நீதி விசாரணை வேண்டும். செம்மணி விவகாரத்துடன் தொடர்புடைய சோமரத்ன ராஜபக்ஷவை நீங்கள் சர்வதேச விசாரணைக்குத் தயார்படுத்துங்கள்! உண்மை வெளியில் வரட்டும்! அது சிங்கள மக்களுக்கு நீதியைத் தருவதாக இருக்கட்டும்! இதனை நான் இன்றைய நாளில் மிக முக்கியமானதொரு கருப்பொருளாக வலியுறுத்துகிறேன். தயவுசெய்து, அதற்கு ஏற்பாடு செய்யுமாறு கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද දිනය අපේ පාර්ලිමේන්තුව තුළ ඓතිහාසික දිනයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ, අපේ ජාතික ජන බලවේගයේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව එක පැත්තකින් දූෂණයට, වංචාවට අදාළව නිශ්චිත ක්‍රියාමාර්ග ගන්නා වූ ඒ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් මේ පාර්ලිමේන්තුවේ බලතල පාවිච්චි කරලා රජයේ හිටපු දූෂිතම නිලධාරියෙක් ඉවත් කිරීමට අද මැදිහත් වීම නිසා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මෙතැන දේශබන්දු තෙන්නකෝන් පිළිබඳව සාකච්ඡාව සිදු කරන අතරතුර, සමහර අය ඒ සාකච්ඡාවෙන් පරිබාහිරව ගිහිල්ලා සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් එහෙට මෙහෙට ගහන්න පටන් අරගෙන තිබෙනවා. දේශබන්දු තෙන්නකෝන්ව ඉවත් කිරීම පිළිබඳ සාකච්ඡාව යද්දි "ඒක හොඳයි. හැබැයි, මේකත් වුණා නම් හොඳයි, මේකත් වුණා නම් හොඳයි" කියන සාකච්ඡාව තමයි ගෙනෙන්න උත්සාහ කළේ. ඒ කියන්නේ මේක හොඳයි කියලා කියන්නේ නැතිව, තව පොඩ්ඩක් මොනවා හරි කළා නම් හොඳයි කියලා තමයි කියන්න හදන්නේ. ඒ නිසා මම කියන්නේ, මේක පියවරෙන් පියවර යන නිසා ඒ මහත්වරුන්ට හැම දෙයක්ම බලා ගන්න පුළුවන්කම තිබෙනවා කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂ නායකතුමා මෙතැන උදේ සංවාදයේ දී කිව්වා, තොරතුරු වගයක් table කරනවා කියලා. මම දන්නේ නැහැ, මට ඒක එයිද, නැද්ද කියලා. මම දැන් අවස්ථා දෙක තුනකදී උත්සාහ කර බැලුවා, මට ඒ තොරතුරු ලබා ගන්න ඕනෑ නිසා ඒවා table කරලාද කියලා. මොකද, තොරතුරු වගයක් තිබෙනවා කියලා කියපු නිසා. *[බාධා කිරීමක්]* කමක් නැහැ, තිබෙනවා නම් කමක් නැහැ. මම තුන්පාරක් එතැනින් ඇහුවා. නමුත්, මට තවම හම්බ වුණේ නැහැ. කමක් නැහැ. මම පස්සේ හරි ඒක අරගෙන බලන්නම්, විපක්ෂ නායකතුමාගේ උනන්දුව පිළිබඳව. *[බාධා කිරීමක්]* ඔව්, ඒ තොරතුරු ඒකේ තිබෙනවා.

අනෙක් කාරණය තමයි, මෙතැන සංවාදයක් මතු වුණා, අපි මොකක් හරි agenda එකකට ගමේ තිබෙන සමිතිවලින් බලය අල්ලන්න යනවා කියලා. මාර වැඩේ! විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සිටින පටු දේශපාලන අරමුණින් මේ කාරණා මතු කරන කට්ටියට මම කියන්නේ මේකයි. එහෙම පාරේ යන ගමන් මේ සමිති හදලා නැහැ. පාරේ යන ගමන්, කඩේ යන ගමන්, ටොෆි ගෙනෙන්න යන ගමන්, Food City යන ගමන්, බඩු ගෙනෙන්න යනවා වාගේ සමිති හදන්න බැහැ. මේක 1979 ඉඳලා ආරම්භ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එරංග ගුණසේකර මහතා]

කරපු, ඉතිහාසයක් තිබුණු එකක්. කාලයක ඉඳලා රජයේ නිලධාරින්, ග්‍රාම නිලධාරි මහත්මයා, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු ඒ සියලුදෙනාගේ දැනුවත් කිරීම, අවබෝධය ඇතුළේ තමයි ගමේ සමිති නිර්මාණය කළේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හැබැයි වෙනදාට මොකක්ද වුණේ? වෙනදා කළේ ඉතාම චූටි සමිති කීපයක් හැදුවා. මම මේ ඒ සමිතිවල හිටපු ආදි තරුණ තරුණියන්ට - ආදි යෞවනයන්ට - අපහාසයක් කරන්න උත්සාහ කරනවා නොවෙයි. ඔවුන් ගම ඇතුළේ වැඩ කළා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ පිළිබඳව අපේ සංවාදයකුත් ඇති වුණා. අපි පොඩි කාලයේ ඉඳලා කථාවක් තිබුණා, ගමේ පිපෙන මල් ගමේම තිබෙනවා, එතැනින් එහාට එන්නේ නැහැ කියලා. ඉතින්, ඒ නිසා අපේ අරමුණ තමයි ගමේ සිටින දක්ෂ තරුණ තරුණියෝ මේ ක්‍රියාවට කොහොම හරි සම්බන්ධ කරගන්න ඕනෑ කියන එක. එහෙම නම් කරන්න ඕනෑ මොකක්ද? මේක පටු තැනක ඉඳලා පුළුල් තැනකට ගෙනෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි මේ වැඩ පිළිවෙළ සංවිධානය කළේ. මම උදේත් විපක්ෂ නායකතුමාට උත්තර දුන්නා. ලංකාවේ පළමුවැනි වතාවට 12,700කට වැඩි ප්‍රමාණයක් -සියයට 91ක්- දැන් අපි youth clubs නිර්මාණය කරලා තිබෙනවා. මේ youth clubs ටික නිර්මාණය කළාට පස්සේ ඒකට නිලධාරින් හයදෙනෙක් පත් වෙනවා. ඊට පස්සේ ඒ හයදෙනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය සම්මේලනය ගොඩනඟනවා. අර ගමේ මූලික නිලධාරින් හයදෙනාට තමයි ප්‍රාදේශීය සම්මේලනයේ ඡන්දයට ඉන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව පාරේ හිටියා කියලා, පක්ෂ කාර්යාලයක හිටියා කියලා ඡන්දයට එන්න බැහැ. මම කියන්නේ මේවා කියවලා බලන්න කියලා. එතකොට ඒගොල්ලන්ගේ කැමැත්තෙන් තමයි ප්‍රාදේශීය බල මණ්ඩලය පත් වෙන්නේ. මේ ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිලධාරින්, විධායක නිලධාරින් හයදෙනෙකු නම් කර ගන්නවා. ඒ හයදෙනා එකතු වෙලා තමයි දිස්ත්‍රික් සම්මේලනය පවත්වන්නේ. ඒගොල්ලන්ට තමයි ඡන්ද හිමිකම තිබෙන්නේ. එහෙම නැතිව පාරේ යන කාටවත් ඡන්දය දෙන්න බැහැ.

එතකොට දැන් මොකක්ද මේ තිබෙන ගෝරනාඩුව? සමහර සභාවලට ගියාම මම දැක්කා, දිස්ත්‍රික්ක කීපයක තමයි මේක වුණේ. උතුරේ අපේ දෙමළ දේශපාලන පක්ෂවල හිටපු සමහර නායකයෝ අපිත් එක්ක ආවා. එතුමන්ලා ඇවිල්ලා ඒකට සම්බන්ධ වුණා. හැබැයි, දැන් වෙලා තිබෙන දේ තමයි, ප්‍රජාතන්ත්‍රවාදීව ඒක ඇතුළේ නම් දෙකක් හෝ තුනක් යෝජනා වීම. යෝජනා වුණාට පස්සේ ඒකට ඡන්දයක් තියනවා. ඉතින්, ඒක හරි නේ. ඒකේ මොකක්ද තිබෙන වැරැද්ද? ඒ ඡන්දයේදී දහම් පාසල්වල, ඉස්කෝලවල වාගේ අත ඔසවලා කැමැත්ත ගන්න එක නොවෙයි කරන්නේ. ඡන්ද පෙට්ටියක් හදලා, ඡන්ද පත්‍රිකා හදලා රහස් ඡන්දයක් තමයි පවත්වන්නේ. ඒ රහස් ඡන්දය තුළින් එක්කෙනෙක් දිනනවා. මෙතුමන්ලා රහස් ඡන්දවලට බයයි නේ. එතැනත් රහස් ඡන්දයක් තියන්නේ. ඒ රහස් ඡන්දයෙන් මොකක්ද වෙන්නේ? රහස් ඡන්දයෙන් එක තරුණයකු හෝ තරුණියක් ජයග්‍රහණය කරනවා. ඊට පස්සේ පරාජය වෙච්ච කෙනා අතට අත දීලා, බදාගෙන "අපි ඔක්කෝම එකතුවෙලා වැඩ කරමු" කියලා කියනවා. ඒක තමයි සංස්කෘතිය. මේගොල්ලන් කරපු දේ මොකක්ද? මේගොල්ලන්ගේ පක්ෂවල ඡන්දය ඉල්ලපු කිහිප දෙනෙක් ඉන්නවා. ඒගොල්ලන් එම ඡන්දය පරාජය වෙලා තිබෙනවා. ඒක අපේ ප්‍රශ්නයක්ද? ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක තරුණ සේවා සභාවේ හෝ ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි. එහෙම පරාජය වුණාට පස්සේ මොකක්ද කරන්නේ?

අපේ රටේ, නයෙක් යවපු එකයි, උඩින් බලන එකයි කියලා නාළිකා දෙකක් තිබෙනවා. ඒකේ හදනවා, ටොන් පව ටිකක්. එහෙම කරලා කියනවා, මේක ඇතුළේ ගැටුමක් කියලා. ඇතුළේ ගැටුමක් නැහැ. හැබැයි, mediaවල පෙන්වනවා ගැටුමක් කියලා. මොකක්ද තිබෙන ගැටුම, මොකක්ද තිබෙන ප්‍රශ්නය කියලා තමයි මම අහන්නේ. ප්‍රජාතන්ත්‍රවාදීව ඡන්දය තියලා එක්කෙනෙක් දිනනවා, අනෙක් කෙනා පරාජය වෙනවා. ඒක ඇරෙන්න වෙන මොකක්ද තිබෙන්නේ? මේගොල්ලන් ප්‍රාදේශීය සභාවල ඡන්දයේදීත් නහයෙන් ඇඬුවා. ඒක තමයි ඒ මහත්වරු කිහිප දෙනෙකුටත් පුරුදු කරලා තිබෙන්නේ. ඉතින් අපි මොනවාද කරන්නේ? ඡන්දයෙන් පරාජය වුණාට පස්සේ යන්න ඕනෑ. ඡන්දය දිනලා එන්න, එච්චරයි. වෙන මොකක්වත් ගැටලුවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ කරන්න යන්නේ මොකක්ද? මම මුලිනුත් කිව්වා, 2020 ඉඳලා මේවා ප්‍රතිසංවිධානය කරලා නැහැ කියලා. එතකොට මේවා ප්‍රතිසංවිධානය කරන්න ඕනෑ නැද්ද? ප්‍රතිසංවිධානය කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම 1993න් පස්සේ ලංකාවේ යෞවන සමාජ සම්මේලනයක් පවත්වා නැහැ. ජාත්‍යන්තර තරුණ දිනයේදී සුගතදාස එකට මේ රටේ තරුණයෝ එනවා. අවුරුදු 32කට පස්සේ යෞවන සමාජ සම්මේලනය තියලා මේ ආණ්ඩුව රටට නායක නායිකාවන් රොත්තක් හඳුන්වා දෙන්න තමයි ඉන්නේ. ඒක ජාතික ජන බලවේගයේ ප්‍රශ්නයක් නොවෙයි, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය. ඒක වැරදිද? හැබැයි, මීට පෙර සිටි මහත්වරුන් ඒවා කළේ නැහැ. හේතුව මොකක්ද? අපේ අහිංසක දෙමව්පියන්ගේ හැකියාව තිබෙන, දැනුම තිබෙන දූ දරුවන් රටේ නායකයෝ ලෙස පත් කරන්න ඒගොල්ලන්ට ඕනෑකමක් නැහැ. ඒගොල්ලන්ට හැම දාම මතු කරන්න ඕනෑ වුණේ ඒගොල්ලන්ගේ දුව, පුතා, ඥාතීන්, බාප්පාගේ පුතා කියන අය. අපේ රටේ සාමාන්‍ය පවුල්වල උගත්, බුද්ධිමත් තරුණ පරම්පරාව රටේ නායකයෝ කරන්න ඒගොල්ලන්ට ඕනෑකමක් තිබුණේ නැහැ. ඒ නිසා දැන් ඒ අය බියෙන් සලිත වෙන්න පටන්ගෙන තිබෙනවා. ඒ ඇයි? දැන් ගම්වල ඉන්න දක්ෂ තරුණයන්ට අවස්ථාව හැදෙනවා. එම නිසා මම ඉතාම ඕනෑකමින් කියනවා, මෙය අපේ රටේ තරුණ තරුණියන්ට අවස්ථාව විවර කිරීමක් කියලා. මේ පිළිබඳව තරුණ තරුණියන්ට යම් ගැටලුවක් තිබෙනවා නම්, ඔවුන් එක්ක සාකච්ඡා කරන්න අපි ඕනෑම මොහොතක සූදානම්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හැබැයි, පක්ෂ ඇතුළේ, එක එක බලකා ඇතුළේ, පටු දේශපාලන අදහසින් කවුරු හෝ ගෙනෙන්න උත්සාහ කරනවා නම් අපි ඉතා වගකීමෙන් කියනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හැටියට අපි එය ප්‍රජාතන්ත්‍රවාදීව පරාජය කරන්න මැදිහත් වන බව. ඒ ගැන කිසි දෙගිඩියාවක් නැහැ. අපි කැමැතියි, ඕනෑම මොහොතක තරුණ තරුණියන් එක්ක සාකච්ඡා කරන්න; සංවාද කරන්න. ඒ ගැන ගැටලුවක් නැහැ.

විපක්ෂයේ සමහර මහත්වරුන් කියනවා නේ, ජාතික තරුණ සේවා සභාව දේශපාලනීකරණයට ලක් කරනවා කියලා. ඒ සම්බන්ධව මම තොරතුරු ටිකක් කියන්නම්. 2009දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සමුළුව සඳහා ජාතික තරුණ සේවා සභාවේ තරුණයන් යොදාගෙන තමයි මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රූපය හදලා, "අත" ලකුණ හදලා campaign එක කළේ. ඒ විතරක් නොවෙයි. 2010-2014 කාලයේදී මැතිවරණ වෙනුවෙන් "නිල් බලකාය" කියලා එකක් හැදුවා. ඒ මහත්මයා අද ගරු සභාවේ නැහැ. අන්න ඒ බලකායේ මහත්මයාට අරගෙන යන්න බැරි වුණු නිල් බලකායේ t-shirts ටික තවම තිබෙනවා, ජාතික තරුණ සේවා සභාවේ Batangala Farm එකේ. එදා මොකද කළේ? ජාතික තරුණ සේවා සභාව පාවිච්චි කරලා තමන්ගේ දේශපාලන පක්ෂ හැදුවා. ඒ වාගේම තමන්ගේ තරුණ ව්‍යාපාරය හැදුවා. ඒ කෙනාව promote කර ගත්තා. එහෙම දේශපාලනයක් තමයි 2010-2014 කාලයේ තිබුණේ. ඒ විතරක්

නොවෙයි. ජාතික තරුණ සේවා සභාවේ ප්‍රාදේශීය වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකයා හෝ සංවිධායකවරිය සහභාගි කරවීම අනිවාර්ය කරමින් චක්‍රලේඛ ගැහුවා. එහෙමයි මේ අය කටයුතු කළේ. මේවා හරිද?

ඒ විතරක් නොවෙයි. ජාතික තරුණ සේවා සභාවට 2020 අවුරුද්දට ලැබී තිබුණු ප්‍රතිපාදන පාවිච්චි කරලා - ආණ්ඩුවේ ප්‍රතිපාදන පාවිච්චි කරලා - "Talk with Namal" කියලා වැඩසටහනක් කළා. "Talk with Namal" වැනි වැඩසටහන් කරපු අයියලා තමයි දැන් මේ ඇවිල්ලා බණ දේශනා කරන්න පටන් අරගෙන තිබෙන්නේ. දැන් එතුමන්ලාගේ අර චූටි මහත්වරු කිහිපදෙනෙක් පාවිච්චි කරලා, අපි ජාතික තරුණ සේවා සභාව දේශපාලනීකරණයට ලක් කරනවා කියලා බණ දේශනා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. හිටපු අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීමේ උද්ඝෝෂණයට ඒගොල්ලෝ ජාතික තරුණ සේවා සභාවේ මුදල්වලින් ප්‍රවාහන පහසුකම් දීලා සේවකයෝ අරගෙන ගියා. ඒවා හරිද? ඒ විතරක්ද? ඊට පස්සේ 2024දී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා ප්‍රවර්ධනය කරන්න "Youth Summit" කියලා වැඩසටහනක් කළා. රනිල් වික්‍රමසිංහ තමන්ගේ දේශපාලන ව්‍යාපෘතිය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම ඒ projects පාවිච්චි කළා. තව තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරනවා.

එහෙමයි ඒගොල්ලන් වැඩ කළේ. මම මේ කියපු ඒවා සම්බන්ධව අපි නීත්‍යනුකූලව වැඩකටයුතු කරනවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා දන්නවා. COPE වාර්තාව හරහාත් මේ කාරණා ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි ඒ වෙනුවෙනුත් මැදිහත් වනවා.

අද විපක්ෂයේ සමහර පක්ෂ කිහිපයක් තරුණයෝ කිහිපදෙනෙක් පාවිච්චි කරලා මේ නැඟීගෙන එන තරුණයන්ට ලැබෙන අවස්ථාව, තරුණ නායක නායිකාවන් බවට පත් වන්න තිබෙන අවස්ථාව ඔවුන්ගේ පටු දේශපාලන කූඩයට දමන්න උත්සාහ දරමින් සිටිනවා. හැබැයි අපි වගකීමෙන් මේ කාරණය කියනවා. ජාතික ජන බලවේගය සහ මේ මහජන ආණ්ඩුව නිර්මාණය වෙලා තිබෙන්නේ අපේ තරුණ පරම්පරාවේ ශක්තියෙන්. ඔවුන්ගේ හැකියාවෙන් නැවත නැවතත් අපේ රටේ පොහොසත්ම තරුණ පරම්පරාව ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම ශක්තිමත්ව මෙම කටයුත්ත කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාවේ ඇතුළත් චෝදනා පිළිබඳ පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව පදනම් කර ගනිමින් ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව විවාද කරන අවස්ථාවයි මේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙහිදී පිටු 206ක වාර්තාවක් අපට පාර්ලිමේන්තුවෙන් ලබා දුන්නා. අපි මේ වාර්තාව කියෙව්වා. මේකේ සාක්ෂි සටහන්, අනෙකුත් කාර්ය සටහන් සියල්ල තිබෙනවා.

අපි දන්නවා, කාගේ හෝ අතින් යම් වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඔහුගේ තරාතිරම නොබලා ඒ වෙනුවෙන් තීන්දු තීරණ ගැනීමට මේ වන විට රජය තීන්දුවක් අරගෙන තිබෙන බව. දැන් පොලීසිය භාර ඇමතිතුමා කථා කළා, අධිකරණ ඇමතිතුමා කථා කළා. එතුමන්ලා කථා කරන වෙලාවේදී මේ වාර්තාවේ තිබෙන හැම කාරණයක්ම වාගේ මේ සභාවට සංක්ෂිප්තව ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ගරු ඇමතිතුමනි, මෙතැනට සම්බන්ධ වන්නේ අතීතය සහ වර්තමානය. ලංකා දේශපාලන ඉතිහාසයේ පළමු වතාවට තමයි මේ වාගේ තීන්දුවක් මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ අරගෙන තිබෙන්නේ. මේක ඓතිහාසික දිනයක්. මගේ දේශපාලන ජීවිතයේ පාර්ලිමේන්තුවේ සිටි අවුරුදු 25ක කාලය තුළ මෙහෙම දෙයක් මීට පෙර වෙලා නැහැ. මෙවැනි නිලධාරියෙක් ඉවත් කරන කාර්යය මගේත් ආධුනික අත්දැකීමක් බවට වෙලා තිබෙනවා. අතීතය සහ වර්තමානය බලපානවා අනාගතයට. මේක අනාගතයට බලපාන්නේ කෙසේද? මේ අවුරුද්දේ සැප්තැම්බර් 21 දින ඉඳලා තව අවුරුදු 4කට තමුන්නාන්සේලාට ආණ්ඩු බලය තිබෙනවා. තමුන්නාන්සේලා මේ තුළින් නිලධාරීන්ට හොඳ පණිවුඩයක් යවනවා, කොන්ද කෙළින් තබාගෙන ඉන්න, දේශපාලන අරමුණු වෙනුවෙන් හිටගන්න එපා කියලා. දේශපාලන අරමුණු වෙනුවෙන්, පැවති රජයට පක්ෂපාතීව යම් යම් තීන්දු තීරණ ගත්තා නම්, ඒ තීන්දු තීරණ අනුව තමයි නිලධාරීන්ට මේවාට වන්දි ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

අපට සමස්ත පොලීසියටම වැරදි කියන්න බැහැ. අද අපි සමහර වෙලාවට පොලිස් නිලධාරියෙකුගෙන් යම් වැරැද්දක් වුණාම ඒ වැරැද්ද සමස්ත පොලීසියටම දාලා සමස්ත පොලීසියටම දැඩිව පහර ගහනවා. නමුත් එහෙම කරන්න බැහැ. ඉතාම හොඳ, වැදගත්, උගත්, ඒ වාගේම සමාජයට යම් සේවාවක් ඉටු කරන නිලධාරීන් විශාල සංඛ්‍යාවක් පොලීසියේ ඉන්නවා. රාජ්‍ය සේවය ගත්තත් එහෙමයි. පොලීසිය, ත්‍රිවිධ හමුදාව සහ රාජ්‍ය සේවය ගත්තාම දහහත් ලක්ෂයක් පමණ මේ රටේ රාජ්‍ය සේවයේ යෙදෙනවා. මේ තුළ ඉතාම වැදගත් නිලධාරීන් ඉන්නවා. හැබැයි තමුන්නාන්සේලා බලධාරීන්, ඒ නිලධාරීන්. බලධාරීන්ට වගකීමක් තිබෙනවා, නිලධාරීන්ගෙන් වැඩ ගැනීමට. හැබැයි යම් විධියකින් නිලධාරීන් භය වුණොත්, යම් විධියකින් නිලධාරීන්ට යම් තැති ගැන්මක් ඇති වුණොත්, නිලධාරීන් අභිමතයට අනුව වැඩ කළත් ඒකත් වැරදි විධියට ගිහිල්ලා තව කාලයක් යනකොට - අනාගතයේදී- හොඳට තීන්දුවක් ගත් නිලධාරීන්ටත් මේ දේ සිද්ධ වෙන්න පුළුවන්. මේක පළමු වතාව නේ. ආණ්ඩු විශ්වාස නැහැ. ආණ්ඩු කියන ඒවා අද තිබෙන්න පුළුවන්, හෙට නොතිබෙන්න පුළුවන්. ආණ්ඩු එක රැයින් වෙනස් වෙන්නත් පුළුවන්, තව කාලයක් දිගට පවතින්නත් පුළුවන්. ඒක ජන මතය. ජන මතය

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

අනුව තමයි ඒක වෙනස් වෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම කියපු අර හොඳ නිලධාරින් අතර නව රජයක් පත් වුණාම ඒ රජය සතුටු කරන්න වැඩ කරන නිලධාරින් ද ඉන්නවා. එහෙම අය නැහැ කියන්න බැහැ.

මම විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න ඕනෑ. මේ අවස්ථාවේ සභාව තුළ නොසිටියත්, ගරු ජගත් පින්නගොඩ විතාන මැතිතුමා කියන්නේ කළුතර දිස්ත්‍රික්කයේ සමගි ජන බලවේගය නියෝජනය කරන මන්ත්‍රීතුමා. මමත් කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. පසුගිය දිනවල මමත්, එතුමාත් ගැන බොහෝ මාධ්‍ය තුළ ආන්දෝලනාත්මක වැඩ පිළිවෙළක් ගියා. සාමාන්‍යයෙන් අපේ රටේ නීතිය අනුව මේ ඉන්න ඇමතිතුමෙක්, මන්ත්‍රීතුමෙක් වුණත් වාහනයක් මිලදී ගන්න යනකොට, ඒක ලියාපදිංචි නොකළ වාහනයක් නම් ඒක ලියාපදිංචි කරන්න යනවා. Department of Motor Traffic එකට ගිහින් ඊට අවශ්‍ය documents භාර දුන්නාම ඒ වාහනය ලියාපදිංචි වෙනවා. ලියාපදිංචි කරපු වාහනයක් ගන්නවා නම් ඕනෑම කෙනෙක් කරන්නේ, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට - Department of Motor Traffic එකට - ගිහින් අහනවා, "මේ වාහනය අපි ගන්න යනවා, මේක නීත්‍යානුකූලද?" කියලා. ඔවුන් කියනවා, නීත්‍යානුකූලයි කියලා. එහෙම නීත්‍යානුකූලයි කියනකොට ඒ වාහනයට ෆිනෑන්ස් පහසුකමත් ලබා දෙනවා, ඒ අදාළ ආයතනවලින්. එක් පැත්තකින් ෆිනෑන්ස් පහසුකම් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවාය කියන්නේත් ඒ වාහනය නීත්‍යානුකූල වාහනයක් නිසායි. Department of Motor Traffic එකත් කියනවා, එය නීත්‍යානුකූල වාහනයක් කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම නඩුවලට අදාළ කාරණා ගැන කථා කරන්නේ නැහැ. මොකද, අධිකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙනකොට මේ පාර්ලිමේන්තුව ඇතුළේ කවදාවත් අපි ඒ ගැන විවාද කරලා නැහැ. මම මේ කියන්නේ එක් දෙයක් ගැනයි. වලාන දූෂණ මර්දන ඒකකය කියන්නේ ශ්‍රී ලංකා පොලීසිය යටතේ තිබෙන ඒකකයක්. එම ඒකකයෙන් ජගත් පින්නගොඩ විතාන මන්ත්‍රීතුමාගේ පුතාව අත්අඩංගුවට ගත්තා, වාහනයක් සම්බන්ධයෙන්.

ඒ වාහනය විකුණා තිබෙන්නේ මගේ දියණියගේ මහත්තයා; මගේ බෑණා. එතකොට ඒ අයත් වෙන අයගෙන් මේක අරගෙන තිබෙනවා. ලියාපදිංචි වෙලා තිබෙනවා, මේකේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මට තිබෙන එකම ප්‍රශ්නය තමයි මම මේ නිලධාරින්ට කියන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, හොඳ සහ නරක කියලා නිලධාරින් කොටස් දෙකක් ඉන්න බව.

පොලීසිය භාර ගරු ඇමතිතුමනි, මේ කාරණයට අදාළ "බී" වාර්තාව මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමාත් නීතිඥ මහත්මයෙක්. ඔබතුමා දන්නවා, මේ ගැන. මේ, "බී" වාර්තාවක්. මේක ලංකා ඉතිහාසයේ හොඳ "බී" වාර්තාවක්. මොකක්ද මේ "බී" වාර්තාව? ගරු ඇමතිතුමනි, මේ "බී" වාර්තාවේ එක තැනක සඳහන්ව තිබෙනවා, "මෙම රථය සැකකරුගේ පියා වන ජගත් පින්නගොඩ විතානගේ විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහිත අබේගුණවර්ධන මහතාගේ දියණියගේ පුරුෂයා වන ධනුෂ්ක..." කියලා. මට තිබෙන ප්‍රශ්නය තමයි, "බී" වාර්තාවකට පාර්ලිමේන්තුව නියෝජනය කරන -දුව වෙන්න පුළුවන්, බෑණා වෙන්න පුළුවන්, පුතා වෙන්න පුළුවන්- මන්ත්‍රීවරු දෙදෙනාගේ නම් දෙක යොදන්නේ ඇයි කියන එක.

එහෙම නම්, මම උදාහරණයක් කියන්නම්. සයිමන්ගේ පුතා පීටර්. ඔහු පොල් කඩනවා. ඔහු පොල් කඩලා අහු වුණාම මොකද කරන්නේ? "සයිමන්ගේ පුතා තමයි පීටර්. පොල් කඩලා තමයි පීටර්ව ගෙනාවේ" කියලා "බී" වාර්තාවේ ලියනවාද? එතකොට මේ වාගේ "බී" වාර්තාවක් ඉදිරිපත් කරනවාද? මොකක්ද මේ කරන්න හදන්නේ? ඔබතුමන්ලා දන්නේත් නැතුව ඇති මේවා. හැබැයි, කොහොම හරි මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න අයට මඩ පහරක් ගහලා ලකුණු ටිකක් දා ගන්න පුළුවන්ද, තරුවක් පැලඳ ගන්න පුළුවන්ද කියලා ඒ නිලධාරියා බලනවා. මේක අපිත් දැකලා තිබෙනවා, ඒ කාලවල. මම මේවා අත්දැකීම් මතයි කියන්නේ. මේවා කවුරුන් හෝ නිලධාරින් කරනවා නම් මෝඩ වුන්. මේවා මෝඩ වුන්. *[බාධා කිරීමක්]* අනේ, බලන්නකෝ මම මේ අහිංසකව කියන්නේ තාත්තා කෙනෙක් හැටියට පුතේ. *[බාධා කිරීමක්]* ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් අහගෙන ඉන්න. මොකක්ද ඒකට හේතුව? මම වැඩිහිටියෙක්. ඔබේ වයසයි, මගේ වයසයි උසයි, මිටියි. ඒ නිසා ඔබට ආදර්ශයක් වෙන්නයි මම මේ කාරණා කියන්නේ. එහෙම නැතුව මම මේ කරන්නේ ආණ්ඩු විවේචනයක් නොවෙයි.

මතක තියා ගන්න, අපේ ආණ්ඩුවටත් වැරදුණා එක දෙයක්. මොකද, විවේචනය අහගෙන ඉන්න බැරි වුණා. විවේචනයට විරුද්ධව නැඟී සිටින්න ගිහිල්ලා අන්තිමට ගෙදර යන්න වුණා. ගෙවල් ගිනි තියා ගන්න වුණා. ඒ නිසා මම මේ කියන්නේ මේ වැරැද්ද තවත් කෙනෙකුට වෙන්න දෙන්න එපා කියන එකයි, ගරු ඇමතිතුමනි. මේ වැරැද්ද තව කෙනෙකුට වෙන්න දෙන්න එපා. මේවා දේශපාලන ප්‍රචාර කරන්න එපා. මේවා සාමාන්‍ය දේවල්. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා, වැඩ කරන රාජ්‍ය සේවකයාව ආරක්ෂා කරන්න කියලා. පොලීසියේ වැඩ කරන නිලධාරියාව ආරක්ෂා කරන්න. වැඩ නොකරන කෙනාට දඬුවම් දෙන්න. අපිත් තමුන්නාන්සේලාත් එක්ක ඒ දේ වෙනුවෙන් හිට ගන්නවා. ඒ නිසා මම ඔබතුමන්ලාට කියනවා, මේ රටේ කොයි දේ කොහොම කළත්, ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා කොච්චර වැඩ කළත් කවදාවත් මිනිස්සුන්ව සියයට සියයක් සතුටු කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියලා.

මට කාලය ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.33]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහත්මයාව ධුරයෙන් ඉවත් කිරීමේ යෝජනාව සහ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන වාර්තාව සම්බන්ධයෙන් අද මේ ගරු සභාවේදී කථා කරන්න ලැබීම භාග්‍යයක් විදියට මම සලකනවා. ඒ වාගේම ඒක ඓතිහාසික කාර්යභාරයක්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අද විපක්ෂය පැත්තෙන් මේ යෝජනාවට ලැබුණු ප්‍රතිචාර අපි ඇත්තටම සලකා බලන්නට ඕනෑ. මොකද, එලෙස ලැබෙන ප්‍රතිචාරවලින් විපක්ෂයේ දේශපාලනය ගැන, ඔවුන් කරන්න හදන්නේ මොකක්ද කියන එක ගැන සහ විපක්ෂයේ තිබෙන අර්බුදය හොඳටම පැහැදිලි වෙනවා.

අපේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා උදේ පාන්දර නැඟිටලා කිව්වා, මේක අධිකරණයේ දැනට අසමින් තිබෙන - *sub judice*- කාරණයක් නිසා මේ ගරු සභාවේදී මේ ගැන කථා කරන්න එපා කියන කාරණය. ඒ සම්බන්ධයෙන් එතුමාගේ විරෝධය එතුමා ලකුණු කළා. ඇත්තටම මේක දේශබන්දු තෙන්නකෝන් මහත්මයාගේ නීතිඥවරු විසින් විමර්ශන කමිටුව ඉස්සරහ ඉදිරිපත් කරපු මූලික විරෝධතාවක්. එතකොට දේශබන්දු තෙන්නකෝන් මහත්මයාගේ තෝල්ක මුදලි හැටියට තමයි අද නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඇවිල්ලා, "මේක *sub judice.* මේක මෙතැන කථා කරන්න එපා" කියලා ඒ විරෝධතාවම නැවත උච්චාරණය කරමින් කිව්වේ. ඒ කියන්නේ, මේ ගැන අධිකරණයේ සාකච්ඡා වෙමින් තිබෙනවා. ඒ මූලික විරෝධතාවට මේ විමර්ශන කමිටුව විසින් පැහැදිලි උත්තරයක් ලබා දීලා තිබෙනවා. ඒක මේ විමර්ශන කමිටු වාර්තාවේ සඳහන් වෙලාත් තිබෙනවා. මම දන්නේ නැහැ, එතුමා ඒ වාර්තාව කියෙව්වාද, නැද්ද කියලා. නමුත්, ඒක දැන-දැන තමයි අද උදේ මේ ගරු සභාවට ඇවිල්ලා මේ විවාදය වෙන එක නවත්වන්නට එතුමා උත්සාහ කළේ. තමන්ගේ පක්ෂපාතීත්වය ලකුණු කරන්නයි ඒක කරන්නේ. තමන් කාවද ආරක්ෂා කරන්නේ කියන එක ලකුණු කරන්නයි ඒක කරන්නේ. ඒක බොහොම පැහැදිලියි. ඒ, එතුමාගේ දේශපාලනය. අපි පරාජය කරපු මජර දේශපාලනය තමයි ඒ පෙන්වන්නේ. මේ දේශබන්දු තෙන්නකෝන් කියන පොලිස්පතිවරයා අදින් පසුව එම තනතුරේ නැහැ. ඒ පොලිස්පතිතුමා සම්බන්ධයෙන් මේ විමර්ශන කමිටුව විසින් විමර්ශනය කරන ලද චෝදනා පිළිබඳව ඇති තරම් අද කථා කළා. ඒවා බරපතළ චෝදනා. ඒ වාගේම ඒවා ලෙහෙසි පහසු චෝදනා නොවෙයි. අපරාධයක් කිරීමට අනුබල දීම, ඒකට කුමන්ත්‍රණය කිරීම, පහසුකම් සැලසීම කියන චෝදනාව එකක්, මේ පොලිස්පතිතුමාට විරුද්ධව තිබෙන. අනෙක් චෝදනාව තමයි, පොලීසියේ කීර්ති නාමයට හානිකර විධියට පලා ගිහින් හැංගිලා හිටපු එක. අධිකරණයෙන් හැංගිලා හිටියා, මේ පුද්ගලයා මාසයක් විතර කාලයක්. පොලිස්පති ධුරයේ සිටියදී තමයි ඔහු එහෙම කළේ. මෙන්න මේ පුද්ගලයාව තමයි මේගොල්ලන් ආරක්ෂා කරන්න හදන්නේ. එසේ ආරක්ෂා කරන ගමන් විහිළුවට වාගේ අහනවා, අර සිඬාලේප සිද්ධිය ගැන. සිඬාලේප සිද්ධිය මොකක්ද අහනවා, ඒ ගැන කියන්න ලු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ සිඬාලේප කථාව මොකක්ද ඇත්තටම? 2010 දෙසැම්බර් 15 සිට දින කිහිපයක් තුළ වෙහෙරගෙදර රංජිත් සුමංගල කියන පුද්ගලයා සහ තවත් පුද්ගලයින් දෙදෙනෙකුව වධ හිංසනයට ලක් කිරීම සම්බන්ධයෙන් වූ චෝදනාවක්, මේක. 2011දී පවරපු නඩුවක් අනුව දේශබන්දු තෙන්නකෝන් මහත්මයා මේ නඩුවේ 5වන වග උත්තරකරුව දැන-දැන වධ හිංසාවට ලක් කළා, එම නිසා ඔහු මේ වධ හිංසාවට වගකිව යුතුයි කියලා 2023 දෙසැම්බර් 14වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දීපු තීන්දුවක්, මේක. අධිකරණය ගැන, අධිකරණයට බලපෑම් කිරීම ගැන කථා කරන මේ මහත්වරුන් මෙතැනට ඇවිල්ලා අපහාසයට ලක් කරන්නේ, අවතක්සේරුවට ලක් කරන්නේ ඒ අධිකරණ තීන්දුව තමයි. ඒක ගැන අපි පුදුම වෙන්න ඕනෑ නැහැ. මොකද, ඒ ගැන පුදුම වෙන්න ඕනෑ නැත්තේ? මේ තීන්දුව 2023 දෙසැම්බර් 14වැනි දා දෙනකොට, ඒ තීන්දුව තුළ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියා තිබෙන්නේ මොකක්ද? "The affidavit further states that the 5th Respondent himself beat the petitioner with a 'three-wheel rubber band' after stripping him naked and ordering him to rub Siddhalepa on his genitalia." That is the allegation against this IGP. That is what is being ridiculed here, among all of us. "The 5th Respondent is specifically referred to therein by his name and rank -" මේ පෙත්සම්කරුවා විසින් ඔහුව නමින් සහ තනතුරෙන් හඳුනා ගත් බවත්, තමන්ව වධ වේදනාවට ලක් කළ බවත් මෙම පෙත්සම තුළ සඳහන් කර තිබෙනවා. ඒක ශ්‍රේෂ්ඨාධිකරණය සලකා තිබෙනවා. ඒ සමඟම ශ්‍රේෂ්ඨාධිකරණය තව මොකක්ද කියන්නේ? "Therefore, I find the 5th Respondent to have tortured the Petitioner -" මේ පෙත්සම්කරුවා වධ වේදනාවට ලක් කර තිබෙනවා කියන එකත් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරනවා. එසේ කියන ගමන් කියනවා, that while findings of fundamental rights violations are ample, the wrongdoers -especially the big fish in the pond - are seldom held duly accountable. Senior officers, under whose authority and direction their subordinates may act, have a special duty to ensure that they do not abuse such authority or go beyond such direction. ලොකු ලොකු තෝරු, මෝරුන්ට - big fish in the pond - වගකීමක් තිබෙනවා, තමන්ගේ පහළ නිලධාරින් බලය අවභාවිත නොකරන බවට වග කියන්න. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මේවා නිරීක්ෂණය කර තිබෙනවා. ඔවුන්ට විරුද්ධව, ඒ කියන්නේ තෝරුන්ට, මෝරුන්ට විරුද්ධව ඉදිරිපත් වන ජනතාවගේ මූලික අයිතිවාසිකම් පෙත්සම් සඳහා නිසියාකාරයෙන් කටයුතු කරන්නේ නැති බව. ඕනෑ තරම් මෙවැනි abuses සිද්ධ වුණත්, මෙවැනි වැරදි සිද්ධ වුණත් ඒ ඉහළ නිලධාරින්ට අවශ්‍ය දඬුවම් ලබා නොදෙන බව ශ්‍රේෂ්ඨාධිකරණයම නිරීක්ෂණය කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ නිසායි අද අපි මේ ගෙනෙන යෝජනාව, අද අපි මේ කරන විවාදය වැදගත් වන්නේ. ඒ නිසාම තමයි නාමල් රාජපක්ෂ වාගේ මන්ත්‍රීවරුන් මේ විවාදය නවත්වන්න කටයුතු කරන්නේ. බලය තිබෙන මිනිස්සු බලය පාවිච්චි කරලා ජනතාවට දෙන වධ වේදනා ගැන, ඔවුන්ව හිංසනයට ලක් කිරීම ගැන තමයි අපි මේ තුළ කථා කරන්නේ. 2023 දෙසැම්බර් 14වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් ලබා දී තිබියදීත් 2024 පෙබරවාරි මාසයේදී මේ පුද්ගලයාව පොලිස්පති හැටියට පත් කරන්නේ නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලා අත ඔසවා පත් කර ගත් ජනාධිපති තමයි. ඒක හින්දා තමයි ඒ මන්ත්‍රීතුමා අද මෙතැනට ඇවිල්ලා ඒ විධියට කථා කළේ. තමන්ගේ පක්ෂපාතීත්වයයි එතුමා මේ ලකුණු කරන්නේ. අපි ඒක හොඳින් මතක තබා ගන්න ඕනෑ. මජර දේශපාලනය ආරක්ෂා කරන්නයි මෙතැනට ඇවිල්ලා ඒ විධියට කථා කරන්නේ.

අනෙක් කාරණය මේකයි. මෙතැන තවත් විපක්ෂයක් ඉන්නවා. ඒ තමයි, සමගි ජන බලවේගය; විපක්ෂය නියෝජනය කරන ප්‍රධාන කණ්ඩායම. ඔවුන් මොකක්ද කියන්නේ? ඔවුන් කුහක විපක්ෂය. අරක මජර විපක්ෂය. මේක කුහක විපක්ෂය. මේ විපක්ෂයට පිළිගන්න බැහැ, අද මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, මේ විමර්ශනය සිද්ධ වුණේ, පොලිස්පතිවරයා ඉවත් කරන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව යටතේ කියන එක. මහජන විනිශ්චයක්, මේක; පාර්ලිමේන්තුව විසින් පත් කරපු කමිටුවක් විසින් කරපු විනිශ්චයක්, මේක. ඒ අනුව තමයි පොලිස්පතිතුමා අයින් කරන්නේ. මේ කුහක විපක්ෂය තමයි 2023, 2024දී ප්‍රධාන විපක්ෂය. ඒ වෙලාවේ තමන්ට තිබුණු වගකීම තමයි පොලිස්පතිවරයාට තිබුණු චෝදනා ගැන කථා කරන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේදී ඒකට විරුද්ධ වෙන එක. ඒක තමයි ඔවුන්ගේ වගකීම. *[බාධා කිරීම්]* හොඳයි, ඒක කළා. නමුත් ඒ කුහකකම කොච්චරද කියන්නේ, අද පිළිගන්නේ නැහැ. අද මේ යෝජනාව අපියි ගෙනැල්ලා තිබෙන්නේ කියන

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

එක පිළිගන්න බැහැ. Delusion! මෙතැන තිබෙන්නේ තමන් ගැන තිබෙන අධිමානය, තමන්ගේ නොහැකියාව ගැන තිබෙන අධිමානය. ඒක තමයි මේ තිබෙන්නේ. පිළිගන්න මේක, අපියි, ජාතික ජන බලවේග ආණ්ඩුවයි මේ යෝජනාව ගේන්නේ. මේ රටේ විනිර්මුක්තිය දශක ගණනක් තිබුණා. පොලීසියේ දශක ගණනක් තිබුණු විනිර්මුක්තිය. ඒ වාගේ වෙනත් ආයතනත් තිබුණා. ජනතාව වද වේදනා වින්දා. ඒ විනිර්මුක්තිය අවසන් කරන්නයි අපි මේ යෝජනාව ගේන්නේ. ඒක අපේ වගකීම. එදා අපි තුන්දෙනෙක් තමයි හිටියේ. අද අපි 159දෙනෙක් ඉන්නවා. අපි හැමෝම අත උස්සලා තමයි අද මේ යෝජනාව සම්මත කරන්නේ. විනිර්මුක්තිය අවසන් කරන්නේ අපි හැමෝම අත උස්සලායි. ඒකට සහයෝගය ලබා දීමට සමගි ජන බලවේගයට decency එකක් නැහැ. ඒකටත් ඇවිල්ලා මෙතැන කුහක කථා කියවනවා. තමන්ගේ කතන්දරයක් කියවනවා. තමන් කරපු කාර්යභාරය ගැන මෙතැන මොකක්ද මේ කියන්නේ? Delusion at its highest peak! තමන්ගේ ආණ්ඩුව කියලායි හිතාගෙන ඉන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මේක අහගෙන ඉන්න කෙනෙකුට හිතෙන්නේ මේගොල්ලන්ගේ ආණ්ඩුව යෝජනාවක් ගෙනැල්ලා පොලිස්පතිව අයින් කරන්න හදනවා, ඒකට අපි විරුද්ධ වෙනවා වාගෙයි. මතක තියා ගන්න, අපේ ආණ්ඩුවයි ඒක කරන්නේ. අපට ජනතාව බලය දීලා තිබෙන්නේ ඒකටයි. ජනතාවට තවදුරටත් මේ රටේ විනිර්මුක්තිය අපි මේ රටේ පවතින්න දෙන්නේ නැහැ. අර ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා වාගේ, big fish in the pond, තෝරු, මෝරුන්ට දඬුවම් දෙන්න තමයි මේ ආණ්ඩුව පත් කරලා තිබෙන්නේ. අපි ඒ කාර්යය කරනවා. ඒ තෝරු, මෝරු තමයි අද මෙතැනට ඇවිල්ලා තමන්ටත් අනාගතයේ සිද්ධ වෙන දේවල් දැක දැක කෑගහන්නේ. අන්න ඒ හින්දා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසානයි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Okay, Madam, I will conclude. Give me 30 seconds, please.

මජර විපක්ෂයටත්, කුහක විපක්ෂයටත් දෙකටම අපට කියන්න තිබෙන්නේ ඒකයි. මේක අපේ ජනවරම. මේ පොලීසිය නිවැරදි කරන එක, මේ රටේ නීතියේ ආධිපත්‍යය හදන එක අපේ ජනවරම. අපි ඒකට අනුව කටයුතු කරනවා. ඒකට තමන්ලාට සහයෝගය දෙන්න බැරි නම්, ඔය විපක්ෂ නායකකමට කරන fight එක නේ, පෙන්වන්නේ. එක්කෙනෙක් නැගිටලා එකක් කියනවා. ආණ්ඩුවට විරුද්ධ වෙන්න තමයි දෙගොල්ලම හයියෙන් කෑ ගහන්නේ. බොහොම හොඳයි. හැබැයි, අපේ ජන වරම අපි ඉෂ්ට කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.42]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றையதினம் நாங்கள் பொலிஸ்மா அதிபர் தேசபந்து தென்னகோன் அவர்களைப் பதவியிலிருந்து நீக்குவதற்கான தீர்மானம் தொடர்பில் விவாதித்துக்கொண்டு இருக்கிறோம். கௌரவ ஜீவன் தொண்டமான் அவர்கள் தனது பாட்டியின் இறுதிக் கிரியையில் கலந்துகொள்வதற்காக வெளிநாடு சென்றுள்ளார். அதனால் தனக்கு ஒதுக்கப்பட்ட நேரத்தில் மூன்று நிமிடங்களை எனக்குத் தந்தார். அதற்காக அவருக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அவருடைய நிலைப்பாடும் தமிழ்த் தேசிய மக்கள் முன்னணி மற்றும் தமிழ் தேசியப் பேரவையின் நிலைப்பாடும் ஒன்றாகவே இருக்கின்றது. அதாவது, தேசபந்து தென்னகோன் தொடர்பான தீர்மானத்துக்கு எங்களுடைய பூரண ஆதரவை அரசாங்கத்துக்கு வழங்குவதாக நான் இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

தேசபந்து தென்னகோன் ஓர் அரசியல் முகவர்! தனது பதவிக் காலம் முழுவதும் அரசியல்வாதிகளுக்கு முகவராகச் செயற்பட்டு இருக்கிறார் என்பதுதான் அவருடைய வரலாறு! அந்த வகையில், அவர் தொடர்பில் முன்வைக்கப்படுகின்ற குற்றச்சாட்டுகள் அனைத்துமே அரசியல் பின்னோக்கத்தோடு அணுகப்பட வேண்டும். நான் நினைக்கின்றேன், அவரைத் தங்களுடைய முகவராகப் பயன்படுத்திய தரப்பைத் தவிர, இந்தப் பாராளுமன்றத்தில் இருக்கக்கூடிய அனைத்துத் தரப்புகளும் அதனை ஏற்றுக்கொள்வார்கள் என்று. அவ்வகையான அரசியல் முகவர்களை முக்கியமான பதவிகளில் வைத்திருக்க முடியாது என்பது மட்டுமல்ல, அத்தகையவர்களை அரசாங்க சேவையிலேயும் அனுமதிக்க முடியாது. அந்த வகையில், அவர் பொலிஸ்மா அதிபர் பதவியிலிருந்து நீக்கப்பட வேண்டும் என்பதில் மாற்றுக் கருத்து இருக்க முடியாது.

தேசபந்து தென்னகோன் என்ற நபர் மட்டுந்தான் இவ்வகையான அரசியல் மயப்படுத்தப்பட்ட ஒரு கலாசாரத்தில் மாட்டுப்பட்டவர் என்று எவரும் சொல்ல முடியாது. இந்த அரசாங்கம் முன்வைக்கின்ற பிரதான குற்றச்சாட்டு என்னவெனில், சென்ற வருடம் நவம்பர் மாதம் தங்களுடைய ஆட்சி ஆரம்பிப்பதற்கு முன்பு கிட்டத்தட்ட 76 வருட காலமாக - பிரித்தானியர் இந்த தீவைவிட்டு வெளியேறிய நாளிலிருந்து - ஆட்சியிலிருந்த அனைத்துத் தரப்புகளும் தங்களுடைய அதிகாரங்களைப் பயன்படுத்தி, அரச உத்தியோகத்தர்களுக்கு அழுத்தங்களைக் கொடுத்து, அவர்களைத் தங்களுடைய அரசியல் தேவைகளுக்காகப் பயன்படுத்தியதால், ஒட்டுமொத்த அரச இயந்திரமும் அரசியல்மயப்படுத்தப்பட்ட நிலையில் இருக்கிறது என்பதுதான். இந்த அரசாங்கம் தனக்குக் கிடைக்கின்ற ஒவ்வொரு சந்தர்ப்பத்திலும் இந்தக் குற்றச்சாட்டை முன்வைத்து வருகின்றது. அது உண்மை! அதிலே மாற்றுக்கருத்து இல்லை. இன்றைக்கு இந்த அரசாங்கம் தேசபந்து தென்னகோனுக்கு எதிராக எடுத்திருக்கின்ற

நிலைப்பாட்டுக்குக் காரணம், அவர்கள்கூட அவரால் பாதிக்கப்பட்டு இருக்கலாம் அல்லது அவர்கள் அவரால் எந்தவித நன்மையும் அடையாமல் இருந்திருக்கலாம். ஏன் நான் இதைச் சொல்கிறேன் என்றால், அரச உத்தியோகத்தர்கள் அரசியல் மயப்படுத்தப்பட்ட நிலையில் சேவை செய்யக்கூடாது என்ற நிலைப்பாட்டில் உண்மையிலேயே இந்த அரசாங்கமும் இல்லை என்பதைச் சுட்டிக்காட்டுவதற்கும் நிரூபிப்பதற்குமாகத்தான்.

ஆட்சியில் இருக்கின்ற அரசாங்கம் அரச உத்தியோகத்தர்களைத் தங்களுடைய தேவைகளுக்காகப் பயன்படுத்தும்போது, அந்த அரசாங்கம் மாறி புதிய அரசாங்கம் ஆட்சிக்கு வருகின்ற பட்சத்தில் குறித்த நபர்களைக் குறிவைத்து, அவர்கள் வகிக்கின்ற பதவிகளிலிருந்து அவர்களை அகற்றுவதற்கான செயற்பாடுகளை முன்னெடுப்பதை இந்தச் சபையிலுள்ள அனைவரும் வரவேற்பார்கள்; நாங்களும் வரவேற்கின்றோம். அப்படிப்பட்டவர்கள் பதவியில் இருக்கக்கூடாது; அவர்கள் பதவிகளிலிருந்து அகற்றப்பட வேண்டும். அதில் மாற்றுக்கருத்து இல்லை. ஆனால், ஆட்சிக்கு வரக்கூடிய அனைத்து அரசாங்கங்களும் ஓர் அரசினுடைய கொள்கையாக இந்த நாட்டில் வாழக்கூடிய குறிப்பிட்ட ஒரு தரப்பை அல்லது ஓர் இனத்தைக் குறிவைத்து அவர்களுக்கு எதிராக வேலைசெய்யும்பொழுது அதற்கு என்ன பரிகாரம்? அதற்கு என்ன பதில்? என நான் கேட்கிறேன்.

பொலிஸ் சேவையில் இருக்கின்றவர்களும் இராணுவத்தில் இருக்கின்றவர்களும் தமிழ் மக்களைப் படுமோசமாகக் குறிவைக்கிறார்கள். அதுதான் எங்களுடைய வரலாறு! தேசபந்து தென்னகோன், தென் பகுதி அரசியலில் அரசியல் மயப்படுத்தப்பட்ட ஒரு நபர் என்ற வகையில், இன்றைக்கு நீங்கள் சந்தர்ப்பம் கிடைக்கின்ற இடத்தில் அவரைக் குறிவைக்கிறீர்கள். நீங்கள் அவரை மட்டும் குறிவைப்பதால், இந்த நாட்டினுடைய அனைத்து விவகாரங்களிலும் புற்றுநோய்போல் இருக்கக்கூடிய அரசியல் தலையீடுகளை நீக்க முடியாது. அப்படி நீங்கள் அதை நீக்குவதற்கு முயற்சித்தாலும்கூட, தமிழ் மக்களுக்கு இருக்கக்கூடிய பிரச்சினைகள், அவர்கள் இன்றைக்குச் சந்திக்கின்ற அநீதிகளுக்கு ஒருபோதும் நீதியைப் பெற்றுக்கொடுக்கப் போவதில்லை. ஏனெனில், நீங்களும் தமிழ் மக்களுக்கு எதிராகத் திட்டமிட்டுச் செயற்படுகின்ற ஒரு தரப்பாக இருக்கிறீர்கள்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைக்கு செம்மணி மனித புதைகுழியில் அகழ்வுகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இன்றுவரை 130க்கும் மேற்பட்ட எலும்புக்கூடுகள் அங்கு கண்டுபிடிக்கப்பட்டு இருக்கின்றன. அங்கு கண்டுபிடிக்கப்பட்டு இருக்கின்ற artifactsஐக் காட்சிப்படுத்தி, அவற்றை அடையாளப் படுத்துவதற்கு பொதுமக்களுக்கு ஒரு சந்தர்ப்பம் வழங்குமாறு நீதவான் கட்டளை ஒன்றை இட்டிருக்கிறார். அதன்படி, இன்றைய தினம் செம்மணியில் பொதுமக்களை அழைத்து, அங்கு காட்சிப்படுத்தப்படுகின்ற artifactsஐ அடையாளப் படுத்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படுகின்றது. இந்த நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுக்கொண்டு இருக்கின்ற இந்த வேளையில், நீதி அமைச்சின் செயலாளர் அவர்கள் அங்கே அகழ்வுச் செயற்பாடுகளில் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றவர்களோடு நேரடியாகத் தொடர்புகொண்டு பேசிக்கொண்டு இருக்கிறார் என்பதை நான் பொறுப்போடு கூறுகின்றேன். இதுவும் அரசியல் மயப்படுத்துகின்ற வேலைத்திட்டமல்லவா? இது அரசியல் தலையீடு இல்லையா? இது அழுத்தத்தைக் கொடுக்கின்ற ஒரு விஷயம் இல்லையா? நீதிமன்ற கட்டளையின்படி நடைபெறுகின்ற ஒரு செயற்பாடு தொடர்பில் உங்களுக்கு மேலதிக தகவல் வேண்டுமென்றால், நீங்கள் நீதிமன்றத்துக்குத்தான் போக வேண்டும். அமைச்சின் செயலாளர் அங்கு வேலை செய்துகொண்டு இருக்கின்ற உத்தியோகத்தர்களோடு நேரடியாகத் தொடர்புகொள்வது என்பது அரசியல் தலையீடு! அதை நீங்கள் செய்யலாமா? நான் பொறுப்புடன் கூறுகின்றேன், நீதி அமைச்சின் செயலாளர்தான் இவ்வாறு செயற்படுகின்றார் என்று. உண்மையிலேயே நான் மிகவும் மதிக்கின்ற ஓர் அம்மணி இப்படிச் செயற்படுவார் என்று நான் ஒருபோதும் நினைக்கவில்லை. ஆனால், இப்படி நடக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
විනාඩි තුනක් තිබෙනවා.

செம்மணியில் அகழ்வின்போது கண்டெடுக்கப்பட்ட தடயப்பொருட்களை அடையாளம் காண்பதற்கு பொது மக்களுக்குச் சந்தர்ப்பம் வழங்கப்பட்டு இருக்கின்ற இன்றைய தினம், அந்த இடத்துக்குச் செல்லும் வழியில் ASP, CIDயும் அவரைச் சுற்றிவர இன்னும் 10 பேரும் இருக்கின்றார்கள். இது மக்களை மிரட்டுகின்ற ஒரு செயற்பாடு அல்லவா? ஏற்கனவே, பொதுமக்கள் பயத்தில் - பீதியில் - இருக்கின்றார்கள். அவர்கள் அந்த இடத்துக்குப் போகும்போது அவர்களை மிரட்டுகின்ற ஒரு திட்டமிட்ட செயற்பாடு அல்லவா இது? இதனை நீங்கள் செய்யலாம்! ஏனெனில், இது தமிழனுக்கு நடக்கின்றது. அதனால் இது அரசியல் தலையீடு அல்ல. இது எப்படி நியாயமாகும்? ஆகவேதான் நான் சொல்கின்றேன், 'அரசியல் தலையீடு' எனும் புற்றுநோயை நீக்க வேண்டும் என்பதில் மாற்றுக் கருத்து கிடையாது என்று. இந்த அரசாங்கம் அதற்காக எடுக்கின்ற நடவடிக்கைகளுக்கு எங்களுடைய பூரண ஆதரவு இருக்கும். ஆனால், இந்த அரசு தமிழ் மக்களுக்குச் செய்கின்ற அநியாயத்தை ஏற்றுக்கொள்ள முடியாது. இன்றைக்கும் தமிழ் மக்கள் பொறுப்புக்கூறுவதற்குத் தாகத்தோடு இருக்கின்றார்கள். இந்நிலையில் நீங்கள் எமது மக்களுக்குச் செய்கின்ற அநியாயத்தை மன்னிக்கவே முடியாது. அதனால்தான் நாங்கள் திரும்பவும் சொல்கின்றோம், உங்களுக்கும் மற்றவர்களுக்கும் இடையில் இனம் சார்ந்த விடயங்களில் ஒரு வித்தியாசமும் கிடையாது என்று.

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழுவின் அதிகாரிகள் நேற்று யாழ்ப்பாணம் சென்று, செம்மணியில் அகழ்வுப் பணிகள் இடம்பெறும் பிரதேசங்களைக் கண்காணித்துவிட்டு, தங்களுடைய கருத்துகளைத் தெரிவித்து இருக்கிறார்கள். கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு உண்மையிலேயே சுயாதீனமான ஓர் அமைப்பாக இருந்தால், அவர்கள் இந்த அரசாங்கத்துக்குச் சொல்லவேண்டிய விடயம் என்னவென்றால், "நீங்கள் ரோம் சாசனத்தில் கைச்சாத் திடவில்லை; ரோம் சாசனம் ஊடாக அறிமுகப்படுத்தப்பட்ட குற்றங்கள் இந்த நாட்டின் சட்டத்துறையில் குற்றங்களாக அறிமுகப்படுத்தப்படவில்லை; செம்மணியில் நடந்திருக்கின்ற

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

அநியாயம் ரோம் சாசனத்தில் இருக்கக்கூடிய குற்றங்கள்! இந்த நாட்டில் அது குற்றங்களாக அங்கீகரிக்கப்படாத நிலையில், ஒரு சர்வதேச குற்றவியல் விசாரணை மட்டும்தான் இங்கு நடந்துள்ள அநியாயத்துக்கு நீதியைப் பெற்றுக்கொடுக்கும்" என்பதைத்தான். அவர்கள் அதைச் சொல்லாமல் ஊடகங் களுக்கு புத்திமதி சொல்கிறார்கள். அதாவது, தயவுசெய்து நீங்கள் உணர்வுபூர்வமாக இந்த விஷயங்களை வெளிக் கொண்டு வராதீர்கள்! உணர்ச்சிவசப்பட்டுக் கதைக்காதீர்கள்! குழப்பாதீர்கள்! என்ற கருத்தைத்தான் சொல்கிறார்கள். அரசே ஓர் இனத்துக்கு எதிராக இருக்கும்பொழுது, அந்த இனத்துக்குரிய நீதி அரச கட்டமைப்புக்கூடாகக் கிடைக்காது என்பதை 130 எலும்புக்கூடுகள் கண்டுபிடிக்கப்பட்டு இருக்கின்ற இன்றைக்காவது நீங்கள் ஏற்றுக்கொண்டு, உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.54]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා නතර කරපු තැනින් මම මේ විවාදය ආරම්භ කරන්න හිතුවා. මේ මෑතකදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසමේ මහ කොමසාරිස් වොල්කර් ටර්ක් මහතා ලංකාවට ආවා. එතුමා ජුනි 26වැනි දා ලංකාවෙන් යන අතරේ නිකුත් කරපු "X" පණිවුඩයේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "Leaving #SriLanka with much hope. Sensed a real desire from Gov't & civil society to break from entrenched identity politics. In a divided world, my wish is for Sri Lanka to become a story of peaceful coexistence, of understanding others - where diversity is embraced as a strength."

මම එය නැවත කියන්නම්. එතුමා කියනවා, "Leaving Sri Lanka with much hope. Sensed a real desire from Government and civil society to break from entrenched identity politics" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම කියන්න කැමැතියි, චෙම්මනි මිනී වළේ පරීක්ෂණ කටයුතු කරවන්නේ ආණ්ඩුව බව. එය අධිකරණයේ අධීක්ෂණය මත සිදු වෙන්නේ. අපේ ආණ්ඩුව එනකොට එහි ඇටසැකිලි සොයාගෙන තිබුණේ සුළු ප්‍රමාණයක්. දැන් ඒ බේදවාචකයට අදාළ ඇටසැකිලි සංඛ්‍යාව 130 දක්වා වර්ධනය වෙමින් තිබෙනවා. ඒ පරීක්ෂණ කරවන්නේ වෙන කවුරුවත් නොවෙයි, ආණ්ඩුවයි. ඒ අපරාධවලට සම්බන්ධ වෙච්ච උතුරේ සමහර කල්ලි එක්ක එකතු වෙලා, අද යාපනය නගර සභාවේ පාලනය පිහිටුවා තිබෙන්නේ මේගොල්ලෝ. ඒ ඇටකටු ගණනාවකට වග කියන්න ඕනෑ අය එක්ක තමයි, මේගොල්ලෝ යාපනය නගර සභාව හදලා තිබෙන්නේ. උතුර පළාතේ වැඩිම ඡන්ද තිබෙන පක්ෂය, අපේ පක්ෂය. අපි එතැනදී යුක්තිය ඉටු කරනවා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? දකුණේ ජාතිවාදීන් පැරදිලා. රාජපක්ෂලා මොකක් හරි දෙයක් හොයා ගන්න දැන් නටනවා. මේගොල්ලෝත් එහෙම තමයි. අද මොකක්ද තිබෙන ප්‍රශ්නය? මේගොල්ලන්ට ඕනෑ මොකක් හරි සිද්ධියක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, චෙම්මනි මිනී වළේ පරීක්ෂණ කටයුතු කරවන්නේ අපේ ආණ්ඩුව. ඒ විතරක් නොවෙයි, ඒවාට අපි කිසිම බාධාවක් කරන්නේ නැහැ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්තුමා අපේ පක්ෂ කාර්යාලයට ආපු වෙලාවේ අපි එතුමාගෙන් ඉල්ලීමක් කළා. මොකක්ද අපි ඉල්ලුවේ? අපි කිව්වා, carbon datingවලට යවන්න අපට කල් යනවා, පුළුවන් නම්, accreditation කරන්න පුළුවන් laboratory එකක් ලංකාවට දෙන්න කියලා. මොකද, මාතලේ මිනී වළක් තිබෙනවා; මන්නාරමේ සතොස යට මිනී වළක් තිබෙනවා. ඒවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ වාගේම, තිරුකේතීෂ්වරන්වල මිනී වළක් තිබෙනවා; මණ්ඩතිව්වල මිනී වළක් තිබෙනවා; කොක්කුතුඩුවායිවල මිනී වළක් තිබෙනවා. ඒ හැම මිනී වළක්ම බලන්න මම ගිහිල්ලා තිබෙනවා. ඒ ගියේ කැමරාකරුවන් එක්ක නොවෙයි. ඒ නිසා මම මේ කාරණය කියන්න කැමැතියි. මේගොල්ලන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, අප වාගේ ජාතික සමගි ආණ්ඩුවක් ආපු එක. මේගොල්ලෝ අනාථ වෙලා ඉන්නේ. ජාතිවාදය ගැන දෙදරුම් කවමින් කථා කළාට වැඩක් නැහැ. ඒවා කවුරුවත් ගණන් ගන්නේ නැහැ. අන්ත ජාතිවාදියි.

දැන් මම තවත් කාරණයක් ගැන අහන්න කැමැතියි. මිරුසුවිල්වලදීත් මැරුවා. දරුවෝ ළිඳේ දාලා මැරුවා. ඒ පිරිස මරන්න දායක වෙච්ච අය එක්ක තමයි මේගොල්ලෝ යාපනය නගර සභාව හදලා තිබෙන්නේ. ඒ history එක ඉවරයි. රාජපක්ෂලා ජාතිවාදයට දහලන තරම්ම,- *[බාධා කිරීම්]* රාජපක්ෂලාට අද,- *[බාධා කිරීම්]* සිංහල මිනිස්සු, ස්වාමින් වහන්සේලා, බෞද්ධ හා ක්‍රිස්තියානි ජනතාව අද ජාතික ජන බලවේගය ආණ්ඩුවත් එක්ක ඉන්න කොට රාජපක්ෂලාට සොරි. ඒගොල්ලෝ බලනවා, මොකක් හරි ඇදයක් හොයන්න. කලින් මේ සභාවේ හිටපු කෙනෙක් කිව්වා, අපි ආවොත් පෙරහැර නැහැ කියලා; දානය ලැබෙන්නේ නැහැ කියලා. මේ සජබයේ කෙනෙක් කිව්වේ. ඒ වාගේ තක්කඩි ජාතිවාදීන් එක්ක, රාජපක්ෂලා එක්ක ලැගගෙනයි අද ඉන්නේ. අද මේ විවාදයේ සජබයේ තහනම් වචනය මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය දන්නවා ඉස්සර "තහනම් වචනය" කියලා ගුවන් විදුලි වැඩසටහනක් තිබුණු බව. මමත් චූටි කාලයේ අත්තම්මාත් එක්ක ඒ වැඩසටහන අහලා තිබෙනවා. ඒ කියන්නේ, රැල්ල ගැන කියන්න පුළුවන්, හැබැයි වෙරළ කියන වචනය කියන්න බැහැ. මල කියන්න පුළුවන්, හැබැයි සුවඳ කියන්න බැහැ. අද සජබයට මොකක්ද වෙලා තිබෙන්නේ? දේශබන්දු කියන්න පුළුවන්, රාජපක්ෂ කියන්න බැහැ. දේශබන්දු ගෙනාවේ රාජපක්ෂලා. දේශබන්දුලා මිනී මැරුවේ රාජපක්ෂලාත් එක්ක එකතු වෙලා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahman)

රාජපක්ෂ ගෙනාවේ ඔයගොල්ලෝ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අනේ මේ. මේගොල්ලන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,- *[බාධා කිරීම්]* හරි ලස්සනයි. හරිම ලස්සනයි. මම ඇත්තටම ඔබතුමියගෙන්, *[බාධා කිරීම්]* හරිම ලස්සනයි, නේද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි? මොකක්ද දන්නවාද? මම කියන්නේ පුළුවන් නම් මේ කැමරා කරකවලා මේක පෙන්වන්න කියලායි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
*පෙන්වන්න. දෙන්න මයික් එක.[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ කථාවට නම් බාධා කරන්න දෙන්න එපා.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා නිහඬ වෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ කථාවට බාධා කරන්න එන්න එපා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අමු රාජපක්ෂලා ගෙනාපු දේශබන්දුගේ අපරාධ ගැන,- *[බාධා කිරීම්]* දේශබන්දු කියන්නේ කවුද? රාජපක්ෂලා හදපු අපරාධ රාජ්‍යයේ අංශු මාත්‍රයක්. මේ රට සදහටම කැරකෝප්පුවක් කරපු රාජපක්ෂලා. 2009 දී යුද්ධය අවසාන වුණාට පස්සේ අඩු ගණනේ යම් කිසි දෙයක් කරන්න පුළුවන්කම තිබියදී මුළු රටම විනාශ කරපු, බංකොලොත් කරපු, ජාතිවාදය ඇති කරලා මුස්ලිම් මිනිස්සුත් අනාථ කරලා, දෙමළ මිනිස්සුත් අනාථ කරලා, සිංහල මිනිස්සු පරම්පරාවක්ම රටින් යවපු ඒ අපතයොත් එක්ක තමයි දැන් මේ කට්ටිය ඔක්කොම ඉන්නේ. මම කියන්නේ කැමරා කරකවලා ඒක පෙන්වන්න කියලා. කවුද මේ කථා කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ තිබෙන්නේ මොකක්ද? දේශබන්දු සම්බන්ධ ප්‍රශ්නයක් විතරක් නොවෙයි මේක. මම සජිත් ප්‍රේමදාසට, ගයන්ත කරුණාතිලක මැතිතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් දේශබන්දුට විරුද්ධව අද හවස හතරට ඇවිත් ඡන්දය දෙන්න කියලා. මම අභියෝග කරනවා.

සජබය පක්ෂයේ සාමාන්‍ය මන්ත්‍රීතුමන්ලාට මම ගරු කරනවා. ඔබතුමන්ලාට නිසි ගෞරවය ඇතිව මම මේ කියන්නේ. හැම මන්ත්‍රී කෙනෙක්ම වටිනවා. විපක්ෂ නායකතුමාට, ගයන්ත කරුණාතිලක මැතිතුමාට, මේ ඉදිරි පේළිවල කට්ටියට මම අභියෝග කරනවා, පුළුවන් නම් දේශබන්දුට විරුද්ධව ඡන්දය දෙන්න කියලා. මොකක්ද මේකේ තිබෙන තහනම් වචනය? තහනම් වචනය තමයි රාජපක්ෂ. ඒ වෙනුවට අපි 2005දී රාජපක්ෂලා ගෙනාවා කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2005දී රාජපක්ෂලා මෙහෙම පව් කරලා තිබුණේ නැහැ. රාජපක්ෂලා 2005දී පව් කරලා තිබුණේ නැහැ, මේ තරමට. රාජපක්ෂලා ඩබල් එකේ පව් කළේ, සුදු වෑන් ගෙනාවේ, මුළු රටම මිනී කනත්තක් කරන්න පටන් ගත්තේ යුද්ධයෙන් පස්සේ, 2010න් පස්සේ. අපි ඒ නිසා රාජපක්ෂ අතහැරියා. අපි 2005න් පස්සෙත් ආණ්ඩු අස්සට ගියේ නැහැ. අපට ප්‍රශ්නයක් තිබුණා. අපට රට බෙදන එක වළක්වා ගන්න ඕනෑකම තිබුණා. මගේ වෙලාව ගත වෙනවා, කථාව වෙන පැත්තකට යනවා. මම කියන්නේ මේකයි. රාජපක්ෂලා මුළු රටම විනාශ කළාට පස්සේ තමයි අද මේගොල්ලන් කොළඹ මහ නගර සභාවේ, අරගේ මෙහේ ඔක්කොටම ජැක් ගහලා තිබෙන්නේ. ඒත් කමක් නැහැ කියමු. අද එක වචනයක් කියන්නේ නැහැ නේ. දෙවියනේ! දේශබන්දු තනිවම පොලිස්පති වුණාද? ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වැරැදිකරු වෙලා තිබියදී රාජපක්ෂලා තමයි ඔහු පත් කළේ. ඒකයි මම කියන්නේ මේ දූෂිත තක්කඩි දේශපාලනය, දේශබන්දුත් එක්කම අතුගාන්න ඕනෑ කියලා.

ඒ නිසා මතක තියාගන්න, *[බාධා කිරීමක්]* ඒක තමයි. ඒ දේශපාලනය. ජැක් නොවෙයි නේ. මේ එළිපිට නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මේ රටේ මොකක්ද කරන්නේ? මම සොයලා බැලුවා මෑත භාගයේ ලංකාවේ විතරක් නොවෙයි, ලෝකයේ රටක පොලිස් ප්‍රධානියෙක් මෙහෙම අපරාධ කරලා අහුවෙලා තිබෙනවාද කියලා. අද ඓතිහාසික - historical - අවස්ථාවක්. 1990දී මෙක්සිකෝවල සිද්ධියක් ඇති වෙලා තිබෙනවා. ලොස්ඇන්ජලීස්වල වාගේ ප්‍රාන්ත ප්‍රධානීන් ඉන්නවා. ඇත්තටම දැන් බලන්න දෙයක් නැහැ, සජබයද පොහොට්ටුද කියලා. දැන් දෙකම එකයි. ඒ නිසා මේ දෙකම තමයි දේශපාලන වශයෙන් අතුගාන්න තිබෙන්නේ. දේශබන්දුත් එක්ක ඔයගොල්ලන් අතුගෑවෙනවා. ඒක මතක තියාගන්න. අද උදේ කරපු පළමුවැනි කථාව මම අහගෙන හිටියා. දේශබන්දු ගෙනාවේ අපි වාගේයි කථා කළේ. දේශබන්දු ගැහුවේ, මැරුවේ, ඉස්සුවේ, දෙමළ මිනිස්සු, සිංහල මිනිස්සු. ඔහු ඔක්කොමටම ඒ දේ කළා. "ගෝඨාගෝගම" ට ගැහුවා. ඇත්තටම කළකිරෙනවා, මෙච්චර අධම වෙන්න පුළුවන්ද කියලා. පාස්කු ප්‍රහාරය ගත්තොත්, පාස්කු ප්‍රහාරයෙන් පසුව අවුරුදු එකහමාරක් ඔබතුමන්ලා බලයේ හිටියා. එක මිනීමරුවෙක්, එක අපරාධකරුවෙක් අල්ලන්න මහන්සි වුණේ නැහැ. දැන් මොකක්ද කරන්නේ? ඒ කාලයේ හමුදාපති කෙනෙක් හිටියා, මේගොල්ලන්ගෙන් ඡන්දයත් ඉල්ලන්න හදපු කෙනෙක්.

දැන් එයා ගැන වචනයක් කියනවාද? අපේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමා නිහතමානීව CID එකට ගිහිල්ලා පැය 6ක් කටඋත්තර දුන්නා, පාස්කු ප්‍රහාරය සම්බන්ධව. විශේෂයෙන්ම මම කියන්නේ මේකයි. අපට ජාති, ආගම් ප්‍රශ්නයක් නැහැ. නමුත් පාස්කු ප්‍රහාරයෙන් වැඩියෙන්ම බැට කාපු ප්‍රජාවක් තමයි මුස්ලිම් ප්‍රජාව. ක්‍රිස්තියානි ප්‍රජාව මැරුණා; මුස්ලිම් ප්‍රජාව සහමුලින්ම විනාශ වුණා, කොන් වුණා. සමහර මුස්ලිම් මන්ත්‍රීවරු මේ සභාවේ එක වචනයක් කියන්නේ නැහැ ඒ කාලයේ හිටපු හමුදා නායකයන්ට, රාජපක්ෂලාට, තමන්ගේ නායකයන්ට. ඒ කාලයේ ඒ ආණ්ඩුවේ දෙවැනියා සජිත් ප්‍රේමදාස. රනිල් වික්‍රමසිංහ අගමැති. 2018 අප්‍රේල් මාසයේනේ පාස්කු ප්‍රහාරය වුණේ. ඒගොල්ලන් පැරදිලා ගෙදර ගියේ 2020දී නේ. 2020 පාර්ලිමේන්තු මැතිවරණය. ඒගොල්ලන් අවුරුදු දෙකක් බලයේ හිටියා. දෙකකටත් වැඩියි. පොල් ගෑවාද, ඇමතිකම් කළේ නැද්ද ඒ අවුරුදු දෙකේ? මම කියන්නේ ඒකයි. මෙච්චර අධම වෙන්න පුළුවන්ද කියන එකයි මට තිබෙන ප්‍රශ්නය? මෙච්චර අධම වෙන්න පුළුවන්ද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි ජරා දේශපාලනය දැකලා තිබෙනවා. අපි මිනිස්සු පහළටම වැටෙනවා දැකලා තිබෙනවා. මම හිතුවේ නැහැ සජබයේ ඉන්න සමහර මුස්ලිම් මන්ත්‍රීවරු පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මේ තරම් තුච්ඡ තැනකට පත් වෙයි කියලා. ආණ්ඩුවට ගහන්න ඕනෑ දෙයක් ගන්න. ඒකට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුවට ගහන්න සාධාරණ දේවල් ගන්න. ඔය කන්ටේනර් සිද්ධිය අරගෙන තිබෙන්නේ. ඒවා ගන්න, කමක් නැහැ. හැබැයි, මේවා ගන්න එපා. මොකද, අපට

[ගරු බිමල් රත්නායක මහතා]

අමාරුයි මිනිස්සු ලෙස ඔබතුමන්ලා දිහා බලන්න. ඒක නැති කර ගන්න එපා අපි ඉස්සරහ. මිනිස්සුයි මේ අපි ඉස්සරහ ඉන්නේ කියලා හිතලා කථා කරන්න අපි කැමැතියි. පාස්කු ප්‍රහාරයේ චෝදනාව අපට හරවනකොට, පාස්කු ප්‍රහාරය සැලසුම් කළ දේශපාලන මිනීමරුවෝ මේ ඉස්සරහා වේදිකාවේ ඉන්නකොට, ඒ ගැන එක වචනයක් කියන්නේ නැතිව ඒක අපට දික් කරන එක මොන අධම දේශපාලනයක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම ඒකයි කියන්නේ. මෙච්චර තුච්ඡ දේශපාලනයක් ඇත්තටම අපි දැක්කේ නැහැ. හොඳයි, තව තව හෙළිදරව් කර කර යන්න. එතකොට ජනතාව ඔයගොල්ලන්ට සොරිම කරනවා. මම ඒකයි කිව්වේ උතුරත් එකයි, දකුණත් එකයි, අන්ත ජාතිවාදීයි. අද වෙවුලනවා, ඇයි?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අනේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම කථා කළේත් නැහැ. මට විනාඩි 14ක් තිබුණා. හරි, හරි. මම ඔබතුමියගෙන් සමාව ඉල්ලනවා. ඔබතුමිය කියන දේ මම පිළිගන්නවා.

මම කියන්නේ ඒකයි. අද උතුරේත්, දකුණේත් ජාතිවාදීන් කලබල වෙලා ඉන්නේ. අපි ජාතික සමගියේ ආණ්ඩුවක් හදලා තිබෙන්නේ. මම අහන්න කැමැතියි මොන එක්සත් ජාතීන්ගේ නියෝජිතයාද පරීක්ෂණ කරලා යන ගමන් ලංකාවට ඇවිල්ලා visit එකක් කරන ගමන් අරවාගේ කළේ?

මම දැන් මගේ මූලික කථාවට එන්නම්. එයින් කරුණු ටිකකුත් කියැවුණා. එකක් තමයි, තවමත් පොලිස්පතිවරයා දේශබන්දු තෙන්නකෝන්මයි; ඔහු ඉවත් කරලා නැහැ. අද හවස 4න් පස්සේ, මේ ඡන්දයෙන් පස්සේ තමයි ඉවත් වෙන්නේ, ඒ තීරණයත් ජනාධිපතිතුමාට යැව්වාට පස්සේ.

අද පාර්ලිමේන්තුවට ඓතිහාසික අවස්ථාවක්. මම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ Motion එක කියවන්න කියලා. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට යෝජනා ඉදිරිපත් කරන්නේ එක්කෝ මන්ත්‍රීවරු, නැත්නම් සභානායකවරයා, නැත්නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා, විපක්ෂයේ සංවිධායකවරයා වාගේ අය. නමුත් මෙතැන විශේෂත්වයක් තිබෙනවා. ගරු කථානායකතුමා තමයි මේ Motion එක දාන්නේ. ඒක ඉතා දුර්ලභ අවස්ථාවක්. ඒක 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත යටතේ තිබෙන විශේෂ දෙයක්. මීට කලින් මෙහෙම දෙයක් මේ පාර්ලිමේන්තුවේ වෙලා නැහැ. අපි පාර්ලිමේන්තුවක් වශයෙන් පෙන්වා තිබෙනවා අපි කොච්චර සමත්ද කියන එක. මම ස්තුතිවන්ත වෙනවා, මෙතැන ඉන්න පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්තුමාට. එතුමා ඇත්තටම මහන්සි වුණා මේ පිළිබඳව තිබෙන නීති කටයුතුවල ඇත්ත තත්ත්වය හොයන්න. ඒක අපි අගය කරන්න ඕනෑ. ඒ වාගේම වෙනත් නීති උපදේශකයන් සම්බන්ධ වුණා. විශේෂයෙන්ම ගරු කථානායකතුමා සම්බන්ධ වුණා. අපි ඉතාම පරිස්සමින් මේ පනත සහ Standing Orders අධ්‍යයනය කළා. ඒ අනුව අපි සම්පූර්ණ වැඩ පිළිවෙළක් සකස් කළා, මේ Standing Ordersවලින්, පනත්වලින් තිබෙන මහ පෙන්වීම පිළිබඳව. අද උදේ මන්ත්‍රීතුමෙක් කිව්වා මෙය උසාවියේ තිබෙන ප්‍රශ්නයක් කියලා. නැහැ. මට මතක විධියට අප්‍රේල් මාසයේ 02වැනි දා Parliamentary Business Committee එකේදී අපි මේ ගැන තීන්දු කළා. මා ළඟ ඒ Minutes තිබෙනවා. අපි තීන්දු කළා මේක කිසිම ආකාරයකින් උසාවිය සම්බන්ධ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. ඒ ගැන Parliamentary Business Committee එකේ තීන්දු කරලා තමයි අපි මෙතැනදී මේ යෝජනාව සම්මත කරන්නේ. ඒ නිසා Standing Ordersවල කිසිම violation එකක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමා, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අද උදේ එක මන්ත්‍රීතුමෙක් කිව්වා, පාර්ලිමේන්තුවේ කටයුතුවලට උසාවිය මැදිහත් වෙන එක ප්‍රශ්නයක් කියලා. මෙතැන ඉන්න රාජපක්ෂ මන්ත්‍රීවරයා නැඟිටලා ඒකේ අනෙක් පැත්ත, ඒ කියන්නේ, දේශබන්දුට මේ Motion එක ගෙනෙන එක වැරදියි කියනකොට, අර කලින් කථාව කියපු මන්ත්‍රීවරයාත් නැඟිටලා රාජපක්ෂට කඩේ යන්න ඉන්නවා මම දැක්කා. හොඳ වෙලාවට කථානායකතුමා අවස්ථාව දුන්නේ නැහැ. මේක හරි පැහැදිලිව ස්ථාවර නියෝග අනුව අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

අද ගරු කථානායකතුමා Motion එකක් ඉදිරිපත් කරපු දවසක්. මේ පිළිබඳව උනන්දුවක් තිබෙන ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, කරුණාකර Standing Orders පිළිබඳව ඉගෙන ගන්න කියලා. මේ යෝජනාව අද සම්මත වුණාට පස්සේ ගරු කථානායකතුමා මඟින් එය ජනාධිපතිතුමාට දැනුම් දෙනවා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමතියි, අද අපි සම්බන්ධයෙන් එක එක දේවල් කියන කට්ටියට. මට මතකයි, මම 2001දී පාර්ලිමේන්තුවේ ඉන්නකොට චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව පෙරළිලා ආවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. රනිල් වික්‍රමසිංහ තමයි ඒකේ අගමැති. ඒ කාලයේ නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රධානියා. ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකයන් 3,500ක් අත්අඩංගුවට ගත්තා, ගිනි අවි ආඥාපනත යටතේ. හැමදාම උදේට නිමල් සිරිපාල ද සිල්වාගේ වැඩේ මොකක්ද? ප්‍රශ්න අහන එක. ඒ කාලයේ පොලිස් ඇමති ජෝන් අමරතුංග. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයන් 3,500ක් ගිනි අවි ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත්තා. මට මතකයි, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා ඒක ජිනීවාවලට පැමිණිලි කළා. මේ අය පොලීසිය හැසිරෙව්වේ එහෙමයි. ඊට පස්සේ රාජපක්ෂලා. රාජපක්ෂලා මේ රට අපරාධ රාජ්‍යයක් කළා. ජනාධිපතිතුමා ඒක ඔප්පු කළා. ඒ අපරාධ රාජ්‍යයේ හිටපු එක godfather කෙනෙක් තමයි දේශබන්දු

කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ Motion එකට අවශ්‍ය නැහැ දේශබන්දුගේ හැම අපරාධයක්ම දමන්න. එහෙම වුණොත් මොකද වෙන්නේ? අපි නීති උපදෙස් ගත්තා. දේශබන්දු කරපු හැම අපරාධයක්ම මේ Motionඑකට දැම්මා නම් මොකක්ද වෙන්නේ? මේ පරීක්ෂණ ක්‍රියාවලිය දික් වෙනවා. *[බාධා කිරීම්]* මෙගොල්ලන් කියන විධියට දේශබන්දු කරපු අපරාධ ඔක්කොම දැම්මා නම් මොකද වෙන්නේ? අපෙන් අහනවා ඒවා දැම්මේ නැත්තේ ඇයි කියලා. අපි දැම්මේ එකයි. ඒවා එකක් ඇති ඔහු වැරදිකරු කරන්න. ඒ වාගේම හිටපු පොලිස්පතිතුමා කිව්වා, OICsලා 184කින් 182ක් දේශපාලන පත්වීම් ලබපු කට්ටිය කියලා. මේ දෙගොල්ලන්ගේ පැටිකිරිය එහෙමයි.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මේ දේශබන්දු වාගේ පොලිස්පතිවරයෙක්, බරපතළ, ප්‍රබල පුද්ගලයෙක්, අපරාධ රාජ්‍යයේ එක godgfather කෙනෙක් අපි අද මේ ඡන්දයෙන් පරද්දලා, ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනවා. අපි මේකෙන් දෙන සිග්නල් එක තමයි, කිසිම අවංක නිලධාරියෙක් බය වෙන්න ඕනෑ නැහැ කියන එක. හොරකම් කරන, තක්කඩි වැඩ කරන කට්ටිය විතරයි බය වෙන්න ඕනෑ. සෑම රාජ්‍ය නිලධාරියෙකුටම අපි දෙන ආදර්ශය මෙයයි. Godfathersලා හදපු රාජපක්ෂලාත් අපි දැන් අධිකරණ ක්‍රියාමාර්ගවලට ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම රාජපක්ෂලාත් එක්ක එකතු වෙලා රට විනාශ කරපු ඉහළ පෙළේ නිලධාරීන්ටත් අපි නීති මාර්ගයෙන් දඬුවම් කරනවා. අපි දන්නවා, මේ රටේ දෙමළ, මුස්ලිම්, සිංහල පොදු මහජනතාව අපේ මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළත් එක්ක එකතු වෙනවා කියලා. ඒ අපරාධකරුවන් අනියමින් රකිමින් ආණ්ඩුවට අසාධාරණ විවේචන කරන, තක්කඩිකම් කරන විපක්ෂයත් දේශබන්දුලාත් එක්කම අතු ගැවිලා යයි කියලා මම හිතනවා.

මට වැඩි වෙලාවක් දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.12]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කළ කථිකයා කියපු කාරණය ගැන පොඩ්ඩක් මතක් කරමින්, මගේ කථාව පටන් ගන්න මම කැමැතියි. මොකද, එතුමාට නීතිය තේරෙන්නේ නැති වුණාට අපි හොඳට නීතිය ඉගෙන ගත්ත අය. මම කථා කළේ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් කිසියම් තීන්දුවක් ගැනයි. මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ජනාධිපතිවරයා නිකුත් කරන්න තිබෙන නියෝගය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඡන්ද 120කින් සම්මත කළායින් පස්සේ එය පාර්ලිමේන්තුවේ සම්මත වූ තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට යම් තීන්දුවක් ගන්න පුළුවන්ද, බැරිද කියන කාරණය තමයි මම ඉස්සෙල්ලාම මතු කළේ. හිටපු ජනාධිපතිවරයා -රනිල් වික්‍රමසිංහ මහත්මයා හෝ කවුරු හෝ වෙන්න පුළුවන්- එදා ඒ තීන්දුව ගත්තේ නැත්නම්, එදා මේ පාර්ලිමේන්තුව ගිනි තියනවා. මොකද, පාර්ලිමේන්තුව ගිනි තියන්න කථා කරපු කට්ටිය, පොල්දූව හන්දියේ ඉඳලා පාර්ලිමේන්තුවේ කට්ටිය ඉන්නවා කියලා කථා කරපු හඬපට තවමත් මේ රටේ තිබෙනවා. ඒ අය දැන් පාර්ලිමේන්තුවෙත් ඉන්නවා. එහෙම ගිනි තියන්න හදපු පාර්ලිමේන්තුවක්, මේ. මේ රට විනාශ කරන්නයි හැදුවේ. මිනිස්සුන්ව මරලා ඉවර කරන්නයි හැදුවේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකසිය ගණනකගේ ගෙවල්වලට ගිනි තැබුවා. පාරවල් දිගේ මිනිස්සුන්ට ගැහුවා. දේශබන්දු තෙන්නකෝන් කරපු විනාශයත් එක පැත්තකින් ඒකට හේතුවක් තමයි කියලා මම කියනවා. ඒ කරපු විනාශය නතර කරලා, පාර්ලිමේන්තුව කැඳෙව්වාම අපි රනිල් වික්‍රමසිංහට විරුද්ධව ඡන්දය දුන්නා. හැබැයි පාර්ලිමේන්තුවේ තිබෙන නීති, අණපනත් එක්ක තමයි ඔහු මේ පාර්ලිමේන්තුව කැඳවලා ජනාධිපති තෝරා ගැනීමේ ඡන්දයක් පාර්ලිමේන්තුවේ පැවැත්වූවේ. ඒක කරන්න තමයි එදා ඒ ගැසට් එක ගැහුවේ. ඒ ගැසට් එක ගහලා ඒක මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. අපි ඒකට ඡන්දය දුන්නෙත් නැහැ. අපි ඒකටත් විරුද්ධවයි ඡන්දය දුන්නේ. හැබැයි ඒක ගැන පාර්ලිමේන්තුවෙන් පිට ප්‍රශ්න කරන්න බැහැ කියන එකයි අපි කිව්වේ.

දෙවැනි කාරණය විධියට මම කිව්වේ, ස්ථාවර නියෝග යටතේ මේක *sub judice* වෙනවා කියලායි. මොකද, කරුණු ගණනාවක් එක්ක. ඒක මම දැනුත් කියනවා. දේශබන්දු තෙන්නකෝන් ඉවත් කරන්න ඕනෑ කියන කාරණයේ මම සියයට 100ක් ඉන්නවා. ඒකේ කිසි ගැටලුවක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. මිනිහෙකුව තනතුරකින් ඉවත් කරන ක්‍රමයක් තිබෙනවා. ඉතිහාසයේ ශිරානි බණ්ඩාරනායක මැතිනියව තනතුරෙන් ඉවත් කරනකොටත් අපි එයට විරුද්ධව කථා කළා. ඒක වැරැදි නම් වැරැදියි කියන එක අපි කොන්ද කෙළින් තියාගෙන කිව්වා. ඒකට විරුද්ධව අපි පෙළපාළි ගියා, උද්ඝෝෂණ කළා. ඒ වාගේම මම අදත් කියනවා, මේ *sub judice* කියන එක නතර කරන්න බැහැ කියලා. ඒක තමයි මම මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ගන්න හැදුවේ. එහෙම නැතුව රාජපක්ෂලාට කඩේ යන්න නොවෙයි. රාජපක්ෂලාට කවුරුත් කඩේ යන්නේ නැහැ. රාජපක්ෂලාට මම කඩේ යන්නේ නැහැ. ඒක මතක තියාගන්න. ගහන්න ඕනෑ වුණාම වටේ ඔක්කෝටම ගහලා, ඒගොල්ලෝ විතරක් සුදනෝ කියලා කථා කරන්න ලැහැස්ති වෙන්න එපා.

දැන්, දේශබන්දු තෙන්නකෝන්ට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 9ක් තිබෙනවා. මම මේ කාරණය මුලින්ම කිව්වා. මම බොහොම ගරු කරන කෙනෙක් තමයි, වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා. ඒ වාගේම, යසන්ත කෝදාගොඩ මැතිතුමා

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඇතුළු මේ අය ගැන අපිට විශාල ගෞරවයක් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු වන ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා මේ තනතුරේ ඉඳගන්න එක එතුමාට හොඳ නැහැ කියලා මේ පත්වීම කරනකොට මම කිව්වා. මොකද, මේ චූදිතයාට විරුද්ධව තිබෙන නඩු 9ක එතුමා තමයි ප්‍රධාන සභාපති විනිශ්චයකාරවරයා. ඒ වාගේම මානව හිමිකම් සම්බන්ධව දේශබන්දු තෙන්නකෝන්ට විරුද්ධව එතුමා තීන්දුවක් දීලා තිබෙනවා. එතකොට ඒ විනිශ්චයකාරවරයාම ඇවිල්ලා මේ තනතුරේ වාඩි වුණාම, එතැනට ගියාමත්, අතැනට ගියාමත් ඉන්නේ එකම විනිශ්චයකාරවරයා නම්, වරදකාරයෙක් සාධාරණයක් බලාපොරොත්තු වෙන්නේ කොහොමද? ඒක තමයි මම කියපු පළමුවැනි කාරණය.

මම කියපු දෙවැනි කාරණය මෙයයි. පසුගිය ජූලි 21වැනි දා මේ වාර්තාව භාර දෙනවා. පසුගිය ජූලි 22වැනි දා ජනාධිපතිතුමා එතුමාව ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා කරනවා. මෙහෙන් මේ වාර්තාව භාර දෙනවා. ඊළඟට එතුමා අගවිනිසුරු පත්වීම ගන්නවා. ඒක හරිද, වැරදිද? මම එච්චරයි අහන්නේ. එහෙම නැතුව මට එතුමා ගැන කිසිම භේදයක්, කිසිම ප්‍රශ්නයක් නැහැ. එතුමා ඉතා වැදගත් සහ කාටවත් නතු නොවන අග්‍ර විනිශ්චයකාරවරයෙක් කියලා මම විශ්වාස කරනවා. මොකද, මට එතුමා ගැන යම් විශ්වාසයක් තිබෙන නිසා. මේවා ගැන කථා කළා කියලා ඒකෙන් දේශබන්දු තෙන්නකෝන්ට කඩේ යන එකක් නොවෙයි වෙන්නේ. වැරදි නම් තමුන්නාන්සේලාත් වැරදියි, අපිත් වැරදියි. මම මේ කරුණු ටික මතු කළේ අන්න ඒ කාරණය නිසායි.

ඒ වාගේම මේ කාරණයත් මම මතක් කරන්න කැමැතියි. පාස්කු ප්‍රහාරය වළක්වාගන්න බැරි වුණා කියලා අද දේශබන්දු තෙන්නකෝන් මහත්මයාට විරුද්ධව තිබෙන චෝදනා ඇතුළේ තිබෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? තොරතුරු ලැබිලා දේශබන්දු තෙන්නකෝන් මහත්මයා මේක පාලනය කළේ නැහැ කියලා අපේ ඇමතිතුමාම කිව්වා. තොරතුරු දුන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා නිලන්ත ජයවර්ධනව සේවයෙන් එළියට දානවා. පොලිස් කොමිසමේ සභාපති මේ කමිටුවේම එක සාමාජිකයෙක්. ඔහුත් සිටින කමිටුව දුන්න නිර්දේශයේ කියනවා, දේශබන්දු තෙන්නකෝන් මහත්මයා පාස්කු ප්‍රහාරය පිළිබඳව තොරතුරු දැනගෙන ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. තොරතුරු දැනගෙන කියන්නේ, එහෙම නම්, නිලන්ත ජයවර්ධන ඒ තොරතුරු දීලා තිබෙනවා දේශබන්දු තෙන්නකෝන්ට. ඔහු වැඩ කරලා නැහැ. ඒ නිසා ඔහු පොලිස්පති ධුරයෙන් ඉවත් කරන්න ඒකත් එක චෝදනාවක්. හැබැයි, තොරතුරු දුන් කෙනාත් ඉවත් කරලා තිබෙනවා. ඒකෙන් මොකක්ද තිබෙන වැඩේ? තොරතුරු ලබා ගත්ත රවී සෙනෙවිරත්න මහත්මයා අද අමාත්‍යාංශයේ ලේකම්. එතකොට ඒකේ සාධාරණත්වය මොකක්ද? වැරදි නම් ඔක්කෝම වැරදියි. ඒකයි මම මේ කිව්වේ. අද මොකක්ද කරලා තිබෙන්නේ? තමුන්නාන්සේලා මෙතැන මහා ලොකුවට කයිය ගහනවා පොලීසිය හරියට කටයුතු කරනවා කියලා. කොහේද පොලීසිය හරියට කටයුතු කරලා තිබෙන්නේ?

මා ළඟ තිබෙන සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා ගහපු චක්‍රලේඛයේ මොකක්ද තිබෙන්නේ? ඒකේ බොහොම පැහැදිලිව තිබෙනවා, ග්‍රාමීය මට්ටමේ ප්‍රජා පොලිස් කමිටු හදන ආකාරය. ඒකේ දේශපාලනය නැහැ. දැන් තමුන්නාන්සේලා ගහපු චක්‍රලේඛයේ මොකක්ද තිබෙන්නේ? මේකේ ඉස්සෙල්ලාම මොකක්ද තිබෙන්නේ? මහජන ආරක්ෂක කමිටු පිහිටුවීම. කවුද මේ චක්‍රලේඛය ගහන්නේ? ප්‍රියන්ත වීරසූරිය මැතිතුමා, වැඩබලන පොලිස්පති. ඔහු මොකක්ද කියන්නේ? මහජන ආරක්ෂක කමිටු පිහිටුවන්න, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිගේ මඟ පෙන්වීම අවශ්‍ය බව කියනවා. කවුද ඒ සභාපති විධියට ඉන්නේ? තමුන්නාන්සේලාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී. ඒ මන්ත්‍රී තමයි මේ පිළිබඳ කටයුතු කරන්න ඕනෑ. ඔහුගේ මඟ පෙන්වීම අනුව තමයි මේ ආරක්ෂක කමිටු පිහිටුවන්න ඕනෑ, මේ රටේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,022ම. එතැනදී පත් කරන්න කියනවා, කොට්ඨාස භාර නිලධාරියා. කොට්ඨාස භාර නිලධාරියා කවුද? Clean Sri Lanka වැඩසටහනේදීත් ඒ වාගේ දෙදෙනෙක් පත් කරන්න කියලා තිබෙනවා. ඒ පත් කිරීම කරන්නේත් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපති. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන කොට්ඨාස භාර නිලධාරියා තමයි මේ කටයුතු සම්පූර්ණයෙන් සංවිධානය කරන්න ඕනෑ. මෙච්චර කාලයක් එහෙම දේවල් තිබුණේ නැහැ. ඉස්සර මේවා කළේ කොහොමද? පොලිස් නිලධාරියෙක් එනවා, ග්‍රාම නිලධාරි මහත්මයා එනවා, හාමුදුරුවරු එනවා. ඒ වාගේ අය එකතු වෙලා තමයි ඒ කමිටුව පිහිටෙව්වේ. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? දැන් තමුන්නාන්සේලා මේ රටේ ග්‍රාම නිලධාරි වසම් 14,022ක ඒ කමිටු පිහිටුවන එක කොහොමද කරන්නේ? *[බාධා කිරීමක්]* මොකක්ද කියන්නේ, වටගල මහත්තයා? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. අපි ඒවාට අත ගැහුවේ නැහැ, මහත්තයෝ. මතක තියාගන්න. නොදන්න දේවල් කථා කරන්නේ නැතුව ඉන්න. අපි මේවාට අත ගහන්න ගියේ නැහැ, එදා. තමුන්නාන්සේලා තමයි අද කුලහන සමිතියටත් අත ගහලා තිබෙන්නේ, මරණාධාර සමිතියටත් අත ගහලා තිබෙන්නේ, තරුණ සමිතියටත් අත ගහලා තිබෙන්නේ, තරුණ සේවා සභාවටත් අත ගහලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* කුලහන සමිතිය පත් කරනකොට තමුන්නාන්සේලාට ඒකත් ඕනෑ. මතක තියාගන්න. *[බාධා කිරීම්]* තමුන්නාන්සේලා තමයි මේවා දේශපාලනීකරණයට ලක් කරලා තිබෙන්නේ. මහජන ආරක්ෂක කමිටු පිහිටුවීම අද සම්පූර්ණයෙන් දේශපාලනීකරණයට ලක් කරලා තිබෙන්නේ. මේ චක්‍රලේඛයේ බොහොම පැහැදිලිව තිබෙනවා, මේ ගන්න අයගේ විස්තර ඔක්කෝම. ප්‍රජා පොලිස් කමිටු පිහිටුවීමයි, මහජන ආරක්ෂක කමිටු පිහිටුවීමයි සම්බන්ධ චක්‍රලේඛ දෙක තමුන්නාන්සේලා අරගෙන බලන්න. ඒ චක්‍රලේඛ දෙකේ තිබෙන්නේ වෙනස් කාරණා. තමුන්නාන්සේලා සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයාට මේ බලය දීලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කියන්න කැමැතියි, ඉන්දීය ගිවිසුම් පිළිබඳව. විදේශ කටයුතු ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. මෙතැනට ඇවිල්ලා එතුමා කිව්වා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉන්දියාව සමඟ අත්සන් කරපු ගිවිසුම් පිළිබඳ තොරතුරු ලංකාවේ ඕනෑම කෙනෙකුට ගිහිල්ලා බලන්න පුළුවන්, ගන්න පුළුවන් කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ගැන නඩුවක් දැම්මා, ගුණදාස අමරසේකර මැතිතුමා ඇතුළු පිරිසක්. ඊළඟට "විනිවිද" පදනමත් ගිහිල්ලා එකට එකතු වෙලා ඒ අයත් නඩුවක් දැම්මා. දැන් ශ්‍රේෂ්ඨාධිකරණය නඩුව කැඳවනවා, මේ සඳහා තීන්දුවක් දෙන්න. මේ ගහපු ගිවිසුම් මොනවාද කියන තොරතුරු ඉල්ලා තිබෙනවා. දැන් මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහෙමපිටින්ම උල්ලංඝනය කරලා තිබෙන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබුණු නිදහස් හා ස්වෛරී ජන රජයක් කියන එක මේ ගිවිසුමේ 1.(3) යටතේ සම්පූර්ණයෙන් උල්ලංඝනය කරනවා. එහි තවදුරටත් තිබෙනවා, ඉන්දියාවේ ආරක්ෂාවට තර්ජනයක් වන කිසිම කාර්යයක් සඳහා ලංකාවේ ආණ්ඩුවට කිසිම ගිවිසුමකට එකඟ වෙන්න බැහැ කියලා. එතකොට මොකක්ද කරලා තිබෙන්නේ? රටේ ස්වෛරීභාවය, අපේ ස්වාධීනත්වය තමයි නැති කරලා තිබෙන්නේ. මේ ගැන කථා කළාම මොකක්ද කියන්නේ? ඒ ගැන මේ රටේ නීතිපති එවන ඒ affidavit එක මම කියවන්නම්. එහි මෙසේ සඳහන්ව තිබෙනවා:

"In view of the fact that this MoU involves national security and because the disclosure thereof would be or is likely to be seriously prejudicial to Sri Lanka's relations with the Government of India, in view of the request by the Government of India to maintain the confidentiality of the said MoU, I respectfully state that copies of the said MoU, Cabinet Memorandum and decision thereto and a chart indicating the sequential order of the steps taken by the relevant governmental organizations prior to the signing of the MoU can be submitted to Your Lordships' Court under confidential cover, if required by Your Lordships."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේ කියන්නේ?

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන කාරණය ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ challenge කරලා තිබුණා; two petitions were dismissed *in limine.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඒක තමයි කිව්වේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා. මම ඒක දන්නවා, මහත්තයෝ. මේ රටේ නීතිපතිට ඇති වෙලා තිබෙන ප්‍රශ්නය මම මේ කිව්වේ. තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ ඇති වෙනකම් හඬ තළා තිබෙනවා, ඉන්දියාවත් එක්ක ගහපු ගිවිසුම් පෙන්වන්නේත් නැහැ, ඇමෙරිකාවත් එක්ක ගහපු ගිවිසුම් පෙන්වන්නේත් නැහැ, ඒ ගිවිසුම් එකක්වත් පෙන්වන්නේ නැහැ කියලා. හැබැයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ ඉන්න නීතිපති මොකක්ද කියන්නේ? මේක දෙන්න විධියක් නැහැ, මම මේක ඔතලා seal කරලා ගෙනැල්ලා දෙන්නම් ඔබතුමන්ලාට බලන්න කියලා එතුමා කියනවා. මේ රටේ මිනිසුන්ට තමුන්නාන්සේලා අවුරුදු ගණනක් කිව්වා නේ, ඒ කාලයේ තිබුණු ආණ්ඩු හොර ගිවිසුම් ගහනවා කියලා. ඉන්දියාවට තෙල් ටැංකි විකුණනවා කියලා පාරවල් දිගේ කෑ ගැහුවේ තමුන්නාන්සේලා නේ. අද තමුන්නාන්සේලා මොකක්ද කියන්නේ? ඉන්දියාවත් එක්ක ගහපු ගිවිසුමට දැන් මාස ගණනක් වෙනවා. මේ රටේ මිනිස්සුන්ට ඕනෑ නැහැ. නමුත් තමුන්නාන්සේලා මේක පාර්ලිමේන්තුවට ගේන්න.

විදේශ කටයුතු ඇමතිතුමා මෙතැනදී අපට කිව්වා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ මේ තොරතුරු ගන්න පුළුවන් කියලා. ඊට පස්සේ අපි ඒ තොරතුරු ගන්න ගියා. නමුත්, ගන්න දුන්නේ නැහැ. ඒක තමයි සිද්ධ වුණේ. ඒ නිසා මතක තියාගන්න, මේ ක්‍රියාවලි හැම එකක්ම අද වෙනකොට දේශපාලනීකරණය වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා වර්තමානයේ වැඩබලන පොලිස්පතිතුමාටත් මම මේ කාරණය කියන්න ඕනෑ. එතුමා අපිත් එක්ක ශිෂ්‍යයකු විධියට ඉගෙන ගත් කෙනෙක්. කරුණාකරලා ඔබතුමා තවත් දේශබන්දු කෙනෙක් වෙන්න එපා. මොකද හේතුව, දේශබන්දුලා මෙතැනින් ඉවර කරන්න ඕනෑ. අරගළයේ හිටපු අහිංසක මිනිසුන්ට පහර දීලා මේ රටම විනාශ මුඛයට පත් කරන්න කටයුතු කෙරුවේ දේශබන්දුලා වාගේ පොලිස් නිලධාරින්. ආපහු මේ ආණ්ඩුවත් තව දේශබන්දු කෙනෙක් හදාගන්න ලෑස්ති වෙන්න එපා. මම වර්තමාන වැඩබලන පොලිස්පතිතුමාට ඒ බව ප්‍රකාශ කරන්න ඕනෑ.

තමුන්නාන්සේලා මහා ලොකුවට අවුරුදු ගණනක් තිස්සේ කයිය ගැහුවා, ඉන්දු-ලංකා ගිවිසුම ඇතුළු මේ ගිවිසුම් හොර ගිවිසුම් කියලා. ඒ නිසා තමුන්නාන්සේලා ගහපු ගිවිසුම කරුණාකරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඇමෙරිකාව එක්කත් ගහලා තිබෙන ගිවිසුම් මොනවාද කියන්න. ඊට පස්සේ කියයි, ඒකත් කියන්න බැහැ, ඒකත් රටේ ආරක්ෂාවට ලොකු ප්‍රශ්නයක් කියලා. මම කියන්නේ ඒකයි. ඒ කාලයේ අපි මොකක් හරි ගිවිසුමක් අත්සන් කළාම තමුන්නාන්සේලා මේ රටේ මිනිස්සු හැමදාම පාරට බැස්සුවා. මිනිස්සු පාරට බස්සලා මේ රටේ වැඩක් කරන්න දුන්නේ නැහැ. එහෙම මිනිස්සු ටිකක් තමයි අද මේ වැඩේ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම ඔබතුමාගෙනුත්, මෙතැන ඉන්න ඇමතිවරුන් සියලුදෙනාගෙනුත් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ ඉන්දු-ලංකා ගිවිසුමේ තිබෙන තොරතුරු ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. එසේ ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහජන ආරක්ෂක කමිටු පිළිබඳව මෙතැනදී වැරදි ප්‍රකාශයක් කියැවුණා. මහජන ආරක්ෂක කමිටු පිහිටුවීම කිසි ලෙසකත් දේශපාලනීකරණයට ලක් කරලා නැහැ. මහජන ආරක්ෂක කමිටුවේ ලේකම් වෙන්නේ අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිටින ග්‍රාම නිලධාරි මහතා හෝ මහත්මිය. එහි සභාපති වන්නේ ඒ ප්‍රදේශයේ පිළිගත් පුද්ගලයෙක්. ඒක කැඳවන්නේ ප්‍රජා පොලිස් කොට්ඨාසයේ නිලධාරියා. එහෙම නැතිව දේශපාලනයට සම්බන්ධ වෙන කවුරුවත් මේකට කැඳවන්න කටයුතු කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ගරු මන්ත්‍රීතුමා චක්‍රලේඛයේ වචනයක් අල්ලාගෙන කරපු ප්‍රකාශයක්; මේක සභාව නොමඟ යවන ප්‍රකාශයක්. අපි මේ මහජන ආරක්ෂක කමිටු කිසි ලෙසකවත් දේශපාලනීකරණයට ලක් කරලා නැහැ. ප්‍රාදේශීය ලේකම්වරයාට වාගේම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිවරයාට මේ සඳහා මැදිහත්වීමක් කරන්න පුළුවන්. ඒක දේශපාලන මැදිහත්වීමක් නොවෙයි. එතැන කිසිසේත්ම දේශපාලන මැදිහත්වීමක් වෙන විධියට තනතුරු හදලා නැහැ. අදාළ ග්‍රාම නිලධාරි තමයි ඒකේ ලේකම්. ප්‍රදේශයේ පොදුවේ පිළිගත් පුද්ගලයෙක් සභාපති කරනවා. ප්‍රජා පොලිස් කොට්ඨාසයේ නිලධාරියා කැඳවුම්කරු වෙනවා. ඊට අමතරව සියයට 25ක් කාන්තා නියෝජනය තිබෙනවා. සියයට 25ක් තරුණ නියෝජනය තිබෙනවා. ඒ කිසිවක් දේශපාලනීකරණය කරලා නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, කොට්ඨාස භාර නිලධාරි කියන්නේ කවුද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
කොට්ඨාස භාර නිලධාරියා කියලා කෙනෙක් නැහැ. ප්‍රජා පොලිස් සේවයේ නිලධාරියා තමයි පත් වෙන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේකේ තියෙන්නේ එතකොට?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මේකේ කොට්ඨාස භාර නිලධාරියා පත් කරන්නේ කවුද?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
කොට්ඨාස භාර නිලධාරියා පත් වෙන්නේ පොලීසියෙන්. ඔබතුමා දන්නේ නැතිව ඒ ගැන කථා කරන්න එපා. ඒක වැරදියි. මෙතැන වැරදි අදහසක් ඉදිරිපත් කරන්න එපා. ඔබතුමා චක්‍රලේඛය කියවන්න. චක්‍රලේඛය කියවන්නේ නැතිව සභාව නොමඟ යන සහ රට නොමඟ යන දේවල් මෙතැන ප්‍රකාශ කරන්න එපා. හැමදාම මේ වාගේ දේවල් ප්‍රවෘත්තිවලට ගන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන කිසිදු දේශපාලනීකරණයක් වෙලා නැහැ. ඒ සඳහා ප්‍රදේශයේ පිළිගත් පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරලා තිබෙන්නේ. මේ චක්‍රලේඛයේ වචනයක් විතරයි එතුමා ඉදිරිපත් කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමස්ත චක්‍රලේඛය කියවා බලන්න කියලා මම එතුමාට ආරාධනා කරනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්. හැබැයි, ඊට පස්සේ මයික් එක දෙන්නේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කවදාකවත් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිගේ නියෝග මත වැඩ කරන්න කියලා පොලිස් කමිටු හදලා නැහැ, ලංකා ඉතිහාසයේ. ඒ පත් කරන කෙනා තමයි කොට්ඨාස භාර නිලධාරියා. එතකොට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිගේ මඟ පෙන්වීම අනුව තමයි කටයුතු කරන්න තිබෙන්නේ. ඉතිහාසයේ කවදාකවත් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට එහෙම නියෝගයක් දීලා තිබුණේ නැහැ. ඒක සම්පූර්ණ වැරදියි. *[බාධා කිරීමක්]* බොරු කියන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔය කථාව මෙතැනින් අවසන් කරමු. *[බාධා කිරීම්]*

ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

[අ.භා. 3.29]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණයෙන්ම මගේ කථාව පටන් ගන්නම්. විශේෂයෙන්ම එතුමා මතු කළා, දේශබන්දුලා මෙතැනින් අවසන් කළ යුතුයි කියලා. නැහැ, එතැනින් විතරක් මේක අවසන් කරන්න බැහැ. දේශබන්දුලා නිර්මාණය කළ ඒ මජර, තුච්ඡ, කාලකණ්ණි දේශපාලනයත් අපි අවසන් කරන්න ඕනෑ. ඒ දේශපාලනය අවසන් කිරීමට අදාළව තමයි අද ලංකා ඉතිහාසයේ මෙවැනි දෙයක් කරන්නේ.

මේ රටේ පුරවැසියන් විධියට අපි කනගාටු විය යුතු කරුණක් තිබෙනවා. පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීම තමයි නීතිය හා සාමය රැකීම, අපරාධ වැළැක්වීම. හැබැයි, අද අපි මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්නේ මොකක්ද? නීතිය හා සාමය රැකිය යුතු, අපරාධ වැළැක්විය යුතු මේ රටේ දෙපාර්තමේන්තු ප්‍රධානියා දේශපාලන වහලකු බවට පත් වෙලා, නීතිය හා සාමය බිඳ වට්ටලා, අපරාධ සැලසුම් කරලා, ඒ අපරාධ ක්‍රියාත්මක කරලා මේ රටේ රාජ්‍ය සේවය අපකීර්තියට පත්කර තිබෙනවා. නීතියෙන් විතරක් නොවෙයි, දේශබන්දුලා වැනි පුද්ගලයන්ට එරෙහිව මේ රටේ සමාජයත් පෙළ ගැහෙන්න ඕනෑ. ඇයි ඒ? මෙවැනි දූෂිත, තුච්ඡ, තිරිසන් නිලධාරින් නිසා මේ රටේ රාජ්‍ය සේවය අද අපකීර්තියට පත් වෙලා තිබෙනවා. අද රාජ්‍ය සේවය පිළිබඳව වාගේම රාජ්‍ය සේවකයන් පිළිබඳව මේ රටේ පුරවැසියන් දේශබන්දුලාගේ කෝණයෙන් බලන්න උත්සාහ කරනවා. අපි ඉතා පැහැදිලිව කිව යුතුයි, ඒ අපරාධ රාජ්‍යයන්වලට ඕනෑ විධියට තමන්ගේ දේශපාලන වුවමනා ඉටු කර ගන්න තමයි දේශබන්දුලා වැනි පුද්ගලයන් එදා නිර්මාණය කළේ කියන එක. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, දේශබන්දුලා මෙතැනින් අවසන් විය යුතුයි කියලා. නැහැ, ඒක විතරක් නොවෙයි, දේශබන්දුලා වැනි පුද්ගලයන් නිර්මාණය කරපු ඒ මජර දේශපාලන සංස්කෘතියත් අපි අවසන් කළ යුතුයි. ඒ දේශපාලන සංස්කෘතිය අවසන් කරන්න, ඒ වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න තමයි, මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් එදා ජාතික ජන බලවේගයට ජන වරම ලබා දුන්නේ.

මම කථා කරන්න හිටපු මාතෘකාවෙන් පොඩ්ඩක් ඔබ්බට මට යන්න වෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කලින් කිව්වා, මහජන ආරක්ෂක කමිටු පිළිබඳව ගරු මන්ත්‍රීතුමනි, රට නොමඟ යවන්න එපා. තමන්ට media ආකර්ෂණය ලබා ගන්න මේ රට නොමඟ යවන එක එක පිස්සු කථා කියන්න එපා. මහජන ආරක්ෂක කමිටු පිහිටුවීම පිළිබඳ චක්‍රලේඛය නිවැරදිව බලන්න. ඒකේ කැඳවුම්කරු පොලිස් නිලධාරියෙක්. ඒකේ ලේකම්වරයා අදාළ වසමේ ග්‍රාම නිලධාරිවරයා. මොකක්ද ඒකේ කියන්නේ? සම්බන්ධීකරණ කමිටුවේ සභාපති,- *[බාධා කිරීමක්]* ඔබතුමා හිතාමතා එක වචනයක් පාවිච්චි කළේ නැහැ. සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා සහ ලේකම්ගේ මඟ පෙන්වීම. කවුද ලේකම්? අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමා හෝ ප්‍රාදේශීය ලේකම්තුමිය. මහජන ආරක්ෂක කමිටු පත් කිරීම දේශපාලනීකරණය වෙලා කියලා විපක්ෂයේ බංකොලොත් වුවමනාව සමාජගත කරන්න වැරදි විධියට චක්‍රලේඛ අර්ථ කථනය කරන්න ගන්නා උත්සාහය අපි හෙළා දකින්න ඕනෑ. ඒක වැරදියි කියලා පැහැදිලිව කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශබන්දු තෙන්නකෝන් මහත්මයාට එරෙහිව අද ඉදිරිපත් වෙලා තිබෙන චෝදනා මොනවාද? අපේ රටේ රාජ්‍ය සේවකයෝ දන්නවා, රාජ්‍ය

සේවකයෙකු අතින් යම් විනය විරෝධී කටයුත්තක් සිද්ධ වුණොත්, ආයතන සංග්‍රහ විධිවිධාන ඇතුළේ, වෙනත් විනය කාර්ය පටිපාටිය රීති ඇතුළේ ඒවා විනිශ්චය කරන ක්‍රම තිබෙන බව. දේශබන්දු මහත්මයාට අදාළව තිබෙන චෝදනාව මොකක්ද? ඒ වෙන මොකක්වත් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2002 අංක 5 දරන පනතේ 3(ඇ) වගන්තිය අනුව විෂමාචාර ක්‍රියා සිදු කර ඇති බවත්, 3(ඉ) වගන්තිය අනුව ධුරයේ බලය දැඩි සේ අයුතු ලෙස භාවිත කිරීමේ ක්‍රියා සිදු කර ඇති බවත් තමයි කියන්නේ.

ඒ නිසා ඔහුගේ රාජකාරි ක්‍රියාවලිය ඇතුළේ දේශපාලන වුවමනාවන් වෙනුවෙන් කටයුතු කිරීමේ වරද තමයි අද මේ විනිශ්චයට සහ විමර්ශනයට ලක්වෙලා තිබෙන්නේ. මීට කලින් කථා කරපු විපක්ෂයේ ඇතැම් මහත්වරු විවිධ දේවල් මතු කළා.

අපට මතකයි, ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුතුමිය එදා බැසිල් රාජපක්ෂලා ගෙනාපු දිවි නැඟුම පනතේ තුනෙන් එකක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිවයි කියලා ලබා දුන් අධිකරණ මතය දරා ගන්න බැරිව තමයි එතුමිය ධුරයෙන් ඉවත් කරන්න රාජපක්ෂ පාලනය ඉතාම නරක විධියට තමන්ගේ බලය පාවිච්චි කරලා කටයුතු කළේ කියන එක. ඒ විතරක් නොවෙයි. අද සමහර අය අහනවා, මේවා සාධාරණද, යුක්තිසහගතද කියලා. හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහත්මයාට එරෙහිව එදා රාජපක්ෂ කඳවුර කටයුතු කරද්දී, ඒවා යුක්තිසහගතද, නීත්‍යානුකූලද, හරිද කියලා ප්‍රශ්න කරන්න නාමල් රාජපක්ෂලාට පුළුවන්කමක් තිබුණාද? නැහැ. විශේෂයෙන්ම දේශබන්දුලා වැනි පොලිස් දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරින් එදා අපරාධ රාජ්‍යයක් පවත්වාගෙන යන්න කටයුතු කරනවා අපි දැක්කා. ඒක ඇතුළේ විවිධ අපරාධ සිදු වෙනවාත් අපි දැක්කා. තාජුඩීන් ඝාතනය, එක්නැලිගොඩ පැහැර ගැනීම වැනි සිදුවීම් පසුපසත් පොලිස් දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරින්ගේ මැදිහත්වීම් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් ඉතාම වගකීමෙන් මේ රටේ රාජ්‍ය සේවකයන්ට -රාජ්‍ය සේවයට- පණිවුඩයක් ලබා දෙනවා, අපි රාජ්‍ය සේවය ශක්තිමත් කරමින්, කාර්යක්ෂම කරමින්, අවංකව සහ මේ රටට හිතැතිව වැඩ කරන රාජ්‍ය සේවකයන් ආරක්ෂා කරනවා කියලා. මේ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් ඉතාම වගකීමෙන් වැඩ කරන ආණ්ඩුවක්; රජයක්. අද විපක්ෂය ඔවුන්ගේ බංකොලොත්භාවය වහගන්න, ආණ්ඩුව ගන්නා ඉතාම නිවැරදි ක්‍රියාමාර්ග පාවිච්චි කරලා රාජ්‍ය සේවය ඇතුළේ යම් යම් ගැටලු නිර්මාණය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, ජාතික ජන බලවේග ආණ්ඩුව කියන්නේ, රට වෙනුවෙන් නිවැරදිව වැඩ කරන, රාජ්‍ය සේවකයා ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ඇතුළේ ගමන් කරන ආණ්ඩුවක් කියලා. ඒ අදහසත් ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම දේශබන්දු තෙන්නකෝන් කියන රාජ්‍ය නිලධාරියා, ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සිදු කර තිබෙන අපරාධ පිළිබඳව ගතයුතු විනිශ්චය ඉතාම පැහැදිලිව, නිශ්චිතව අරගෙන තිබෙනවාය කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශබන්දු තෙන්නකෝන් පොලිස්පතිතුමා එම ධුරයෙන් ඉවත් කිරීමේ යෝජනාව තමයි අද පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ. ආණ්ඩු පක්ෂය කිව්වා, දේශබන්දු Godfather කියලා. නමුත්, Godfather STF එක තියාගෙන CID එකට ගිහිල්ලා පැයක් දෙකක් ඉඳලා ගෙදර ආවා. M15 හෝටලයේ අයිතිකාරයෝත් දේශපාලන පවුලක්. මේ සම්බන්ධයෙන්,- *[බාධා කිරීම්]* මොකක්ද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
M15 නොවෙයි, W15. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔව්, W15 හෝටලය. සමාවෙන්න. කමක් නැහැ, මිනිස්සුන්ට වරදිනවා නේ. දැන් අහගන්න.

W15 හෝටලයේ අයිතිකාරයෝත් එක් දේශපාලන පවුලක්. එතකොට, මේ godfather අද ඉන්නවා. හැබැයි, godfather පැත්තකට වෙලා ඉන්නවා. ආණ්ඩුවත් එක්ක හොඳට ඉන්නවා. හැබැයි, දේශබන්දුට, පූජිත් ජයසුන්දරට, නිලන්ත ජයවර්ධනලාට, ප්‍රියන්ත ජයකොඩිලාට මේවා හොඳ පාඩම්. මම පොලීසියේ අනික් අයටත් කියන්නේ, අද දේශබන්දුට නම්, අද නිලන්ත ජයවර්ධනට නම්, අද පූජිත් ජයසුන්දරට නම්, හෙට අනික් අයට කියන එකයි. පොලිස් දෙපාර්තමේන්තුවේ දැන් වැඩ කරන අය ඒ කාරණය ගැනත් හිතන්න වෙයි. මොකද, ආණ්ඩු මාරු වෙනකොට ඒ ආණ්ඩුවේ කට්ටිය ඔවුන්ව ආරක්ෂා කරන්නේ නැහැ. අද දේශබන්දුටත්, පසුගිය කාලයේ පූජිත් ජයසුන්දරටත්, නිලන්ත ජයවර්ධනටත් වුණේ ඔන්න ඔය සිද්ධියම තමයි. මේක හෝටලයක් සම්බන්ධව නොවෙයි, ඉඩමක් සම්බන්ධ තණ්හාවක්. මේකට දේශබන්දු ගැව්ලාවත් නැහැ. ගැවුණු මිනිස්සු නිදහසේ ඉන්නවා. කමක් නැහැ, දේශබන්දුට අද ගෙදර යන්න වෙනවා. ඒකට කරන්න දෙයක් නැහැ. නමුත් මේකේ ඇත්ත කථාව හොයාගෙන ගියොත්, වැලිගම හෝටලය ගැන ලොකු කතන්දරයක් තිබෙනවා. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. මම ඒ ගැන වැඩිය කථා කරන්න යන්නේ නැහැ.

ඊළඟට 2017දී, තිලිණ ගමගේ හිටපු මහෙස්ත්‍රාත්තුමාට අලි පැටියෙකුගේ ප්‍රශ්නයට නඩුවක් දාලා ඒකෙන් නිදොස් කොට නිදහස් වෙලා, හිඟ වැටුපත් දුන්නා. ආයෙත් එතුමාගේ වැඩ තහනම් කරලා තිබෙනවා. පසුගිය කාලයේ නිශ්ශංක බන්දුල කරුණාරත්න අභියාචනාධිකරණ විනිසුරුවරයාට අල්ලස් චෝදනාවක් තිබුණා. ඒ අල්ලස් චෝදනාව තිබුණු එකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 120ක් අත්සන් කරලා දුන්නා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු 120ක් බන්දුල කරුණාරත්නට විරුද්ධව අත්සන් කරලා දුන්නා. එතුමාට ගත්තු තීන්දුව මොකක්ද? එතුමාට ගත්තු තීන්දුව තමයි, එතුමා විශ්‍රාම යවපු එක. සියලු වරප්‍රසාද- *[බාධා කිරීමක්]* පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා, මට කථා කරන්න දෙන්න කෝ. ඔබතුමා විනයක් තියාගන්න. එතුමා විශ්‍රාම යැව්වා. බන්දුල කරුණාරත්නට එක නීතියක්, තිලිණ ගමගේට වෙන නීතියක්. මාර නීති මේවා. දේශබන්දු අද තනතුරෙන් එළියට යනවා. ඒ හෝටලයට ගිහිල්ලා දේශබන්දු වෙඩි තිබ්බේ නැහැ නේ. කවුරු හරි ගිහිල්ලා වෙඩි තිබ්බා. අපි පිළිගනිමු කෝ දේශබන්දු වැරැදියි කියලා. එතකොට වංචාවක් කරපු, සල්ලි ගත්තු, මිනිසුන්ගෙන් පගා ගත්තු ඒ විනිශ්චයකාරයා විශ්‍රාමත් එක්ක ගෙදර යවනවා. මේවා මාර නීති!

මේ රටේ හමුදාපති පත් කිරීම හරි. මේ ජනාධිපතිතුමා ම කිව්වා, හමුදාපති කෙනෙක් 55න් පත් කළාම, ඊට පිටිපස්සෙන් මේජර් ජෙනරාල්ලා කී දෙනෙක් ඉන්නවාද කියලා. ඔබතුමන්ලාට

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ඡන්දය දීපු මේජර් ජෙනරාල්ලා කිහිප දෙනෙක් අද උදේ gym එකේදී කිව්වා, මේක වැරැදියි කියලා. අවුරුදු 55 පිරුණු මේජර් ජෙනරාල්ලා ගොඩක් දෙනෙක් පෝලිමේ ඉන්නවා, ඊළඟ හමුදාපති වෙන්න. මේ හමුදාපතිතුමාගේ සේවය තව අවුරුද්දකින් දීර්ඝ කළා. ඒ නිසා හමුදාපති පත් කරන කොට බලන්න, ඒ list එකේ කවුද හිටියේ කියලා. හමුදාපති පත් කරන කොට තව කොච්චර කට්ටිය list එකේ හිටියාද? නමුත් එතුමාට දුන්නා. එතුමාගේ වාසනාව. මේජර් ජෙනරාල් දිනේෂ් නානායක්කාර තමයි හමුදාපති තනතුරට සුදුසු වෙලා හිටියේ. හැබැයි, ඒ සුදුසු වෙලා හිටපු මනුෂ්‍යයාට නොදී මේ හමුදාපතිතුමාට දුන්නා. කමක් නැහැ. මේජර් ජනරාල් දිනේෂ් නානායක්කාර විශ්‍රාම ගියා. *[බාධා කිරීමක්]* අපි තෝරන්නේ නැහැ. List එක අනුව තමයි තෝරන්නේ. ඒ list එකේ senior කෙනා තමයි හමුදාපති වෙන්නේ. *[බාධා කිරීමක්]* මෝඩ කථා කියන්න එපා. එහෙම තෝරන්න මම ජනාධිපති ද? මෝඩ කථා කියන්න එපා. මම ජනාධිපති නම් මට ඕනෑ කෙනා මම දානවා නේ. හැබැයි, වර්තමාන හමුදාපතිතුමාගේ සේවා කාලය අවුරුද්දක් දීර්ඝ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය කාලයේ හිටපු නාවික හමුදාපතිතුමා හිරේ. මට කවුරු තරහ වුණත් කමක් නැහැ. මෙතැනට පනතක් ගෙනැල්ලා මා එල්ලලා මැරුවත් කමක් නැහැ. මම කියන්න තිබෙන දේ කියනවා. හෙට පාර්ලිමේන්තුවේදී අනෙක් ආගම්වල අය ඡන්දය දුන්නත් එකයි, නැතත් එකයි. හොඳ වෙලාවට කාදිනල්තුමා පාප් වුණේ නැහැ. නැත්නම් මේකත් වතිකානුවක් වෙනවා. හොඳ වෙලාවට! තරහ වුණත් කමක් නැහැ; මම නැති වුණත් කමක් නැහැ. ඒක අපේ ස්වාමීන් වහන්සේලාටත් කියන්න ඕනෑ. හොඳ වෙලාවට පාප් වහන්සේ වුණේ නැහැ, අපේ කාදිනල්. පාප් වුණා නම් මේකත් වතිකාවනුවක් වෙනවා. අපේ ස්වාමීන් වහන්සේලාත් අහගන්න. මේ හමුදාපති පත් කිරීම, සේවා දීර්ඝ කිරීම් මේවා පිටිපස්සේ කවුද ඉන්නේ? හිටපු නාවික හමුදාපතිතුමා හිරේ. ඒකට අපට කමක් නැහැ. හැබැයි, සාධාරණය කාටත් ඉෂ්ට වෙන්න ඕනෑ. මේ වෙලාව රටේ කොච්චර ප්‍රශ්න තිබෙන වෙලාවක්ද? මම දේශබන්දුගේ ප්‍රශ්නය එතැනින් එහාට ගෙන යන්නේ නැහැ.

පසුගිය කාලයේ ආන්දෝලනාත්මක කථාව මොකක්ද? අනුරාධපුරයේ වැව් රක්ෂිත ගැන කථා වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අනුරාධපුරයේ නේ. තිසාවැව තිබෙන්නේ පොතානගම හන්දියෙන් එහා පැත්තේ නේ. පොතානගම හන්දිය පාරේ තිබෙන තිසාවැවේ වැව් රක්ෂිතය අල්ලනවා. කවුද? "රාජ සභාවේ" මහින්ද පතිරගේ - "බඩුම තමයි" කියන කෙනා. මහින්ද පතිරගේ තිසාවැව රක්ෂිතයේ ගෙයක් හදලා තිබෙනවා. ඊට අමතරව දැන් ඉඩම ශුද්ධ කරලා තිබෙනවා; පුච්චලා තිබෙනවා. කෝ, අපේ ලාල් කාන්තට කියන්න කෝ, "බඩුම තමයි" අල්ලලා අයින් කරන්න කියලා. පළමුවැනියට "බඩුම තමයි" අයින් කරන්න කියන්න. මේ ආණ්ඩුව පටන් ගත්ත ඒ වැඩේ වෙනවාද? එයාත් අයින් කරන්න කියන්න. අනුරාධපුර ගුවන් තොටුපළ පාරේ, northern camp එකට එහා පැත්තේ, නුවර වැවට තමයි - *[බාධා කිරීමක්]* Airport එකේ runway එකෙනුත් භාගයක් පුරවලා තමයි අර පාර හැදුවේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම බදුල්ලේ ගිහිල්ලා ඔබතුමා හදපු පාරක්,-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නැහැ, නැහැ. ඔබතුමා බදුල්ලේ ගිහිල්ලා හදපු පාරකට මුල් ගල තැබුවා. මම භාගයක් හදපු පාරේ කාපට් එක උඩින් ගිහිල්ලා ඔබතුමා ඉතිරි ටිකට මුල් ගල තැබුවා. මම හදපු පාරේ කාපට් එකේ ගිහිල්ලා ඉතිරි ටිකට මුල් ගල තැබුවා. මම ඒක දැක්කා. ඒක හොඳයි. ඒක නැහැ කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නුවර වැව ළඟ northern camp එකට එහා පැත්තේ airport එකේ runway එක හැදුවේ යුද්ධය කාලයේ. ඒ පුරවලා හදපු එකට එහා පැත්තෙන් තමයි පාර හදලා තිබෙන්නේ. ඒ පාරත් එහෙනම් වහන්න වෙනවා. පුළුවන් නම් ඒ පාරත් වහලා airport එකේ runway එකත් වහන්න කියන්න. ඒවාත් නුවර වැවට අයිතියි. අහිංසක මිනිසුන්ගේ ඒවා අයින් කරනවා කිව්වා. ඒ තැන්වල රජයේ ගොඩනැඟිලි කීයක් තිබෙනවාද? DIG නිල නිවස තිබෙනවා. එතැනින් ගියාම පුරාවිද්‍යා කාර්යාලය තිබෙනවා. එතැනින් ගියාම Forest Department එකේ කාර්යාලයක් තිබෙනවා. වැව ළඟින් යනකොට කීයක් රජයේ ගොඩනැඟිලි තිබෙනවාද? ඒවාත් අයින් කරන්න කියන්න කෝ. නමුත් අහිංසක මිනිස්සුන්ගේ ඒවා අයින් කරනවා කියනවා. අර ඔයගොල්ලන්ගේ වේදිකාවලනේ හිටියේ "බඩුම තමයි" කියන එක්කෙනා. මුලින්ම "බඩුම තමයි" කියන එක්කෙනාගේ එක අයින් කරන්න කෝ. මේ වාගේ දේවල් කියනකොට සමහර වෙලාවට අපි වැරැදිකාරයෝ වෙයි. නමුත් අපි වැරැදි නැහැ. අපි මේවායේ ඇත්ත දකිනවා.

දැන් දේශබන්දු ගෙදර යනවා. නමුත් ඉලුක්පිටිය තවම ඇතුළේ ඉන්නවා. ඉලුක්පිටියට අච්චු කරනවා. අපේ සභානායකතුමනි, ඔබතුමා මටත් දැන් බාධා කළා. වචනයක් කිව්වාට කමක් නැහැ. ඒක බාධාවක් නොවෙයි. ඔබතුමා කිව්වා නේ, Godfather ගැන. Godfather නියමෙට දැන් ඉන්නවා STF එකත් තියාගෙන. නමුත් ඉලුක්පිටිය ඇතුළේ. දේශබන්දු අද ගෙදර යනවා. මරු ආණ්ඩුව! Godfatherගේ නම කියන්න ඕනෑ නැහැ. ඒක මේ රටම දන්නවා. අද මාධ්‍යයත් දන්නවා. Godfather කොතැනද ඉන්නේ කියලා දන්නවා. Godfather කියන්නේ කවුද කියලාත් දන්නවා. Godfather ආණ්ඩුවත් එක්ක ඉන්නේ කියලාත් දන්නවා. ඒ නිසා බෙදනවා නම් කාටත් එක හැන්දෙන් බෙදන්න. කාටත් එක විධියට සලකන්න. චාමර සම්පත්ට එක විධියක්, තව එක්කෙනෙකුට තවත් විධියක් කරන්න එපා. ආණ්ඩුව චාමර සම්පත්ට නඩු දානවා නම් අනෙක් මිනිස්සුන්ටත් නඩු දාන්න. අනෙක් මිනිස්සුන්ගේ නඩු වහන්න එපා. හිතවත්කම්වලට වැඩ කරන්න එපා. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව අවුරුදු 70ක්- *[බාධා කිරීමක්]* අපට නඩු දමන මිනිස්සු කවුද? ඔස්ට්‍රියාවේ වියානාවලට ගිය විධිය මම කියන්නද? වියානාවල හිටපු කාමර ගැනත් මට කියන්න පුළුවන්. සැප ගන්න. අපි එපා කියන්නේ නැහැ. ඕනෑ කෙනෙකුට සැප ගන්න කියන්න. අපි සැප ගන්න එපා කියන්නේ නැහැ.

මරාගෙන මැරෙන බෝම්බකාරයෝ හිටපු LTTE එකට මොකද වුණේ? අන්තිමේදී LTTE එක කැඩුණෙත් සැප ගන්න ගිහිල්ලා තමයි. තායිලන්තය පැත්තේ, සිංගප්පූරුව පැත්තේ ගිහින් ආවාම LTTE එක ඉවර වුණා. මතක නේ, කට්ටියක් සැප දුන්න හින්දා නේ LTTE එකත් ඉවර වුණේ. ඒ හින්දා සැප ගන්න කියන්න. හැබැයි, සැප ගන්න මිනිස්සුන්ට කියන්න උඩ බලාගෙන කෙළ ගහන්න ලෑස්ති වෙන්න එපා කියලා. අපට විතරක් නීතිය. අපට විතරක් දූෂණය කියනවා. අපට විතරයි දූෂණය. හැබැයි, අපට දූෂණය කියනවා නම් අරවා මොනවාද? වියානාවල? එතැන දූෂණය සිද්ධ වුණේ නැද්ද? වුණේ නැද්ද? අපි ඒවාත් හොයාගෙන ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නියමිත කාලය අවසානයි. අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
එල්ලලා මැරුවත් අපි කියන්න තිබෙන දේ කියනවා. අපි ඒවාට බය වෙන්නේ නැහැ. හිර ගෙවල් හතක ගියත් අපි කියනවා. අපි ළඟ සාක්ෂිත් එක්ක ඒවාට කරුණු තිබෙනවා. ඕනෑ මිනිහෙකුට සැප ගන්න කියන්න.

කාලය නොමැති නිසා මම කථාව අවසන් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චාමර සම්පත් මන්ත්‍රීතුමා යම් කාරණයක් කිව්වා. මම හිතනවා, ඔබතුමා මේ seat එකේ හිටියා නම් ඔබතුමාත් මේ කටයුත්ත කරයි කියලා. අපේ දිස්ත්‍රික්කයේ ප්‍රවීණ කලාකරුවකු වන මහින්ද පතිරගේ මහත්මයා පිළිබඳව එතුමා බොරුවක් කිව්වේ. එතැන තමයි මහින්ද පතිරගේ මහත්මයාගේ නිවස තිබෙන්නේ. *[බාධා කිරීම්]* ඉතින්, අහගෙන ඉන්න කෝ. අහගෙන ඉන්න කෝ. *[බාධා කිරීම්]* ඒක මහින්ද පතිරගේ මහත්මයාගේ නිවස. ඊට එහා පැත්තේත් හෝටල් තිබෙනවා. ඔහුට පවුලෙන් අයිති වෙච්ච ඉඩම එතැන තිබෙනවා. තිසා වැව පාර තිබෙනවා. ඒ පාරට මෙහා පැත්තෙන් තමයි ඉඩම තිබෙන්නේ. මහින්ද පතිරගේ මහත්මයා මෙතැන නැති නිසා ඔහු වෙනුවෙන් මේක කියන්න ඕනෑ කියලා හිතුණා. මොකද, ඔහු මාත් එක්කත් දේශපාලන වැඩ කරන කෙනෙක්. බොරු කියන්න එපා. පාර්ලිමේන්තුව පාවිච්චි කරලා ඇත්ත කියන්න. *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
සාධාරණව දෙන්න. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. වසන්ත සමරසිංහ ඇමතිතුමනි, අනුරාධපුරය ගැන මාත් හොඳට දන්නවා. පොතානගම හන්දියේ හෙරිටේජ් හෝටලයට එහා පැත්තේ-*[බාධා කිරීමක්]* හරි නේ. හෙරිටේජ් හෝටලයට එහා පැත්තේ මේ දවස්වල ගිනි තියනවා. ඔබතුමා තවම ගිහිල්ලා බලලා නැහැ. ඔබතුමා ගිහිල්ලා බලලා ආවාට පස්සේ අපි දෙන්නා ලබන සතියේ මේ ගැන කථා කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ රටේ උසස්ම තනතුරක් දැරූ, එම තනතුර අවභාවිත කරමින් විෂමාචාරව හැසිරුණු නිලධාරියෙක් පිළිබඳව අපි අද පාර්ලිමේන්තුව තුළ විවාද කරනවා. ඒ නිලධාරියාගේ නිල ඇඳුමේ පැළඳ ගත්තු නිල ලාංඡනයේ සඳහන් වන කාරණය තමයි, "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" කියන එක. රටේ නීතිය, සදාචාරය ආදී හැම දේකටම වඩා එම ධම්ම පද පාඨය තුළම තිබෙන පණිවුඩය වටහා ගත යුතුයි කියලායි මා හිතන්නේ. එකිනෙකාට කඩේ නොගිහින්, ධර්මය අනුව හැසිරුණා නම් අද මෙවැනි තත්ත්වයකට, මෙවැනි ඉරණමකට පත් වන්න ඔහුට සිදු වන්නේ නැහැ.

අපි පුරවැසියන් ලෙස කම්පාවට පත් වෙන්න ඕනෑ. මොකද, මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන, මේ රටේ ජනතාව විශ්වාස කරන, එවැනි ආයතනයක උසස් නිලධාරියෙක් මොනම පදනමකින් හෝ එවැනි විෂමාචාර සිද්ධිවලට සම්බන්ධ වීම හා ඒ වෙනුවෙන් කටයුතු කිරීම පුරවැසියන් අසරණභාවයට පත් වන කරුණක් බව අපි හැම කෙනාම දන්නවා.

මෙම විවාදයේදී ගරු මන්ත්‍රීවරු නීති තර්ක සහ විවිධ තර්ක මේ ගරු සභාව තුළ ඉදිරිපත් කරමින් මේ ගැන කරුණු කාරණා ඉදිරිපත් කළා; සාකච්ඡා කළා. විශේෂයෙන්ම මෙතැනදී මතු වෙච්ච කාරණයක් තමයි, දේශපාලන බල අධිකාරියට යටත්වී විෂමාචාර වැඩවල යෙදෙන එවැනි නිලධාරීන් මේ රට තුළ ආයෙත් බිහි නොවිය යුතුයි කියන එක. මා හිතන්නේ, එය අපේ රටේ සියලුදෙනාගේම ප්‍රාර්ථනාවයි. එය ප්‍රාර්ථනාවක් විතරක් නොවී සැබෑවක්ම විය යුතුයි. රාජ්‍ය නිලධාරීන් ඒ තත්ත්වයට පත් කරපු, ඒ තැනට තල්ලු කරපු ඒ දේශපාලනය අද පරාජයට පත් කර තිබුණත්, එම දේශපාලනයේ යෙදුණු අයම නැවත ඇවිල්ලා අද පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව උජාරුවෙන් කථා කිරීම ඇත්තටම කනගාටුවට කරුණක්.

[ගරු මුනීර් මුලාෆර් මහතා ]

ඔබතුමන්ලා දන්නවා ඒ අරගළ සමය තුළ වෙච්ච දේ. අපි හැම කෙනාම දන්නවා හේතුඵලවාදය පිළිබඳවත්. ඒ වෙලාවේ හිටපු ඇමතිවරු ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිරිසකගේ නිවාස ගිනි තැබුවා. ඒකට ප්‍රධානම හේතුව තමයි, එදා අරගළ භූමියේ හිටපු අයට ඉතාම කැත විධියට පහර දීම. ඒ අරගළ සමය තුළ, රටේ නීතිය හා සාමය රකින පොලිස්පතිවරයා මහ ජනතාවගෙන් ගුටි කන තත්ත්වයට පත් වුණා. මම හිතනවා එය කිසිම රටක, කිසිම පුරවැසියෙක් නොදැකිය යුතු දර්ශනයක් කියලා. ඔහු ඒ තත්ත්වයට පත් කළේ, වැරදි දේශපාලනයයි. එම දේශපාලනයේ යෙදුණු අය අද මෙහි ඇවිල්ලා විවිධ කතන්දර, කරුණු කාරණා කියනවා. තවත් සමහර අයගේ කථා තුළින් මතු කළා, අපේ දේශපාලනය තුළ පවුල්වල අයට, ඥාතීන්ට, හිතමිත්‍රයන්ට තනතුරු, වරප්‍රසාද ඇතුළු විවිධ දේවල් ලබා දී තිබෙනවාය කියන කාරණය. නමුත්, අපත් සමඟ කටයුතු කරන, අප හොඳින් දන්නා හැම කෙනාම දන්නවා, ඒ පරණ දේශපාලන වැරදි නොකර සිටීමට හැම විටම පරෙස්සම් වෙමින්, නිවැරදිව දේශපාලනය කරමින් මේ රට වැටී තිබෙන තත්ත්වයෙන් නිවැරදි තත්ත්වයට පත් කරන්න අප හැමකෙනාම උත්සාහ දැරිය යුතුයි කියන අදහසින් අපි කටයුතු කරන බව.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, වාහන අවභාවිතය පිළිබඳවත් සමහර මන්ත්‍රීවරු මෙතැනදී කරුණු මතු කළා. අපි දන්නවා කලින් හිටපු ඇමතිවරු අමාත්‍යාංශවල වාහන අවභාවිත කළේ කොහොමද කියලා. බිරින්දෑවරුන්ට විතරක් නොවෙයි, මිත්‍රයන්ටත් වාහන බෙදා දුන් ඉතිහාසයක් අපේ රට තුළ තිබුණා. හැබැයි, අද අපට පාර්ලිමේන්තුවේදී පැහැදිලිව කියන්න පුළුවන්, අපේ කිසිම ඇමතිවරයෙක් එලෙස වාහන පාවිච්චි කරන්නේ නැහැ කියන කාරණාව.

අපි සාකච්ඡා කළ යුතු එවැනි බොහෝ කරුණු කාරණා තිබෙනවා. ඊයේ "වෙලිවැකිය" තුළත් සඳහන් වෙච්ච කාරණාවක් අද මතු වුණා. ඒ තමයි, ජනාධිපතිවරයා මාලදිවයිනට ඇරලවා එන ගමන් ජනාධිපති ආරක්ෂක නිලධාරින් කීපදෙනෙක් කරපු වැරැද්දක් සම්බන්ධයෙන් එම නිලධාරින්ට එරෙහිව කටයුතු කළාය කියන එක. අතීතයේත් එවැනි වැරදි සිද්ධ වෙලා ඇති; එවැනි කරුණු කාරණා මතු වෙලා ඇති. හැබැයි, කවදාවත් ඔවුන් නීතිය ඉදිරියට ගෙනාවේ නැහැ. ඔවුන්ට එරෙහිව දඬුවම් ක්‍රියාත්මක වුණේ නැහැ. හැබැයි, අද මේ ආණ්ඩුව පැහැදිලිව, නිවැරදි ගමනක යෙදෙනවාය කියන කාරණාව කියමින්, මට මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුරෙෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SPEAKER took the Chair.*

[பி.ப. 3.53]

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ சபாநாயகர் அவர்களே, அரசியல்புல ஈடுபாடும் மக்கள் மயப்பட்ட அழுத்தமும் இருக்கும்போது விசாரணைகளைத் தொடங்கி உரியவர்களை பொறுப்புக்கூற வைக்கும் தற்போதைய இலங்கை அரசின் திறனை திரு. ரி.எம்.டபிள்யூ. தேசபந்து தென்னகோன் அவர்களை IGP பதவியிலிருந்து அகற்றுமாறு கோரும் குற்றச்சாட்டுகளுக்கான காரணங்கள் .

தொடர்பில் புலனாய்வு மற்றும் விசாரணை செய்து அறிக்கையிடுவதற்காக நியமிக்கப்பட்ட விசாரணைக் குழுவின் இறுதி அறிக்கை பிரதிபலிக்கிறது.

இந்த நாட்டில் சிலருக்கு நீதியும் பாதுகாப்பும் உரிமைகளும் நிலைநிறுத்தப்படுவதோடு, மற்றவர்களுக்கு நிரந்தரமான நியாயக்கேடும் அநீதியும் வழங்கப்படுவது வேதனையான உண்மையாகும். இந்த விசாரணையும் அதையே சுட்டிக்காட்டுகிறது. அதிகார முறைகேடுகளுக்கு எதிரான இப்படியான விரைவான விசாரணைகள், தமிழர்களுக்கு எதிரான இலங்கை அரசின் வன்முறைகள் சார்ந்து இந்த நாட்டில் நடைபெறுவதில்லை. நூற்றுக்கும் அதிகமான எலும்புக்கூடுகளுக்குள் உறைந்துள்ள படுகொலைகள், இறுதிப் போரின்போது உங்களை நம்பி ஒப்படைத்த எங்களின் உறவுகளுக்கான தேடல்கள், அதன்போது நிகழ்ந்தேறிய இனப்படுகொலைகள் உள்ளிட்ட ஈழத் தமிழ் மக்களுக்கு உங்கள் அரசுகள் ஏற்படுத்திய வன்முறைகளுக்கும் அதிகார முறைகேடுகளுக்கும் அதிகார வல்லாளுகைகளுக்கும் எப்போது விசாரணைகள் மேற்கொள்ளப்படவுள்ளன? எப்போது நீதி கிடைக்கவுள்ளது? IGP தேசபந்து தென்னகோன் அவர்கள் தொடர்பான விசாரணையின்போது நடந்ததைப்போல தமிழர்கள் விடயத்திலும் நடக்க வேண்டும். அதாவது, அதே அவசரத்தையும், அதே வெளிப்படைத் தன்மையையும், அதே நேர்மையையும், உடனடி நீதியையும் எங்கள் விடயத்திலும் ஏற்படுத்துங்கள்!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Sir.

பொலிஸ் சார்ஜன் உப்புல் கொல்லப்பட்டமை தொடர்பான விசாரணை மேற்கொள்ளப்பட்டபோது, வெலிகம பொலிஸ்மூலம் குற்றவியல் விசாரணை நடாத்தப்பட்டமை தவறு என்றும் வெளிப்படைத் தன்மையின் பொருட்டு வேறு ஒருவரை நியமித்து விசாரிப்பதே ஏற்புடையது என்றும் பிரதிப் பொலிஸ்மா அதிபர் குணந்தாவடு நிசாந்த த சொய்சா அவர்கள் வாக்குமூலம் அளித்துள்ளார். அதாவது, அவர்களது அணியினரே அவர்களை விசாரிப்பது பொருத்தமற்றது எனக் கூறியுள்ளார். இதுதான் முறைமை. குற்றஞ்சாட்டப்பட்டவரே குற்றத்தை விசாரிப்பதை எவ்வகையில் ஏற்றுக்கொள்வது? தொடர்ந்து வரும் அரசுகள் எங்கள்மீது இனப் படுகொலைகளையும், கட்டமைக்கப்பட்ட இன அழிப்பையும் மேற்கொள்ளும்போது, எங்கள்மீது நீங்கள் மேற்கொள்ளும்

இம்முறைகேடுகளை நீங்களே விசாரிப்பது முறையன்று. அது ஒருபோதும் எங்களுக்கான நீதியைத் தராது. செம்மணிப் புதைகுழி உள்ளிட்ட படுகொலைகளுக்கு நீங்கள் கொண்டுள்ள மௌனமே இதற்குச் சான்று. உங்களைச் சாராத, சர்வதேச தலையீடுகொண்ட சுதந்திரமான ஒரு விசாரணையை நாங்கள் கோருகின்றோம். தமிழர்கள் மீதான வன்முறைகள் மறைக்கப்படுவதையோ, நீதிக்கான காலம் கடத்தப்படுவதையோ எவ்வகையிலும் ஏற்றுக்கொள்ள இயலாது. உண்மை வெளிவர வேண்டும்; நீதி வழங்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொண்டு, நிறைவுசெய்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. M. Nizam Kariapper. You have three minutes.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Three minutes?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
In that event, Sir, I do not want to speak. I have been allotted seven minutes. How did it become three minutes? Why did they make it three minutes from seven minutes? I am not going to speak. I was informed that it was seven minutes. How it became three minutes, I just do not understand. Was that time taken from the Opposition? You can do whatever you want, Sir. I am sorry.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
This is the time allotted for the Opposition.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
It is wrong, Hon. Speaker! From whose time was it taken?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේක මේ අලුත් දෙයක් නොවෙයි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අද සවස 4.00ට ඡන්දය පවත්වන්න කියලා. විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ කථිකයන් හැමෝම වාගේ වෙන් කරපු වෙලාවට වඩා වැඩිපුර කාලය ගත්තාම, අවසානයට කථා කරන මන්ත්‍රීතුමන්ලාට ලැබෙන කාලය අඩු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
හරි කමක් නැහැ, මට මිනිත්තු 5ක කාලයක් දෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එහෙම දෙන්න මට බලයක් නැහැ. අපි පස් වරු 4.00ට ඡන්දය පවත්වන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, again, you are losing the time left.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Okay. I will finish speaking within five minutes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, Hon. Member, you are given only three minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි ඔබතුමා දැන් සභාවේ කාලය දීර්ඝ කරනවාද කියලා. එහෙම කරනවා නම්, ඒක අනෙක් කටයුතු ඔක්කොටම ප්‍රශ්නයක් වෙනවා. අපේ ගරු චන්ද්‍රන අබයරත්න ඇමතිතුමාට නියමිත කථාව ඉවත් කරලායි මම ලේකම් මණ්ඩලයට දැනුම් දුන්නේ, පස් වරු 4.00ට ඡන්දය පවත්වන්න කියලා. *[බාධා කිරීමක්]* ඒ නිසා තමයි අපි time management එක ගැන කියන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මේක හරිම අසාධාරණයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බලය තිබෙන බව අපි පිළිගන්නවා. නමුත්, කාලය දීර්ඝ කළාට පසුව අපි ඔක්කොටම ප්‍රශ්නයක් වෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මට මිනිත්තු 5ක් දෙන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, ඉස්සර වෙලා කථා කළ මන්ත්‍රීතුමාටත් විනාඩි 3ක කාලයක් තමයි දුන්නේ. ඔබතුමාට ලබා දී තිබෙන මේ කාලයත් අපතේ යනවා, ඔබතුමා ඔය විධියට argue කරන්න ගියාම. Hon. Member, you have only two more minutes.

[අ.භා. 3.58]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු කථානායකතුමනි, මම මේ කඩාගෙන බිඳගෙන ආවේ හේතුවක් ඇතුවයි. "මෙය ඓතිහාසික දිනයක්, ඓතිහාසික දිනයක්" කියලා අද උදේ ඉඳන්ම කියන නිසා මොනවාද මේ ඓතිහාසික දිනයේ වෙලා තිබෙන්නේ කියලා බලන්නයි මම කඩාගෙන බිඳගෙන අවේ. මම බැලුවා, මහ මොළකරුවෙක්වත් අල්ලලා ද, God Father කෙනෙක් අල්ලලා ද, big boss කෙනෙක් අල්ලලා ද, එහෙමත් නැත්නම් මේවාට අදාළ කවුරු හෝ අස්වෙලා ද කියලා. බැලින්නම්, මේ පාර්ලිමේන්තුවේ සියයට 90කට වඩා මන්ත්‍රීවරුන් එකඟ වන, මුළු රටම එකඟ වන, දේශබන්දු තෙන්නකෝන් හා සම්බන්ධ යෝජනා සම්මතය ගැනයි එහෙම කියලා තියෙන්නේ. ඔහුට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනා අතරින් 1 සිට 10 දක්වාත්, 13 සිට 19 දක්වාත්, 22 සහ 23 යන චෝදනාත් ඔප්පු වෙලා තිබෙනවා. ඔහු ඉවත් කරන්න මේ ගෙන එන යෝජනා සම්මතයේ, මේ විෂයයේ ඓතිහාසිකත්වයක් නැහැ. හැබැයි, එකම එක කාරණයක් කියලා මට ඉඳගන්න සිදු වෙනවා, අවාසනාවට මට ලබා දීලා තිබෙන්නේ සුළු කාලයක් වන නිසා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, you have only one more minute.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු කථානායකතුමනි, මේක හරිම අසාධාරණයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

You have to stick to the time.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

That is not the way to handle this. Just because I am a new Member, you should not do this. It does not matter. Anyway, I do not want to waste my time arguing with you, Sir.

ගරු කථානායකතුමනි, මා කියා සිටින්නේ, මේ සියල්ලම අතරේ අවධානය යොමු කළ යුතු ප්‍රධාන දෙයක් තිබෙන බවයි. ඒ තමයි, කෙනෙකුට ලබා දී තිබෙන බලතල අනාගතයේදී අපරාධ වගකීමට ලක් නොවන සේ පාවිච්චි කරන්නේ කෙසේද යන්නයි. ඒ පිළිබඳව ළඟදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර යසන්ත කෝදාගොඩ මැතිතුමා ඉතා ලස්සන කථාවක් කියා තිබෙනවා. ඒක පොඩ්ඩක් ඇහුවා නම් හොඳයි. වැරැදීමකින් අපගේ පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ඒක එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ නඩු තීන්දුවකදී කියපු කථාවක් කියලා. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධ නඩු තීන්දුව ලබා දී තිබුණේ පංච පුද්ගල විනිශ්චයකාර මණ්ඩලයක් විසින්. මේ, ඒක නොවෙයි. ඒ කෙසේ වෙතත්, I do not want to get into an argument about that. අනාගතයේදී අපරාධ වගකීම්වලට යටත් නොවන සේ තම බලතල පාවිච්චි කිරීමේදී අවධානය යොමු කළ යුතු කාරණා 3ක් තිබෙනවා. ඒ කාරණා 3 ගැන කියලා මම කථාව නතර කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, your time is over. Please wind up.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

අවංකව, ස්වාධීනව, ජනතාවගේ සුබසිද්ධිය තකා එම බලතල භාවිත කළොත් මෙතැන සිටින පරිපාලන, නීති ආදි සියලු අංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට රාජකාරිය කාර්යක්ෂමව ඉටු කළ හැකියි කියා සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Mahinda Jayasinghe. You have five minutes.

[අ.භා. 4.01]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, අද විශේෂයෙන්ම ඓතිහාසික දිනයක්. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා ඇහුවා, මෙය ඓතිහාසික වෙන්නේ කොහොමද කියලා. මෙය ඓතිහාසික වන්නේ පිටු 206ක මේ සමස්ත වාර්තාව නිසා. මෙය මේ රට, මේ රටේ දේශපාලන ගමන් මඟ අලුත් මාවතකට යොමු කරපු වාර්තාවක්. ඉතිහාසය පුරා පොලීසිය දේශපාලනීකරණය වුණා. ඒ ගැන කරුණු එකින් එකට මේ වාර්තාවේ පිටු 206 පුරා මැනවින් වාර්තා කර තිබෙනවා. මෙය ඓතිහාසික වාර්තාවක් කියන්නේ ඒ නිසායි.

ඒ වාගේම පොලීසියට විතරක් නොවෙයි, සමස්ත රාජ්‍ය සේවයටම අලුත් පණිවුඩයක් දෙනවා අනීතික නියෝග පිළිපැදීමෙන් වෙන්න පුළුවන් ඉරණම මොකක්ද කියලා. ඒ විතරක් නොවෙයි. සුදුපිරුවට ඇඳගෙන කිරෙන් නාවලා වාගේ ඇවිල්ලා අද බොහෝ දේවල් සමහරු කථා කරනවා. හැබැයි, ඒ කථා කරන මහත්තුරුන්ගේ නියෝග නිසා තමයි අද දේශබන්දු වැනි පොලිස් නිලධාරින්ට මේ ඉරණම අත්වෙලා තිබෙන්නේ. පසුගිය කාලයක් තිස්සේ ඔයගොල්ලන් කරපු දේවල්වල ප්‍රතිවිපාක විඳින්න සිද්ධ වෙලා තිබෙනවා, අද මේ පොලිස් නිලධාරින්ට. මේ සියලු කරුණු නිසා මේක ඓතිහාසික වෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ වාර්තාව පුරාම සමහර අහිංසක පොලිස් නිලධාරින්ගේ සාක්ෂි තිබෙනවා. මේ අවසන් වාර්තාවේ පිටු අංක 28හි තිබෙනවා, පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන්ගේ සාක්ෂිය. ඔහු මෙහෙම කියා තිබෙනවා. "මම දරු තුන් දෙදෙනෙකුගේ තාත්තා කෙනෙක්, ස්වාමීනී. මට වෙන රැකියාවක්, ගොවිතැනක් කරගෙන ඉන්න තිබුණා මෙහෙම වන බවක් දන්නවා නම්" කියලා. එය මේ වාර්තාවේ තිබෙනවා. ඒකෙන් කියන්නේ මොකක්ද? අන්න, නීතිගරුක පොලිස් නිලධාරින්ගේ හෘදය සාක්ෂිය තමයි මේ සාක්ෂියෙන් කියැවෙන්නේ.

ඒ වාගේම, හමුදා නිලධාරි මහත්මයෙක් සාක්ෂි දෙන විට කියා තිබෙනවා, "මම දැන ගෙන හිටියා නම් මේ ඉන්නේ පොලිස් නිලධාරින් කියලා, මම වෙඩි තියන්නේ නැහැ, කොළඹින් ගිය

වැන් එකට" කියලා. එහෙම කියනවා. එතකොට එතැන හිටපු පොලිස් මහත්තයෙක් මොකක්ද කියන්නේ? "නැහැ, ඔබ කළ දේ නීත්‍යානුකූලයි. ඔබ ඔබේ රාජකාරිය කළේ." මේ අනීතික කටයුත්තට දායක වෙච්ච පොලිස් නිලධාරීනුත් ඒකේ තිබුණු නීත්‍යානුකූලභාවය පිළිබඳව එදා හරි පැහැදිලිව පිටු 206ක් තිබෙන මේ අවසන් වාර්තාව පුරා සඳහන් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ විවාදය පුරා විවිධ කරුණු කිව්වා. පොලිස් ස්ථාන 184කට දෙදෙනෙක් හැර අනෙක් සියලුදෙනා ප්‍රාදේශීය දේශපාලකයන්ගේ වුවමනාවට ස්ථානාධිපතිවරු පත් කරපු මහත්වරු, මේ නාමල් රාජපක්ෂලා තමයි අද ඇවිල්ලා මේ ඉස්සරහ පුටුවල ඉඳගෙන නන් දොඩවන්නේ. මේ විවාදය පටන් ගන්න කලින්, අද උදේ මේ විවාදය පටන් ගන්න කලින්- මේ විවාදය **ලොප්** කරන්න උත්සාහ කළා. නීතිමය තර්ක ගෙනැල්ලා, points of Order ඉදිරිපත් කරලා උත්සාහ කළා මේ විවාදය නතර කරන්න. ඇයි ඒ? අද දවස පුරා මේ විවාදය සිදු වෙනකොට තමන් අනීතික විධියට පොලිස් නිලධාරින් කටයුතු කරන්න මෙහෙයවලා ඒ හරහා අත්වන ඉරණම හරහා තමන්ගේ පැටිකිරිය එළියට එන එකට බයේ මේක වළක්වන්න උත්සාහ කළා. ඒ කථාව පුරාමත් ඒකට උත්සාහ කළා. මේ සම්බන්ධ නඩු කටයුත්තක් තිබෙනවා කියලා මේ විවාදය නවත්වන්න උත්සාහ කළා. එහෙම කියලා පැනලා ගියා. කථාව කරලා හැම දාම පැනලා යනවා. ඒක තමයි ඒගොල්ලන්ගේ සින්දුව. මම දැක්කා, ඊයේ ද පෙරේදා ද මාධ්‍යයට කිව්වා, "වැඩ වරද්දා ගන්නේ නැතිව ගියොත් හොඳයි" කියලා. මේ ආණ්ඩුවට උපදෙසක් දෙනවා. බොහොම හොඳ උපදෙසක් දුන්නා වැඩ වරද්දා ගන්නේ නැතිව ඉස්සරහට ගියොත් හොඳයි කියලා. වැඩ වරදින්නේ කාටද කියලා ඉස්සරහට බලා ගන්න පුළුවන්. දැන් ඉතා හොඳින් නීතිය ක්‍රියාත්මක වෙමින් අධිකරණ පද්ධතිය හරහා මේ කටයුතු සිදු වෙමින් තිබෙනවා. එහා පැත්තේ ඉඳගෙන උගත් නීතිඥ මහත්තුරු කිව්වා, මේක නීතියට අනුව නොවෙයි සිදු වුණේ කියලා. ඉතාම පැහැදිලිව, අපේ වර්තමාන ආණ්ඩුව 2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත අනුව ඉතාම නිරවුල්ව, නිවැරදිව පියවරෙන් පියවර මේ ක්‍රියාවලිය දියත් කරලා තිබෙනවා. ඒ නිසා මේ තුළ කිසිම අනීතිකභාවයක් නැහැ කියලා මම කියනවා. හැබැයි, අපි දැක්කා මේ ඉන්න බොහෝදෙනෙක් ශිරානි බණ්ඩාරනායක ධුරයෙන් ඉවත් කරන්න මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායය පවා කඩ කරපු හැටි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

ඒ නිසා විපක්ෂයේ මහත්තුරුන්ට අපි කියන්න කැමතියි, ඔබතුමන්ලා මේ අනීතික කටයුතුවලට විරුද්ධ නම්, මේකට පක්ෂව ඡන්දය නොදී ඉන්න ඔබතුමන්ලාට කිසිදු අයිතියක් නැහැ කියලා.

කියන්න බොහෝ දේවල් තිබුණත් කාලය සීමිත බැවින් මම කථාව අවසන් කරනවා. විපක්ෂ නායකතුමාත් විවිධ දේවල් කිව්වා. ජේවීපී මන්ත්‍රීවරු ඡන්දය දුන්නා ලු; මොනවාදෝ මොනවාදෝ ගොඩක් දේවල් කිව්වා. නමුත් හැමෝම බලන්න ඕනෑ වැඩවලින්, ක්‍රියාවෙන් මිස වචනවලින් නොවෙයි. අපි, වර්තමාන ආණ්ඩුව ක්‍රියාවෙන් ඔප්පු කරලා තිබෙනවා මේවා සම්බන්ධව කටයුතු කරන්නේ කොහොමද කියලා. තවත් බොහෝ දේවල් කියන්න තිබුණත් කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය සම්බන්ධයෙන් එකී පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව සභාවේ ඡන්දය විමසීම.

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනාව සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරයන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරයන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
පක්ෂයි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂව ද, විපක්ෂව ද?

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා තවත් සිටිනවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***(මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.)***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 175; විරුද්ධව 0; වැළකී සිටි 01 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 175; எதிராக 0; விலகியிருந்தோர் 01.*
*According to Electronic Voting, Parliament divided: Ayes 175; Noes 0; Abstain 01.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekarn | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 024. Nihal Galappaththi | Yes |
| G 025. Nihal Abeysinghe | Yes |
| G 026. Namal Karunaratne | Yes |
| G 027. Wasantha Piyathissa | Yes |
| G 028. Gamagedara Dissanayake | Yes |
| G 029. R.M. Jayawardhana | Yes |
| G 030. Sunil Watagala | Yes |
| G 031. Rathna Gamage | Yes |
| G 032. Mahinda Jayasinghe | Yes |
| G 033. Chathuranga Abeysinghe | Yes |
| G 034. Eranga Gunasekara | Yes |
| G 035. Upali Samarasingha | Yes |
| G 036. T.B. Sarath | Yes |
| G 037. Nalin Hewage | Yes |
| G 039. Anton Jayakody | Yes |
| G 040. Sundaralingam Pradeep | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Ruwan Ranasinghe | Yes |
| G 043. Muneer Mulaffer | Yes |
| G 044. Susil Ranasinghe | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Ashoka Ranwala | Yes |
| G 055. Lakshman Nipuna Arachchi | Yes |
| G 056. R.M. Gamini Rathnayake | Yes |
| G 057. Manjula Suraweera Arachchi | Yes |
| G 058. K. Ilankumaran | Yes |
| G 059. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 060. Samanmali Gunasingha | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Ajith Agalakada | Yes |
| G 063. Sagarika Athauda | Yes |
| G 064. Roshan Akmeemana | Yes |
| G 066. L.M. Abeywickrama | Yes |
| G 067. M.K.M. Aslam | Yes |
| G 068. Kaushalya Ariyarathne | Yes |
| G 069. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 070. Arkam Ilyas | Yes |
| G 071. Oshani Umanga | Yes |
| G 072. Krishnan Kalaichelvi | Yes |
| G 073. Upul Kithsiri | Yes |
| G 074. Wasantha Pushpa Kumara | Yes |
| G 075. Chaminda Lalith Kumara | Yes |
| G 076. Sarath Kumara | Yes |

| | |
|---|---|
| G 077. Nilanthi Kottahachchi | Yes |
| G 078. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 079. Lasith Bhashana Gamage | Yes |
| G 080.Thilanka U. Gamage | Yes |
| G 081. Nilusha Lakmali Gamage | Yes |
| G 082. Ajantha Gammeddage | Yes |
| G 084. Jagath Gunawardana | Yes |
| G 085. Aboobucker Athambawa | Yes |
| G 086. Ruwanthilaka Jayakody | Yes |
| G 087. Thushari Jayasingha | Yes |
| G 088. T.K. Jayasundara | Yes |
| G 089. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 091. Sellaththamby Thilaganathan | Yes |
| G 092. Anushka Thilakarathne | Yes |
| G 093. Chandana Thennakoon | Yes |
| G 094. Thanura Dissanayake | Yes |
| G 095. Dharmapriya Dissanayake | Yes |
| G 096. Sujeewa Dissanayake | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Susantha Dodawatta | Yes |
| G 099. Susantha Kumara Nawarathna | Yes |
| G 100. Sena Nanayakkara | Yes |
| G 101. Najith Indika | Yes |
| G 102. Aruna Panagoda | Yes |
| G 103. Nimal Palihena | Yes |
| G 104. Nishantha Perera | Yes |
| G 105. Stepni Fernando | Yes |
| G 106. Kanthasamy Prabu | Yes |
| G 107. Lal Premanath | Yes |
| G 108. Nanda Bandara | Yes |
| G 109. Padmasiri Bandara | Yes |
| G 110. Ravindra Bandara | Yes |
| G 111. Sudath Balagalla | Yes |
| G 112. Sri Bavanandarajah | Yes |
| G 113. E. M. Basnayaka | Yes |
| G 114. Wijesiri Basnayake | Yes |
| G 115. Lakmali Hemachandra | Yes |
| G 116. S. Sandaruwan Madarasinghe | Yes |
| O 001. Mano Ganeshan | Yes |
| O 007. Gayantha Karunathilleka | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 014. Amirthanathan Adaikkalanathan | Yes |
| O 015. G.G. Ponnambalam | Yes |
| O 016. Ramanathan Archchuna | Abstain |
| O 017. M.A.M. Thahir | Yes |
| O 019. Sivagnanam Shritharan | Yes |
| O 020. Shanakiyan Rajaputhran Rasamanickam | Yes |
| O 022. Harsha de Silva | Yes |
| O 027. J. C. Alawathuwala | Yes |
| O 029. Hector Appuhamy | Yes |
| O 039. Kaveenthiran Kodeeswaran | Yes |
| O 040. Gnanamuththu Srineshan | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 057. M.S. Uthumalebbe | Yes |
| O 058. Abthul Wazeeth | Yes |
| O 059. Kathiravelu Shanmugam Kugathasan | Yes |
| O 060. Thurairasa Ravikaran | Yes |
| O 063. Ismail Muththu Mohamed | Yes |
| O 064. Nissam Kariyappar | Yes |
| O 065. Prageeth Madhuranga | Yes |
| O 066. Jagath Manuwarna | Yes |
| O 067. Ruwan Mapalagama | Yes |
| O 068. Nandana Millagala | Yes |
| O 069. Riyas Farook | Yes |
| O 070. Danushka Ranganath | Yes |
| O 071. Sanjeewa Ranasingha | Yes |
| O 072. Sunil Rathnasiri | Yes |
| O 079. Elayathamby Srinath | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | Yes |
| O 081. Manjula Sugath Rathnayaka | Yes |
| O 082. A.M.M.M. Rathwaththe | Yes |
| O 083. Manoj Rajapaksha | Yes |
| O 084. Sunil Rajapaksha | Yes |
| O 085. Hasara Liyanage | Yes |
| O 086. Deepthi Wasalage | Yes |
| O 087. Kanchana Welipitiya | Yes |
| O 088. R. G. Wijerathna | Yes |
| O 089. Nishantha Samaraweera | Yes |
| O 090. Priyantha Wijerathna | Yes |
| O 091. Ruwan Wijeweera | Yes |
| O 092. Darmapriya Wijesinghe | Yes |
| O 093. Hiruni Wijesinghe | Yes |
| O 094. Athula Welandagoda | Yes |
| O 095. Fasmin Sharif | Yes |
| O 096. Dinindu Saman | Yes |
| O 097. Thilina Samarakoon | Yes |
| O 098. Ambika Samivel | Yes |
| O 099. Dewananda Suraweera | Yes |
| O 100. Chandana Sooriyaarachchi | Yes |
| O 101. G.D. Sooriyabandara | Yes |
| O 102. Aravinda Senarath | Yes |
| O 103. Kitnan Selvaraj | Yes |
| O 104. Janaka Senarathna | Yes |
| O 105.Chandima Hettiaratchi | Yes |
| O 106. Champika Hettiarachchi | Yes |
| O 107. Dinesh Hemantha | Yes |
| O 108. Geetha Herath | Yes |
| O 109. Bhagya Sri Herath | Yes |
| O 110. Muhammad Faizal | Yes |
| O 111. Ashoka Gunasena | Yes |
| O 112. Nandana Pathmakumara | Yes |
| O 113. Sunil Biyanwila | Yes |
| O 114. Samantha Ranasingha | Yes |
| O 115. Nishantha Jayaweera | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 176 |

**Votes:**

| | |
|---|---|
| Yes | 175 |
| No | 0 |
| Abstain | 01 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 175යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 177යි.

විරුද්ධව 0යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 01යි.

[ගරු කථානායකතුමා]

ඒ අනුව න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම පිණිස වූ යෝජනා සම්මතය වැඩි ඡන්ද 177කින්, එනම් නොපැමිණි මන්ත්‍රීවරයන්ද ඇතුළුව මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර මන්ත්‍රීවරයන්ගේ ඡන්දයෙන් සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සහ 3 ඉදිරිපත් කිරීම, ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා.

ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

## ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත: නියෝග
## மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத்தீர்வைகள் சட்டம்: ஒழுங்குவிதிகள்
## ANTI-DUMPING AND COUNTERVAILING DUTIES ACT: REGULATIONS

[අ.භා. 4.17]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ 64, 65, 66, 69 සහ 70 වගන්ති සමඟ සහ 45(5) වගන්තිය සමඟ කියවිය යුතු 84 වගන්තිය යටතේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 3 දරන යෝජනාව - අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග - ද මා ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ දිනට නියමිත වැඩකටයුතුවල විෂය අංක 2 යටතේ සඳහන් ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ ප්‍රසිද්ධියට පත් කරන ලද නියෝග සහ විෂය අංක 3 යටතේ සඳහන් යෝජනාව පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමයි මේ අවස්ථාවේදී මා සිදු කළේ. අද මේ කටයුත්තේ අරමුණ බවට පත් වන්නේ ඒකයි. විශේෂයෙන්ම ජාතික ජන බලවේගය ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය විසින් 2025 මාර්තු මාසයේ 27වැනි දා සම්මත කළ කැබිනට් පත්‍රිකාව අනුව, 2025 ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පැනවීම සඳහා විමර්ශන ආරම්භ කිරීමට ඉල්ලුම් කිරීමේ නියෝග පැනවීමයි මෙසේ සිද්ධ කරන්නේ.

ඒ වාගේම 2025 මිල පොරොන්දු වීමේ ක්‍රියා පටිපාටි නියෝග 2025.03.27 දින සිට බලපැවැත්වෙන පරිදි අංක 2429/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අපගේ අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙම නියෝග අනුමත කර ගැනීමේ වුවමනාව තිබෙන්නේ විශේෂයෙන්ම අපේ රටේ දේශීය නිෂ්පාදකයන් වෙනුවෙනුයි. දේශීය නිෂ්පාදකයන්ට සාධාරණ වෙළෙඳ පොළ අවස්ථාවක් හදන්නට - අසාධාරණ වෙළෙඳ කටයුතුවලින් ඔවුන් ආරක්ෂා කර ගැනීම ඉලක්ක කරගෙන - තමයි ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග ඉදිරිපත් කරලා, නීතිය සංශෝධනය කරලා ඉදිරියට යෑමට අවශ්‍ය කටයුතු කරගන්නට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලන්නේ.

Anti-Dumping and Countervailing Duties Act එක යටතේ අපි මේ කටයුත්ත කරන්න යනකොට මේ කටයුත්ත පිළිබඳ විවිධ සාකච්ඡා, සංවාද ඇති වුණා. මොකද, මේ පනත් පිළිබඳ සාකච්ඡා 2006 ඉඳන් තිබෙනවා. ලෝක වෙළෙඳ සංවිධානයේ GATT සහ GATS කියන සම්මුති යටතේ ආපු මේ සමහර නියෝග මඟින්, ලෝකයේ සාධාරණ වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කිරීම සඳහා වාගේම දේශීය ව්‍යාපාරිකයන්ට, දේශීය කර්මාන්තකරුවන්ට තමන්ගේ ව්‍යාපාරය, කර්මාන්තය අසාධාරණ වෙළෙඳ පොළ තරගවලින් මුදා ගැනීමට අවශ්‍ය රැකවරණය ලබා දීමයි අරමුණ බවට පත් වෙන්නේ. ලෝකයේ වෙනත් රටක්, ඒ රටේ ආණ්ඩුව විසින් ලබා දෙන සහනාධාර පාවිච්චි කරලා සිදු කරන නිෂ්පාදන අපේ වෙළෙඳ පොළ තුළට අරන් එන්න පුළුවන්, නැත්නම් ඇතුළු කරන්න පුළුවන්, නැත්නම් ප්‍රපාතනය - dump - කරන්න පුළුවන්. එහෙම කළාට පස්සේ මොකක්ද වෙන්නේ? එවැනිම නිෂ්පාදනයකට ලංකාවේදී දරන්න වන නිෂ්පාදන පිරිවැයත්, ඒ භාණ්ඩය හා සමාන භාණ්ඩයකට ලංකාවේ පාරිභෝගිකයාට වැය වන මුදලත් එක්ක ගත්තාම ඒ නිෂ්පාදකයාට සිද්ධ වෙනවා, ඒ රටේ නිෂ්පාදනයත් එක්ක එනම් අර dump කරන භාණ්ඩයත් එක්ක තරග කරන්න. මේ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. විශේෂයෙන් අපේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රයේ පවා මේ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම tile and ceramic industriesවලත් මේ ප්‍රශ්නය තිබෙනවා. ඇලුමිනියම් නිෂ්පාදන සම්බන්ධවත් මේ

ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේ නිෂ්පාදන ගණනාවක් පිළිබඳව අපට මේ වෙනකොට තොරතුරු වාර්තා වෙලා තිබෙනවා. ඒ නිසා අපේ වාණිජ දෙපාර්තමේන්තුව හරහා මේ වෙනුවෙන් පරීක්ෂණ පවත්වන ඒකකයක් ස්ථාපිත කරලා තිබෙනවා. ඒ ඒකකයට පැමිණිල්ලක් ආවාම, ඒ පැමිණිල්ල විභාග කිරීමට අවශ්‍ය කටයුතු කරන්න, ඊට අවශ්‍ය ශක්තිය, අවශ්‍ය පහසුකම් සැපයීමත් අපි මීට පෙර ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

අද අපේ රටේ නිෂ්පාදකයෙකුට අසාධාරණ වෙළෙඳ පොළ තරගයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා නම්, ඔහුට හැකියාව තිබෙනවා ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරන්නට. මොකද, තමන්ගේ නිෂ්පාදනය හා සමාන නිෂ්පාදනයක් වෙෙළඳ පොළට එනවා, එම නිෂ්පාදනය ආනයනය කරන රටේ ආණ්ඩුව විසින් ලබා දෙන සහනාධාරවලින් එම නිෂ්පාදනයේ පිරිවැය අඩු කර ගන්නවා, ඒ අඩු කර ගන්නා පිරිවැය මත එම භාණ්ඩය අපේ වෙළෙඳ පොළට ඇතුළු වුණාට පස්සේ අපේ වෙළෙඳ පොළේදී අපි නිෂ්පාදනය කරන භාණ්ඩයත් එක්ක තරග කරනකොට ඒ භාණ්ඩය අඩු මිලකට විකුණන්න පුළුවන්කම තිබෙනවා. ඉතින් අඩු මිලකට ඒ භාණ්ඩය විකිණීම නිසා දේශීය කර්මාන්තකරුවාට ඔහුගේ ආයතනයේ සුරක්ෂිතතාව, එහි සිටින සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව සම්බන්ධව ප්‍රශ්න ඇතිවනවා වාගේම, ඒ තුළින් ජාතික නිෂ්පාදනය බිඳ වැටීම නිසා අපේ රටේ ආර්ථිකයටත් එය බලපානවා. ඒ වාගේම විදේශ විනිමය විදෙස්වලට ගලා යැම කියන කාරණාත් මේකත් එක්ක බැඳිච්ච කරුණු හැටියට තිබෙනවා.

ඒ නිසා විශේෂයෙන් කර්මාන්ත අමාත්‍යාංශයට, ඒ වාගේම අපේ රටේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට බලපාන කරුණකට අදාළ රෙගුලාසි සකස් කරලා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි දැන් සකස් කරලා අවසානයි. ඒ අනුව Anti-Dumping and Countervailing Duties Act එක හරහා අපි කරන්න හදන කාර්යභාරය ඉතා වැදගත්. මොකද, පසුගිය මාර්තු මාසයේ 27වෙනි දා සිට බලපැවැත්වෙන පරිදි ඕනෑම කෙනෙකුට මේ විමර්ශන ඒකකයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව අපි සකස් කරලා දෙනවා. අපි නිකුත් කරන නියෝග මාර්තු මාසයේ 27වන දා සිට ක්‍රියාත්මක වන ලෙස අපි සකස් කරලා දෙනවා. නමුත් මේ කාර්යභාරය ඉටු කරන්න යද්දී එය සරල වෙන්නේ නැහැ. කෙනෙකු තර්ක කරන්න පුළුවන්, ලෝකයේ සහනාධාර ලබා නිෂ්පාදනය කර තිබෙන භාණ්ඩ අපේ රටට ගෙනැල්ලා දාන එක හරහා පාරිභෝගිකයාට යම් සහනයක් ලැබෙනවා නේද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔව්, කෙනෙකුට එහෙම තර්ක කරන්න පුළුවන්. නමුත් මේ සංශෝධනය කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කර ගත්තාට පස්සේ අපි කරන්නේ මේ භාණ්ඩය අපේ රටට ගෙන ඒම වැළැක්වීම සඳහා බදු පැනවීමයි. ඒ කියන්නේ එම භාණ්ඩයට බද්දක් පනවන එක තමයි අපි කරන්නේ. ඒ සඳහා බද්දක් පැනවීමට අපට තිබෙන අයිතිය තමයි අපි මේකෙන් තහවුරු කර ගන්නේ. මොකද, ලෝකයේ වෙළෙඳාම සඳහා වෙච්ච එකඟතාවල අපි ඉන්නවා. ඒ අනුව බද්දක් පැනවීම සඳහා වෙච්ච අයිතිය අපි තහවුරු කර ගන්නවා. හැබැයි, බද්දක් පනවන්නේ කොහොමද?

යම් නිෂ්පාදනයක් පිළිබඳව යම් දේශීය නිෂ්පාදකයෙකුගේ කර්මාන්තයට මේ dumping හරහා සිද්ධ වන, මේ ප්‍රපාතනය හරහා සිද්ධ වන බලපෑම නිසා ඔහුගේ කර්මාන්තය අර්බුදයට යනවා නම් ඔහුට පුළුවන්, අපේ වාණිජ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න. ඒ පැමිණිල්ල ඉදිරිපත් කිරීම සඳහා application එකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ application එක පුරවලා, ඒ application එක හරහා අපේ වාණිජ දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර ඇති මෙහෙයුම් ඒකකයට - ඒ මෙහෙයුම් ඒකකය අපි ආරම්භ කරනවා - කියන්න ඕනෑ, මෙන්න මේ නිෂ්පාදනය විසින් අපේ වෙළෙඳ පොළට බලපෑමක් ඇති කරනවා, මේ නිෂ්පාදනය අපේ production cost එකටත් වඩා අඩුවෙන් වෙළෙඳ පොළේ විකිණෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනත් රටක ඉඳන් නැව්වලින් ගෙනැල්ලා මෙහේ ලාභ තියාගෙන production cost එකටත් වඩා අඩුවෙන් විකුණනවා කියනකොට, ඔහු ඒකට අදාළ තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ තොරතුරු ඉදිරිපත් කළාට පස්සේ අපේ වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පවත්වන විභාගයකින් පසුව Inter-Ministerial Committee එකකට එය යොමු කරනවා, මේ පිළිබඳව තීරණයක් ගන්න. ඒ Inter-Ministerial Committee එක විසින් ගන්නා වූ තීරණය වන්නේ බදු පනවනවාද, නැද්ද, පනවනවා නම් කොච්චරයිද කියන එකයි. ඉන් පසු ඒ තීරණය යවනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා බලනවා, මේ බදු පැනවීම මඟින් ආර්ථිකයට සිද්ධ වන හානිය මොකක්ද, ආර්ථිකයට සිද්ධ වන බලපෑම මොකක්ද, ඒ හරහා අපට සිද්ධ වන්න පුළුවන් ආර්ථික බලපෑම මොකක්ද කියලා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර නිෂ්පාදන තිබෙනවා, ඒවා වෙළෙඳ පොළට පැමිණීම නිසාම අපේ රටේ පාරිභෝගිකයාට වාසියක් ඇතිවනවා.ඒ නිසා පාරිභෝගිකයාට අත්වන වාසියත්, ඒ වාගේම අපේ රටේ වෙළෙඳ පොළ තුළ තිබෙන ස්ථාවරත්වයත් යන මේ සියල්ල මේ බදු පැනවීමට බලපානවා. මට ඒකට උදාහරණයක් කියන්න පුළුවන්. විශේෂයෙන්ම පරිප්පු වාගේ දෙයක් අපේ රටේ හදන්නේ නැහැ නේ. සමහර රටවල ගොවියෝ කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වූ සහනාධාර ලබාගෙන පරිප්පු වගා කරනවා. ඊට පස්සේ අපේ රටට ඒ පරිප්පු එවනවා. පරිප්පු අපේ රටේ නිෂ්පාදනය කරන්නේ නැති නිසාම, සහනාධාර ලබාගෙන පිට රටවල වගා කරන පරිප්පු අපට එන එක වාසියක් වනවා.

හැබැයි, සමහර නිෂ්පාදන තිබෙනවා, අපිත් සුළු ප්‍රමාණවලින් නිෂ්පාදනය කරන. එහෙම නිෂ්පාදනය කළත්, අපේ රටේ සමස්ත පරිභෝජනයෙන්, රටේ අවශ්‍යතාවෙන් සියයට 10කටත් අඩුවෙන් තමයි එම දේශීය නිෂ්පාදනය තිබෙන්නේ. එවැනි අවස්ථාවක බද්දක් පැනවීමෙන් සියයට 90ක් වෙච්ච අනෙකුත් පාරිභෝගිකයන්ට ඒකෙන් බලපෑමක් ඇති වෙනවා. ඒ නිසා මේ සියලු පැති ගැන මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාත් කල්පනා කරනවා. අපට ලැබෙන තොරතුරු, ඒ හරහා කරන පරීක්ෂණය, ඒ මෙහෙයුම් ක්‍රියාවලිය ඉතා හොඳ අවබෝධයක් යටතේ කිරීමෙන් පසු වාණිජ අධ්‍යක්ෂවරයා ඒක අන්තර් අමාත්‍ය කමිටුවකට - Inter -Ministerial Committee එකකට - යවනවා. ඉන් පසු ඒ අන්තර් අමාත්‍ය කමිටුව හරහා ගන්නා තීරණය මුදල් අමාත්‍යාංශයට ලබා දෙනවා. ඉන් පසු මුදල් අමාත්‍යාංශය හරහා මෙය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තීරණය අපි ගන්නවා. ඒ නිසා අපට මේ හරහා සිද්ධ කරන්න පුළුවන්කම තිබෙන්නේ මොකක්ද? මේක සදාකාලික බද්දක් ලෙස පැනවිලා තිබෙන්නේ නැහැ. මෙහිදී දේශීය කර්මාන්තකරුවාටත් යම් කාලයක් ලැබෙනවා. මේ application එක ලැබීමෙන් පසු අපි එය පරීක්ෂාවට ලක් කරනවා. ඉන් පසු වෙළෙඳ පොළ තුළ ඇති වන බලපෑම පිළිබඳව එම කර්මාන්තකරුවා තොරතුරු එකතු කරගන්න අවශ්‍යයි. මේ පිළිබඳව අපි සීමා පනවනවා නම්, ඔහුටත් ඒ සීමා පැනවීම සඳහා යම් කාලයක් තිබෙනවා. ඔහුගේ කර්මාන්තයත් යම් මට්ටමකට කාර්යක්ෂම කරගෙන, පිරිවැය අඩු කරගෙන, වෙළෙඳ පොළ තුළ අසාධාරණ තරගයකට නොයා, සාධාරණ තරගයක් සඳහා සූදානම් වෙන්න ඔහුටත් යම් කාලයක් ලැබෙනවා. ඒ නිසා අපි මේ බදු පැනවීමේ ක්‍රියාවලිය හරහාත් සිද්ධ කරන්නේ, දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීම. මෙහිදී ඔහුගේ නිෂ්පාදනවලට වාගේම කර්මාන්තයටත් නව තාක්ෂණය එකතු කරලා, නිෂ්පාදන පිරිවැය අඩු කරලා, දේශීය වෙළෙඳ පොළට වාගේම විදේශීය

[ගරු වසන්ත සමරසිංහ මහතා ]

වෙළෙඳ පොළටත් යවන්න පුළුවන් මට්ටමට එම නිෂ්පාදනය දියුණු කරන්න ඕනෑය කියන අභියෝගය අපේ රටේ නිෂ්පාදකයාට, කර්මාන්තකරුවාට එනවා. අන්න ඒක තමයි, මේ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ පනවන්න යන නියෝගවලින් සිද්ධ කරන්නේ.

මේ කටයුත්ත වෙනුවෙන් පසුගිය අවුරුදු 20කට වැඩි කාලයක් තිස්සේ අපේ රටේ නිෂ්පාදකයන් විවිධ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. සමහර කර්මාන්තශාලා වැහිලා තිබෙනවා. සමහර කර්මාන්ත සඳහා නව පිරිසක් ආයෝජනත් කළා. අපි දන්නවා, පසුගිය කාලයේ අපේ රටේ සමහර කර්මාන්තකරුවන් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රුපියල් බිලියන 4, 5 ආයෝජනය කර තිබෙන බව. මොකද, ආනයන සීමා කරලා තිබෙනවා. ඒ ආනයන සීමා කර රඳවා ගැනීම සම්බන්ධයෙන් අපට දැන් ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. අපි නිදහස් වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කිරීම සඳහා වුණු ලෝක සම්මුතිවලට එකඟ වෙලා තිබෙනවා. ඒ සම්මුතිවලට ගිහිල්ලා අපි නිදහස් වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කරන්න එකඟ වෙලා තිබෙන වෙලාවේ, ලෝකයේ තවත් රටක් සහනාධාර ලබාගෙන නිෂ්පාදනය කරන භාණ්ඩයක් අපේ රටට එන එක තුළින් පාරිභෝගිකයාට සහනයක් ලැබෙනවා තමයි. හැබැයි, පාරිභෝගිකයාට සහන ලැබෙනවා වාගේම, අපේ රටේ නිෂ්පාදන කර්මාන්තය බිඳ වැටෙනවා නම්, ඒ කර්මාන්තය වැහිලා යනවා නම්, ඒ කර්මාන්තය අපට ආපහු අහිමි වෙනවා නම්, අපි රටක් හැටියට ඒ කර්මාන්තය ආරක්ෂා කර ගැනීම ගැන වැඩියෙන් හිතන්නත් ඕනෑ. ඒ නිසා මේ නියෝග පැනවීමට අපි පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත් ගමන්, මේ නියෝග පනවන්නේ නැහැ. හැබැයි, අපේ දේශීය කර්මාන්තකරුවාට දැන් අවස්ථාව තිබෙනවා, ඔහුගේ කර්මාන්තයට මෙතෙක් කල් අභියෝගයක් වෙච්ච dumping, එහෙම නැත්නම් ලෝකයේ වෙනත් රටක් සහනාධාර අරගෙන කරන නිෂ්පාදනයක් අපේ රටට ගෙනැල්ලා දැම්මාට පස්සේ ඔහුගේ කර්මාන්තය අභියෝගයට ලක් වෙනවා නම්, මේ විධියට වාණිජ දෙපාර්තමේන්තුවට application එකක් දමන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපේ රටේ කර්මාන්තකරුවන්ටත් මේ ප්‍රශ්නය තිබෙනවා. මොකද, අපේ රටේ කර්මාන්තකරුවනුත් නොයෙක් නිෂ්පාදන පිටරට යවනවා. ඒවා පිටරට යැවීමේදී අපේ රටේ කර්මාන්තකරුවාත් මේ පිළිබඳව දැන් අවබෝධයෙන් ඉන්න ඕනෑ. මොකද, මේ වන විට ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත - Anti-Dumping and Countervailing Duties Act එක - සම්මත කරලා තිබෙනවා, ඒ වාගේම අපි දැන් ඒ යටතේ නියෝග පනවන්නත් කටයුතු කරලා තිබෙනවා, පරීක්ෂණවලටත් ඉඩ දීලා තිබෙනවා. මේ කටයුත්ත තවත් රටක කෙනෙකුට අපේ රටේ නිෂ්පාදකයන්ට, අපේ අපනයනකරුවන්ට විරුද්ධවත් කරන්න පුළුවන්. අපි ලබා දෙන සමහර බදු සහන පාවිච්චි කරලා cost එක අඩු කරගෙන, ඒ කරන නිෂ්පාදන ඒ රටට එවනවා කියලා ඒ රටවලිනුත් අපට විරුද්ධව මෙහෙම චෝදනාවක් ගෙන එන්න පුළුවන්.

ඒ නිසා දැන් දෙපැත්තේම ආරක්ෂාව පිළිබඳව හිතන්න වෙලා තිබෙනවා. ලෝකයේ නිදහස් වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කරනවා වාගේම, දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා ලෝක වෙළෙඳ සංවිධානය GATT සම්මුතිය හරහා ආපු එකඟතා ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අපි රටක් හැටියට WTO එකේ සාමාජිකයන් වෙලා තිබෙනවා. ඒ අනුව අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ ක්‍රියාමාර්ගය ඉදිරියට අරගෙන යන්න. මේ හරහා දේශීය කර්මාන්තකරුවා රැක ගන්නවා වාගේම, පාරිභෝගිකයා රැක ගැනීමේ වගකීමත් ආණ්ඩුවක් ලෙස අපට පැවරී තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් ලෙස මේ තිබෙන වගකීම ඉටු කිරීම සඳහා තමයි අපි මේ කටයුත්ත කරන්න යන්නේ.

මේ පනතේ 38වන වගන්තිය යටතේ පරීක්ෂණයක් එනවා. 39වන වගන්තිය යටතේ වෙළෙඳ අමාත්‍යාංශය හරහා මේ පරීක්ෂණය ක්‍රියාත්මක වෙනවා. ඒ පරීක්ෂණය ක්‍රියාත්මක වුණාට පස්සේ එය අමාත්‍ය කමිටුවකට යනවා. ඒකෙන් පස්සේ තමයි මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා බදු පැනවීම සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ නියෝග අනුමත වූ සැනින් බදු පැනවෙන්නේ නැහැ කියන එක මම ප්‍රකාශ කරනවා. අවශ්‍ය තොරතුරු ටික සොයලා අදාළ application එක දමන එකත් ව්‍යාපාරිකයාට සහ නිෂ්පාදකයාට පැවරෙන වගකීමක් හැටියට තිබෙනවා. රජයක් හැටියට අපි හිතනවා, ඒ අයට උදවු කරන්න ඕනෑ කියලා. ඒ සඳහා අපි වාණිජ දෙපාර්තමේන්තුවේ ඒකකයක් පිහිටුවා තිබෙනවා, මේ application එකක් දමන කෙනෙකුට උදවුවක් වශයෙන් අවශ්‍ය තොරතුරු ලබා දෙන්න. ඒ වාගේම ලෝකයේ තිබෙන, කලාපයේ තිබෙන අත්දැකීම් ටිකත් අපි ලබාගෙන තිබෙනවා. මේ අත්දැකීම් ටිකත් ලබාගෙන අපේ රටේ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කරගන්නත්, අසාධාරණ වෙළෙඳ පොළ තරගය අවසන් කරලා පාරිභෝගිකයා වාගේම නිෂ්පාදනයත් රැකගෙන සාධාරණ වෙළෙඳ පොළ තත්ත්වයක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ වන නියෝග පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම සඳහා කටයුතු කරන අවස්ථාව පිළිබඳ සතුටු වෙමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have nine minutes.

[பி.ப. 4.33]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் நடைபெறுகின்ற மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத் தீர்வைகள் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமான விவாதத்தில் கலந்துகொள்வதில் மட்டற்ற மகிழ்ச்சியடைகின்றேன்.

மன்னார் மாவட்டத்தில் காற்றாலை மின் உற்பத்தி சம்பந்தமான பிரச்சினை தொடர்ந்துகொண்டு இருக்கின்றது. இன்று கௌரவ அமைச்சர் குமார ஜயகொடி, மன்னார் மாவட்ட அபிவிருத்திக் குழுத் தலைவர் ஆகியோர் உட்பட நாங்கள் எல்லோரும் ஒன்றுகூடி எதிர்வரும் 7ஆம் திகதி எங்களுடைய பிரதிநிதிகளைச் சந்தித்து இதற்கு ஒரு தீர்வைப் பெறுவதென்ற ஒரு முடிவுக்கு வந்திருக்கிறோம். உண்மையிலே மக்களுடைய போராட்டத்தால் என்ன நடக்குமென்ற அச்சத்தோடு நாங்கள் இருந்துகொண்டு இருக்கின்ற நிலையில், இப்படியாக ஒரு தீர்வைக் கொண்டுவருவதற்குரிய முயற்சியை மேற்கொண்டதற்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத் தீர்வைகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் மூலம் உற்பத்தியாளர்கள்மீது வரி விதிக்கப்படுமா? என்ற கேள்வி எழுகின்றது. எங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்குள்ள விவசாயிகள் தங்களுடைய உற்பத்திப் பொருட்களை நியாய விலையில் விற்பதென்பது குதிரைக் கொம்பாகவே இருக்கின்றது. உதாரணத்துக்கு, ஒரு கிலோகிராம் கத்தரிக்காயை 100 ரூபாய்க்கு வாங்கி, அதனை வியாபார ரீதியாக 300 - 400 ரூபாய்க்கு விற்கின்ற சூழல் இருக்கின்றது. ஒரு விவசாயி கஷ்டப்பட்டு பயிர்ச்செய்கை செய்து, உற்பத்திப் பொருளைப் பாதுகாத்து, விற்பனை செய்யும்போது, அதை இடைத்தரகர்கள் கூடுதலான விலைக்கு விற்பதென்பது, விவசாயிகளுக்கு நஷ்டத்தை ஏற்படுத்துகின்றது. நாங்கள் உற்பத்தியாளர்களை ஊக்குவிக்க வேண்டுமாக இருந்தால், உள்ளூர் சந்தை வாய்ப்புகளை உருவாக்க வேண்டும். அரசாங்கம் அதற்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும். கிராமப் புறங்களில் சந்தை வாய்ப்பை உண்டு பண்ணி, மரக்கறி போன்ற உற்பத்திப் பொருட்களை விற்பனை செய்வதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும்.

எமது வட மாகாணத்தில் பனையின் உபயோகம் கூடுதலாகக் காணப்படுகின்றது. பனை வளத்தினூடாக பனாட்டு போன்ற உணவுப் பொருட்களையும் தொப்பி போன்ற கைவினைப் பொருட்களையும் உற்பத்தி செய்வதில் அங்குள்ள பெண் தலைமைத்துவ குடும்பங்கள் கவனம் செலுத்தி வருகின்றன. எனினும், அவர்களின் உற்பத்திக்கு நியாயமான விலையைப் பெற்றுக்கொள்ள முடியாத சூழல் காணப்படுகின்றது. எனவே, அரசாங்கம் இந்த வரி விதிப்பைக் கொண்டுவருவதற்கு முதல் அந்த உற்பத்தியாளர்கள் தங்களது உற்பத்திகளுக்கு நியாயமான விலையைப் பெறுவதற்கான வாய்ப்பை உண்டுபண்ண வேண்டும். அப்படி உண்டுபண்ணினால்தான் இந்த வரி விதிப்பு செல்லுபடியாகக்கூடிய நிலை ஏற்படும். எங்களுடைய கிராமப் புறங்களில் இருக்கின்ற விவசாயிகளின் உற்பத்திகளுக்கு நல்ல விலையைப் பெற்றுக் கொடுக்கக்கூடிய வாய்ப்புகளை உண்டுபண்ணும்போது, அதனூடாக நாங்களும் நன்மை அடைவதற்கு வாய்ப்பு இருக்கிறது.

மேலும், எங்களுடைய பிரதேசங்களில் குரங்குகளின் தொல்லை அதிகமாக இருக்கின்றது. இதனால் விவசாயிகள் மிக மோசமானதொரு நிலையைச் சந்திக்கிறார்கள். எனினும், அதனைக் குறைப்பதற்கான வாய்ப்புகளும் இல்லை. குரங்குகளை சீனாவுக்கு ஏற்றுமதி செய்வதாகச் சொன்னார்கள். அப்படிச் செய்தால்கூட குரங்குகளின் தொல்லையைக் குறைக்க முடியும். ஒருபுறம் யானைகளின் பிரச்சினை; மறுபுறம் குரங்குகளின் பிரச்சினை! இப்படி நிலைமை இருந்தால், உற்பத்தியில் ஈடுபடுகின்ற எங்களுடைய மக்கள் என்ன செய்ய முடியும்? அன்றாடம் கஷ்டப்பட்டு உழைக்கின்ற விவசாயிகளின் நிலைமை எப்படி இருக்கும்? இந்த விடயத்தில் அரசாங்கம் கவனம் செலுத்தினால்தான், அடுத்த கட்டமாக எப்படி வரியை அறவிடுவது? எப்படி சட்ட ரீதியான நடவடிக்கைகளுக்குச் செல்வது? போன்ற விடயங்கள் பற்றி நாங்கள் சிந்திக்க முடியும்.

உதாரணத்துக்கு, நுகர்வோருக்குப் பொருட்கள் கிடைக்க வேண்டுமானால் அவை சந்தைப்படுத்தப்பட வேண்டும். வெளிநாட்டில் இருந்து இறக்குமதி செய்யப்படுகின்ற பொருட்கள் மட்டுமல்ல, உள்நாட்டில் உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களும் சந்தைப்படுத்தப்பட வேண்டும். குறிப்பிட்ட இடங்களில்தான் முறையான சந்தை அமைப்பு இருக்கின்றது. பேசாலையை எடுத்துக்கொண்டால், அங்கு சந்தை இருக்கிறது. ஆனால், அது சந்தை மாதிரி இல்லை. அதாவது, காலையில் வியாபாரிகள் கூடுவார்கள்; மக்கள் மரக்கறி வாங்குவார்கள்; மீன் வாங்குவார்கள். பின்னர் அவர்கள் கலைந்து விடுவார்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கு இருக்கிறார். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, பெரிய கிராமங்களில் இருக்கின்ற மக்களுடைய உற்பத்திகள் நுகர்வோரைச் சென்றடைவதற்கு ஏற்ற வகையில், நீங்கள் பெரிய அளவில் அல்லாது சாதாரண சந்தை அமைப்புகளையாவது உருவாக்கிக் கொடுக்க வேண்டும். அவ்வாறு செய்தால் இந்தச் சட்ட திட்டங்களைச் சிறந்த முறையில் நடைமுறைப்படுத்துவதற்கான வாய்ப்பு ஏற்படும்.

மொத்தத்தில் நீங்கள் எல்லோரும் கீழ்நிலையிலிருந்து வளர்ந்துவந்த அரசாங்க பிரதிநிதிகள்! அதுமாத்திரமன்றி, கிராம மக்களுடைய கஷ்டங்களை உணர்ந்தவர்கள்! அங்குள்ள விவசாயிகளின் உற்பத்திப் பொருட்களுக்குச் சரியான விலையைப் பெற்றுக்கொடுக்கவில்லை என்றால், அவர்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கவேண்டிய சூழ்நிலைதான் ஏற்படும். எங்களுடைய விவசாயிகளாக இருக்கலாம்; மீனவ சமூகத்தினராக இருக்கலாம். அவர்கள் உற்பத்தி செய்கின்ற பொருட்கள் தொடர்பில் கவனம் செலுத்தாத காரணத்தால்தான் இன்றைக்கு நாங்கள் பொருளாதார ரீதியில் மிகவும் பின்னடைந்து இருக்கவேண்டிய ஒரு சூழல் ஏற்பட்டு இருக்கின்றது. நாங்கள் உள்ளூர் உற்பத்தியாளர்களின் உற்பத்திகள்மீது நல்ல முறையில் கவனம் செலுத்தும்போது, எங்களுடைய நாட்டை முன்னோக்கிக் கொண்டுசெல்வதற்கான வாய்ப்பை உண்டுபண்ண முடியும்.

இன்றைக்கு அமெரிக்கா tax விதித்திருக்கிறது. அண்மையில் இருக்கின்ற இந்தியா போன்ற நாடுகளைச் சரியாகப் பயன்படுத்தினால், நிச்சயமாக உற்பத்திப் பொருட்களை மலிவு விலையில் கொண்டுவரக்கூடிய ஒரு சந்தர்ப்பத்தை உருவாக்க முடியும். எங்களுடைய மக்களுக்குத் தேசியப் பிரச்சினையொன்று இருக்கின்றது. அதைவிட, பொருளாதார ரீதியான பிரச்சினையும் இருக்கின்றது. எங்களுடைய விவசாயிகள், மீனவர்கள் மற்றும் சிறுசிறு தோட்டங்களை வைத்திருப்பவர்கள்மீது கவனம் செலுத்தாவிட்டால் அங்கு பாரியதோர் இடைவெளி ஏற்படுகின்றது. அதனை முதலாளிமார் பயன்படுத்தக்கூடிய வாய்ப்பு ஏற்படுகின்றது. நான் ஏற்கெனவே சொன்னதுபோல, ஒரு கிலோகிராம் கத்தரிக்காயை 100 ரூபாய்க்கு வாங்கி, அதை wholesaleஇல் 300 - 400 ரூபாய்க்கு விற்கின்ற நிலை காணப்படுகின்றது. இதனால் சாதாரண விவசாயிகள் மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். அவர்கள் கண்விழித்திருந்து, மிருகங்களிடமிருந்து பாதுகாத்தே தங்களுடைய உற்பத்திகளை மேற்கொள்கிறார்கள்.

மன்னாரில் பனை உற்பத்திமூலம் செய்கின்ற கைவினைப் பொருட்களை விற்பதற்கென இருக்கின்ற seasonஇல்தான் சில சில இடங்களில் கடைகளைத் திறக்கிறார்கள். ஆனால், அதன்மூலம் அதிகளவு வருமானம் பெறக்கூடிய வாய்ப்பு வெளிநாடுகளில் இருக்கிறது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்தக் கைவினைப் பொருட்களை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதற்கான வாய்ப்புகளை உருவாக்கிக் கொடுத்தால், அதன்மூலம் நாங்கள் அந்நியச் செலாவணியைப் பெறமுடியும். இவ்வாறான சிறு கைத்தொழில்கள்மூலம் எமது நாட்டின் பொருளாதாரத்தை முன்னேற்றுவதற்கான வாய்ப்புகளையும் ஏற்படுத்த முடியும். போரால் பாதிக்கப்பட்ட எங்களுடைய வன்னிப் பிரதேசத்திலுள்ள மக்கள் குறிப்பாக விவசாயிகளும் மீனவர்களும் இன்றைக்கும்

[ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

துன்பப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். எனவே, இந்த விடயங்களில் அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று பெற்றோல் மற்றும் மண்ணெண்ணெயின் விலைகள் அதிகரித்து இருக்கின்றபடியால், மீனவ சமூகத்தின் வருமானம் குறைந்திருக்கிறது. இன்றைக்கு எல்லா வகையிலும் விலைவாசி அதிகரித்து இருக்கின்றபடியால், சாதாரண விவசாயிகள் தங்களது உற்பத்திகளைச் சரியான முறையில் செய்ய முடியாத நிலையில் இருக்கிறார்கள். இது எங்களுடைய பிரதேசத்தில் மட்டுமல்ல, இலங்கை பூராவும் இருக்கின்ற ஒரு பாரிய பிரச்சினை! இதனை நீங்கள் நன்கு அறிவீர்கள்! உங்களுடைய கவனம் கிராமப் புறங்களில் கூடுதலாக இருக்கின்றது. இந்த விடயத்தில் கவனம் செலுத்துகின்றபோதுதான் சட்டரீதியாக வரியைச் செலுத்துகின்ற முன்னேற்றகரமான செயற்பாட்டுக்கான சந்தர்ப்பத்தை நாங்கள் ஏற்படுத்த முடியும்.

சாதாரண விவசாயிகளாக இருக்கலாம், மீனவ சமூகத்தினராக இருக்கலாம், இவர்கள் விடயத்தில் கௌரவ அமைச்சர் அவர்களும் அரசாங்கமும் கவனம் செலுத்த வேண்டும். மேலும், அன்றாட தொழில் சம்பந்தமான விடயங்களாக இருக்கலாம், பனை சார்ந்த விடயங்களாக இருக்கலாம், நெல் சார்ந்த விடயங்களாக இருக்கலாம், இப்படியான உள்ளூர் உற்பத்திகளை கிராம மட்டத்தில் ஊக்குவிக்கும்போதுதான் எங்களுடைய நாட்டை வளமானதாகக் கட்டியெழுப்ப முடியும். எனவே, இந்த விடயங்களில் மக்கள் அச்சம் கொள்ளாத ஒரு சூழலை உருவாக்கி, அவர்கள் நல்ல முறையில் செயற்படுவதற்கான வாய்ப்பை உண்டுபண்ணுவதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Mrs.) Sagarika Athauda. You have seven minutes.

[අ.භා. 4.44]

**ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට පළමු වතාවට සාම විනිසුරු තනතුර හඳුන්වා දීම සිදු වෙනවා 1801 ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ කාලයේ. විශේෂයෙන් එය හඳුන්වාදීමේ අරමුණ වෙන්නේම එය ගරු පත්වීමක්, ඒ වාගේම යහපත් සමාජ සේවයක් සිදු කරන චරිතවත් පුද්ගලයන්ට දෙන ගෞරවාන්විත පිළිගැනීමක් වශයෙන්. එහි පැහැදිලිවම දක්වනවා අපරාධ චෝදනාවන්ට ලක්වූවන්ට මේ ගෞරවාන්විත භූමිකාව දරන්න බැහැ කියලා. විශේෂයෙන් සාම විනිසුරු කාර්යභාරය විධියට දිවුරුම් ප්‍රකාශ අත්සන් කිරීම, අත්සන් සහතික කිරීම සහ සමාදාන විනිශ්චයකාරවරයකුගේ සහතිකයක් අවශ්‍ය අවස්ථාවලදී එකී ලේඛන සහතික කිරීමත් එම කාර්යභාරයේ කොටසක් වනවා.

අපේ රටේ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 සහ 45(6) යන වගන්ති මඟින් සමාදාන විනිශ්චයකාරවරුන් පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ අවසන් කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට බලතල පවරා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පෙර අපි බලන්න ඕනෑ අතීතයේ සාම විනිසුරුවන්ගේ භූමිකාව කොහොමද කියලා. විශේෂයෙන් අපට "සාම විනිසුරු" කියන නමත් එක්ක ඇහෙන නමක් තමයි සුනිල් පෙරේරා, එහෙම නැත්නම් ගෝනවල සුනිල් කියන නම. ඒ තැනැත්තාගේ නම විශේෂයෙන් සඳහන් වන්නට හේතු වන්නේම ඔහු අධිකරණයකින් වරදකරුවෙක් කරලා, ඊට අමතරව ඒ දඬුවම අභියාචනාධිකරණය තහවුරු කරලා තිබියදීත් එවකට පැවති දේශපාලන අධිකාරිය විසින් ඔහුව සාම විනිසුරුවරයෙක් විධියට නම් කරලා තිබීමයි. ඒ ගෞරවාන්විත භූමිකාවේ වගකීම් දරන්නට එවැනි අයව නම් කරපු නිසාවෙන්ම සාම විනිසුරු ධුරය, එහෙම නැත්නම් මේ තනතුර අවභාවිත වීම පටන් ගත්ත කාල සීමාව 70 දශකයේ අග භාගය කිව්වොත් නිවැරදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තනතුර ගෞරවාන්විත විධියට හඳුන්වා දුන්නත්, වරින් වර දේශපාලන බලපෑම මත පත්වීම් ලබා දීම, එහෙම නැත්නම් විධිමත් නියාමනයක් නැතිව, පිළිවෙළක් නැතිව, කිසිදු ප්‍රමිතිගත කිරීමකින් තොරව සාම විනිසුරු පත්වීම් ලබා දීම නිසා පසුගිය කාල සීමාව තුළ මේ ධුරය, එහෙම නැත්නම් මේ ගෞරවාන්විත භූමිකාව සමාජයේ බොහෝ විවේචනයන්ට ලක් වුණා. ඒ පත් වන ලද පුද්ගලයින්ගේ හැසිරීම, ඔවුන්ගේ භාවිතාව සම්බන්ධයෙන් සමාජය වරින් වර දීර්ඝ ලෙස සාකච්ඡා කරන්නට පටන් ගත්තේ එය එතරම්ම සමාජය තුළ පිළිගැනීමකට ලක් නොවූ නිසායි. මේ ගෞරවාන්විත භූමිකාවට ඒ නැති වුණු ගෞරවය නැවත ලබා දීමට නව පිරිවිතර සහ නව ප්‍රමිතියක් හඳුන්වා දීමේ අරමුණින් 2025.06.04 දිනැති අංක 2439/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරනවා. මෙමඟින් සමාදාන විනිශ්චයකාරවරුන්ගේ පත් කිරීම්, අත්හිටුවීම් සහ අවලංගු කිරීම් යටතේ වන නියෝග සංශෝධනය කිරීමක් සිදු කරලා, මෙහි ගෞරවාන්විත බව විධිමත් කිරීම වෙනුවෙන් නව රජය අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. විශේෂයෙන් එතෙක් මෙතෙක් පැවති සමාදාන විනිශ්චයකාර පත්වීම්වල වර්ගීකරණයක් දකින්නට ලැබුණේ නැහැ. සමාදාන විනිශ්චයකාරවරයකු යනු කවරෙක්ද යන්න නිවැරදි අර්ථ දැක්වීමක් දකින්න ලැබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම නව ගැසට් නිවේදනය යටතේ පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා පත් කරන ලද සමාදාන විනිශ්චයකාරවරයෙක් සහ ජනරජය සඳහා පත් කරන ලද සාමදාන විනිශ්චයකාරවරයෙක් සඳහා නිර්ණායක වෙන වෙනම දක්වා තිබෙනවා. ඒ වාගේම එයට මෙතෙක් උපරිම වයස් සීමාවක් හඳුන්වා දීමක් සිදුව තිබුණේ නැහැ. නමුත් මෙම නව නියෝග යටතේ උපරිම වයස් සීමාවක්, වාගේම අවම අධ්‍යාපන සුදුසුකම් හඳුන්වා දීමක් සිදු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මෙම නියෝග මඟින් ලේඛන සහතික කිරීම සම්බන්ධයෙන් නව නිර්දේශ හඳුන්වා දීලා තිබෙනවා වාගේම ඉංග්‍රීසි භාෂාවෙන් ලේඛන සහතික කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම මෙම සමාදාන විනිශ්චයකාර භූමිකාව දරන තැනැත්තෙකු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඔස්සේ එම ධුරය දැරීමේ ශක්නුතාව තහවුරු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාර්යයන් ඔස්සේ නව රජය බලාපොරොත්තු වෙන්නේ සමාජයේ විශිෂ්ට පුද්ගලයන්ට, ගෞරවනීය පුද්ගලයන්ට මේ ගෞරවනීය තනතුර ලබා දීමටයි. එය දැනට භාවිත වන ආකාරය වෙනස්කොට සමාජය පිළිගන්නා වූ නිශ්චිත වගකීමක් සහිත ගෞරවනීය

තනතුරක් බවට පත් කිරීමේ ආරම්භයයි මේ හරහා සිදු කරන්නේ. කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය, අඛණ්ඩතාව වැඩිදියුණු කිරීම තුළින් සමාදාන විනිශ්චයකාර ධුරය දරන පිරිස් වෙතට ගෞරවනීය බවක් එක් කරන්න මේ තුළින් අපේක්ෂා කරනවා. අපි අද උදෑසන ඉඳලා සාකච්ඡා කළේ නීතිය ශක්තිමත් විය යුතුයි, ඒ වාගේම යන්ත්‍රණ සකස් විය යුතුයි කියන කාරණයයි. පසුගිය කාල සීමාව තුළ අපේ රටේ තිබුණු භාවිතාවන් ඔස්සේ රටට සිදුවුණු පරිහානිය අපි දැක්කා. මේ ක්‍රියාවලිය වෙනස් කරලා නව ආරම්භයක් සකස් කරන්නට නව රජය ගත්තා වූ විශිෂ්ට වැඩසටහනක්, එහෙම නැත්නම් විශිෂ්ට තීරණයක් විධියට මේ 2025 ජූනි 04 දිනැති අංක 2439/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය යටතේ සමාදාන විනිශ්චයකාරවරුන්ගේ පත් කිරීම් සම්බන්ධයෙන් සකස් කරන ලද නියෝග භාවිත කරන්නට හැකියාව තිබෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Ramanathan Archchuna. You have seven minutes.

[පි.ව. 4.51]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Speaker, முதலில், எனது உரையை தமிழிலே ஆரம்பிக்கிறேன். செம்மணி மனிதப் புதைகுழி - චෙම්මනි සමූහ මිනී වළ - தொடர்பாக கௌரவ ஹர்ஷன நாணாயக்கார அவர்கள் அண்மையில் ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அதாவது, செம்மணி மனிதப் புதைகுழி என்பது செவிவழி வந்த -hearsay- செய்தியென்றும் அது உண்மையான விடயமல்ல என்றும் சொல்லியிருந்தார். இன்று வரைக்கும் 150 எலும்புக்கூடுகள் கண்டுபிடிக்கப்பட்டு இருக்கின்றன. அங்கு புதைக்கப்பட்ட எங்களுடைய இரத்த சொந்தங்களது உடலங்கள் இப்போது மீண்டும் தோண்டி எடுக்கப்படுகின்றன. அதனோடு சேர்த்து எங்களுடைய வலிகளும் தோண்டப்படுகின்றன. ஆகவே, நாங்கள் இது தொடர்பில் ஒரு சர்வதேச விசாரணையைக் கேட்கின்றோம்.

இரண்டாவது விடயம், என்னுடைய முகப் புத்தகத்திலே ஒரு கருத்தைத் தெரிவித்ததற்காக நேற்றைய தினம் PTAஇன்கீழ் CIDக்குகு அழைத்து என்னை விசாரித்தார்கள். ஒரு பாராளுமன்ற உறுப்பினரை அவ்வாறு அழைப்பதால் ஒரு பிரச்சினையும் இல்லை. ஆனால், ஆனந்த சுதாகரன் போன்ற எத்தனையோ எங்களுடைய சகோதரர்கள் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் தடுத்து வைக்கப்பட்டு இருக்கிறார்கள். அவர்களை அதே PTAஇன்கீழ் 20 - 25 வருடங்கள் தடுத்து வைத்திருக்கிறீர்கள். நீங்களும் ஒரு போராட்டக் குழுவின் அங்கத்தவர்தான். ஆகவே, அவர்கள் சம்பந்தமாகவும் நடவடிக்கை எடுக்குமாறு உங்களை அன்பாகக் கேட்டுக்கொள்கிறேன்.

கௌரவ ஹரினி அமரசூரிய அவர்கள் அண்மையில் யாழ்ப்பாணத்துக்கு வந்து education reform சம்பந்தமாக நடத்திய meetingஇல் ஆசிரியர்களும் அதிபர்களும் நித்திரை செய்தமை ஒரு பாரதூரமான விடயமாகப் பேசப்படுகின்றது. ஐயா, தாங்களும் ஒரு வைத்தியர். நீங்களும் research ஒன்றைச் செய்திருப்பீர்கள். நாங்கள் பெரிய reform ஒன்றைச் செய்வதற்கு முன்னர் ஓரிடத்திலே pilot studyஐச் செய்ய வேண்டும். அதிலே வரும் research findingஐ வைத்துத்தான் ஒரு வேலையைச் செய்ய வேண்டும். அதைவிடுத்து, எடுத்த எடுப்பிலே educationஐ தலைகீழாக மாற்றுவதையிட்டு உண்மையாகவே நான் கவலைப்படுகிறேன்.

அடுத்து, நல்லூர் மணல் தொடர்பாகப் பேச வேண்டும். இன்றைய தினம் நான் கதைப்பதற்காக இருந்த விடயம் வேறு. அதைப் பற்றி கதைக்க வேண்டாமென என்னைக் கேட்டிருந்தபடியால், நல்லூர் மண்ணோடு நிறுத்தி விடுகிறேன். அந்த மண் தொடர்பில் நியாயம் கிடைக்க வேண்டும். முன்னர் இருந்தது போன்று அது இருக்க வேண்டும் அல்லது அங்கு என்ன நடக்கின்றதென DCC meetingஇல் தெரியப்படுத்த வேண்டும்.

මම තව ටිකක් කියන්නයි යන්නේ, සිංහලෙන්. මම සිංහලෙන් කථා කළොත් ඔබතුමන්ලා වැඩියෙන්ම සතුටු වෙනවා. මට සමහර වෙලාවට වචන ටිකක් වැරදෙනවා. මට වචන මොනවා හරි වැරදුණොත් සමාවෙන්න. මෙච්චර කාලයක් මගේ නම කියලා "කොටි, කොටි" කියලා කිව්වා. ඔයගොල්ලන් 159දෙනාම මට කිව්වා, "ඔන්න කොටියා උතුරේ ඉඳන් ආවා" කියලා. හැබැයි, දැන් ඔයගොල්ලන් මාදිවෙල ගැන තිබෙන comments පොඩ්ඩක් කියවලා බලන්න. මාව ඊයේ CID එකට කැඳෙව්වා. ඔයගොල්ලන් ඒ comments ටිකක් කියවන්න. එතකොට ඔයගොල්ලන්ට තේරෙයි කවුද කොටියා, කවුද ත්‍රස්තවාදියා, කවුද මිනිසුන් වෙනුවෙන් පෙනී හිටින්නේ කියලා. ඒක ඔයගොල්ලන්ට දැනගන්න පුළුවන්. හැබැයි, මට දුකයි. අනුර කුමාර ජනාධිපතිතුමා ඡන්දය ඉල්ලපු කාලයේ උතුරේ ප්‍රසිද්ධියේ කථා කරන කොට මිනිස්සු දන්න පුද්ගලයෙක් විධියට මම විතරයි කිව්වේ, "අනුර කුමාර දිසානායකට අපි අනිවාර්යයෙන් support එකක් දෙන්න ඕනෑ" කියලා. එහෙම කියපු පුද්ගලයා මම. හැබැයි, දැන් මාව විපක්ෂයට ගෙන්නලා අන්තිමට මගේ කටත් වහලා, නඩු 25කුත් දාලා තිබෙනවා. මම MP කෙනෙක් විධියට hospital එකට ගිහිල්ලා මිනිසුන්ට වෙච්ච අසාධාරණ ගැන ටිකක් අහන්න යනකොට රාජකාරියට බාධා කිරීම කියලා නඩුවක් දැම්මා. ඊට පස්සේ ඒක ගැන complain කරන්න පොලීසියට ගියා. එතකොට පොලීසිය ආයෙත් නඩුවක් දැම්මා, රාජකාරියට බාධා කෙරුවා කියලා. ආපහු ඇවිල්ලා ඒක ගැන පාර්ලිමේන්තුවේ කථා කළා. පාර්ලිමේන්තුවෙනුත් මගේ කට වැහුවා. මිනිස්සු මේවා දිහා බලාගෙන ඉන්නවා. ඒක පොඩ්ඩක් හිතන්න.

ලොකුම දේ තමයි අපේ education reforms. අපේ history එක ගැනත් බලන්න ඕනෑ. අපි education system එක සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනෑ. ඔයගොල්ලන් දකින්න ඇති අද Vote එකේදී මම "Abstain" කියලා දැම්මා. හේතුව, අලුත් ආණ්ඩුවක් ආවාම විපක්ෂයේ ඉන්න කෙනෙක් හරි පොලීසියේ කෙනෙක් හරි, කවුරු හරි අල්ලලා ජම්පර් අන්දලා හිරේ දමනවා. ඊට පස්සේ ඒගොල්ලන් බලයට ආවාම ඔයගොල්ලන් කිහිපදෙනෙකුට ජම්පර් මහනවා. ඒක අනිවාර්යයි. ජම්පර් මහලා ඔළුවට දමනවා. ඔය විධියට ඔයගොල්ලන් දෙපැත්තට කරන සෙල්ලමෙන් අහිංසක පුද්ගලයන්ට, මේ රටේ ඉන්න ලක්ෂ 225කින් 225දෙනෙක් අයින් කළාම ඉතුරු මිනිස්සුන්ට අද කන්න නැහැ, බොන්න නැහැ, පාරවල්වල යන්න බැහැ. ඔයගොල්ලන් ටොන්පව ගහලා නේ බලයට ආවේ. මේ ආණ්ඩුව කිව්වා, උගන්ඩාවල තිබෙන සල්ලි ටික ගේනවා කියලා. ඒ සල්ලි කෝ? ඒ සල්ලි ආවේ නැහැ. ඔයගොල්ලන් කිව්වා, අනුරාධපුරයේ තිබෙන වැව් රක්ෂිතවල අනවසර ඉදිකිරීම් ගැන. ඩඩ්ලි මහත්තයාටත් නඩුවක් දමනවා කිව්වා. කවුරු හරි ඇමති කෙනෙක් කියපු කථාවක් මම බැලුවා. නඩුවක් දාලා ඒක

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

සම්පූර්ණයෙන්ම අයින් කරනවා කිව්වා. දැන් කියනවා, වැට අයින් කරනවා කියලා. අන්තිමට කිව්වා වැටත් හරි, හරියටම ගහලා තිබෙනවා, ඒ නිසා අපි ඒක තියාගන්නවා කියලා. ඒ වාගේ ටොන්පව ගහලා ගහලා අපේ මිනිස්සුන්ට එපා වෙලා තිබෙන්නේ.

ඔයගොල්ලන් හිතනවා නම්, අපි තව පාරක් ආණ්ඩුවක් හදන්න ඕනෑ, මම ජනාධිපති වෙන්න ඕනෑ කියලා, ඒවා ගැන මම කථා කරන්නේ නැහැ. මම කථා කරන්නේ, උතුරේ ඉන්න මිනිස්සුන්ගේ, දකුණේ ඉන්න මිනිස්සුන්ගේ හිතේ තිබෙන දේවල්. ඔයගොල්ලන් හිතලා බලන්න, සාමාන්‍ය ව්‍යවසායකයෙක්, එහෙම නැත්නම් ත්‍රීවීල් එකක් දුවන කෙනෙක් ගැන. අද ඒගොල්ලන්ගේ බඩ පිරෙනවාද කියන්නකෝ. ඒගොල්ලන් තවම ඒ විධියටම, දුප්පත් විධියටම ඉන්නවා. ඔයගොල්ලන් කිව්වා, "අපි කවදාවත් වාහන පාවිච්චි කරන්නේ නැහැ" කියලා. එක දවසක් මම පාර්ලිමේන්තුවට එනකොට මාව පොලිසියෙන් නැවැත්තුවා. "ඇයි?" කියලා මම ඇහුවා. "හරිනි අමරසූරිය මැඩම් එනවා" කිව්වා. "එතකොට මම නැවතිලා ඉන්න ඕනෑද? මම විනාඩි 5ක් පරක්කුයි නේද?" කියලා මම ඇහුවා. "නැහැ, නැහැ. මැඩම් එනකම් doctor වුට්ටක් ඉන්න" කියලා මාව විනාඩි දෙකක් එතැන නවත්වා ගෙන හිටියා. කලින් ඔයගොල්ලන් මොනවද කිව්වේ? "අපි බස්වල යනවා, අපි කෝච්චිවල යනවා" කිව්වා. Jaffnaවලටත් ඇවිල්ලා ඔය වාගේ scenesදාලා, photos දාලා ගියා. එහෙම කරන්න එපා. කරුණාකරලා ඔය වාගේ ඒවා කරන්න එපා. මිනිස්සු හිනා වෙනවා. මිනිස්සු ඔයගොල්ලන්ට "ජෙප්පෝ" කියලා බණිනවා. YouTube එක බලන්න. දැන් ගොඩක් අය බලන්නේ phone එක නේ. අද ඒ නිව්ස් එක "හිරු" එකේ දමනවා; "දෙරණ" එකේ දමනවා; "දසත" එකේ දමනවා. ඒගොල්ලන් දමන එකේ comment එක කරුණාකරලා අරගෙන කියවන්න.

ඔයගොල්ලන් කිව්වා, "අපිට පඩි ඕනෑ නැහැ" කියලා. අන්තිමට කිව්වා, කලින් හිටපු ජනාධිපතිතුමාලාගේ වරප්‍රසාද ටික ඔක්කොම අයින් කරනවා කියලා. ඕනෑ නම් අස්වැසුමට apply කරන්න කියලා මන්ත්‍රී කෙනෙක් කිව්වා. හිතලා බලන්න. ලබන අවුරුද්දේ ඔයගොල්ලන් තුන්දෙනෙක් හරි හතරදෙනෙක් හරි තමයි ඉතුරු වෙන්නේ. එතකොට අනෙක් 154ට -ආණ්ඩු පක්ෂයේ ඉන්න මේ මිනිස්සුන්ට- අස්වැසුම දෙන්න වෙනවා. කරුණාකරලා MP කෙනෙකුගේ ගරුත්වය තියාගන්න. ජනාධිපති කියන ගරුත්වය තියාගන්න try කරන්න.

"සෙබළා" කියන්න එපා. ඒගොල්ලන් රණවිරුවෝ. ඒගොල්ලන් ඔයගොල්ලන් වෙනුවෙන් මැරුණේ. අපේ විරුවන්ට, අපි වෙනුවෙන් මැරිච්ච ප්‍රභාකරන්ට අදටත් ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ මම කියනවා, "අපේ දෙයියෝ" කියලා. එකම හේතුවයි තිබෙන්නේ. එයා අපි වෙනුවෙන් මැරුණා. ඔයගොල්ලන්ගේ රෝහණ විජේවීරට "දෙයියෝ" කියලා මම කියනවා. මොකක්ද හේතුව? ඒගොල්ලන් ඔයගොල්ලන් වෙනුවෙන් මැරුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, your time is up.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තවත් තත්පර 20ක් දෙන්න, මම ඉක්මනින් කථාව ඉවර කරන්නම්.

ඔයගොල්ලන්ට කොන්ද පණ තියෙනවා නම්, ඔයගොල්ලන් වෙනුවෙන් මැරිච්ච ඒ අයට "රණ විරුවෝ" කියලා කියන්න ඕනෑ. ඒකට කාටවත් නඩු දමන්න බැහැ. ඔයගොල්ලන්ට 159ක් ඉඳලාත් පාර්ලිමේන්තුව ඇතුළේදී එහෙම කියන්නේ නැහැ. පුළුවන් නම් එක්කෙනෙක් හරි නැඟිටලා කියන්නකෝ "ඒගොල්ලෝ රණ විරුවෝ" කියලා. අනේ ඒ වාගේ ටොන්පව ගහන්න එපා. මිනිස්සු ඔයගොල්ලන්ට කෙළ ගහනවා. තව පොඩ්ඩක් යනකොට මිනිස්සු ගල් ගහනවා; ඔයගොල්ලන්ගේ ගෙවල් ගිනි තියනවා. හැබැයි, ඒකට මම කැමති නැහැ. ඔයගොල්ලන් ලබන සැරේත් ඡන්දෙ ඉල්ලලා වැඩේ අවුල් වුණොත් ඔයගොල්ලන්ට ආපහු teacher විධියට, principal විධියට යන්න බැහැ. එතකොට මිනිස්සු ඔයගොල්ලන්ට අනිවාර්යයෙන් දඬුවම් දෙනවා. හැබැයි, පොඩ්ඩක් හිතලා බලන්න. ඔයගොල්ලන්ට හොඳ දෙයක් මම කියන්නම්. ඒක ගැන හිතලා බලන්න. පුළුවන් නම් ඔයගොල්ලන් වෙච්ච පොරොන්දු ඔක්කොම ටික ඉෂ්ට කරන්න. Jaffnaවල හොරෙක් අල්ලගෙන ඇවිල්ලා ඔයගොල්ලන් පත් කර තිබෙනවා. මම ඒක ගැන කථා කරන්න documents ටිකක් ගෙනාවා. හැබැයි, මට chance එකක් දෙන්න කියලා ඉල්ලපු නිසා මම මේ කථාව නවත්වනවා.

Thank you very much.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Handunnetti. You have 12 minutes.

[අ.භා. 4.58]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ වන නියෝගවල විශේෂ වැදගත්කමක් තිබෙනවා, අපේ දේශීය කර්මාන්තවලට. දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම පිළිබඳව අපි අවස්ථා කිහිපයකදීම ව්‍යාපාරිකයන් ඇතුළු අදාළ පාර්ශ්ව එක්ක සාකච්ඡා කළා. විවෘත ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන යථාර්ථයන් යටතේ පසුගිය කාලය පුරාම ආ ලොකුම මැසිවිල්ල තමයි ආනයනවලින් ඇති වන බලපෑම හේතුවෙන් අපේ රටේ තිබෙන දේශීය කර්මාන්ත බොහොමයක් අනතුරට පත් වුණා කියන එක.

මේකෙන් ප්‍රධාන වශයෙන්ම අද ආරක්ෂා වෙන ක්ෂේත්‍ර තිබෙනවා. මම ගරු වෙළෙඳ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ නියෝග ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කෙටි කාලයක් තුළ සම්මත කිරීමට කටයුතු කිරීම වෙනුවෙන්. විශේෂයෙන්ම සනීපාරක්ෂක ඇඳුම් කර්මාන්තයේ නියුතු අපේ දේශීය කර්මාන්තකරුවන් ඉන්නවා. ඒ වාගේම, bathroomsවලට අවශ්‍ය නාන උපකරණ - bathware - වාගේ නිෂ්පාදනවල සහ tile industry එකේ නියුතුව ඉන්නවා, විශාල පිරිසක්. ඒ වාගේම, leather products. පාවහන් සහ පාවහන් ආශ්‍රිත කර්මාන්තවල නියැළී ඉන්න දේශීය කර්මාන්තකරුවන් විශාල පිරිසකට අද මේ නියෝග සම්මත වීමෙන් විශාල ආරක්ෂාවක් ලැබෙනවා. මා හිතන හැටියට අපේ උතුර නියෝජනය කරන මන්ත්‍රීතුමාත් ඒ පළාතේ ඉන්න ඒ කර්මාන්තකරුවන් ගැන වචනයක් හරි කථා කළා නම්

අගනේ ය. එතුමා ගොඩක් දේවල් කියමින් කථා කරන්න ආවත්, අන්තිමට කථා කරන්න දෙයක් නැහැ කියලා වාඩි වුණා. Anti-dumping කිව්වාම, එතුමාට හිතෙන්නේ අත පය කඩන *[බාධා කිරීමක්]* වෙම්මනි මීනී වළ වාගේ එකක් කියලා. වෙම්මනි මීනී වළ කියලා තමයි එතුමා හිතන්නේ. Anti-dumping කිව්වාම හිතන්නේ අත පය කඩන එකක් කියලා, මීනී ඇටකටු කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති, යාපනයේ - උතුරේ - මේ leather products කරන අය විශාල පිරිසක් ඉන්නවා කියලා. *[බාධා කිරීමක්]* ඒ අය ගැන වචනයක් හරි පාර්ලිමේන්තුවේ කථා කරන්න, *[බාධා කිරීමක්]* මේ වාගේ වැදගත් වෙලාවකවත්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අඩුම ගණනේ ඒවා හොයාගෙන එන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අඩුතරමින් වෙලාවක් හම්බ වුණාම වචනයක් කියන්න, අපේ පළාතේත් දේශීය කර්මාන්තරුවන් ඉන්නවා කියලා. දේශීය කිව්වාම, தேசிய மக்கள்! ඔක්කෝම ජනතාව; எல்லோரும் தேசிய மக்கள். එතකොට ඒ උතුරේ ජනතාවත් අපේ ජනතාව. ඒ ඔක්කෝම ජනතාව ගැන කථා කරන්න, ඒ කර්මාන්ත ගැන කථා කරන්න. මේ නියෝගවලින් ආරක්ෂාව දෙන්නේ දකුණට, දකුණේ ජනතාවට විතරක් නොවෙයි, දේශීය මක්කල්; මුළු රටේම ජනතාවට. එල්ලාම්. ඊළාම් නොවෙයි. හරිද? ඒක හින්දා ඒ ගැන පොඩ්ඩක් කල්පනා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම කියන්නකෝ පොඩ්ඩක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ tile industry එක ගත්තොත්, අපේ tile industry එක අද දේශීය කර්මාන්තයක් හැටියට සම්පූර්ණයි. නමුත් අපි දන්නවා, වෙළෙඳ පොළට ගියාම අපේ වෙළෙඳ පොළේ -දේශීයව- රැකියා සපයන, පවුල් ගණනාවක් ජීවත් වෙන, දේශීය ටයිල්වලට වඩා ඉතාම අඩු මිලට ටයිල් තිබෙනවා කියලා. එතකොට හුඟක් අය පෙලඹෙනවා, ඒ ටයිල් මිලදී ගන්න. ඒක තමයි යථාර්ථය. පාරිභෝගිකයා බලන්නේ අඩු මිලට මිලදී ගන්න. හැබැයි සමහර විට ඒ අඩු මිලට වෙළෙඳ පොළට එන ඒවා ගත්තාම, චීනය, තායිලන්තය වාගේ වෙන රටක නිෂ්පාදන පිරිවැයටත් වඩා අඩු ඒවා තමයි මෙහාට dump කරලා තිබෙන්නේ. එහෙම dump කළාය කියලා අපේ වෙළෙඳ පොළේ කිසිම සාධාරණ තරගයක් කරන්න පුළුවන් ආරක්ෂණයක් අපේ කර්මාන්තකරුවන්ට තිබුණේ නැහැ. අද අන්න ඒ ආරක්ෂණය තමයි අපි හදන්නේ. අද මේ හදන කොමිෂන් එක, මේ හදන යන්ත්‍රණය පිළිබඳව tile industry එකේ ඉන්න සියලු අය දැනුවත් කරලා තිබෙන්නේ. එතකොට ඒ අයට පුළුවන් තිබෙන යම් පැමිණිල්ලක් කරන්න මේ යන්ත්‍රණයට. ඒ පැමිණිල්ල කළාම උතුරේ, දකුණේ හැම තැනම ඉන්න අයට මූලාශ්‍රයේ මිල හොයාගෙන යන්න පුළුවන්. Sri Lanka Customs එකෙන් ලංකාවට එවපු මිල බලන්න පුළුවන්. මූලාශ්‍රය හැටියට ටයිල් නිෂ්පාදනය කරපු රටින් අපේ රටට එවන ලද භාණ්ඩවල ඇත්ත මිල හොයන්න පුළුවන් නිල අයිතියක් අද අපට පාර්ලිමේන්තුවෙන් ලැබෙනවා. ඒක මේ කර්මාන්තකරුවන් හැමෝටම ලැබෙන වාසියක්, සහනයක්. එතකොට කර්මාන්තකරුවන් රැවටීමට ලක් වෙන්නේ නැහැ. පාරිභෝගිකයා රවටන්නත් බැහැ. කර්මාන්තයත් ආරක්ෂා වෙනවා.

අපේ සපත්තු කර්මාන්තය ගත්තොත්, පිට රට තිබෙන මට්ටමට වඩා ඉහළ මට්ටමේ සපත්තු සමහර තැන්වල තිබෙනවා. එවැනි අපේ දේශීය නිෂ්පාදන තිබෙනවා. අපේ ඩීඑස්අයි, බාටා වාගේ නිෂ්පාදන ගත්තොත්, ඒවා හොඳ brand එකක් වෙලා තිබෙනවා. හැබැයි පිටරටින් ගෙනෙන සපත්තු ජෝඩුවට සියයට 300ක් tax කළත්, exhibitionsවලට ගිහිල්ලා බැලුවාම ඒවා රුපියල් 800ට, 900ට තිබෙනවා. ඒක පාරිභෝගිකයාට සහනයක් බව ඇත්ත, තාවකාලිකව. හැබැයි ඒක අපේ ජාතික ආර්ථිකයට විශාල හානියක්. මේ නිසා දේශීය කර්මාන්ත විශාල ප්‍රමාණයක් වැහිලා ගියා පසුගිය කාලයේ. ඒවා ගැන complain කරන්න තැනක් නැහැ. ඒ නිසා ඒවා එහෙම විකුණනවා.

මම මේ පාර්ලිමේන්තුවේ ම මීට කලින් මේ ගැන කථා කරලා තිබෙනවා. අපේ රටේ ගිනිපෙට්ටි හදන අය ඉන්නවා. උතුරේ, ගිනි පෙට්ටි කර්මාන්තය කරන අය ඉන්නවා. නැඟෙනහිර පළාතේත් ඉන්නවා. හැබැයි, ගිනිපෙට්ටියේ නිෂ්පාදන වියදමට වඩා අඩු මිලකට, රුපියල් 20ට, 30ට ලයිටර් තිබෙනවා පාරේ. පිටකොටුවට ගියාම ගොඩගහලා තිබෙනවා, ලයිටර්. ඒ ලයිටරයේ මිල අපේ දේශීය ගිනිපෙට්ටි නිෂ්පාදකයෙක් ගෙවන tax එකටත් වඩා අඩුයි. අන්න ඒවා ගැන කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඒවා ගැන කථා කරන්න. ඒවා ගැන කථා කළාම- *[බාධා කිරීමක්]* මීනී වළ ගැන විතරක්ම නොවෙයි, කථා කරන්න ඒවා ගැනත්. එතකොට ඔබතුමාගේ ජනතාවත් ඔබතුමා ගැන හිතාවි, ඔබතුමාට පාර්ලිමේන්තුවට එන්න ගහපු කතිරෙත් පොඩි හරි වටිනාකමක් තිබෙනවා කියලා.

මාතෘකාවට අදාළව කථා කරන්න දන්නවා කියලා ඒ අය හිතයි. මොකද, ඉස්කෝලේ යන පොඩි ළමයි පවා මාතෘකාවට අදාළව කථා කරන්න දන්නවා. පාර්ලිමේන්තුවට ආවාට පස්සේ මන්ත්‍රීවරු 225දෙනා මාතෘකාවට අදාළවත් කථා කරන්න දන්නේ නැහැ කියන එක ටිකක් හොඳ මදි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සභාවේ සිද්ධ වෙන දේවල් මේ මොහොතේත් පොඩි පාසල් දරුවන් මහජන ගැලරියේ ඉඳන් බලාගෙන ඉන්නවා. මේ පොඩි දරුවෙකුට දුන්නා නම්, මේ පොඩි දරුවෝ මාතෘකාවට අදාළව කථා කරනවා. අර මාමා මාතෘකාවට අදාළව කථා කළේ නැහැ නේද, පුතේ? අර මාමා මාතෘකාවට අදාළව කථා කළේ නැහැ නේද? අන්න ඒකයි. ඒ කියන්නේ, පොඩි ළමයින්ටත් ලජ්ජයි. අර මාමා දන්නේ නැහැ මාතෘකාවට අදාළව කථා කරන්න. හැබැයි, ඒ මාමා දෙමළෙන් කියන්න ඕනෑ ටික ගාණට ඒ අයට ගැළපෙන්න කියනවා. සිංහලෙන් කියන්න ඕනෑ ටික මේ පැත්තට ගැළපෙන්න කියනවා. ඒක මාමා දන්නවා, හොඳට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම සපත්තු කර්මාන්තය ගත්තොත්, leather products ගත්තොත්, අපි ජාත්‍යන්තර මට්ටමින් තරග කරන්න පුළුවන් මට්ටමක අද ඉන්නවා. අපේ නිෂ්පාදන අද එවැනි තැනක තිබෙනවා. හැබැයි, වෙළෙඳ පොළට ගිහිල්ලා බලන්න. ඉතාම අඩු මිලට මේ දේවල් අද වෙළෙඳ පොළේ තිබෙනවා. මේ දේවල් අඩු මිලට පාරිභෝගිකයාට සපයන එකේ වරදක් නොවෙයි මේ තිබෙන්නේ. නමුත් අඩු මිලට තිබෙන එකේ quality එක ගැන සහතිකවීමක් නැහැ. අද මේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග මේ පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් පස්සේ අපි අන්න ඒ ආරක්ෂණය දෙනවා. ඒ නිසා දේශීය සපත්තු කර්මාන්තයේ ඉන්න අයට, සනීපාරක්ෂක උපකරණ, සනීපාරක්ෂක ඇඳුම් හදන අයට, bathware, ටයිල් කර්මාන්තයේ ඉන්න අයට අද ලොකු ආරක්ෂණයක් හදනවා මේ හරහා. ඒක තමයි අද මේ කරන්නේ. ඒක කළාට පස්සේ අපේ දේශීය නිෂ්පාදන ආරක්ෂා වෙනවා කියලා අපි දන්නවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකත් එක්කම අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, - අපි වෙළෙඳ අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා - ජාතික තීරුබදු ප්‍රතිපත්තිය - National Tariff Policy එක - පාර්ලිමේන්තුවට ගේන්න. මොකද, එතකොට අපට සැරින් සැරේ, වරින් වර බදු වෙනස් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ නීතිමය රාමුව ඇති වෙනවා නම් අනිවාර්යයෙන්ම  ආයෝජකයෝ, ලංකාවට විදේශ වශයෙන් එන අය, joint venturesවලට එන අය, අපිත් එක්ක එකට වැඩ කරන අය, අපේ දේශීය කර්මාන්තකරුවන්, ආයෝජකයෝ දන්නවා  මෙන්න මේක තමයි අවුරුදු 5ත් තුළ අපේ ජාතික ප්‍රතිපත්තිය, අපේ තීරුබදු ප්‍රතිපත්තිය, අපේ ආරක්ෂණය කියලා. අපේ ආයෝජන අවස්ථාව මේක තමයි කියලා ඔවුන් දන්නවා.  අද කොටස් වෙළෙඳ පොළ ශීඝ්‍ර වර්ධනයක් ලබා තිබෙනවා. 20,000 ඉලක්කය සම්පූර්ණ කළා පසුගිය දවසේ. ඒ කියන්නේ, මේක එකින් එක පරස්පර වන අවස්ථාවක් නොවෙයි. උච්චාවචනය වන කොටස් වෙළෙඳ පොළක් නොවෙයි, අද ස්ථාවර කොටස් වෙළෙඳ පොළක් රටේ හැදිලා තිබෙනවා. ඒ වර්ධනය ක්‍රමිකව ස්ථාවරව ඉදිරියට යනවා.

පසුගිය දවසේ අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 8ක සීමාවේ ඉක්මවා ගියා. ඒක විශාල වර්ධනයක්. ජූලි මාසය කියන්නේ අපට සංචාරක කර්මාන්තයේ season එකක් නොවෙයි. හැබැයි, අපේ රටට මේ ජූලි මාසයේ දෙලක්ෂයකට වඩා සංචාරකයන් ආවා. ඒ සියල්ල සිද්ධ වෙන්නේ එක පද්ධතියක් හැටියට. මේ system එකේ ඇති වන නීතිය ස්ථාපිතවීම, සාධාරණත්වය නිර්මාණය වීම, අවස්ථා ඇතිවීම, ආයෝජන පිළිබඳ විශ්වාසය නිර්මාණය වීම, ජාත්‍යන්තර වශයෙන් අපි ලබාගෙන තිබෙන ප්‍රමිතිකරණය, ජාත්‍යන්තර වශයෙන් ආයෝජන පිළිබඳ අපට ඇවිල්ලා තිබෙන විශ්වාසය, එක්සත් ජනපදයෙන් අපට ලැබිච්ච තීරුබදු සහනය යන මේ සියල්ල එක ක්‍රියාවලියක්.  විශේෂයෙන්ම නොතේරෙන, නවක, අත්දැකීම් නැති, පළපුරුද්ද නැති  මේ ඇමති මණ්ඩලය ආවොත් මාස 6කින් මේ රටේ සාගතයක් ඇති වේවි, මේ රටේ මිනිස්සුන්ට කන්න බොන්න නැති වේවි, මේ රට වැනසේවි කියලා ප්‍රාර්ථනා කරපු ඔබේ ප්‍රාර්ථනාව විනාශ වෙලා ගිහිල්ලා, නීතියේ ආධිපත්‍යය හරියට ස්ථාපිත වන, හොරුන්ට දඬුවම් දෙන, පාතාලය හෙල්ලිලා තිබෙන රටක් බවට පත්වී තිබීම පිළිබඳව අපි සතුටු වෙනවා. අද මේ රට යම්කිසි system එකකට, සැලැස්මකට අනුව ක්‍රියාත්මක වන තත්ත්වයකට පත්වීමේ ප්‍රතිඵල තමයි මේ තිබෙන්නේ. එහිදී පාර්ලිමේන්තුවක වගකීම තමයි, ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වගකීම තමයි මෙන්න මෙවැනි වටිනා අණ පනත් යුහුසුලුව ගෙනැල්ලා සම්මත කරන එක. ඒක නිසා Anti-Dumping and Countervailing Duties Act එකට ගේන නියෝග අද මේ පාර්ලිමේන්තුවේ සම්මත වීම, ජාතික ආර්ථිකයේ අපේ පංගුව ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්, අපේ දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වැදගත් වන බව අපි විශ්වාස කරනවා.  වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, අපේ ගරු ඇමතිතුමාටත්  විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් මම ස්තුතිවන්ත වෙනවා. එ◌ි වාගේම මේ ක්‍රියාවලියට සහාය දක්වපු, මැදිහත් වෙච්ච විශාල පිරිසක් ඉන්නවා. අපේ national Chambers of Commerce, අපේ දේශීය නිෂ්පාදකයන්, දේශීය නිෂ්පාදන සංගම්, ඒ සියලුදෙනා මේකට ගොඩක් සහාය දැක්වූවා. අපි සාකච්ඡා වට ගණනාවක් කළා. අපි අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා වට ගණනාවක් කළා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අද මේ නියෝග සම්මත වන්නේ. ඒ නිසා මේක විහිළුවක් නොවෙයි. රටක් හැටියට මේක අපට හොඳ අවස්ථාවක්, ඉදිරියේදී අපි කරන්න බලාපොරොත්තු වන නව කර්මාන්ත ජනපද, නව කර්මාන්ත ගම්මාන, දේශීය කර්මාන්ත, ව්‍යවසායක ගම්මාන නිර්මාණයේදී. ඒ වාගේම අප අවිශ්වාස කරපු කර්මාන්තකරුවන් පවා මේ ලැබිච්ච අවස්ථාව නිසා අලුත් කර්මාන්තවලට, අලුත් නිෂ්පාදනවලට පෙලඹෙයි කියලා අපි විශ්වාස කරනවා. අද අපේ දේශීය කර්මාන්තකරුවන්ට ලොකු ආරක්ෂණයක් අපි ලබා දෙනවා, මේ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග පාර්ලිමේන්තුවේ සම්මත කිරීම තුළින්. ඒ නිසා මේක අපේ දේශීය කර්මාන්තකරුවන් ලබපු ජයග්‍රහණයක්. අපේ ආරක්ෂණය ලබපු ජයග්‍රහණයක්. අපේ ජාතික ආර්ථිකය ලබපු ජයග්‍රහණයක්. ඒ නිසා මේ පද්ධතිය ඉදිරියටත් සාර්ථකව පවත්වාගෙන යන්න හැකි වේවා  කියා ප්‍රාර්ථනා කරමින්, මේකට සහාය දුන් හැමෝටම  ස්තුතිය පළ කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thurairasa Ravikaran. You have four minutes.

Order, please! Will an Hon. Member propose the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne to the Chair?

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
Sir, I propose that the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය  කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) KAUSHALYA ARIYARATHNE took the Chair.*

[பி.ப. 5.11]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதமானது, மிகைப்பொருள் திணிப்பெதிர்ப்பு மற்றும் எதிரீட்டுத்தீர்வைகள் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் சம்பந்தமானது. இந்த விடயத்தில் அரசாங்கம் சிறப்பான முறையில் செயற்பட வாழ்த்துகின்றேன்.

அந்நிய ஆக்கிரமிப்புக்கு எதிராக இறுதிவரை போராடிய எமது வன்னி இராச்சியத்தின் இறுதி மன்னனான மாவீரன் பண்டாரவன்னியனை நினைவுகூரும் மாதம் இதுவாகும். அந்த வகையில், மாவீரன் பண்டாரவன்னியனுக்கு இவ்வுயரிய சபையில் தலைசாய்த்து, எனது அஞ்சலியைத் தெரிவித்துக் கொள்கின்றேன். அத்துமீறிய ஆக்கிரமிப்புகள் தற்போதும் எமது வன்னி மண்ணில் இடம்பெற்று வருகின்றன. அதன் ஒரு கட்டமாகத்தான் மன்னாரில் எமது மக்கள் காற்றாலை மின்னுற்பத்திக் கோபுரங்களுக்கு - *[இடையீடு]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග පොත ගන්නකෝ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පොත ගන්න, මම කියවන්නම්. නැත්නම් මම කියන එක තේරෙන්නේ නැහැ නේ. පොත ගන්නකෝ. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 91(a) යටතේ මෙසේ තිබෙනවා:

> "Every Member shall address his observations to the Speaker... "

ඒ කියන්නේ, Speakerට විතරයි address කරන්න පුළුවන්. "උතුරේ ඉන්න මන්ත්‍රීතුමා" කියලා මට කථා කරපු එක සම්පූර්ණයෙන්ම වැරදියි. අනෙක් එක, උතුර ගැන කියපු නිසා කියන්න ඕනෑ, මට තත්පරයක් දෙන්න, මම ඉවර කරන්නම්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. හොඳ එකක් කියන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, උතුරේ මන්ත්‍රීවරු තව ගොඩක් ඉන්නවා නේ. ඒ නිසා, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. මගේ මුහුණ බලලා "මාමා" කියලාත් කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට මේක කථා කරලා ඉවර කරන්න දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, அது point of Order இல்லை.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙෙරාසා රවිකරන් මන්ත්‍රීතුමා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
தற்போதும் எமது வன்னி மண்ணில் அத்துமீறிய ஆக்கிரமிப்புகள் இடம்பெற்று வருகின்றன. அதன் ஒரு கட்டமாகத்தான் மன்னாரில் எமது மக்கள் காற்றாலை மின்னுற்பத்திக் கோபுரங்களுக்கு எதிர்ப்புத் தெரிவித்துப் போராடி வருகின்றனர். மன்னார் மக்கள் ஏற்றுக்கொள்ளாத, அந்த மக்கள் அனுமதிக்காத இந்தக் காற்றாலை மின்னுற்பத்திக் கோபுரங்களை அங்கு நிறுவுவதற்கு அமைச்சரவை அனுமதி வழங்கியுள்ளது. இந்த நிலையில், மன்னாரில் காற்றாலை மின்னுற்பத்திக் கோபுரங்களை நிறுவும் நோக்கில் எடுத்துவரப்பட்ட காற்றாலை மின்னுற்பத்திக் கோபுரத்தின் பாகங்கள் மன்னார் மக்களால் தள்ளாடிப் பகுதியில் வைத்து வழிமறிக்கப்பட்டுள்ளன. மக்கள் வீதிக்கு இறங்கி தொடர் போராட்டத்தில் ஈடுபட்டுள்ளனர். ஒருபுறம் அந்த மக்கள் சட்டரீதியாகவும் போராடவேண்டிய நிலை ஏற்பட்டுள்ளது. *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා. එතුමාගේ කථාවෙන් පසුව ඔබතුමාට point of Order එකට අවස්ථාව දෙන්නම්.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
எனவே, மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்தக்கூடிய, மக்கள் ஏற்றுக்கொள்ளாத இந்தக் காற்றாலை கோபுரத்தின் பாகங்களை உடனடியாக அங்கிருந்து எடுத்துச் செல்லுமாறு இவ்வுயரிய சபையில் உரிய தரப்பினரைக் கோருகின்றேன். *[இடையீடு]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවට බාධා කරන්න එපා. එතුමාගේ කථාවෙන් පසුව point of Order එක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නම්. එතුමාගේ කථාව අවසන් වෙනකල් ඉන්න.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
இன்னொரு விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். முல்லைத்தீவில் 2025.06.19 அன்று அதிகாலை 2.30 மணிக்கு கடலுக்கு மீன் பிடிக்கச் சென்ற வின்சன்டிப்போல் அருமை என்ற மூன்று பிள்ளைகளின் தந்தையைக் காணவில்லை. அவர் தனது குடும்பத்தின் வாழ்வாதாரத்துக்காகவே கடலுக்குச் சென்றார். அவருடைய படகு மீட்கப்பட்டபோது, அதில் இரத்தக்கறை இருந்துள்ளது. அத்துடன், எஞ்சின் உட்பட படகின் ஏனைய பகுதிகளுக்குச் சேதம் ஏற்பட்டுள்ளது. அந்தப் படகிலுள்ள இரத்தக்கறையானது மனிதனுடையது என்பது தடயவியல் நிபுணர்களால் உறுதிப்படுத்தப்பட்டுள்ளது. கடலில் சட்டவிரோத தொழிலில் ஈடுபடுபவர்களால் அவர் தாக்கப்பட்டு இருக்கலாம் என்ற சந்தேகம் மக்களுக்கு உள்ளது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up now.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஒருநிமிடம் தாருங்கள்!

முல்லைத்தீவு கடற்பிரதேசம் சட்டவிரோதிகளின் கைகளில் இருக்கிறது. இரவில் வெளிச்சம் பாய்ச்சி மீன்பிடித்தல் நடவடிக்கையால் கடல் முழுவதும் பகல்போல் காட்சியளிக்கின்றது. இப்படி அங்கு சட்டவிரோதச் செயற்பாடுகள் நடைபெறும்போது, உரியவர்களைக் கைது செய்யவேண்டிய பொறுப்பில் உள்ளவர்கள் வேடிக்கை பார்ப்பதுதான் மிகவும் வேடிக்கையாக உள்ளது. ஏன் இந்தச் செயற்பாடுகளை கடற்படையினர், பொலிசார், கடற்றொழில் திணைக்களத்தினரால் தடுக்க முடியவில்லையெனக் கேட்டு, விடைபெறுகின்றேன்.நன்றி!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක කියන්න, තත්පර 30කින්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අනේ, කරුණාකරලා අහන්නකෝ. විපක්ෂයෙන් කවුරු හරි මන්ත්‍රීවරයෙක් නැඟිට්ටාම, මොනවාද කියන්නේ කියලා කරුණාකරලා අහන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තත්පර 30ක් දෙන්නම්, point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක් ගැන නේ අපි කියන්නේ. මේ බලන්න, ස්ථාවර නියෝග 91- *[බාධා කිරීමක්]* පොඞ්ඩක් ඉන්න, පොඞ්ඩක් ඉන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. පොඞ්ඩක් කට වහගෙන ඉන්නකෝ. කට තිබෙනවා කියලා හැම තැනදිම අරින්න එපා. *[බාධා කිරීමක්]* මේ අහන්න, Standing Order No. 91(a) states, "Every Member shall address his observations to the Speaker..." කලිනුත් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. Point of Order එක කිව්වා නේ ඉතින්. ඒක මට ඇහුණා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, මම පැහැදිලි කරලා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කලිනුත් ඔය point of Order එකම නේ කිව්වේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ, ඒක නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලි කරන්න තවත් වෙලාවක් දෙන්න බැහැ, මන්ත්‍රීතුමා. මට point of Order එක පැහැදිලියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
පැහැදිලි කරන්න නොවෙයි, ඔක්කෝටම ඉස්සර වෙලා කියන්න ඉඩ දෙන්න. මට අපහාස කරනකොට, ඒවාට උත්තර දෙන්න ඉඩ දෙන්න. තත්පර 20යි ගන්නේ. අපි වැඩි වෙලා ගන්නේ නැහැ. හොඳ දෙයක් කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. තත්පර 20න් කියන්න, ගරු මන්ත්‍රීතුමා. වෙලාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම හොඳ දෙයක් කියන්න යන්නේ. ඔබතුමන්ලා ඇයි බය වෙලා නැඟිටගෙන? උතුරු, නැඟෙනහිර leather factory එකක් හදන්න කිව්වා. උතුරු, නැඟෙනහිර leather factory එකක් හදන්න කියලා අපි ඉඩම් පවා අරගෙන දීලා, DCC meetingsවලත් කථා වෙලා, ඒකත් කරලා තිබෙනවා. නමුත් ඒ එකක්වත් උතුරු, නැඟෙනහිර හදන්නේ නැහැ. උතුරු, නැඟෙනහිර මැරෙන හැම සතාම, ඒ හැම එකක්ම දකුණට ගෙනෙනවා. අපි ඉඩම් පවා අරගෙන දුන්නා. කරුණාකරලා ඒ ගැන කියන්න දෙන්න. ඔබතුමන්ලා බය වෙන්න එපා. අපි කවදාවත්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දුන් තත්පර 20 ඉවරයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Madam, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නජිත් ඉන්දික මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 92 (2)(අ) යටතේ මෙසේ සඳහන් වී තිබෙනවා:

> "ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකු විසින් ප්‍රශ්න කරනු ලැබිය හැකි වන්නේ ය."

දැන් උදේ ඉඳන් මේ ප්‍රශ්නය තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මීට කලින් දෙමළ මන්ත්‍රීතුමෙක් කථා කරමින් සිටියා. මේ සභාවේ මොකක් හරි පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එක්කෝ, අපට විනයක් තිබෙන්න ඕනෑ, point of Order එකක් පාවිච්චි කරන්න. එහෙම නැත්නම් සභාව හසුරුවන්න ඕනෑ. දැන් මේ සභාවේ කිසිම මන්ත්‍රීවරයෙකුට කථාවක් කරගෙන යන්න බැහැ නේ. අර මන්ත්‍රීතුමාගේ මුළු කථාව පුරාම කෑ ගැහුවා; බාධා කළා ඒ නිසා මොකක් හරි පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මේක කරන්න ඉඩ දෙන්න එපා. මේ සභාවේ වැඩ කටයුතු පිළිවෙළක් ඇතිව කරගෙන යන්න ඕනෑ. අද දවස පුරා කීවෙනි වතාවටද මේක වුණේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි, ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමනි.

ගරු මීරා සාහිබු උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.17]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යම් කිසි චූදිතයෙකුට මානසික ආබාධයක් තිබෙනවා නම්, ඔහු සම්බන්ධයෙන් ගන්න පුළුවන් පියවර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 376 වගන්තිය යටතේ සඳහන් වනවා. නමුත්, සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පිස්සු හැදිලා වාගේ කථා කරන එක ගැන පියවරක් ගන්න මට හැකියාවක් නැහැ. සමහර වෙලාවට ඒක හවස් වනකොට ඇති වන ප්‍රශ්නයක් විය හැකියි. එහෙම නැත්නම්, පින්න වැටිලා එහෙම මොනවා හරි ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මම කිව්වේ ඒක තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය) නියෝග අද ඉදිරිපත් කරනවා. මේ නියෝග මොනවාද කියලා අපි කියා තිබෙනවා වාගේම මෙතැනට ඉදිරිපත් කර තිබෙනවා. *[බාධා කිරීමක්]* මේ නියෝග සම්මත කරන්න කියා ඉල්ලනවා. මොළය පෙඟුණු ප්‍රශ්නය නිසා මගේ කථාව මෙච්චරයි. මොකද, මෙතැනින් එහාට මේ විවාදය ගෙනියන්න බැහැ.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අධිකරණ සංවිධාන පනත: නියෝග
## நீதித்துறைச் சட்டம்: ஒழுங்குவிதிகள்
## JUDICATURE ACT: REGULATIONS

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූනි 04 දිනැති අංක 2439/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු සරෝජා සාවිත්‍රී පෝල්රාජ් මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

## කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැසට් කිරීම
## கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவு தொடர்பான வர்த்தமானி அறிவித்தலை வெளியிடல்
## GAZETTING OF DIVISIONAL SECRETARY'S DIVISION OF KORALAIPATTU CENTRAL

[பி.ப. 5.19]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் ஒத்திவைப்பு வேளையின்போது பின்வரும் பிரேரணையை முன்மொழிகின்றேன்:

" புதிய பிரதேச செயலகங்களை நிறுவுவது குறித்து பரிசீலனை செய்வதற்கென 1999ஆம் ஆண்டில் நியமிக்கப்பட்ட பனம்பலன ஆணைகுழுவின் அறிக்கையின்படி, பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் அமைச்சரவைப் பத்திரத்துக்கமைய, 08 புதிய பிரதேச செயலகப் பிரிவுகளை நிறுவுவதற்குப் பரிந்துரை செய்யப்பட்டது. அதில் கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவும் ஒன்றாகும்.

புதிய கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவானது, 11 கிராம சேவையாளர் பிரிவுகளுக்கு வரையறுக்கப்பட்டுள்ளதாகத் தெரிவிக்கப்பட்டுள்ளது. அதன்படி, குறித்த 08 பிரதேச செயலகப் பிரிவுகளில் 07 பிரதேச செயலகப் பிரிவுகள் வரையறைகளுக்கு உட்பட்டு பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சினால் வர்த்தமானியில் வெளியிடப்பட்டிருந்தாலும், கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவுக்கு 11 கிராம சேவையாளர் பிரிவுகளை உள்ளடக்கி இதுவரை வர்த்தமானி அறிவித்தல் வெளியிடப்படவில்லை.

இதன் காரணமாக, அந்தப் பிரதேச செயலகத்திலுள்ள பிரதேச செயலாளருக்குத் தமது கடமைகளை மேற்கொள்வதில் பல சிக்கல்களை எதிர்கொள்ளவேண்டி ஏற்பட்டுள்ளது. ஏனைய பிரதேச செயலாளர்கள் தமது ஆளுகைப் பிரதேசத்தில் தமது கடமைகளைச் சரியாகச் செய்து வருகின்றனர். இதன் காரணமாக இந்த ஆளுகைப் பிரதேசத்தில் வசிக்கும் மக்களும், அதனுடன் தொடர்புடைய உத்தியோகத்தர்களும் அன்றாடம் எதிர்கொள்ளும் பிரச்சினைகளைத் தீர்க்க முடியாமல் சிரமப்படுகின்றனர்.

எனவே, புதிய கோறளைப்பற்று மத்தி பிரதேச செயலகப் பிரிவினை 11 கிராம சேவையாளர் பிரிவுகளை உள்ளடக்கி, பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின்மூலம் வர்த்தமானி அறிவித்தலை வெளியிட உடனடியாக நடவடிக்கை எடுக்குமாறு நான் பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் கோரிக்கை விடுக்கின்றேன்."

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 1999ஆம் ஆண்டு இலங்கையில் புதிய பிரதேச செயலகப் பிரிவுகளை உருவாக்குவதற்காக பொது நிருவாக அமைச்சினால் நியமிக்கப்பட்ட Panambalana Commissionஇன் அறிக்கையில் எட்டு புதிய பிரதேச செயலகங்களை உருவாக்குவதற்கு சிபாரிசு செய்யப்பட்டு இருந்தது. அதன் அடிப்படையில், 13.07.2000 அன்று இடம்பெற்ற அமைச்சரவைக் கூட்டத்தில் எடுக்கப்பட்ட தீர்மானத்தின் பிரகாரம், அந்த எட்டு பிரதேச செயலகப் பிரிவுகளும் உருவாக்கப்பட்டு, இன்றுவரை - 25 வருடங்களாக - இயங்கி வருகின்றன. அவற்றில் ஆறு பிரதேச செயலகப் பிரிவுகள் ஏற்கனவே வர்த்தமானிமூலம் பிரகடனம் செய்யப்பட்டு, எல்லைகள் வரையறுக்கப்பட்டு, அவை தமது கடமைகளைச் செய்து வருகின்றபோதிலும், மட்டக்களப்பு மாவட்டத்துக்கென சிபாரிசு செய்யப்பட்ட கோறளைப்பற்று மத்தி, கோறளைப்பற்று தெற்கு ஆகிய இரண்டு பிரதேச செயலகப் பிரிவுகளும் இன்னும் வர்த்தமானிமூலம் பிரகடனம் செய்யப்படவில்லை. இதனால் கடந்த 25 வருடங்களாக இப்பிரதேச செயலகங்களில் கடமையாற்றும் பிரதேச செயலாளர்கள் இவற்றின் எல்லைகள் தெரியாமல் இருக்கிறார்கள்.

அதுமாத்திரமன்றி, அங்குள்ள சாதாரண குடிமக்கள் தமது பிரச்சினைகளைத் தீர்த்துக்கொள்ள முடியாத நிலையில் இருக்கிறார்கள். உதாரணத்துக்கு, கோறளைப்பற்று மத்தியில் இருக்கின்ற ஒருவர் தன்னுடைய பிரச்சினையைத் தீர்த்துக்கொள்வதற்கு கோறளைப்பற்று மத்தி பிரதேச செயலகத்துக்குச் சென்றால், "இங்கு இதனைச் செய்ய முடியாது; நீங்கள் வாகரை பிரதேச செயலகத்துக்குச் செல்லுங்கள்!" என்று சொல்கிறார்கள். அவர்கள் வாகரைப் பிரதேச செயலகத்துக்குச் சென்றால், "கிரான் பிரதேச செயலகத்துக்குச் செல்லுங்கள்!" என்று சொல்கிறார்கள். அங்குள்ள மக்கள் 25 வருடங்களாக தங்களுடைய சிறிய பிரச்சினையைக்கூட தீர்த்துக்கொள்ள முடியாமல் அலைந்துதிரிகின்ற ஓர் அவல நிலையே காணப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, Panambalana Commission Reportஇன்படி, அமைச்சரவை எந்தத் தீர்மானத்தை எடுத்ததோ, அந்தத் தீர்மானத்தின் பிரகாரம், இந்தப் பிரதேச செயலகங்கள் இயங்குவதற்குரிய நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டும். குறிப்பாக, அவற்றை வர்த்தமானிமூலம் பிரகடனம் செய்து இயங்குவதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும்.

2012, 2020ஆம் ஆண்டுகளில் நியமிக்கப்பட்ட ஆணைக்குழுக்களின் அறிக்கைகளை மீளாய்வு செய்து, அது தொடர்பில் அறிக்கை ஒன்றைச் சமர்ப்பிப்பதற்காக புதிய Delimitation Committee ஒன்றை நியமிப்பதற்கு நேற்றைய தினம் இடம்பெற்ற அமைச்சரவைக் கூட்டத்தில் அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதாக நாங்கள் செய்திகள் ஊடாக அறிந்து கொண்டோம். நாங்கள் இதனைப் பாராட்டுகின்றோம். 25 வருடங்களுக்கு முன்பு எல்லா இனங்களாலும் ஏற்றுக்கொள்ளப்பட்ட பனம்பலான ஆணைக்குழுவின் அறிக்கையிலுள்ள சிபாரிசுகள் நடைமுறைப்படுத்தப்பட வேண்டும். சிலவேளைகளில் இதனைச் செய்வதற்குக் காலதாமதம் ஏற்படுமாக இருந்தால், அதற்கு முன்பு எவ்வாறு நிலைமை இருந்ததோ, அந்த நிலைமையில் செயற்பாடுகள் இருக்க வேண்டும். அப்பொழுதுதான் அதனை நியாயப்படுத்த முடியும்.

கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் இனங்களுக்கு இடையில் முரண்பாடுகளை வளர்த்துக்கொள்ளக் கூடாது. கடந்த காலங்களைவிட இப்பொழுது மட்டக்களப்பு மாவட்டத்தில் தமிழ், முஸ்லிம் மக்கள் மிகவும் ஒற்றுமையாக வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள். எனவே, நீங்கள் இனங்களுக்கு இடையில் முரண்பாடுகள் ஏற்படாத வகையில், கலந்துரையாடல்கள்மூலம் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காண வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Rauff Hakeem to second the Motion. You have two minutes.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාටත්, එම යෝජනාව ස්ථිර කරන මන්ත්‍රීවරයාටත් මේ වාගේ සුළු කාලයක් ලබා දුන්නාම යෝජනාවේ අන්තර්ගතයවත් කියන්න බැරි වෙනවා. මේක ඉතාම අසාධාරණ වැඩක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාවට කාලය වෙන් කරලා තිබෙන්නේ මිනිත්තු 15ක් විධියට.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

එහෙම කාලය බෙදන්න බැහැ නේ. යෝජනාව ඉදිරිපත් කරන මන්ත්‍රීවරයාට විනාඩි 3යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විපක්ෂයේ මන්ත්‍රීවරුන් හත්දෙනෙක් කථා කරන්න ඉන්නවා, ගරු මන්ත්‍රීතුමා. ඒ තමයි කාලය බෙදලා තිබෙන්නේ.

[අ.භා. 5.24]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

දැන් ඒ පිළිබඳව කථා කරන්න බැහැ, පස්සේ කථා කරමු.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் முன்மொழியப்பட்ட ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிகின்றேன். இன்று அமைச்சரவை ஊடாக புதியதொரு எல்லை நிர்ணய ஆணைக்குழுவை நியமிப்பதற்குத் தீர்மானம் எடுக்கப்பட்டிருப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் சொல்வதற்கு இருக்கிறாரென நாங்கள் கேள்விப்படுகின்றோம். என்னைப் பொறுத்தமட்டில், வேதாளம் முருங்கை மரம் ஏறுவதுமாதிரி ஒவ்வொரு தடவையும் திரும்பத் திரும்ப எல்லை நிர்ணய ஆணைக்குழுக்களை நியமிப்பதன்மூலம் இந்த விவகாரத்தை இழுத்தடிக்கிறார்கள். இந்த விஷயத்துடன் நான் உடன்படவில்லை என்பதை முதலில் சொல்லிவைக்க விரும்புகின்றேன். ஏனென்றால், இந்த விடயத்துக்காக ஏற்கெனவே பலCommissions நியமிக்கப்பட்டு இருக்கின்றன. There was an Andrew Silva Commission; there was a Nanayakkara Commission; then, there was this Panambalana Commission. So, every time, there had been several such commissions. Now, if this Government do not want to solve a problem, you all appoint a committee; if you do not want to solve a problem, you appoint a commission. Is that theattitude of the Government? இதுதான் அரசின் நிலைப்பாடா? எனக் கேட்க விரும்புகின்றேன். இந்த விடயத்தில் அநீதி இழைக்கப்பட்டு இருப்பதை நாங்கள் எல்லோருக்கும் மிகத் தெளிவாகக் காண்கின்றோம்.

வர்த்தமானியில் பிரசுரிக்கப்படாத சில கிராம சேவகர் பிரிவுகளை பிரதேச செயலக ரீதியாக வெவ்வேறு முறைகளில் நிருவகிப்பதற்கு மட்டக்களப்பு மாவட்டத்திலுள்ள உரிய அதிகாரிகள் அனுமதித்து இருக்கிறார்கள் என்பது மிக மோசமான அநீதியாகும். அந்த அடிப்படையில்தான் இன்று கௌரவ எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்கள் இந்தப் பிரேரணையைக் கொண்டுவந்து இருக்கின்றார். இதேபோன்ற ஓர் ஒத்திவைப்புப் பிரேரணையை கடந்த அரசாங்க காலத்தில் முன்னாள் முதலமைச்சர் கௌரவ ஹாபிஸ் நஸீர் அஹமட் அவர்கள் 30.11.2021 அன்று கொண்டுவந்தபோதும், நான் இதே விவகாரத்தை பாராளுமன்றத்தில் குறிப்பிட்டேன். இப்படிப்பட்ட குளறுபடியான விடயங்களை அடிக்கடி Commission ஒன்றை நியமிப்பதன்மூலம் தொடர்ந்தும் இழுத்தடிப்புச் செய்யாமல், உண்மையிலே செய்யப்படவேண்டிய விடயத்தைச் செய்ய வேண்டும். கிராம சேவகர் பிரிவுகளின் எல்லைகளை இனவிகிதாசார அடிப்படையில் அல்லாமல், நிலப்பரப்பை அடிப்படையாகக்கொண்டு செய்வதாக இருந்தால், மக்களின் எண்ணிக்கையை அடிப்படையாகக் கொண்டு அதனைச் செய்ய வேண்டும். கோறளைப்பற்று தெற்கில் 31,565 பேரும், கோறளைப்பற்று வடக்கில் 27,681 பேரும், கோறளைப்பற்று மத்தியில் 35,126 பேரும், கோறளைப்பற்று மேற்கில் 28,360 பேரும் இருக்கின்ற நிலையில், கோறளைப்பற்று தெற்கு, கோறளைப்பற்று வடக்குக்கு முறையே 620 சதுரமைலும் 589 சதுரமைலும், கோறளைப்பற்று மத்தி, கோறளைப்பற்று மேற்குக்கு முறையே 8 சதுரமைலும் 31 சதுரமைலும் இருக்கின்றது.

இது எந்த அடிப்படையில் நியாயமாக முடியும்? இந்த அநியாயத்துக்குத்தான் இன்று அந்த மக்கள் நீதி கோரி நிற்கிறார்கள். இவ்விடயம் தொடர்பில் நியமிக்கப்பட்ட ஆணைக்குழுக்களின் பரிந்துரைகள்கூட, சரியான முறையில் நடைமுறைப்படுத்தப்படுவதற்கு நிர்வாகங்கள் தடையாக இருக்கின்றன. அதேநேரம், ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்களும் இவ்விடயத்தில் பராமுகமாகவே இருக்கின்றன. இதனைத் தொடர்ந்தும் இழுத்தடிப்புச் செய்யும் விதமாக மீண்டும் வேதாளம் முருங்கை மரம் ஏறுகின்ற விக்கிரமாதித்தன் கதையைத்தான் இந்த அரசாங்கமும் கூறுகின்றது. அதற்கு என்னுடைய பலத்த எதிர்ப்பைத் தெரிவித்து அமர்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The Hon. Gnanamuththu Srineshan. You have four minutes.

[பி.ப. 5.28]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு வணக்கம்! இன்றைய தினம் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் கொண்டுவந்துள்ள ஒத்திவைப்புப் பிரேரணையை நாங்கள் மிகவும் கூர்மையாகவும் அவதானத்துடனும் நோக்கவேண்டி

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

உள்ளது. தமிழ், முஸ்லிம் மக்கள் மத்தியில் நல்லிணக்கம் ஏற்பட்டுக்கொண்டு இருக்கின்றது என்பதை நானும் ஏற்றுக் கொள்கின்றேன். கோறளைப்பற்று தெற்கு அல்லது கிரான் பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற 18 கிராம சேவையாளர் பிரிவுகளுள் குறிப்பிட்ட 5 கிராம சேவையாளர் பிரிவுகளிலுள்ள மக்கள் என்ன நினைக்கின்றார்கள் என்பதை நாங்கள் முதலில் கவனத்திற்கொள்ள வேண்டும். அதாவது, அவர்கள் கிரான் பிரதேச செயலகம் அல்லது கோறளைப்பற்று தெற்குப் பிரதேச செயலகத்துடன் இணைந்திருக்க விரும்புகின்றார்களா? அல்லது அதிலிருந்த பிரிந்து சென்று, வேறு பிரதேச செயலகத்துடன் இணைந்திருக்க விரும்புகின்றார்களா? என்பதை நாங்கள் கவனத்திற்கொள்ள வேண்டும்.

கோறளைப்பற்று தெற்கு பிரதேச செயலாளர் பிரிவில் காணப்படுகின்ற 18 கிராம சேவையாளர் பிரிவுகளும் 2002இலிருந்து இணைந்து செயற்படுகின்றன. அங்கு வாழுகின்ற தமிழர்களும் முஸ்லிம்களும் முரண்பாடுகள் எதுவும் இல்லாமல் இணைந்து வாழுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. அங்கு வாழுகின்ற முஸ்லிம் மக்கள் தமிழர்களுக்கு இணையாக பயிர்ச்செய்கை மற்றும் கால்நடை வளர்ப்பில் ஈடுபட்டு வருகின்றார்கள். அவர்கள் இணக்கமான நிலையில் அந்த கிரான் பிரதேச செயலாளர் பிரிவில் அல்லது கோறளைப்பற்று தெற்குப் பிரதேச செயலாளர் பிரிவில் வாழ்ந்து வருகின்றார்கள். குறிப்பிட்ட இந்த ஐந்து கிராம சேவையாளர் பிரிவுகளும் எந்தவொரு சந்தர்ப்பத்திலும் கோறளைப்பற்று மத்தியுடனோ அல்லது கோறளைப்பற்று மேற்குடனோ இணைந்து இருக்கவில்லை. அவை கோறளைப்பற்று தெற்குடன்தான் இணைந்து செயற்படுகின்றன. இந்த ஐந்து கிராம சேவையாளர் பிரிவுகளிலுமுள்ள RDS மற்றும் ஏனைய அமைப்புகளை நாங்கள் கோரும்போது, அவர்கள் கோறளைப்பற்று தெற்குப் பிரதேச செயலகத்தோடு இணைந்திருப்பதையே விரும்புகின்றார்கள். கல்லிச்சையில் இருந்த எங்களுடைய முஸ்லிம் சகோதரர்கள் ஜெயந்தியாய, ரிதிதென்ன போன்ற பிரதேசங்களில் குடியேறி இருக்கின்றார்கள் என்று நான் நினைக்கின்றேன். மேலும், ஜெயந்தியாய, ரிதிதென்ன போன்ற பிரதேசங்களும் இதனோடு இணைக்கப்பட இருப்பதாக நான் அறிகின்றேன். எனினும், அவை நிலத்தொடர்பு இல்லாத நிலையில் காணப்படுகின்றன. இப்போது அந்தப் பிரதேசத்தில் எந்தவிதமான நெருக்கீடுகளோ, முரண்பாடுகளோ இல்லாத நிலையில் மக்கள் வாழ்ந்துகொண்டு இருக்கின்றார்கள் என்பது எங்களுடைய சிரேஷ்ட பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களுக்கும் தெரியும்!

அடுத்து, காணி விடயத்தை எடுத்துக்கொள்வோம். அங்கு உறுதிக் காணிகள் மாத்திரம்தான் தமிழர்களுக்கோ, முஸ்லிம்களுக்கோ சொந்தமாக இருக்கின்றன. அந்தப் பிரதேசங்களில் அதிகளவு காணிகள் இருக்கின்றன என்று குறிப்பிடப்பட்டாலும், அவை வன இலாகாவுக்குரிய காணிகள், வனசீவராசிகள் திணைக்களத்துக்குரிய காணிகள், மகாவலி அதிகாரசபைக்குரிய காணிகள், LRC காணிகள், தொல்லியல் திணைக்களத்துக்குரிய காணிகள் என பொதுவான காணிகளாக இருக்கின்றதே ஒழிய, தனியாருக்குச் சொந்தமான காணிகளாக இல்லை. நான் சொல்ல வருகின்ற விடயம் என்னவென்றால், மக்கள் நல்லிணக்கத்துடன் அல்லது முரண்பாடு இல்லாமல் இருக்கின்ற நிலையில், இப்போது கோறளைப்பற்று தெற்கிலுள்ள குறிப்பிட்ட ஐந்து கிராம சேவையாளர் பிரிவுகளையும் பிரிக்கும்போது, முரண்பாடுகள் ஏற்படும் என்பதைத்தான். இந்த விடயம் சம்பந்தமாக எனக்கு தொலைபேசி அழைப்புகள் வந்திருக்கின்றன. அத்தோடு, அவை பற்றி பலரும் என்னிடம் சொல்லி வருகின்றார்கள். எனவே, இந்த விடயத்தை ஓர் இணக்கமான சூழலில் கலந்துபேசி, வெளிப்படையாகச் செய்வதுதான் நன்றாக இருக்கும். நான் அறிந்த வகையில், மேற்படி ஐந்து கிராம சேவையாளர் பிரிவுகளிலும் உள்ள மக்கள் கோறளைப்பற்று தெற்கோடு இணைந்து பயணிப்பதையே விரும்புகின்றார்கள். இதை நான் இச்சபையின் கவனத்துக்கொண்டுவர விரும்புகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Kanthasamy Prabu. You have four minutes.

[பி.ப. 5.32]

**ගරු කන්දසාමි ප්‍රභු මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களால் கோறளைப்பற்று மத்தி பிரதேச செயலகம் தொடர்பான விடயம் ஒத்திவைப்புப் பிரேரணையாகக் கொண்டுவரப்பட்டு இருக்கிறது. மட்டக்களப்பு மாவட்டத்தில் 14 பிரதேச செயலகங்கள் காணப்படுகின்றன. அவற்றில் கிரான் பிரதேச செயலகத்துக்கு உட்பட்டதான கோரளைப்பற்று மத்தி, கோறளைப்பற்று தெற்கு ஆகிய இரு பிரதேச செயலகங்களும் 2002ஆம் ஆண்டு புதிதாக உருவாக்கப்பட்டன. பனம்பலான ஆணைக்குழுவின் பரிந்துரைக்கு அமைய இந்த விடயம் இடம்பெற்று இருந்ததை நான் இந்த நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டமானது, ஒரு மொழி பேசுகின்ற இரு இனங்கள் வாழுகின்ற ஒரு மாவட்டம் என்பது உங்களுக்குத் தெரியும்! அங்கு நாங்கள் இன ஐக்கியத்தோடும், சாந்தி, சமாதானத்தோடும் பயணிக்கவேண்டிய தேவை இருக்கின்றது. கடந்த கால ஆட்சியாளர்கள் இன ரீதியாகச் சில விடயங்களை மேற்கொண்டதன் காரணமாக, இந்த நாடு அசௌகரியமான ஒரு நிலைமைக்குத் தள்ளப்பட்டிருந்ததை நாங்கள் அறிவோம். அதுமாத்திரமன்றி, யுத்த சூழ்நிலையும் உருவாகி, அதில் நாங்கள் அதிக காலத்தையும் செலவழித்து இருந்தோம்.

ஏழு கிராம சேவகர் பிரிவுகள் கோரளைப்பற்று மத்தியுடன் இணைக்கப்பட்டு இருந்தன. அவை கோரளைப்பற்று - வாழைச்சேனை - பிரதேச செயலகப் பிரிவிலிருந்து பெறப்பட்டவையாகும். அதனுடன், கோரளைப்பற்று மேற்குப் பிரதேச செயலகப் பிரிவில் இருந்து பெறப்பட்ட 01 கிராம சேவகர் பிரிவும், கோரளைப்பற்று வடக்கு - வாகரை - பிரதேச செயலகப் பிரிவிலிருந்து பெறப்பட்ட 03 கிராம சேவகர் பிரிவுகளும் இணைக்கப்பட்டு, மொத்தம் 11 கிராம சேவகர் பிரிவுகள் உருவாக்கப்பட்டதாக பனம்பலான ஆணைக்குழுவின் அறிக்கையில் குறிப்பிட்டப்பட்டு இருந்தது. கோரளைப்பற்று மத்தி பிரதேச செயலகத்துக்கு அங்கீகாரம் அளிக்கப்படாமல் இருக்கின்ற அதேநேரத்தில், கோரளைப்பற்று தெற்கு கிரான் பிரதேச செயலகமும் இதுவரை அங்கீகரிக்கப்படவில்லை என்பதையும் நான் இந்த நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

1999ஆம் ஆண்டு காலப்பகுதியில்தான் இந்த விடயம் முன்னெடுக்கப்பட்டு இருந்தது. அதற்குப் பிறகு, 2001ஆம் ஆண்டு காலப்பகுதியில் மீண்டும் இந்தப் பிரதேச செயலகம் உருவாக்கப்பட வேண்டும் என்ற கோஷம் எழுப்பப்பட்டது. அந்தக் காலகட்டத்தில் பாராளுமன்ற உறுப்பினர்களும் சிவில் சமூகத்தினரும் இது குழப்பகரமான ஒரு சூழ்நிலையை உருவாக்கும் என்ற அடிப்படையில், இதனை முன்னெடுக்காமல் தள்ளிவைத்ததாக அறிந்துகொள்ளக் கூடியதாக இருந்தது. அதற்குப் பிறகு, 2013ஆம் ஆண்டு இவ்விடயம் பாராளுமன்றத்தில் ஒரு குழுவினூடாக மீண்டும் பேசப்பட்டதாக அறியக்கூடியதாக இருந்தது. அந்தக் குழுவில் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களும் அங்கம்வகித்து இருந்தார். தேசிய மக்கள் சக்தியானது, அரசாங்கம் என்ற ரீதியில், நிச்சயமாக இந்தப் பிரதேச செயலகங்களுக்கான அங்கீகாரத்தை வழங்க வேண்டும். அதேநேரம், மட்டக்களப்பு மாவட்டத்தில் இனங்களுக்கு இடையே இருக்கின்ற ஒற்றுமையைப் பேணிக்கொண்டுதான் இதனை முன்னெடுக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

கடந்த காலங்களில் இன ரீதியாகச் சில முடிவுகள் மேற்கொள்ளப்பட்டதால், இந்த நாடும் எங்களது பிரதேசங்களும் அசௌகரியங்களை எதிர்நோக்கி இருந்தன. அவ்வாறு தேசிய மக்கள் சக்தி அரசாங்கத்தில் இடம்பெறக்கூடாது என்ற நிலைப்பாட்டில் நாங்கள் உறுதியாக இருக்கின்றோம். இரு சமூகங்களினதும் இணக்கத்தோடு, அவர்களது அபிலாஷைகளுக்கு ஏற்ப, அவர்களுடைய கருத்துகளையும் அறிந்து, இந்தப் பிரச்சினையைத் தீர்த்துவைக்க வேண்டும் என்பதுதான் எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam. You have two minutes.

[பி.ப. 5.36]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனக்கு முன்பு பேசிய எங்களுடைய பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவர் அவர்கள் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள இரண்டு இனங்களுக்கும் இடையில் இருக்கின்ற ஒற்றுமையைப் பாதுகாக்க வேண்டுமென்று சொல்லியிருந்தார். இந்தப் பிரச்சினையை சமூக மட்டப் பிரச்சினையாக உருவாக்கியதன் பின்புலம், தேசிய மக்கள் சக்தியுடைய ஓட்டமாவடி பிரதேச சபை உறுப்பினர்களையே சேரும். அவர்கள் மூவரும்தான் இதற்கு உண்ணாவிரதம் இருக்கப்போவதாகச் சொன்னார்கள். எதற்கு அவர்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட வேண்டும்? அரசாங்கத்திலே இருப்பவர்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபடுவது வரலாற்றிலே இதுதான் முதல்முறையாகும். அதுவும் இந்த அரசாங்கத்தின்கீழேதான் அவர்கள் ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டார்கள்.

நாங்கள் இலங்கைத் தமிழரசுக் கட்சியைச் சேர்ந்தவர்கள். முஸ்லிம், தமிழ் ஆகிய இந்த இரண்டு சமூகங்களும் கிழக்கு மாகாணத்திலே ஒற்றுமையாக வாழ வேண்டுமென்பதற்காக நாங்கள் பல பேச்சுவார்த்தைகளிலே ஈடுபட்டு வருகின்றோம். ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் தலைவர் உட்பட ஏனைய உறுப்பினர்களுக்கும் நான் ஒன்றைச் சொல்ல விரும்புகிறேன். கிழக்கு மாகாணத்திலே முஸ்லிம் மக்களுக்கு எதிராகப் பேசுவதனூடாகத்தான் தமிழர்கள் அரசியலிலே வளர முடியும் அல்லது தமிழர்கள் அரசியலில் ஈடுபடலாம் என்றொரு காலம் இருந்தது. அதேபோல், தமிழர்களுக்கு எதிராகப் பேசுவதனூடாகத்தான் இஸ்லாமியக் கட்சிகள் அரசியலில் ஈடுபட முடியும் என்ற நிலையில் சில உறுப்பினர்களின் அரசியல் செயற்பாடுகள் இருந்தன. ஆகவே, மீண்டுமொரு முறை அவ்வாறான செயற்பாடுகளுக்கு தயவுசெய்து இடமளிக்காதீர்கள்! நாங்கள் இந்த விடயத்தைப் பற்றி பேசும்போது தொடர்ச்சியாக கல்முனை வடக்குப் பிரதேச செயகத்தைப் பற்றியும் பேசி வருகிறோம். அந்தப் பிரதேச செயகத்திலே இவ்வாறான பல குறைபாடுகள் இருக்கின்றன. அது தொடர்பாகப் பேசுவதற்கு நாங்கள் தயாராக இல்லை. இதை வைத்துக்கொண்டு கடந்த காலத்தில் இராணுவப் புலனாய்வுத்துறையினர் இலாபம் அடைந்திருக்கிறார்கள். இந்த முறை நாங்கள் ஒன்றாக இணைந்து உள்ளூராட்சி சபைகளில் ஆட்சியை அமைத்திருக்கின்றோம். இந்த ஒற்றுமை நீடிக்க வேண்டும்.

அரசாங்கம் எல்லை நிர்ணய ஆணைக்குழுவை நியமித்து எதுவும் செய்ய முடியாது. நாங்கள்தான் இதற்குரிய முடிவை முன்வைக்க வேண்டும். அரசாங்கம் எந்தவொரு எல்லை நிர்ணய ஆணைக்குழுவை நியமித்தாலும், அதனை எங்களுடைய மக்கள் ஏற்றுக்கொள்ளவில்லை என்றால் போராட்டங்கள் வெடிக்கும்! ஆர்ப்பாட்டங்கள் நடக்கும்! அதனால், Delimitation Committeeனால் எதுவும் செய்யமுடியாத சூழல் வரலாம்! அந்த வகையில், நாங்கள்தான் பேச வேண்டும்; நாங்கள் எங்களுக்குள்ளே பேச வேண்டும். நாங்கள் எங்களுக்குள்ளே பேசினால் மாத்திரம்தான் இதற்கான தீர்வு ஒன்றைக் காண முடியும். அவ்வாறு இல்லாதுவிட்டால், இது இரு சமூகங்களுக்கு இடையிலான பாரிய பிரச்சினையாக மாறிவிடும்.

அந்தப் பிரதேசங்களில் இருக்கின்ற மக்கள் தங்களுடைய நிலங்களைத் தருவதற்கு நாங்கள் தயாராக இல்லை என்று எதிர்த்துப் பேசுவார்கள். இந்தப் பிரச்சினை இரு சமூகங்களுக்கு இடையிலான பிரச்சினையாக மாறுவதற்கு முன்பாக, நாங்கள் எங்களுக்குள்ளே இந்த விடயம் தொடர்பாகப் பேசித் தீர்க்கக்கூடிய வகையில் அரசாங்கத் தரப்பினர் அதற்கான வழிகளைத் தரவேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இறுதியாக ஒரேயொரு விடயத்தைக் கூறி முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is up.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

I am winding up, Hon. Presiding Member.

ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் தலைவர் அவர்கள் அதிகாரிகள்மீது குற்றஞ் சுமத்தியிருக்கின்றார். அதிகாரிகள்மீது குற்றஞ்சுமத்துவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. முஸ்லிம் காங்கிரஸின் தலைவர் அவர்களே, நசீர் அஹமட் அவர்கள் கொண்டுவந்த ஒரு பிரேரணை பற்றி நீங்கள் பேசியிருந்தீர்கள். அந்த நேரத்தில் அவர் உங்களுடைய கட்சியிலிருந்து விலகிச்சென்று அமைச்சுப் பதவியைப் பெற்றிருந்தார். அவர் அமைச்சராக

[ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

இருந்தபோது ராஜபக்ஷக்களையும், அதிகாரிகளையும் வைத்து ஏன் அதனைச் செய்யவில்லை? உங்களுடைய கட்சியைச் சேர்ந்த முன்னாள் உறுப்பினர் நசீர் அஹமட் அவர்கள் அதிகாரிகளைப் பயன்படுத்தி வியாபாரம் செய்தார்; கல்முனையில் இருக்கின்ற ஒரு சிலரும் வியாபாரம் செய்தார்கள். வியாபாரம் செய்வதற்கு அதிகாரிகளுடைய உதவியைப் பயன்படுத்தலாம்! ஆனால், இவ்வாறான விடயங்கள் வரும்போது, 'அதிகாரிகளுடைய பயங்கரவாதம்' என்று நீங்கள் சொல்கின்றீர்கள். தயவுசெய்து மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற அரச அதிகாரிகளை இந்த விடயத்தில் இழுத்து அவர்கள்மீது நீங்கள் குற்றஞ்சுமத்தக் கூடாது. நீங்களும் ஓர் அமைச்சராக இருந்தீர்கள். நீங்கள் அமைச்சராக இருந்த காலத்தில் அந்த அதிகாரிகளை வைத்து இந்த விடயத்தைப் பற்றி பேசியிருக்கலாம். அந்த வகையில், தொடர்ச்சியாக இரு இனங்களுக்கும் இடையில் முரண்பாடுகள் வரும் வகையில் நாங்கள் நடந்துகொள்ள மாட்டோம். எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற ஏனைய அரசியல் கட்சிகளும் அதனைப் பின்பற்றினால், இரண்டு சமூகங்களும் சமாதானமான முறையில் தொடர்ந்தும் ஐக்கியமாக வாழலாம். அந்தச் சூழலை உருவாக்கவேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது என்பதைச் சொல்லி விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Rishad Bathiudeen. You have two minutes.

[பி.ப. 5.40]

**ගරු රිෂාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்களால் கொண்டு வரப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணை சம்பந்தமாக தமிழ்த் தரப்பு, முஸ்லிம் தரப்பு என எல்லோரும் தங்களுடைய கருத்துகளைச் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். இந்த விஷயத்தில் அநீதி இழைக்கப்பட்டிருக்கின்றது என்பதை நாங்கள் உணர்ந்தாக வேண்டும். 2002ஆம் ஆண்டு புதிதாக ஒரு பிரதேச செயலகப் பிரிவொன்றை உருவாக்குகின்றபோது, அந்தப் பிரதேசத்தில் வாழுகின்ற மக்களுடைய இனம், மதம் மற்றும் இருப்பிடங்கள் போன்ற விடயங்களையும் கவனத்தில் எடுத்து அதனைச் செய்திருந்தால் இதுபோன்ற பிரச்சினை இன்று ஏற்பட்டிருக்காது. இந்தப் பிரச்சினை தொடர்பாக இங்கே கௌரவ உறுப்பினர் சாணக்கியன் அவர்கள் பேசியதுபோன்று, அரசியல் செய்யாமல் இதனைத் தீர்க்க வேண்டும், இதற்கு ஒரு முடிவைக் காண வேண்டும். இந்தப் பிரச்சினையானது, ஆணைக்குழுக்களாலோ அல்லது அரசாங்க அதிபராலோ தீர்க்கக்கூடிய ஒரு பிரச்சினை அல்ல. இந்தப் பிரச்சினையை இரு தரப்பும் பேசித் தீர்க்க வேண்டும். உள்ளூராட்சிச் சபைகளில் ஆட்சி அமைப்பதற்காக சாணக்கியன் அவர்களும் ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியைச் சார்ந்த ஹிஸ்புல்லாஹ் அவர்களும் ஒன்று சேர்ந்தார்கள். ஓட்டமாவடியில் எங்களுடைய கட்சி வெற்றி பெற்ற சபையில், எங்களுடைய ஒருவரை நீங்கள் இருவரும் சேர்ந்து Chairmanஆக நியமித்து அங்கே நீங்கள் ஆட்சியை அமைத்துக் கொண்டீர்கள். அந்த வகையில், இந்த நாட்டின் வரலாற்றில் இடம்பெறாத ஒன்று நடந்துள்ளது.

இவ்வாறு நிலைமை இருக்கும்போது, ஏன் நீங்கள் இந்த விடயத்தை மட்டக்களப்பு மாவட்டத்தில் ஓர் இடத்தில் இருந்து பேசித் தீர்க்கக் கூடாது? இந்த விடயத்தை இந்தச் சபையில் கொண்டுவந்துதான் தீர்க்க முடியுமா? இவ்வாறான பிரச்சினைகள் அவ்வாறு தீர்க்கப்பட்ட வரலாறு இருக்கின்றதா? தயவுசெய்து, மக்களை ஏமாற்ற வேண்டாம். கல்முனை வடக்குப் பிரதேச செயலக விடயத்தில், குறிப்பாக இனங்களுக்காக பிரதேச செயலகங்களை உருவாக்குவதில் எனக்கு உடன்பாடு கிடையாது. இனங்களுக்காக, மதங்களுக்காக பிரதேச சபைகளையோ, கிராம சேவகர் பிரிவுகளையே அமைக்க முடியாது. ஆனால், மக்கள் வாழ்வதற்கான இடத்தேவை இருக்கின்றது.

இந்தப் பிரச்சினையில், ஐந்து கிராம சேவகர் பிரிவுகள் அங்கு இருப்பதனால் அந்தப் பிரதேச செயலகப் பிரிவில் பெரிய நிலப்பரப்பு இருக்கின்றது. அந்த மக்கள் தங்களிடமிருந்து பறித்ததைத் தருமாறு கேட்கின்றார்கள். இதில் நியாயம் இருக்கின்றதா, இல்லையா? என்பதல்ல முக்கியம். இங்கு பேசிய கௌரவ ஸ்ரீநேசன் அவர்கள் சொன்னார், அந்த மக்கள் அதை விரும்பவில்லை என்று. அது தவறான கருத்து! நான் அந்த மக்களோடு பேசினேன். அவர்கள் அதனை விரும்புகின்றார்கள். இந்தப் பிரச்சினை தீர வேண்டுமாக இருந்தால், நாங்கள் மாறி மாறி பேசுவதை நிறுத்திவிட்டு, இதயசுத்தியோடு செயற்பட வேண்டும். குறிப்பாக, அங்குள்ள இரண்டு தரப்பினரும் - இரண்டு சமூகத்தையும் சார்ந்த கல்விச் சமூகமும் அரசியல் பிரமுகர்களும் - ஒன்றுசேர்ந்து இந்தப் பிரச்சினையைத் தீர்த்துக்கொள்ள வேண்டும். இந்தப் பிரச்சினை தொடர வேண்டும், இரண்டு சமூகமும் தங்களுக்குள் அடிபட்டுக்கொள்ள வேண்டும் என்பதுதான் அரசாங்கத்துக்குத் தேவையாக இருக்கின்றது. இந்த அரசாங்கம் இருந்தாலும், எந்த அரசாங்கம் இருந்தாலும் இதைத்தான் எதிர்பார்க்கும். முஸ்லிம் சமூகமும் தமிழ் சமூகமும் ஒன்றுபடாதவரை இவ்வாறான பிரச்சினைகளுக்கு தீர்வு காண முடியாது.

நீங்கள் இந்த நாட்டில் தமிழீழம் கேட்டுப் போராடினீர்கள். சமஷ்டிகூட வேண்டாம் என்று சொன்னவர்கள் இன்று கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரச்சினை போன்ற சிறிய பிரச்சினைகளைத்தான் இந்த நாட்டிலுள்ள தமிழ் சமூகத்துக்குள்ள பெரிய பிரச்சினைகளாகப் பேசுகிறார்கள். எனவேதான் நான் அன்பாகச் சொல்கின்றேன், முஸ்லிம் காங்கிரஸ் தலைவர், சுமந்திரன், கௌரவ சாணக்கியன், கௌரவ கோடீஸ்வரன் என நாங்களும் நீங்களும் சேர்ந்து இந்தப் பிரச்சினை பற்றி எங்களுக்குள் பேசி ஒரு முடிவுக்கு வருவோம் என்று. நாங்கள் இங்கு வந்து எமது மக்களைக் காட்டிக்கொடுத்து, அடுத்த தேர்தலில் வாக்குகளைப் பெறுவதற்காக சமூகத்தை விற்றுப் பிழைக்கின்ற அரசியலை விட்டுவிடுவோம். நாங்கள் விட்டுக்கொடுப்போடு பேசுவதற்குத் தயாராக இருக்கின்றோம். தயவுசெய்து ஒன்றுபடுங்கள்! இந்தப் பிரச்சினையை இரண்டு சமூகத்தினரும் அவற்றின் அரசியல் தலைமைகளும் ஒன்றுபட்டுத் தீர்ப்போம். அண்மையில் கௌரவ கோடீஸ்வரன் அவர்கள் இன்னொரு விடயம் சம்பந்தமாகப் பேசியிருந்தார். அது சம்பந்தமாக பாராளுமன்றத்தில் தொடர்ந்து பேசி, அரசியல் செய்வதை நிறுத்திவிட்டு, இன்ஷா அல்லாஹ்! நாங்களும் நீங்களும் ஒன்றாக இருந்து பேசி, அம்பாறையிலுள்ள, மட்டக்களப்பிலுள்ள, வடக்கிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்போமெனக் கூறி விடைபெறுகின்றேன். நன்றி!

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා, මිනිත්තුවකින් අවසන් කරන්න.*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ றிஸாட் பதியுதீன் அவர்களே, நானும் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களும் சேர்ந்து உங்களுடைய கட்சியின் உறுப்பினரை களவு எடுக்கவில்லை. இலங்கைத் தமிழரசுக் கட்சி முஸ்லிம் காங்கிரஸுக்கு ஆதரவு என்று இணக்கப்பாடு! நாங்கள் எங்களுடைய உறுப்பினருக்கு முஸ்லிம் காங்கிரஸுக்கு வாக்களிக்குமாறு சொன்னோம். கடந்த முறை ஓட்டமாவடியில் ஆட்சி அமைப்பதற்கு இலங்கைத் தமிழரசுக் கட்சியின் ஆதரவு உங்களுக்குத் தரப்பட்டது. அதேபோல், இம்முறை சம்மாந்துறையிலும் ஆட்சி அமைப்பதற்கு உங்களுக்கு ஆதரவு தரப்பட்டது. நாங்கள் முஸ்லிம் காங்கிரஸுடன் மாத்திரம் இணைந்து செயற்படவில்லை. அது ஒரு விடயம்! நீங்களும் வாருங்கள்! நாங்கள் எல்லோரும் ஒன்றாக இருந்து பேசி, இந்தப் பிரச்சினைத் தீர்ப்போம். முஸ்லிம் காங்கிரஸுக்கும் ACMCக்கும் இடையிலுள்ள பிரச்சினையைக் கொண்டுவந்து இலங்கை தமிழரசுக் கட்சிக்குள் புகுத்தாதீர்கள்! *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Aboobucker Athambawa. You have four minutes.

[பி.ப. 5.45]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உண்மையிலே நான் இன்று சந்தோஷப்படுகின்றேன். இங்கிருக்கின்ற தமிழ், முஸ்லிம் கட்சியினர் அவர்களாகவே தங்களுடைய பிழைகளை ஏற்றுக்கொண்டதுபோல் தெரிகின்றது. நாங்கள் முஸ்லிம்களை வைத்து நிலத்துக்குச் சண்டை பிடிப்பதாக இங்கு பேசிக்கொள்கிறார்கள். உண்மையில் சம்பந்தப்பட்ட தரப்பினர் எதிர்கட்சியில் இருக்கிறார்கள். அவர்கள் இதனைப் பேசித் தீர்க்க வேண்டுமென்று சொல்கிறார்கள். அவர்கள் எங்களை விட்டுவிட்டார்கள். அறிக்கைகளாக இருக்கலாம், ஆணைக்குழுக்களாக இருக்கலாம், எங்களுடைய பிரதேச செயலகங்களின் எல்லைகளாக இருக்கலாம், எதுவாக இருந்தாலும் நீங்கள் நினைப்பது போன்று எதிர்காலத்தில் இந்த நாட்டில் இன ரீதியாக, மத ரீதியாக, மொழி ரீதியாக இந்த நாட்டைப் பிரிப்பதற்கு இந்த அரசாங்கம் ஒருபோதும் இடம்கொடுக்காது. இந்த நாட்டில் குறிப்பாக, வடக்குக் கிழக்கு மாகாணங்களில் இருக்கின்ற தமிழ் பேசும் மக்கள் சார்பாக நீங்கள் பேசி ஒரு தீர்வை எட்டியிருக்கலாம். எதிர்காலத்திலே நீங்கள் கூறுவது போன்று செயற்படலாம்.

நீங்கள் ஒருபோதும் பேசவில்லை. தொலைக்கட்சியில், முகநூல்களில் தகவல் ஒன்றைப் போட வேண்டுமென்பதற்காக நீங்கள் பேசுகின்றீர்கள். கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ் அவர்கள், கடந்த காலத்தில் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சராக, தபால், தொலைத்தொடர்புகள் பிரதி அமைச்சராக, ஆளுநராக இருந்தார்கள். அப்போது அவர் இது பற்றி பேசவில்லை. நான் நினைக்கின்றேன், 2000ஆம் ஆண்டு காலப்பகுதியில் இவ்வாறான ஆணைக்குழுக்கள் உருவாக்கப்பட்டபோது, நிலம் தொடர்பாக மக்களுக்கு இருக்கின்ற பிரச்சினைகள் பற்றி பேசியிருந்தாலும் அவற்றைத் தீர்த்திருக்கலாம். அப்பொழுது அவர்கள் அதைச் செய்யவில்லை. இந்த அரசாங்கம் தங்களுக்குத் தீர்வை வழங்க வேண்டும் என்று இன்று சொல்கிறார்கள்.

அதுமாத்திரமல்ல, எங்களுக்கு இடையில் இருக்கின்ற இனரீதியான பிரச்சினையை அல்லது சமூக முரண்பாடுகளைத் தீர்த்துக்கொண்டு, இந்தப் பிரச்சினைக்குத் தீர்வுகாண வேண்டுமெனச் சொல்கிறீர்கள். நிச்சயமாக இது நல்லதொரு விடயம்! நீங்கள் பேசி, உங்களுக்கு இடையில் இருக்கின்ற முரண்பாடுகளைத் தீர்த்துக்கொண்டு, விட்டுக்கொடுப்போடு இந்தப் பிரச்சினைக்குத் தீர்வைக் காண முன்வாருங்கள்! தமிழ் பேசும் சமூகம் இன்னும் இடர்பாடுகளை எதிர்நோக்கிக்கொண்டு வாழ முடியாது. இன்று தேசிய மக்கள் சக்தியின் ஆட்சியில் நாட்டில் சமாதானம் நிலவுகின்றது. நீங்களே அது பற்றி கூறுகின்றீர்கள். இப்போது நாங்கள் சந்தோசப்படுகின்றோம். ஏனெனில், இந்த நாட்டில் இனக் கலவரம் இல்லை. கடந்த காலங்களில் காலையில் எழுந்தால் பல பிரச்சினைகள் இந்த நாட்டில் இருக்கும். தமிழ் பேசும் மக்களுக்கு நிம்மதி இருக்கவில்லை. இன்று இந்த ஆட்சியின்கீழ் நிம்மதி இருக்கின்றது.

எங்களுடைய வட, கிழக்குப் பிரதேசத்தில் இருக்கின்ற இவ்வாறான எல்லைப் பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். உங்களுக்கு வாக்களித்த மக்கள் பல எதிர்பார்ப்புகளோடு இருக்கின்றார்கள். நீங்கள் காலத்துக்குக் காலம் இவ்வாறான பிரச்சினைகளைப் பாராளுமன்றத்தில் பேசி அதன்மூலம் நன்மை அடைகின்றீர்கள். "தமிழ் பேசும் சமூகத்தை ஏமாற்றுகின்றவர்கள் இருக்கின்றார்கள்; முஸ்லிம்களை ஏமாற்றுகின்றவர்கள் இருக்கின்றார்கள்; தமிழ் மக்களை ஏமாற்றுகின்றவர்கள் இருக்கின்றார்கள்" என்று மக்களே கூறுகின்றார்கள். எங்களிடத்திலும் அவர்கள் இது பற்றி பேசுகின்றார்கள். எனவே, நீங்கள் ஓர் உடன்பாட்டுக்கு வர வேண்டும். "எல்லோரும் இலங்கையர்களாக நிம்மதியாக வாழ வேண்டும்" என்ற எதிர்பார்ப்பை நாங்கள் ஏற்படுத்தி இருக்கின்றோம். அந்த அடிப்படையில், இங்கு எனக்கு முன்னர் பேசிய பாராளுமன்ற உறுப்பினர்களும் கருத்துச் சொன்னார்கள்.

கல்முனையிலும் இவ்வாறான நிலைமைதான் காணப்படுகின்றது. பிச்சைக்காரனுடைய புண்ணைப்போல, அங்கும் இந்தப் பிரச்சினையை வைத்துக்கொண்டு பலர் அரசியல் செய்தார்கள்; இன்னும் செய்துகொண்டு இருக்கிறார்கள். இது பற்றி நாங்கள் சம்பந்தப்பட்ட அமைச்சர்களோடு பேசி இருக்கின்றோம். மாண்புமிகு சனாதிபதியோடும் பேசி இருக்கின்றோம். கல்முனையிலும் கோறளைப்பற்றிலும் இருக்கின்ற பிரச்சினைகளுக்கு உடனடியாக தீர்வுகளை வழங்க வேண்டும். இல்லையென்று சொன்னால், இந்தப் பிரச்சினைகளைப் பயன்படுத்தி இன ரீதியான கட்சிகள் இன்னும் நீண்ட காலம் பயணிக்கும். நிச்சயமாக நாங்கள் உங்களோடு உடன்படுகின்றோம்.

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

சம்பந்தப்பட்ட அமைச்சரோடு நாங்கள் இது பற்றி பேசி இருக்கின்றோம். எனவே, நீங்கள் இந்தப் பிரச்சினையைப் பேசித் தீர்த்துக்கொள்ள வேண்டும். இவ்வாறான பிரச்சினைகளை நாங்கள் இன்னும் நீண்ட காலத்துக்குக் கொண்டுசெல்வோமாக இருந்தால், நிச்சயமாக எங்களுடைய எதிர்கால சமூகம் சண்டை பிடிக்கின்ற ஒரு சமூகமாக மாறும். *[இடையீடு]* எனவே, நாங்கள் எல்லோரும் ஒன்றிணைந்து இதற்கான தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும். உங்களுடைய அரசில் இதற்கான தீர்வு கிடைக்குமாக இருந்தால் இனவாத அரசியல் எவ்வாறு இருக்கும் என்பதை நீங்கள் சற்று உணர்ந்தவர்களாகப் பயணிக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. (Dr.) Elayathamby Srinath. You have two minutes.

[பி.ப. 5.49]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

மிக முக்கியமாக, மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற இப்பிரச்சினை சம்பந்தமாக ஏன் மாவட்ட மட்டத்தில்கூட கலந்துரையாடப்படாமல் பாராளுமன்றத்தில் விவாதப் பொருளாக்கப்பட்டது? இதை நாம் சந்தேகத்துக்குரிய ஒரு விடயமாகவே பார்க்கவேண்டி இருக்கின்றது. இது பற்றி மாவட்ட மட்டத்தில் கலந்துரையாடுவதற்குப் பல சந்தர்ப்பங்கள் அமைந்தபோதிலும்கூட, கலந்துரையாடப்படவில்லை.

வரலாற்று அடிப்படையில் மட்டக்களப்பின் வடக்குப் பகுதி கோறளைப்பற்றாகவே இருந்திருக்கிறது. 1992ஆம் ஆண்டுக்குப் பின்னர்தான், அது கோறளைப்பற்று வடக்கு, கோறளைப்பற்று தெற்கு, கோறளைப்பற்று மேற்கு எனப் பல பகுதிகளாகப் பிரிக்கப்பட்டது. இப்போது கோறளைப்பற்று தெற்கில் குறித்த ஐந்து கிராம சேவகர் பிரிவுகளும் சுமுகமாக இயங்குகின்ற நிலையில், அவை gazette பண்ணப்படாவிட்டாலும்கூட அவற்றினூடாகச் சேவைகள் வழங்கப்பட்டு வருகின்ற இந்த நேரத்தில், ஏன் இந்த அடிப்படையில் இவ்வாறானதொரு விடயம் எழுப்பப்பட்டு இருக்கின்றது? போராட்டங்கள், உண்ணாவிரதப் போராட்டங்கள் எனப் பல விடயங்கள் அந்தப் பிரதேசங்களில் முன்னெடுக்கப்பட்டு, இன முரண்பாட்டை ஏற்படுத்தக்கூடிய சூழ்நிலை உருவாக்கப்பட்டு வருகின்றது. இதன் பின்னணியில் யார் இருக்கின்றார்கள் என்று சிந்திக்க வேண்டும். எனவே, நாம் இந்த விடயத்தில் மிகக் கவனமாகச் செயற்பட வேண்டும்.

கோறளைப்பற்று தெற்கில் 18 கிராம சேவகர் பிரிவுகள் இருக்கின்றன. அந்தப் பிரதேசத்தில் எல்லா இன மக்களும் வாழ்வதற்குரிய சாத்தியமான இயல்பு நிலை இருக்கின்றது. அப்படி இருக்கும்போது, ஏன் குறித்த 5 கிராம சேவகர் பிரிவுகளை கோறளைப்பற்று தெற்கிலிருந்து கோறளைப்பற்று மேற்குக்கு மாற்ற வேண்டும் என்ற விண்ணப்பம் முன்வைக்கப்படுகின்றது. இந்த விண்ணப்பம் நியாயமானதா என்று நாம் யோசிக்க வேண்டும். கடந்த காலங்களில் பல ஆணைக்குழுக்களும் விசாரணைக் குழுக்களும் அமைக்கப்பட்டிருந்தன. எனினும், அந்தக் காலங்களில் நடந்த விடயங்கள் பக்கச்சார்பானதாகவும் ஆட்சியாளர்களின் அல்லது அரசியல் அதிகாரத்தில் இருந்தவர்களின் அழுத்தங்கள் ஊடாகவும் செய்யப்பட்டன என்பது எல்லோருக்கும் தெரியும்! எனவே, நாங்கள் அந்த விடயங்களை விட்டுவிட்டு, மிக நிதானமாகச் செயற்பட வேண்டும்.

இப்போது கோறளைப்பற்று தெற்கில் இருக்கின்ற 18 கிராம சேவகர் பிரிவுகளையும் தொடர்ந்து அவ்வாறே கொண்டுசெல்லக்கூடிய சூழ்நிலை இருக்கின்றபோது, அந்தப் பிரதேசத்தில் எல்லா இன மக்களும் வாழக்கூடிய, எல்லா இன மக்களும் சேவை பெற்றுக்கொள்ளக்கூடிய சந்தர்ப்பம் இருக்கின்றபோது, அவற்றை அவ்வாறே தொடர்ந்து கொண்டுசெல்ல வேண்டும் என்றும் கோறளைப்பற்று வடக்கில் - வாகரை - இருக்கின்ற இரண்டு கிராம சேவகர் பிரிவுகளும் அதனுடன் நிலத்தொடர்போடு இருக்கின்ற காரணத்தால், அவற்றை அவ்வாறே தொடர்ந்து பேண வேண்டும் என்றும் ஓர் இணக்கப்பாட்டுடனான முடிவை எடுக்கவேண்டிய தேவை இருக்கின்றது.

நாம் இந்தப் பிரதேசத்தை இன ரீதியான பிரதேசமாக மாற்றாமல், ஒரு நிர்வாக அலகாக மிக சுமுகமாகக் கொண்டுசெல்லக்கூடிய வகையில் ஒரு தீர்க்கமான முடிவை எடுத்தால், மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற தமிழ், முஸ்லிம் மக்கள் இணக்கமான சூழ்நிலையில் இதனைக் கொண்டுசெல்லக் கூடியதாக இருக்கும். அங்கிருக்கின்ற அரசியல் கட்சிகள் இவ்வாறான விடயங்கள் வருகின்றபோது அவற்றைப் பெரிய விடயங்களாக மாற்றாமல், ஆரம்பத்திலேயே சுமுகமாகத் தீர்த்துக்கொள்ள வேண்டும். இந்த விடயம் சம்பந்தமாக எங்களிடம் பல முறைப்பாடுகள் வந்தபோது, நாங்கள் எங்களுடைய பிரதேச மக்களிடம், "நீங்கள் இனி போராட்டங்களை நடத்த வேண்டாம். நாம் பேசி இணக்கப்பாட்டுடன் இந்த விடயத்தை முடித்துக்கொள்வோம்" என்று கேட்டுக் கொண்டோம்.

இறுதியாக, கோறளைப்பற்று தெற்கிலுள்ள குறித்த ஐந்து கிராம சேவகர் பிரிவுகளையும் அவ்வாறே தொடர்ச்சியாக கொண்டுசெல்வதற்குரிய ஏற்பாட்டை உரிய தரப்பினர் மேற்கொள்ள வேண்டுமென இந்த உயரிய சபையில் கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.53]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මඩකලපුව දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14කින් සමන්විත වන අතර, එයින්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ක් මේ වන විට ගැසට් කර තිබෙනවා. නමුත්, කෝරළේ පත්තු මධ්‍යම සහ කෝරළේ පත්තු දකුණ හෙවත් කිරාන් කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක මේ වන තෙක් ගැසට් කරලා නැහැ. වර්ෂ 1999දී -මීට අවුරුදු 26කට කලින්- එවකට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මහතා විසින් පත් කරන ලද පනම්බලන කමිටුවේ නිර්දේශවලට අනුව, දිස්ත්‍රික්ක 6ක නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8ක් අලුතින් පිහිටුවීම සඳහා වර්ෂ 2000 ජූලි මස 13 දිනැති හා අංක අමප 00/1155/05/65 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දීලා තිබෙනවා. එම අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ගැසට් කිරීමට අනුමැතිය ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක් ක්‍රියාත්මක වන අතර, ඒවායෙන් අම්පාර දිස්ත්‍රික්කයේ නවිඳන්වෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තු මධ්‍යම සහ කෝරළේ පත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හැර අනෙකුත් කොට්ඨාස පහ මේ වන විට ගැසට් කරලා තිබෙනවා. 1999 පනම්බලන කමිටුවේ වාර්තාව මඟින් කෝරළේ පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ග්‍රාම නිලධාරි වසම් 11ක් ඇති කිරීමට යෝජනා වී තිබූ නමුත්, එහි දැනට ක්‍රියාත්මක ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 8කි. එම වසම් 8හි භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 7.22කි. ග්‍රාම නිලධාරි වසම් 11ක් සම්පූර්ණ වන විට එහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 240ක් දක්වා වෙනස් වෙනවා. ඒ කියන්නේ, තව වසම් 3ක් එකතු වනකොට භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 232ක් තරම් ප්‍රමාණයකින් වැඩි වෙනවා. 2011 වර්ෂයේදී කෝරළේ පත්තු උතුර වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කෝරළේ පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා සම්බන්ධ කිරීමේදී පොදු ජනතාව හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විරෝධතා දක්වා ඇති බවත්, ඒ හේතුවෙන් ගැසට් කිරීමට හා පරිපාලන කටයුතුවලට බාධා ඇති වී ඇති බවත් දිස්ත්‍රික් ලේකම්වරයා දන්වා තිබෙනවා. එම ගැසට් කිරීම ප්‍රමාද වුණේ, අඩාළ වුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ මහජනතාව විසින් දක්වන ලද විරෝධතා නිසා කියලා තමයි අපට වාර්තා වෙලා තිබෙන්නේ.

ඒ වාගේම කෝරළේ පත්තුව, එනම් වාලච්චේන, කෝරළේ පත්තු උතුර, එනම් වාකරේ, කෝරළේ පත්තු දකුණ, එනම් කිරාන්, කෝරළේ පත්තු බටහිර, එනම් ඕට්ටමාවඩි සහ කෝරළේ පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මායිම්වල පවතින ගැටලු පිළිබඳ රැස්වීමක් පාර්ලිමේන්තු සංකීර්ණයේදී ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2013 ජනවාරි 24වන දින පවත්වා ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ගෙන නොමැති බව ද මඩකලපුව දිස්ත්‍රික් ලේකම් වැඩිදුරටත් දන්වා තිබෙනවා. මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා වරින් වර පැවැති සාකච්ඡා සාර්ථක වුණේ නැති බවක් තමයි එයින් පෙනී යන්නේ. කොහොම වුණත්, මෙහිදී පවතින ගැටලු සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව සමඟ සාකච්ඡා කළ ද, මේ වන තෙක් නිශ්චිත තීරණයකට එළඹ නොමැති බැවින්, මෙතෙක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගැසට් කිරීමට නොහැකි වී තිබෙනවා. එමෙන්ම මේ ගැටලුවලට විසඳුම් ලබා ගැනීමේදී ජනවාර්ගික ගැටලු ඇති නොවන අයුරින් කටයුතු කිරීමටද විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

මම සතුටු වෙනවා, මේ කරුණු ඉදිරිපත් කළ සියලු ගරු මන්ත්‍රීතුමන්ලා ඒ කාරණයට එකඟ වීම පිළිබඳව. වාර්ගික හෝ වෙනත් ආකාරයක ගැටුමකින් තොරව, සාකච්ඡා මඟින් සුහදව මේ ගැටලුව නිරාකරණය කර ගැනීමට ඔබ සියලුදෙනා දක්වන දායකත්වය බෙහෙවින් අගය කරනවා. ඒ වෙනුවෙන් ස්තුතිය පළ කරනවා.

පනම්බලන කමිටුවෙන් පසුව සීමා නිර්ණය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය මඟින් 2012 සහ 2021 වර්ෂයන්ට අදාළව ක්‍රියාත්මක වූ සීමා නිර්ණය කමිටු මඟින් ලබා දී ඇති නිර්දේශයන්ද -ඒ නිර්දේශ ලබා දීලා තිබුණත් ඒ නිර්දේශවලිනුත් එකඟතාවට පත් වෙන්න නොහැකි වෙලා තිබෙනවා- නැවත දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත ඉදිරිපත් කරනවා. අන්න ඔබතුමන්ලාට අවස්ථාව තිබෙනවා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදීත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් සාකච්ඡා කරලා, ඔබතුමන්ලාම යෝජනා කළ ආකාරයට ඔබතුමන්ලාගේ එකඟතාවෙන් යම් අදහසක්, යෝජනාවක් අපට ලබා දෙන්න. එහෙම ඔබතුමන්ලාට සාකච්ඡා කරලා තීරණයක් ගන්න අවස්ථාව ලබා දෙන්න අපි අපේක්ෂා කරනවා. එම කමිටු නිර්දේශ සම්බන්ධයෙන් සමාලෝචනය කර ඉදිරියේදී පැවැත්වීමට නියමිත සීමා නිර්ණය කමිටුවක් වෙත මෙම ගැටලුව ඉදිරිපත් කිරීම මඟින් විසඳුම් ලබා ගැනීමට අපේක්ෂා කරනවා. ඔබතුමන්ලා එකඟ වෙලා යම් විසඳුමක් දෙනවා නම් ඔබතුමන්ලා කිව්වා වාගේ නැවත සීමා නිර්ණ කමිටුවකට ගිහිල්ලා අමතර කාලයක් ගන්න අවශ්‍ය වෙන එකක් නැහැ. ඒ නිසා ඔබතුමන්ලා එකඟතාවකින් අපට යම් යෝජනාවක් දෙනවා නම්, ඒ පිළිබඳව සලකා බලන්න කිසිම ගැටලුවක් නැහැ. අපි රජය හැටියට, මේ ප්‍රශ්නය විසඳිය යුතුයි කියන කාරණය පිළිගන්නවා. මේ ප්‍රශ්නය 1999 පැන නැඟුණාට ඊට පෙර සිට පැවැති ප්‍රශ්නයක් වෙන්න ඕනෑ. මෙය ක්ෂණිකව, 1999දී පැන නැඟුණු එකක් නොවෙයි. අපි මේ ප්‍රශ්නය අනිවාර්යයෙන්ම විසඳනවා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලා - සියලු පාර්ශ්ව - සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම තමයි කරන්නේ. සාකච්ඡාවෙන් අපට මේ ප්‍රශ්නය නිරාකරණය කරගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඉතා ඉක්මනින් කියලා අවසන් කරන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ඉතා ඉක්මනින් කියන්නම්.

ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ජූනි 24වැනි දා දිස්ත්‍රික් ලේකම් යවපු ලියුමක් නිසා විශාල ආන්දෝලනයක් ඇති වුණා. ගරු ෂාණක්කියන් මැතිතුමාත් දැන් කියා සිටියා, දිස්ත්‍රික් ලේකම් එකේ නිලධාරින්ට දොස් කියන එක එච්චර සුදුසු නැහැ කියලා. නමුත් ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් ඔබතුමාට දැනුම් දෙන කාරණා උඩ සමහර කරුණු වසන් කිරීමක් සිදු වෙනවා. මොකද, ඒ දිස්ත්‍රික් ලේකම් ගත් එම තීරණය උඩ තමයි මේ ප්‍රශ්නය පැන නැඟුණේ. ඒ විතරක් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාරණය පැහැදිලියි. අපට කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට තිබෙන ප්‍රශ්නය නිරාකරණය කරන්නත්, අනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට තිබෙන ප්‍රශ්නය වසන් කරන්නත් එතුමිය කටයුතු කළා කියන එක ඉතාම පැහැදිලියි. එම නිසා දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න බැහැ. ඒකයි මම කිව්වේ. එහිදී ලේකම්වරුන් ඉතාම පක්ෂපාතීව කටයුතු කරන එක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කාරණය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි. අපට විවාදයකට යන්න වෙලාවක් නැහැ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට කරුණු පහදා දීලා තිබෙන්නේ දිස්ත්‍රික් ලේකම් හරහා විතරයි. මම අමාත්‍යාංශයට දොස් කියන්නේ නැහැ. අමාත්‍යාංශය ඒ කරුණු දන්නේ නැහැ. දිස්ත්‍රික් ලේකම්වරුන් පක්ෂපාතී ආකාරයට කටයුතු කිරීම උඩ තමයි ප්‍රශ්නය මෙච්චර දුරට දිග්ගැස්සුවේ කියන එකත් මතක තියා ගන්න ඕනෑ. එච්චරයි.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 අගෝස්තු 06වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.00 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், 2025 ஓகஸ்ட் 06, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.00 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 06th August, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.